සැ. යු.- මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වෙන වෙන ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1904/1 - 2015 මාර්තු මස 02 වැනි බදාදා - 2015.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුවල ආයතනය විසින් මේ සමග පළකර ඇති ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs), සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම ප්‍රමිතීන් වර්ෂ දෙදහස් පහළොව ජනවාරි මස පළමුවැනි දිනෙන් ඇරඹෙන හෝ ඊට පසු කාලපරිච්ඡේදයන් සඳහා කරනු ලබන මූල්‍ය ප්‍රකාශන විගණනයන් සඳහා බලපැවැත්වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.

## 2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට වෙනස්වීම්

පටුන

1. පාරිභාෂික ශබ්ද මාලාව
2. සහතිකවීමේ කාර්යයේ යෙදීම සඳහා වන ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව
3. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 - ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව විගණනය මෙහෙයවීම
4. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 210 - විගණනය භාර ගැනීමේ කොන්දේසි
5. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 220 - මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා තත්ව පාලනය
6. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 230 - විගණන ලේඛනගත කිරීම
7. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 240 - මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වංචා සලකා බැලීමට විගණකගේ ඇති වගකීම්
8. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 250 - මූල්‍ය ප්‍රකාශ විගණනයකදී නීති සහ රෙගුලාසි සැලකිල්ලට ගැනීම
9. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 - පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය
10. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 265 - පාලනය පිළිබඳ වගකීම දරන අය සහ කළමනාකරණය සමඟ අභ්‍යන්තර පාලන ඌනතාවයන් සන්නිවේදනය
11. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 300 - මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීම
12. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 - අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම
13. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 320 - විගණනයක් සැලසුම් කිරීමේදී හා ඉටුකිරීමේදී වන ප්‍රමාණාත්මකභාවය
14. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 330 - තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර
15. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 402 - සේවා සංවිධානයක් සේවයේ යොදවන අස්තිත්වයක් පිළිබඳ විගණයේදී සැළකියයුතු කරුණු
16. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 450 - විගණනය තුළදී හඳුනාගත් අවප්‍රකාශන ඇගැයීම
17. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 500 - විගණන සාක්ෂි
18. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 501 - විගණන සාක්ෂි තෝරාගත් අයිතමයන් සඳහා වූ නිශ්චිත සැලකිල්ලට ගැනීම
19. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 505 - බාහිර තහවුරු කිරීම්
20. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 510 - ආරම්භක විගණන පත්වීම් - ආරම්භක ශේෂ
21. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 520 - විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි
22. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 530 - විගණන නියැදිකරණය
23. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 - සාධාරණ අගයට ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාල හෙළිදරව් කිරීම් ඇතුළත්ව ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම
24. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 550 - සම්බන්ධිත පාර්ශ්ව
25. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 560 - පසුව සිදුවන සිදුවීම්
26. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 - අඛණ්ඩ පැවැත්ම
27. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 580 - ලිඛිත නියෝජනයන්
28. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 600 - විශේෂ සලකා බැලීම් - සමූහ ව්‍යාපාරයන්හි මූල්‍ය ප්‍රකාශ විගණනය
29. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 610 - අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනිම
30. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 620 - විගණකගේ විශේෂඥවරයෙකුගේ වැඩකටයුතු ප්‍රයෝජනයට ගැනීම

31. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 - මූල්‍ය ප්‍රකාශ මත වාර්තාකරණය සහ මතයකට එළඹීම**

32. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 - ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්**

33. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 - ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු අවධාරණය කිරීමේ ඡේද**

34. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 710 - සන්සන්දනාත්මක තොරතුරු - අනුරූපී සංඛ්‍යා සහ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ**

35. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 720 - විගණිත මූල්‍ය ප්‍රකාශ වල අඩංගු ලිපිලේඛන වල සමන්විත වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම්**

36. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 - විශේෂ සලකාබැලීම් - අරමුණ ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ විගණනය**

37. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805 - විශේෂ සැලකිල්ලට ගැනීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතම් විගණනය කිරීම්**

38. **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810 - සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීම සඳහා වන කාර්යභාරය**

දැනට බල නොපැවැත්වෙන සංශෝධිත ප්‍රමිත

1. **ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධ කරගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම**

2. **ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත), අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනිම**

| පාරිභාෂික ශබ්ද මාලාව | |
|---|---|
| ගිණුම්කරණ වාර්තා | ආරම්භක ගිණුම්කරණ සටහන් වලට සහ උපකාර වන වාර්තා චෙක්පත් සහ විද්‍යුත් අරමුදල් මාරුකිරීම් වාර්තා, ඉන්වොයිසි, කොන්ත්‍රාත්තු, පොදු සහ උපයෝගී ලෙජර, ජර්නල් සටහන් සහ විධිමත් ජර්නල් සටහන්වල පිළිබිඹු නොවන මූල්‍ය ප්‍රකාශ සඳහා කළ වෙනත් ගැලපීම් සහ වැඩ පත්‍රිකා පිරිවැය වෙන් කිරීම් තහවුරු කෙරෙන පැතුරුම් පත්‍ර ආගණනය කිරීම් සංසන්දනය කිරීම වැනි වාර්තා සහ හෙළිදරව් කිරීම් ඇතුළත් වේ. |
| යෝග්‍ය නිර්ණායක (SLSAE 3410[3] ප්‍රකාරව) | අස්තිත්වයේ මුදාහැරීම් ප්‍රමාණාත්මකව මැනීමට සහ වාර්තා කිරීමට අස්තිත්වය විසින් GHG ප්‍රකාශයේ භාවිතා කළ නිර්ණායකය.<br><br>යෝග්‍ය නිර්ණායක (*SLSAE 3420*[4] ප්‍රකාරව) - *නාමමාත්‍ර මූල්‍ය තොරතුරු එකට එකතු කරන විට වගකිවයුතු පාර්ශව* විසින් භාවිතා කළ නිර්ණායක. අනුමත හෝ හඳුනාගත් ප්‍රමිති පිහිටුවන ආයතනය හෝ නීති හෝ රෙගුලාසි මඟින් නිර්ණායක පිහිටුවිය හැකිය. පිහිටුවන නිර්ණායක නොපවතින අවස්ථාවක වගකිවයුතු පාර්ශවයන් මඟින් ඒවා සංවර්ධනය කරනු ලැබේ. |
| *අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව* | අස්තිත්වයේ ස්වභාවයේ පෙනුම සහ මූල්‍ය ප්‍රකාශවල අරමුණ හෝ එනම් අවශ්‍යකරන නීති හෝ රෙගුලාසි වලින් අවශ්‍යකරන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් සහ අදාල වන පාලනය භාර අය අනුගමනය කරන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවයි.<br><br>නෛතිකව හෝ රෙගුලාසි වලින් අවශ්‍යකරන පරිදි හෝ අස්තිත්වයේ ස්වභාවය හා මූල්‍ය ප්‍රකාශවල අරමුණු අනුව පිළිගත හැකි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය සහ උචිත වන පරිදි පාලනය පිළිබඳ වගකීම දරන පුද්ගලයින් විසින් අනුමත මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව. SLSRS 4410 (සංශෝධිත) ප්‍රකාරව[5] යොමු කෙරෙන්නේ මූල්‍ය ප්‍රකාශ වලට වඩා මූල්‍ය තොරතුරු වලටය. |
| සැඳෑහුම් | සිදුවීමට ඉඩ ඇති වෙනස් ආකාරවල වියහැකි විභව අවප්‍රකාශන සැලකිල්ලට භාජනය කිරීම සඳහා විගණක විසින් යොදාගනු ලබන මූල්‍ය ප්‍රකාශවල පැහැදිලි හෝ අන් අයුරකින් ඇතුළත්බවට කළමනාකාරීත්වය විසින් කෙරෙන නියෝජනයන් වේ. සිදුවීමට ඉඩ ඇති වෙනස් ආකාරවල වියහැකි විවිධ වර්ගවල විභව අවප්‍රකාශන සලකා බැලීමට වෘත්තියේ යෙදෙන්නා විසින් භාවිතයට ගනු ලබන අස්තිත්වයේ නියෝජන ලෙස GHG ප්‍රකාශයේ SLSAE 3410 හි සැඳෑහුම නිර්වචනය කරයි. |
| තක්සේරු කිරීම | වැදගත්කම නිශ්චය කිරීම සඳහා ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල හඳුනාගත් අවදානම් විශ්ලේෂණය කිරීම සාම්ප්‍රදායිකව තක්සේරුව අවදානම් සම්බන්ධයෙන් පමණක් භාවිතා කරණු ලැබේ. (තවද අගය කිරීමද බලන්න.) |
| පදනම් වර්ෂය | කාලපරිච්ඡේදය පුරා සසඳන අස්තිත්වයක මුදාහැරීම් වලට එරෙහිව විශේෂිත වූ වර්ෂයක් හෝ බහුවර්ෂ පුරා සාමාන්‍යයයි. |
| වැස්ම සහ වෙළඳාම | සමස්ත පිටකිරීමේ සීමා පිහිටුවන සහභාගීවන්නන්ට මුදාහැරීමේ දීමනා වෙන්කරන සහ එකිනෙකා සමඟ වෙළඳ දීමනා වලට සහ මුදාහැරීම් බැරකිරීම් වලට ඉඩදෙන ක්‍රමයකි. |
| සන්සන්දනාත්මක තොරතුරු | අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාර පූර්වගාමී කාලපරිච්ඡේද එකක් හෝ ඊට වඩා ගණනක ඇතුළත් කර ඇති වටිනාකම් සහ හෙළිදරව් කිරීම්. පූර්වගාමී කාලපරිච්ඡේද එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් GHG ප්‍රකාශය තුළ ඇතුළත්වන වටිනාකම් සහ හෙළිදරව් කිරීම් ලෙස SLSAE 3410 හි සන්සන්දනාත්මක තොරතුරු නිර්වචනය කරයි. |

[3] SLSAE 3410- හරිතාගාර වායු පිළිබඳ වූ ප්‍රකාශන මත සහතිකවීමේ කාර්යභාරයන්
[4] SLSAE 3420- සංස්ථා ප්‍රකාශනයක ඇතුළත් නාමමාත්‍ර මූල්‍ය තොරතුරු සම්පාදනය පිළිබඳ වාර්තා කිරීම සඳහා වන සහතිකවීමේ කාර්යභාරයන්
[5] SLSRS 4410 (සංශෝධිත) - මූල්‍ය ප්‍රකාශ සම්පාදනය සඳහා වන කාර්යභාරයන්

| | |
|---|---|
| සම්පාදනය කිරීමේ කාර්යභාරය | යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව අනුව මූල්‍ය තොරතුරු පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අස්තිත්වයක කළමනාකරණයට සහය දෙන වෘත්තියේ යෙදෙන්නෙක් ව්‍යවහාරකරන ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රවීණතාවය මෙම SLSRS මගින් නියම කරන ලෙස වාර්තා කරන කාර්යයභාරයයයි. SLSRS 4410 (සංශෝධිත) මුළුල්ලේම "සම්පාදනය කිරීම", "සම්පාදනය කරමින් " සහ "සම්පාදනය කළ'' යන වචන මෙහිදී භාවිතා කරයි. |
| පිටකිරීම්/මුදා හැරීම් | අදාළ කාලපරිච්ඡේදය තුළදී අත්පත් කරගෙන නොමැති මෙන්ම කසල රඳවනයකට සම්බන්ධ කර ඇති වායුගෝලයට මුදාහැර තිබෙන හෝ වායුගෝලයට මුදාහැර තිබියහැකි හරිතාගාර වායූන්ය. මුදාහැරීම් පහත පරිදි වර්ග කළ හැකිය.<br><br>• ඍජු මුදාහැරීම්, අස්තිත්වයට අයිති හෝ අස්තිත්වය මගින් පාලනය කරන මූලාශ්‍ර වලින් වන මුදාහැරීම් (විෂය පථය 1 හි මුදාහැරීම් ලෙස ද දැක්විය හැක.)<br><br>• වක්‍ර මුදාහැරීම්, අස්තිත්වයේ කාර්යයන්වල ප්‍රතිඵලයක් වන මුදාහැරීම් වන නමුත් වෙනත් අස්තිත්වයක අයිතිය හෝ මූලාශ්‍රයක් මගින් වන මුදාහැරීම්. වක්‍ර මුදාහැරීම් තවදුරටත් පහත පරිදි වර්ග කළ හැකිය.<br>○ විෂය පථ 2 මුදාහැරීම්, අස්තිත්වය මගින් මාරු කරන සහ පරිභෝජනය කරන ශක්තිය සමග සම්බන්ධ වන මුදාහැරීම්<br>○ විෂය පථ 03 මුදා හැරීම්, වෙනත් සියලුම වක්‍ර මුදාහැරීම්. |
| මුදාහැරීම් අඩු කිරීම | මුළු වාර්තාගත මුදාහැරීම් තුළින් අඩුකරන නමුත් එය ඉවත් කිරීමක් නොවන මිලදී ගත් හිලව් කිරීම් තුළ පොදුවේ ඇතුලත් නමුත් අස්තිත්වයේ කොටසක් වන නියාමනය කිරීමක් මගින් හෝ වෙනත් ක්‍රමයකින් හඳුනාගත් කාර්යඵල ලැබීම් සහ දීමනා වැනි වෙනත් උපකරණ හෝ ක්‍රමවල විවිධත්වයක් ද ඇතුළත් කළ හැකි අස්තිත්වයේ GHG ප්‍රකාශයේ ඇතුළත් වන ඕනෑම අයිතමයකි. |
| මුදාහැරීම් සාධකය | ක්‍රියාකාරකමක් හා සම්බන්ධ හරිතාගාර වායු ප්‍රමාණයේ ඇස්තමේන්තුවක් තුළට ක්‍රියාකාරකමක් මැනීම පරිවර්තනය කිරීම සඳහා වන ගණිතමය සාධකයක් හෝ අනුපාතිකයකි. (උදාහරණ ලෙස පරිභෝජනය කළ තෙල් ලීටර්, ගමන් කළ කිලෝමීටර්, ගොවිතැනක සතුන් ගණන හෝ නිෂ්පාදනය කළ නිෂ්පාදන ටොන් ගණන). |
| මුදාහැරීම් වෙළඳ ක්‍රමය | හරිතාගාර වායු පිටකිරීම් අඩු කිරීම ළඟා කර ගැනීම සඳහා ආර්ථිකමය දිරි දීමනා සැපයීම මගින් හරිතාගාර වායු පාලනයට භාවිතා කරන වෙළඳපොළ පදනම් කරගත් ප්‍රවේශයකි. |
| අස්තිත්වය (SLSAE 3410 හි ඇතුළත්) | GHG ප්‍රකාශය තුළ සම්බන්ධ වන මුදාහැරීම් වලට නෛතික අස්තිත්වය, ආර්ථික අස්තිත්වය හෝ නෛතික හෝ ආර්ථික අස්තිත්වයක හඳුනාගත් කොටස (උදාහරණ ලෙස තනි කර්මාන්ත ශාලාවක් හෝ ගොඩකළ ඉඩමක කොටසක් වැනි පහසුකමේ වෙනත් හැඩය) හෝ නෛතික හෝ වෙනත් අස්තිත්තවල සංයෝජනයක් හෝ එම අස්තිත්වවල කොටස් (උදාහරණ ලෙස බද්ධ ව්‍යාපාරයක්). |
| පාරිසරික කරුණු | [ඉවත් කරන ලදී] |
| GHG ප්‍රකාශය | සැලකිය යුතු ප්‍රමාණකරණයේ සාරාංශයක් සහ වාර්තාකරණ ප්‍රතිපත්ති ඇතුළත්ව සන්සන්දනාත්මක තොරතුරු සහ වැඩිදුර සටහන් යෝග්‍ය ලෙස සහ කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්වයක හරිතාගාර වායු මුදාහැරීම් ප්‍රමාණාත්මක කිරීම සහ කොටස්වල සංඝටක පිහිටුවීමේ ප්‍රකාශයකි. (සමහරවිට මුදාහැරීමේ තොග ලෙස දක්වයි) අස්තිත්වයේ GHG ප්‍රකාශය තුළ ඉවත් කිරීම් ඛණ්ඩගත ලැයිස්තුවක් හෝ මුදාහැරීම් අඩුකිරීම් ද ඇතුළත් කළ හැකිය. කාර්යභාරයේදී සම්පූර්ණ GHG ප්‍රකාශයේ ආවරණය නොවන අවස්ථාවක "GHG ප්‍රකාශය" යන පදය කාර්යභාරය ආවරණය වන කොටසක් ලෙස කියවිය යුතු වේ. GHG ප්‍රකාශයේ කාර්යභාරයේ විෂය කරුණු තොරතුරු වේ [15] . |
| හරිතාගාර වායු (GHG) | GHG ප්‍රකාශය තුළ ඇතුළත් කළයුතු යෝග්‍ය නිර්ණායක මගින් අවශ්‍යකරන කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) සහ වෙනත් ඕනෑම වායු එනම් මීතෙන්, නයිට්‍රස් ඔක්සයිඩ්, සල්ෆර් |

[15] සහතිකවීමේ ආකෘතිමය රාමුව, 8 ඡේදය

| | |
|---|---|
| | හෙක්සෝප්ලෝරයිඩ්, හයිඩ්‍රොප්ලූරොකාබන්, ප්ලූරොකාබන් සහ ක්ලොරොප්ලූරොකාබන්. කාබන්ඩයොක්සයිඩ් හැර වායූ නිතරම කාබන්ඩයොක්සයිඩ් සමානුපාතිකයේ වාර ගණනින් ප්‍රකාශ කෙරේ. |
| අභ්‍යන්තර විගණන කාර්යය | අස්තිත්වයේ පාලනයේ කාර්යක්‍ෂමතාවය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් අගය කිරීමට සහ වැඩිදියුණු කිරීමට සැලසුම් කළ සහතික වීමේ සහ උපදෙස් දෙන ක්‍රියාකාරකම් අස්තිත්වය විසින් ඉටු කරන කාර්යයකි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ස්ථාපනය කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත. |
| අවප්‍රකාශනය | මූල්‍ය තොරතුරුවල වාර්තා කරන ලද අයිතමයක වටිනාකම, වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව එම අයිතමය සඳහා අවශ්‍යකරන වටිනාකම, වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම අතර වෙනස අවප්‍රකාශනයක් ලෙස SLSRF 4410හි (සංශෝධිත) නිර්වචනය කරයි. අවප්‍රකාශන වැරැද්දකින් හෝ වංචාවකින් ඇතිවිය හැකිය.<br><br>මූල්‍ය තොරතුරු සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතියක් අනුව සකස් කරන අවස්ථාවකදී, මූල්‍ය තොරතුරු සියලුම ප්‍රමාණාත්මක අගයන්ගෙන් සාධාරණ අන්දමින් ඉදිරිපත් කිරීමට හෝ සත්‍ය සහ සාධාරණ බව දීමට අවශ්‍ය වන බව වෘත්තිකයා විනිශ්චය කළ විට එම වටිනාකම් වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීමේ ගැලපීම් ද අවප්‍රකාශන තුළට ඇතුලත් වේ. |
| සංවිධානමය සීමාව | අස්තිත්වයේ GHG ප්‍රකාශයේ ඇතුළත් කිරීමට අදාල වන මෙහෙයුම් නිශ්චය කරන සීමාව වේ. |
| කාර්යඵල ප්‍රමාණවත් බව | සමස්තයක් වශයෙන් මුල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණවත් බව ඉක්මවන නිවැරදි නොකළ සහ අනාවරණය නොකළ අවප්‍රකාශනවල එකතුව යෝග්‍යවන අඩු මට්ටමේ සම්භාවිතාවයකට අඩු කිරීමට සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා වඩා අඩු ප්‍රමාණවත් බව විගණක විසින් පිහිටුවන වටිනාකම හෝ වටිනාකම්. අදාල නම් ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් විශේෂිත ගණුදෙනුවල වූ පන්තිය සඳහා වඩා අඩු ප්‍රමාණවත් මට්ටම හෝ මට්ටම් විගණක විසින් පිහිටුවන ලද වටිනාකම හෝ වටිනාකම් කාර්යඵල ප්‍රමාණවත් බවේ සඳහන් වේ. GHG ප්‍රකාශය සඳහා ප්‍රමාණවත් බව ඉක්මවන නිවැරදි නොකළ හෝ අනාවරණය නොවන අවප්‍රකාශනවල එකතුව යෝග්‍ය අඩු මට්ටමේ සම්භාවිතාවයකට අඩු කිරීමට GHG ප්‍රකාශය සඳහා වඩා අඩු ප්‍රමාණාත්මකබවට වෘත්තික විසින් පිහිටුවන වටිනාකම හෝ වටිනාකම් ලෙස SLSAE 3410 හි කාර්යඵල ප්‍රමාණවත් බව නිර්වචනය කර ඇත. අදාල නම් වඩා අඩු ප්‍රමාණවත් මට්ටම හෝ මට්ටම් වලට මුදාහැරීම් හෝ හෙළිදරව් කිරීම්වල විශේෂිත වර්ග සඳහා වෘත්තිකයා විසින් පිහිටුවන වටිනාකම හෝ වටිනාකම් වලින් ද කාර්යඵල ප්‍රමාණවත් බව සඳහන් වේ. |
| වෘත්තිකයා (SLSRS 4410 හි ඇති (සංශෝධිත)) | සම්පාදනය කිරීමේ කාර්යභාරයේ නියුතු පොදු පරිචයේ නිරත වන වෘත්තිය ගණකාධිකාරීවරයෙකි. මෙම පදයේ කාර්යයේ නියුතු හවුල්කරු හෝ කාර්යයභාර කණ්ඩායමේ නියුතු වෙනත් සාමාජිකයන් හෝ අදාළවන ආයතනයද ඇතුළත් වේ. කාර්යභාරයේ නියුතු හවුල්කරු විසින් සම්පූර්ණ කළයුතු අවශ්‍යතාවයක් හෝ වගකීමක් අදහස් කිරීම SLSRS 4410 (සංශෝධිත) හි ප්‍රකාශ කළ අවස්ථාවකදී, "වෘත්තිකයා"ට වඩා "කාර්යභාරයේ නියුතු හවුල්කරු" යන පදය යොදාගනී. අදාල අවස්ථාවකදී, ඔවුන්ගේ පොදු අංශයේ සමාන බවට සඳහන් කිරීමේ දී "කාර්යභාරයේ නියුතු හවුල්කරු" සහ "ආයතනය" යන ලෙස කියවිය යුතු වේ. |
| නාමමාත්‍ර ගැලපිලි | නොගැලපූ මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් පහත දෑ ඇතුළත් වේ.<br><br>(අ) නිරූපණයේ අරමුණ සඳහා තෝරාගත් කලින් දවසකට සිද්ධිය සිදුවන්නේ නම් හෝ ගනුදෙනුව භාරගෙන තිබේ නම් සිද්ධිය සිදුවීමේ හෝ ගණුදෙනුවේ (සිද්ධිය හෝ ගණුදෙනුව) බලපෑමේ නිරූපණය කරන නොගැලපූ මූල්‍ය තොරතුරුවලට ගැලපීම් සහ<br><br>(ආ) වාර්තාකරණ අස්තිත්වයේ (අස්තිත්වය) අදාල වන මූල්‍ය වාර්තාකරණ රාමුව සහ එම ආකෘතිමය රාමුව යටතේ එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ඒකාකාරී පදනම සමඟ එකඟ |

| | |
|---|---|
| | විය යුතු නාමමාත්‍ර මූල්‍ය තොරතුරු සඳහා අවශ්‍ය නොගැලපූ මූල්‍ය තොරතුරුවලට ගැලපීම.<br><br>නාමමාත්‍ර මූල්‍ය තොරතුරු සම්පාදනය කිරිමේදී භාවිතාකරන අදාළ මූල්‍ය තොරතුරු ප්‍රමාණය දක්වා (අත්පත් කර ගැනිමට භාජනයවන්නා හෝ ආපසු පවරාගත් මූල්‍ය තොරතුරු) අත්පත් කර ගැනිමට භාජනය වන්නා හෝ ව්‍යාපාරයක හෝ ආපසු පවරාගත් හෝ ආපසු පවරා ගැනීමට යන ව්‍යාපාරයක අදාළ මූල්‍ය තොරතුරු නාමමාත්‍ර ගැලපිලි වලට ඇතුළත් වේ. |
| නාමමාත්‍ර මූල්‍ය තොරතුරු | නිරූපණය කරන අරමුණ සඳහා තෝරාගත් කලින් දිනයේ සිදුවන සිද්ධියක් නම් හෝ භාරගත් ගණුදෙනුවත් වශයෙන් නොගැලපූ මූල්‍ය තොරතුරු මත සිද්ධියක හෝ ගණුදෙනුවක බලපෑම නිරූපණය කිරීමට ගැලපිලි සමඟ පෙන්වන මූල්‍ය තොරතුරු මෙම SLSAE හි (අ) නොගැලපූ මූල්‍ය තොරතුරු (ආ) නාමමාත්‍රික ගැලපිලි සහ (ඇ) නාමමාත්‍ර තීරුවේ ප්‍රතිඵලයෙහි අඩංගු වන, තීරු සහිතව ඉදිරිපත් කරන නාමමාත්‍ර මූල්‍ය තොරතුරු එහිදී අනුමාන කරයි. |
| වෘත්තීය ගණකාධිකාරී | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හි සාමාජික ආයතනයක සාමාජිකයකු වන පුද්ගලයෙකි. |
| වෘත්තීය ප්‍රමිත | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර) සහ අදාළ වන ආචාරධර්ම අවශ්‍යතාවයන් ය. |
| † වෘත්තීය ප්‍රමිත (ත.පා.මත ශ්‍රී.ල.ප්‍ර 1 – SLSQC 1 හි ඇතුළත්)1[21]) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පූර්විකාවේ නිර්වචනය කළ තත්ව පාලනය, විගණන, සමාලෝචනය, වෙනත් සහතික වීමේ සහ සම්බන්ධිත සේවා සහ අදාලවන ආචාරධර්ම අවශ්‍යතාවයන් මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ කාර්යභාර ප්‍රමිත |
| සංස්ථා ප්‍රකාශය | ආයෝජන තීරණයක් සිදු කළයුතු තෙවැනි පාර්ශවයකට අදහස් කරන අස්තිත්වයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් නෛතික හෝ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුව සිදුවන නිකුත් කළ ලියවිල්ලකි. |
| ප්‍රකාශිත මූල්‍ය තොරතුරු | පොදුවේ පැවතීමට ඇති අස්තිත්වයේ හෝ පැවරීමට භාජනය වන තැනැත්තාගේ හෝ පවරනු ලබන්නන්ගේ මූල්‍ය තොරතුරු යි. |
| මිලට ගත් හිලව් කිරීම් | කල්පිත පාද රේඛාවකට සසඳා වෙනත් අස්තිත්වයේ මුදාහැරීම් (මුදාහැරීම් අඩු කිරීම) බැස්සවීම හෝ වෙනත් අස්තිත්වයක ඉවත්කිරීම් වැඩි කිරීම (ඉවත් කිරීම වැඩි කිරීම) සඳහා අස්තිත්වය ගෙවන මුදාහැරීමේ අඩු කිරීමයි) |
| ප්‍රමාණකරණය | විශේෂිත වූ මූලාශ්‍ර මගින් (හෝ කුණු රඳවනයන්) මුදාහැරීම් වශයෙන් (හෝ ඉවත් කළ) සෘජුවම හෝ වක්‍රාකාරව අස්තිත්වයට සම්බන්ධ හරිතාගාරවායුහි ප්‍රමාණය නිශ්චය කිරීමේ ක්‍රියාවලියයි. |
| සාධාරණ තහවුරු කිරීම (විගණන කාර්යභාරය සහ තත්ව පාලනයේ ඇතුළත්ව ඇති) | වඩා වැඩි නමුත් සම්පූර්ණ නොවන සහතික කිරීමේ මට්ටමකි. |
| අදාළ ආචාර ධර්ම අවශ්‍යතා | කාර්යයේ නියුක්ත කණ්ඩායම සහ කාර්යයේ නියුක්ත තත්ව පාලන සමාලෝචක යටත්වන ආචාරධර්ම අවශ්‍යතාවන්ට සාමාන්‍යයෙන් ශ්‍රී.ල.ව.ග. අ. යේ වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන අ සහ ආ කොටස් වලින් සමන්විත සංග්‍රහයට (ශ්‍රී.ල.ව.ග. ආ. සංග්‍රහය) සහ වඩාත් සීමාකාරී වන ජාතික අවශ්‍යතාවන්ට යටත් වේ. සම්පාදනය කිරීමේ කාර්යභාරය භාර ගන්නා විට යටත්ව, කාර්යභාර කණ්ඩායමේ ආචාරධර්ම අවශ්‍යතා වශයෙන් අදාළ ආචාරධර්ම අවශ්‍යතා SLSRS |

[21] ත.පා.මත ශ්‍රී.ල.ප්‍ර 1, *විගණනයන්, සමාලෝචන, වෙනත් සහතික වීමේ සහ සම්බන්ධිත සේවා ඉටුකරන ආයතන සඳහා තත්ව පාලනය,*

| | |
|---|---|
| | 4410 (සංශෝධිත) හි නිර්වචනය කරයි. මෙම අවශ්‍යතා සාමාන්‍යයෙන් වඩා සීමාවලින් යුත් ජාතික අවශ්‍යතාවය සමඟ එකම වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වෘත්තීය ගණකාධිකාරීවරුන්ගේ ආචාරධර්ම සංග්‍රහය සමඟ ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිත මණ්ඩලයේ (අ) සහ (ආ) කොටස්වල (290 කොටසේ, ස්වාධීනත්වය - විගණනය සහ සමාලෝචන කාර්යභාරය සහ 291 කොටසේ ආ කොටසේ වෙනත් සහතිකවීමේ කාර්යභාරයන් හැර) සාමාන්‍යයෙන් අඩංගු වේ. |
| ඉවත්කිරීම් | වායුගෝලයෙන් ඉවත් කරන හෝ වායුගෝලයට මුදාහැරීම්වල කසල රඳවනයකට සම්බන්ධ නොවී සහ ඒ හරහා කාලපරිච්ඡේදය තුළදී අස්තිත්වයේ තිබෙන හරිතාගාර වායු වේ. |
| සැලකිය යුතු පහසුකම | ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ විශේෂිත වූ අවදානම් වලට නැගීමට දෙන GHG ප්‍රකාශයේ හෝ එහි විශේෂිත ස්වභාවයේ හෝ සිද්ධීන්වල ඇතුළත්වන මුදාහැරීමේ එකතුවට සම්බන්ධිත එහි මුදාහැරීම්වල ප්‍රමාණයට හේතුවන තනි වැදගත්කම දෙන පහසුකමකි. |
| කසල රඳවනය | වායුගෝලයේ හරිතාගාර වායු ඉවත්කරන භෞතික ඒකකය හෝ ක්‍රියාවලියකි. |
| මූලාශ්‍රය | වායුගෝලයට හරිතාගාර වායු මුදාහරින භෞතික ඒකකය හෝ ක්‍රියාවලියකි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත | [ඉවත් කරන ලදී] |
| මුදාහැරීමේ වර්ගය | උදාහරණ ලෙස මුදාහැරීමේ මූලාශ්‍රය, වායු වර්ග, ප්‍රදේශය හෝ පහසුකම පදනම මත මුදාහැරීම් වර්ග කිරීමකි. |
| නොගැලපූ මූල්‍ය තොරතුරු | වගකිවයුතු පාර්ශවයක් විසින් අනුගමනය කරන නාමමාත්‍ර ගැලපිලි වලට අදාළ අස්තිත්වයේ මූල්‍ය තොරතුරු |
| **සහතිකවීමේ කාර්යයේ යෙදීම සඳහාවන ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව** | |
| 51 (ඈ) | පරීක්ෂා කිරීම, නිරීක්ෂණය, තහවුරු කිරීම, යළි ගණනය කිරීම, ප්‍රති-ඉටු කිරීම, විශ්ලේෂණාත්මක පටිපාටි සහ විමසුම් වල සංයෝජනයක් භාවිත කර හඳුනාගත් අවදානම් වලට පැහැදිලිව සම්බන්ධ කරන අමතර පටිපාටි ඉටු කිරීම. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 - ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව විගණනය මෙහෙයවීම** | |
| 13 (ඈ) | විගණක - විගණනය මෙහෙයවන පුද්ගලයා හෝ පුද්ගලයින් සාමාන්‍යයෙන් කාර්යයේ නියුතු හවුල්කරු හෝ කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙක් සාමාජිකයෙකු හෝ යෝග්‍ය පරිදි ආයතනයක් හෝ, ''විගණක'' ලෙස ව්‍යවහාර කිරීමට යොමු වේ. කාර්යයේ නියුතු හවුල්කරු විසින් ඉටු කළයුතු ශ්‍රී.ල.වි.ප්‍ර. වල ප්‍රකාශිතව සඳහන් අවශ්‍යතාවයක් හෝ වගකීම් ඇති විට ''විගණක'' යන්නට වඩා ''කාර්යයේ නියුතු හවුල්කරු'' යන පදය යොදා ගනී. "කාර්යයේ නියතු හවුල්කරු" සහ "ආයතනයේ" අදාල තැන්හි රාජ්‍ය අංශයේ ඒ හා සමානදෑට යොමුවන පරිදි කියවා අවබෝධ කරගත යුතුය. |
| අ41 | මූල්‍ය ප්‍රකාශ හෝ සැඳහුම් මට්ටමේදී, ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) විසින් අවශ්‍යතාවය ස්ථාපනය කරන අතර මග පෙන්වීම සපයයි. |
| අ43 | පිළිගත හැකි පහළ මට්ටමකට විගණන අවදානම් අඩුකර ගැනීම සඳහා විගණක විසින් නිර්ණය කරන ලද විගණකගේ පටිපාටිවල ස්වභාවය, කාලය හා ප්‍රමාණය අනාවරණ අවදානමට අදාල වේ. එබැවින් අනාවරණ අවදානම විගණන ක්‍රියාපටිපාටියක සඵලතාවයේ හා විගණක විසින් |

| | |
|---|---|
| | එය අදාළ කර ගැනීමේ කාර්යයක් බවට පත්වේ. පහත සඳහන් කරුණු විගණන පටිපාටියක සඵලතාවය හා ව්‍යාවහාර කිරීම වැඩි දියුණු කිරීමටත් උපකාරී වේ.<br>• ප්‍රමාණවත් සැළසුම්කරණය;<br>• කාර්යභාරය කණ්ඩායමට සාමාජිකයන් නිසි ලෙස අනුයුක්ත කිරීම;<br>• වෘත්තීය <u>සංශය දෘෂ්ඨියක්</u> ව්‍යවහාර කර ගැනීම; සහ<br>• ඉටුකරන ලද විගණන ක්‍රියා අධීක්ෂණය හා සමාලෝචනය. |
| අ69 | අරමුණු ප්‍රයෝජනයට ගැනීමේදී, ශ්‍රී.ල.වි.ප්‍ර. අතර එකිනෙක සැබැඳීම විගණක විසින් සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. මක්නිසාදයත්, අ53 ඡේදයේ දක්වන පරිදි, ශ්‍රී.ල.වි.ප්‍ර සමහර අවස්ථාවලදී සමාන වගකීම් සමග ගණුදෙනු කරන අතර තවත් සමහර අවස්ථාවලදී, එම වගකීම් ව්‍යවහාර කරන්නේ නිශ්චිත මාතෘකා සඳහා වීම නිසාය. උදාහරණයක් වශයෙන්, මෙම ශ්‍රී.ල.වි. ප්‍රමිතියේ විගණකට වෘත්තීය සංශය දෘෂ්ටි ආකල්පයන් අනුගමනය කිරීම විගණනයන් සැලසුම් කිරීම හා ඉටු කිරීම පිළිබඳ සියලු පැතිකඩ සඳහා අත්‍යවශ්‍ය වන නමුත් මෙය අවශ්‍යතාවයක් ලෙස එක් එක් ශ්‍රී.ල.වි.ප්‍ර. වල නැවත කිරීම අවශ්‍ය නොවේ. පිළිවෙලින් ප්‍රමාණාත්මක අවප්‍රකාශන වල අවදානම හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට විගණකගේ වගකීම පිළිබඳව කටයුතු කරන අරමුණ සහ අවශ්‍යතාවයන්ගෙන් සහ එම තක්සේරු කළ අවදානමේ ප්‍රතිචාර සඳහා සැලසුම් කිරීම තවදුරටත් ඉටුකළ යුතු විගණන පටිපාටි වඩාත් විස්තරාත්මක මට්ටමක දී වෙනත් දේවල් අතර <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> හි සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 හි අඩංගු වේ. මෙම අරමුණු සහ අවශ්‍යතා විගණනය මුළුල්ලේහිම ව්‍යවහාර වේ. විගණනයේ නිශ්චිත පැතිකඩ ගැන කටයුතු කරන ශ්‍රී.ල.වි.ප්‍ර.යක (උදාහරණ වශයෙන් ශ්‍රී.ල.වි.ප්‍ර. 540) ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂයට අදාලව <u>ශ්‍රී.ල.වි.ප්‍ර 315 (සංශෝධිත)</u> සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 වැනි ශ්‍රී.ල.වි.ප්‍ර. යොදා ගැනීමේදී කෙසේ ඒවායේ අරමුණු සහ අවශ්‍යතා යොදාගත යුතු දැයි විස්තර කළ හැකිය. එහෙත් ඒවා නැවත නොදැක්වේ. ඒ අනුව ශ්‍රී.ල.වි.ප්‍ර. 540 හි සඳහන් අරමුණු සපුරා ගැනීමේ දී අදාල වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර. වල අරමුණු සහ අවශ්‍යතා ගැන විගණක් සැලකිලිමත් වේ. |
| අ72 | සමහර අවස්ථාවලදී, ශ්‍රී.ල.වි.ප්‍ර යන් (සහ එමනිසා එහි සියලු අවශ්‍යතා) ඇතිවන තත්වයන්හිදී අදාල නොවිය හැකිය. උදාහරණයක් ලෙස අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යන් නොමැති නම් <u>ශ්‍රී.ල.වි.ප්‍ර 610 (සංශෝධිත)</u> කිසිවක් අදාල නොවේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 210 - විගණනය භාර ගැනීමේ කොන්දේසි එකඟවීම** | |
| අ23 | *අස්තිත්වයක ස්වභාවය අනුව විගණනය භාරගැනීමේ ලිපියක ආකෘතිය සහ අන්තර්ගතය එක් එක් අස්තිත්වය සඳහා වෙනස්විය හැකිය. විගණන කාර්‍ය්‍ය භාරගැනීමේ ලිපියේ ඇතුලත් කරන විගණකවරයාගේ වගකීම් පිළිබඳ තොරතුරු ශ්‍රී.ල.වි.ප්‍ර. 200 මත පදනම් වියහැකිය. කළමනාකරණයේ වගකීම් පිළිබඳ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 6 (ආ) සහ 12 ඡේදවල විස්තර දැක්වේ. 10 වන ඡේදය මඟින් අවශ්‍ය කරුණුවලට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහි විගණන කාර්‍ය්‍ය භාර ගැනීමේ ලිපියක යොමු කිරීම් කළ හැකිය. උදාහරණ ලෙස*<br>• *විගණකවරයා අනුගමනය කිරීමට බැඳී සිටින වෘත්තීයමය ආයතනවල වෘත්තීය ආචාර ධර්මයන් සහ වෙනත් ප්‍රකාශනයන්ට එක්කිරීම් ඇතුළුව විගණන විෂය පථය විස්තරාත්මකව සඳහන් කිරීම*<br>• *විගණන කාර්‍ය්‍ය භාරගැනීමේ ප්‍රතිඵලය පිළිබඳ අදාල වන වෙනත් ආකාරයේ සන්නිවේදන*<br>• *ශ්‍රී.ල.වි.ප්‍ර. යන්ට අනුව විගණනය නිසි පරිදි සැලසුම්කර ක්‍රියාත්මක කළද, විගණනයක ආවේණික සීමාවන් සමඟින් අභ්‍යන්තර පාලනයේ ආවේණික සීමාවන් නිසා, ඇතැම් ප්‍රමාණාත්මක අවප්‍රකාශන හෙළිදරව් කර ගත නොහැකියාවේ අවදානමක් පවතින බව කරුණ*<br>• *විගණන <u>කාර්යභාර</u> කණ්ඩායමේ සංයුතියද ඇතුලුව විගණනය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අදාල වැඩ පිළිවෙල*<br>• *කළමනාකරණය ලිඛිත නියෝජන සපයනු ඇතැයි යන අපේක්ෂාව (අ 13 ඡේදයද බලන්න).*<br>• *යෝජිත කාලසටහනකට අනුකූලව විගණකට විගණනය නිම කිරීමට ඉඩ හැරීමට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ සහ එයට සම්බන්ධවන අනෙකුත් තොරතුරු නිසි කලට විගණකට ලබා දෙන බවට කළමනාකරණයේ එකඟතාවය* |

| | |
|---|---|
| | • *විගණකගේ වාර්තාවේ දින සිට මූල්‍ය ප්‍රකාශ නිකුත්කරන දින දක්වා කළමනාකරණයට දැනගැනීමට ලැබෙන මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන කරුණු පිළිබඳ විගණකට දැනුම් දීමට කළමනාකරණයේ එකඟතාවය.*<br><br>• *ගාස්තු ගණනය කිරීමේ පදනම සහ බිල්පත් ඉදිරිපත් කිරීමේ පිළිවෙල*<br><br>• *විගණන කාර්යය භාරගැනීමේ ලිපිය ලැබුණ බව දැන්වීම සහ කාර්යය භාරගැනීමේ කොන්දේසිවලට එකඟ වන ලෙස ඉල්ලීමක්.* |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 220 - මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා තත්ව පාලනය** | |
| 2(අ) | ආයතනය හෝ කාර්යයේ නියුක්ත හවුල්කරුවන් විසින් නිකුත් කරන වාර්තා අවස්ථාවන්ට උචිතවීම. |
| අ28 | ලැයිස්තුගත අස්තිත්වයක, කාර්යයේ නියුතු තත්ව පාලන සමාලෝචනයේදී, කාර්යයේ නියුතු කණ්ඩායමේ වැදගත් විනිශ්චයන් සම්බන්ධව ඇගයීමේදී සලකා බැලිය යුතු වෙනත් කරුණු වලට පහත දෑ ඇතුලත් වේ:<br><br>• ශ්‍රී.ල.වි.ප්‍ර. 240 ප්‍රකාර, කාර්යයේ නියුතු කණ්ඩායමේ තක්සේරුව සහ වංචාවක ප්‍රතිචාර ඇතුලත්ව, ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ප්‍රකාරව කාර්යය කරගෙන යන අතරතුර හඳුනාගත් වැදගත් අවදානම්, සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 ප්‍රකාර ඒ අවදානම් වලට දක් වූ ප්‍රතිචාර, සහ එම අවදානම්වලට ප්‍රතිචාර.<br><br>• ප්‍රමාණාත්මක බව සහ සැලකිය යුතු අවදානම් සහ විශේෂයෙන් ඒවා පිළිබඳව විනිශ්චයන්<br><br>• විගණනයේදි හඳුනාගත්, නිවැරදි කරන ලද සහ නිවැරදි නොකරන ලද අවප්‍රකාශනවල වැදගත්කම සහ නැඹුරුව<br><br>• කළමනාකරණයට සහ පාලනය පිළිබඳ වගකියන අය සහ යෝග්‍ය අවස්ථාවල දී, නියාමන ආයතන වැනි වෙනස් පාර්ශවයන්ට සන්නිවේදනය කළයුතු කරුණු.<br><br>අවස්ථාවට අනුචිතව, ව්‍යවහාර විය හැකි වෙනත් කරුණු. |
| අ33 | විගණන කාර්යයට බලපෑ හැකි දුර්වලතා සළකා බැලිමේදී, කාර්යයේ නියුක්ත හවුල්කරු, එවැනි තත්වයන් නිවැරදි කිරීමට සලසනු ලබන ක්‍රියාමාර්ග වලට, කාර්යයේ නියුක්ත හවුල්කරු, විගණනයේ වැදගත්කම සලකා බලනු ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 230 - විගණන ලේඛණගත කිරීම** | |
| අ7 | විගණන ලේඛනගතකරණය, විගණනය ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව සිදු වූ බවට සාක්ෂි සලසයි. කෙසේ වෙතත්, විගණනයකදී සැළකිය යුතු සෑම කරුණක්ම හෝ සිදු කළ වෘත්තීමය නිගමනයන් විගණක විසින් ලේඛනගත කිරීම අත්‍යවශ්‍ය හෝ ප්‍රායෝගික නොවේ. තවදුරටත්, විගණන ලිපිගොනුවේ ඇතුළත් අනුකූලතාවය පෙන්නුම් කෙරෙන ලේඛන හේතුවෙන් වෙන වෙනම කරුණු සමඟ අනුකූලවීම, විගණන විසින් ලේඛනගත කිරීම අත්‍යවශ්‍ය වේ. (නිදසුන් ලෙස පිරික්සුම් ලැයිස්තුවක් පරිදි)<br><br>*උදාහරණ;*<br><br>• විගණක විසින් විගණනය සැළසුම් කළ බව පෙන්නුම් කරන ප්‍රමාණවත් පරිදි ලේඛණගත කළ විගණන සැලසුමක පැවැත්ම.<br><br>• විගණක විසින් කළමනාකරණය සමඟ හෝ අදාළ පරිදි පාලනය භාරව සිටින අය සමඟ හෝ විගණනය භාරගැනීම සම්බන්ධයෙන් කොන්දේසි වලට එකඟවූ බව පෙන්නුම් කරන අත්සන් කළ කාර්යය භාර ගැනීමේ ලිපිය, විගණන ලිපිගොනුවේ පැවතීම. |

| | |
|---|---|
| | • විගණකගේ වාර්තාවේ, මූල්‍ය ප්‍රකාශ මත යෝග්‍ය වන පරිදි විකරණය කළ මතයක් අඩංගු වීම, ශ්‍රී.ල.වි.ප්‍ර. යන්හි විශේෂයෙන් සඳහන්වන පරිදි විගණක විසින් අදාළ අවස්ථාවන්හීදී තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීමට අදාළ අවශ්‍යතාවයන් සපුරා තිබෙන බව පෙන්නුම් කරයි.<br><br>• සාමාන්‍යයෙන් විගණනය පුරාම ව්‍යවහාරවන අවශ්‍යතාවයන්ට අදාළව, එවැනි දෑ වලට අනුකූලවන ක්‍රම ගණනාවක්, විගණන ලිපිගොනුව මඟින් පෙන්නුම් කරයි.<br><br>○ නිදසුනක් ලෙස, විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨියකින් යුතු බව ලේඛනගත කිරීමට එක් ක්‍රමයක් පමණක් තිබිය නොහැකිය. කෙසේ වෙතත් විගණන ලේඛනගත කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨියකින් යුතු ක්‍රියාකාරකම් පිළිබඳව සාක්ෂි සපයනු ලැබිය හැකිය. විගණකගේ විමසුම් වලට කළමනාකරණයේ ප්‍රතිචාරයක් සනාථ කිරීමට ඉටුකළ නිශ්චිත ක්‍රියාපටිපාටි, එවැනි සාක්ෂි තුළ ඇතුළත් විය හැකිය.<br><br>○ එසේම කාර්යයේ නියුක්ත හවුල්කරු, ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව විගණනය මෙහෙයවීම අධීක්ෂණය හා කාර්ය සාධනය කිරීමේ වගකීම භාරගෙන ඇති බව, විගණනය ලේඛනගත කිරීමේ විවිධ ක්‍රම ගණනාවක් මඟින් සාක්ෂි සපයනු ලැබිය හැකිය. මෙම ලේඛනගතකරණයේ ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) මඟින් අවශ්‍ය කෙරෙන කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගීවීම වැනි විගණනයේ පැතිකඩ සඳහා, කාර්යයේ නියුක්ත හවුල්කරුගේ කාලානුරූපී ක්‍රියාකිරීම් ඇතුළත්විය හැකිය. |
| අ8. | කරුණක වැදගත්කම විනිශ්චය කිරීමේදී කරුණු සහ තත්වයන්හි විෂය බද්ධ විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය වේ. කරුණුවල වැදගත්කමට උදාහරණ වලට පහත දෑ ඇතුලත්ය.<br><br>• සැළකිය යුතු අන්දමේ අවදානම් හටගැනීමට දෙන කරුණු (ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හි නිර්වචනය වන පරිදි)<br><br>• (අ) මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ විය හැකි බව හෝ (ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් පිළිබඳ විගණකගේ පූර්ව තක්සේරුව ව්‍යවහාර කිරීමේ හා එවැනි අවදානම් වලට විගණකගේ ප්‍රතිචාරයන්, පෙන්නුම් කෙරෙන විගණන ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලයන්.<br><br>• අවශ්‍ය විගණන ක්‍රියාපටිපාටි ව්‍යවහාර කිරීමේදී විගණකහට සැළකිය යුතු අන්දමේ දුෂ්කරතා ඇතිවන තත්වයන්.<br><br>• විගණන මතය විකරණය කිරීමට හෝ විගණන වාර්තාවේ, කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුළත් කිරීමට ප්‍රතිඵල දෙන සොයා ගැනීම් |
| අ19 | තත්වයන්ට අදාළ අවශ්‍යතාවයන් සඳහා පමණක්, ලේඛනගත කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර වේ. එම අවශ්‍යතාවය අදාළ නොවන තත්වයන් ලෙස,<br><br>(අ) සමස්ථ ශ්‍රී.ල.වි.ප්‍ර. අදාළ නොවන අවස්ථාවකදී (නිදසුනක් ලෙස යම් අස්තිත්වයක අභ්‍යන්තර විගණක කාර්යයන් නොමැති නම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) හි කිසිවක් අදාළ නොවේ) හෝ<br><br>(ආ) අවශ්‍යතාවය කොන්දේසි සහගත වන විට හා කොන්දේසි නොපවතින විට (නිදසුනක් ලෙස, විගණන මතය විකරණය කිරීමේ අවශ්‍යතාවය ඇතිවන, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේ නොහැකියාව ඇති අවස්ථාවල හා එසේ නොහැකියාවක් නොමැතිව තිබූ අවස්ථාවක් ගත හැකිය.) |
| | **අනෙකුත් ශ්‍රී.ල.වි.ප්‍ර. හි නිශ්චිත විගණන ලේඛනගත කිරීමේ අවශ්‍යතා**<br><br>.....<br><br>• ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හි "අස්තිත්වය හා එහි පරිසරය තේරුම් ගැනීම තුලින් ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම" - 32 ඡේදය.<br><br>• ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) හි "අභ්‍යන්තර විගණකයන්ගේ වැඩ භාවිතයට ගැනීම" - 24 ඡේදය |

| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 240 - මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වංචා සම්බන්ධයෙන් විගණකගේ ඇති වගකීම්** | |
|---|---|
| 1 | මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වංචා සම්බන්ධයෙන් විගණකගේ වගකීම පිළිබඳ කටයුතු කිරීම මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතයෙන් (ශ්‍රී.ල.වි.ප්‍ර.) සිදු කෙරේ. වංචාවක් නිසා ප්‍රමාණවත් අවප්‍රකාශයක් සම්බන්ධයෙන් ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 කෙසේ ව්‍යවහාර කරන්නේද යන්න පිළිබඳව එය විශේෂයෙන් විස්තර කරයි. |
| 15 | කාර්යභාරයේ නියැලෙන කණ්ඩායමේ සාමාජිකයන් අතර සාකච්ඡා කිරීම සහ සාකච්ඡාවට සහභාගී නොවූ කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සෙසු සාමාජිකයන්ට සන්නිවේදනය කළ යුත්තේ කුමන කරුණුදැයි කාර්යභාරව කටයුතු කරන හවුල්කරු නිර්ණය කළ යුතුයැයි ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) න් නියම කෙරේ. මෙම සාකච්ඡාව වංචා හේතුවෙන් අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශන වලට නැඹුරු විය හැක්කේ කෙසේද, කුමන අවස්ථාවලදී ද, වංචාවක් සිදුවිය හැක්කේ කෙසේද යන්නද ඇතුළත්ව විශේෂ අවධාරණයක් යොමුකර පැවැත්විය යුතුය. කළමනාකාරිත්වය සහ පාලන භාරකාරිත්වය දරන තැනැත්තන් අවංක හා ඍජුභාවයෙන් යුක්තදැයි කාර්යභාරයේ නියැළෙන සාමාජිකයන් අතර තිබිය හැකි විශ්වාසය පසෙක තබා මෙම සාකච්ඡාව සිදුකළ යුතුය. (යොමුවඃ අ10 - අ11 ඡේද) |
| 16 | ශ්‍රී.ල.වි.ප්‍ර.315 (සංශෝධිත) හි අවශ්‍ය කෙරෙන පරිදි, අස්තිත්වයේ එහි අභ්‍යන්තර පාලනය ඇතුලුව අස්තිත්වය සහ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට අවදානම් තක්සේරු කිරීමේ සහ අදාල ක්‍රියාකාරකම් පටිපාටීන් ක්‍රියාත්මක කරන විට, වංචා නිසා වන ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම හඳුනාගැනීම සඳහා භාවිත කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට විගණක විසින් 17-24 ඡේදවල ක්‍රියාපටිපාටීන් ඉටුකළ යුතුය. |
| 19 | අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති අස්තිත්වයන් සඳහා අස්තිත්වයට බලපෑමක් සිදුවිය හැකි කිසියම් සත්‍ය වශයෙන් සිදුවූ හෝ සැකකරන හෝ චෝදනා කළ හැකි වංචාවක් පිළිබඳව අභ්‍යන්තර විගණක හට දැනුමක් තිබේදැයි නිර්ණය කිරීමට වංචා පිළිබඳ අවදානම ගැන ඔහුගේ අදහස් ලබාගැනීමට, කාර්යයේ යෙදෙන අදාල පුද්ගලයන්ගෙන් විමසිය යුතුය. (යොමුව, අ18 ඡේදය) |
| 25 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අනුව මූල්‍ය ප්‍රකාශ මට්ටමේදී, සහ සැදැහුම් මට්ටමේදී ගණුදෙනුවල පන්තීන්, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් සඳහා වංචා හේතුවෙන් වන ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් විගණක විසින් හඳුනාගෙන තක්සේරු කළ යුතුය. |
| 44 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හි අවශ්‍යකරන පරිදි අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ විගණකගේ අවබෝධය සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානමේ තක්සේරුව පිළිබඳව විගණකගේ අවබෝධය විගණන ලේඛනගත කිරීම තුල පහත සඳහන් පරිදි විගණක ඇතුළත් කළ යුතුය.<br>(අ) අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ වංචාව නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශන වලට නැඹුරුවීම සම්බන්ධයෙන් කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයන් අතර සාකච්ඡා වලදී එළඹුණ වැදගත් තීරණ, සහ<br>(ආ) මූල්‍ය ප්‍රකාශ මට්ටමේදී සහ සැදහුම් මට්ටමේදී වංචාවක් හේතුවෙන් වන ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල හඳුනාගත් සහ තක්සේරු කළ අවදානම්. |
| අ18 | අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති අස්තිත්වයන්ගේ විගණනයන් සඳහා වන අවශ්‍යතාවයන් සහ උපදේශන ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) මඟින් ස්ථාපනය කෙරේ. වංචාවක් සම්බන්ධයෙන් එම ශ්‍රී.ල.වි.ප්‍ර. වල අවශ්‍යතාවයන් ක්‍රියාවට නැංවීමේදී, විගණක විසින් පහත දැ ඇතුළත් නිශ්චිත කාර්යයේ ක්‍රියාකාරකම් පිළිබදව විමසිය හැකිය.<br>• වංචා අනාවරණය කරගැනීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් වර්ෂය තුලදී ඉටුකළ පටිපාටි කිසිවක් වේ නම්,<br>• එම පටිපාටිවල ප්‍රතිඵලයක් ලෙස සොයාගත් කරුණුවලට කළමනාකාරිත්වය සතුටුදායක ලෙස ප්‍රතිචාර දක්වූයේද යන්න, |

| | |
|---|---|
| **1 වන පරිශිෂ්ඨය** | පහත සඳහන් දෑ හේතුකොටගෙන අභ්‍යන්තර පාලන සංරචකයන්ගේ ඌණතා<br>• ඉහළ සේවක පිරිවැටුම් අනුපාත හෝ ගිණුම්කරණ, අභ්‍යන්තර විගණන හෝ තොරතුරු තාක්ෂණ කාර්යමණ්ඩල බඳවාගැනීම් හෝ අභ්‍යන්තර විගණන කාර්යය සඵලදායක නොවීම. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 250 - මූල්‍ය ප්‍රකාශ විගණනයකදී නීති සහ රෙගුලාසි සැලකිල්ලට ගැනීම** | |
| 12 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අනුව අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කරගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස විගණකවරයා විසින් පහත සඳහන් පොදු අවබෝධ කරගැනීම ලබාගතයුතුයි.<br>(අ) අස්තිත්ත්වයට සහ අස්තිත්ත්වය මෙහෙයුම් කටයුතු සිදුකරන කර්මාන්තයට හෝ අංශයට අදාල නෛතික හා නියාමන ආකෘතිමය රාමුව; සහ<br>(ආ) අස්තිත්ත්වය එම රාමුවේ විධිවිධාන වලට අනුකූල වන්නේ කෙසේද යන්න. (අ7 වන ඡේදය බලන්න) |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 - පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය** | |
| අ3 | සියළුම විගණන සඳහා, විගණක නියමිත කරුණු කුමන පුද්ගලයා(න්) සමඟ සන්නිවේදනය කළයුතුදැයි විශේෂිතව දක්වීම වැනි විවිධ වූ උපක්‍රම මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. මඟින් අපහසුය. තවද, සමහර අවස්ථාවලදී, සන්නිවේදනයට යෝග්‍ය පුද්ගලයා(න්) කවුරුන්ද යන්න, ව්‍යවහාරික නෛතික ව්‍යුහය හෝ කාර්යයේ නිරතවීමේ අවස්ථාවන් මඟින් පහසුවෙන් හඳුනාගත නොහැක. උදාහරණ ලෙස, පාලන ව්‍යුහය විධිමත්ව නිර්ණයකර නොමැති අස්තිත්වයන්හි එනම්, සමහර පවුලකට - අයත් අස්තිත්ව, සමහර ලාභ සඳහා නොවන සංවිධාන, සහ රජයේ අස්තිත්ව වැනි එවැනි අවස්ථාවල, කාර්යයේ නිරතවීමේ පාර්ශව සමඟ සාකච්ඡාකර, කවර අදාල පුද්ගලයා(න්)ට සන්නිවේදනය කළයුතුදැයි එකඟවීම අවශ්‍යවිය හැකිය. කවුරුන් සමඟ සන්නිවේදනය කළයුතුදැයි තීරණය කිරීමේදී, ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ප්‍රකාර පාලන ව්‍යුහය සහ ක්‍රියාවලීන් පිළිබඳ විගණකගේ අවබෝධය අදාලවෙයි. සන්නිවේදනය කළයුත්තේ කුමන උචිත පුද්ගලයා(න්) සමඟද යන්න, සන්නිවේදනයට ඇති කරුණ මත රඳා පවතී. |
| අ14 | ….<br>• අස්තිත්වයට අභ්‍යන්තර පාලන කාර්යයක් තිබෙන අවස්ථාවකදි, අභ්‍යන්තර විගණන කාර්යයේ ඕනෑම සැලසුම් කළ වැඩ භාවිතය ඇතුලත්ව බාහිර සහ අභ්‍යන්තර විගණකයින් වැඩදායක සහ අනුපූරකව කටයුතු කරන්නේ කෙසේද යන්න. |
| අ29 | ….<br>• කාර්යයභාර කණ්ඩායමේ පුද්ගලයා(න්) සහ පාලනය පිළිබඳ වගකීම දරන අය අතුරෙන් කවුරුන් සමඟ නියමිත කරුණු වලට අදාලව සන්නිවේදනයේ යෙදිය යුතු යන්න.<br>…. |
| අ33 | එය යෝග්‍ය නොවේ නම් හැර, පාලනය පිළිබඳ වගකීම දරන අය සමඟ කරුණු සන්නිවේදනයට පෙර, ඒවා කළමනාකරණය සමඟ සාකච්ඡා කරනු ඇත. උදාහරණ ලෙස, කළමනාකරණයේ දක්ෂතාවයන් හෝ අවංකභාවය පිළිබඳ ප්‍රශ්න කළමනාකරණ සමඟ සාකච්ඡා කිරීම යෝග්‍ය නොවේ. විධායකයේ, විධායක වගකීම හඳුනාගැනිමට අමතරව, මෙම මූලික සාකච්ඡා, නොයෙක් කරුණු සහ ප්‍රශ්න පැහැදිලි කිරීමට සහ කළමනාකරණය තවදුරටත් තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාදීමට අවස්ථාවක් සලසා දෙයි. ඒ සමානව අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇතිවිට, පාලනය පිළිබඳ වගකීම දරන අය සමඟ සන්නිවේදනයට පෙර, එම කාර්යයේ යෙදී සිටින අදාල පුද්ගලයන් සමඟ සාකච්ඡා කළ හැකිය. |
| අ43 | 4 වන ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි සඵලදායි ද්විපාර්ශික සන්නිවේදනය, විගණකට සහ පාලනය පිළිබඳ වගකීම දරන අය යන දෙපක්ෂයටම සහාය වෙයි. තවදුරටත්, ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), පාලනය පිළිබඳ වගකීම දරන අය විසින්, අභ්‍යන්තර පාලන පරිසරයේ මූලිකාංගයක් ලෙස ඇතොත්, ඔවුන්ගේ අභ්‍යන්තර විගණන කාර්යය සමඟ සම්බන්ධවන අය සහ බාහිර විගණකවරු ඇතුලත්ව සහභාගිවන්නන් හඳුනාගනී. ප්‍රමාණවත් නොවන ද්විපාර්ශික සන්නිවේදනය, අසතුටුදායක පාලන පරිසරයක් පෙන්නුම් කළ හැකි අතර විගණකගේ ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් තක්සේරුවට බලපෑම් විය හැකිය. විගණකට මූල්‍ය ප්‍රකාශ මත මතයක් ඇතිකර ගැනීමට ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබාගැනීමට නොහැකිවීමේ අවදානම ද පවතී. |

| | |
|---|---|
| **පරිශිෂ්ඨය 1** | 2014 ජනවාරි 1 දින හෝ ඊට පසු කාලපරිච්ඡේද වලින් ආරම්භ වන මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලැපැවැත්වෙන, පාලනය පිළිබඳ වගකීම් දරන අය සමඟ සන්නිවේදනයට අවශ්‍ය විශේෂිත කරුණු ශ්‍රී.ල.ත.පා.ප්‍ර (SLSQC) 1 සහ වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර.න් හි ඡේද වලින් මෙම පරිශිෂ්ඨයේ හඳුනාගනී. මෙම ලැයිස්තුව, ශ්‍රී.ල.වි.ප්‍ර.න් හි අවශ්‍යතා සහ සම්බන්ධිත ව්‍යවහාරකරණය සහ වෙනත් පැහැදිලි කිරීමේ දැ සලකා බැලීම සඳහා ආදේශනයක් නොවේ. |
| පරිශිෂ්ඨය 1 | **පාලනය පිළිබඳ වගකීම දරන අය සමඟ සන්නිවේදනයට යොමුකරන SLSQC 1 සහ වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර.න් හි විශේෂිත අවශ්‍යතාවයන්**<br>…….<br>• ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත), අභ්‍යන්තර විගණකගේ වැඩ භාර ගැනීම. - 18 ඡේදය<br>…… |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය 265 - පාලනය පිළිබඳ වගකීම දරණ අය සහ විගණකවරු කළමනාකරණය සමඟ අභ්‍යන්තර පාලන ඌණතාවයන් සන්නිවේදනය** | |
| 1 | මූල්‍ය ප්‍රකාශ විගණනයකදී විගණක හඳුනාගන්නා අභ්‍යන්තර පාලන ඌණතා, පාලනය පිළිබඳ වගකීම් දරණ අය සහ කළමනාකරණය සමඟ යෝග්‍ය පරිදි සන්නිවේදනයට ඇති විගණකගේ වගකීම, පිළිබඳව මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතයෙන් (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරයි. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 අවශ්‍යතාවයන් ඉක්මවායන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සහ පාලනය පිළිබඳ පරීක්ෂණ සැලසුම් කිරීම සහ ඉටු කිරීමේ අමතර වගකීම් විගණක වෙත පැනවීමට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් කටයුතු කරනු නොලබයි. පාලනය පිළිබඳ වගකීම දරණ අය සමඟ සන්නිවේදනයට ඇති විගණකගේ වගකීම සම්බන්ධයෙන්, තවදුරටත් අවශ්‍යතා සහ උපදේශන ශ්‍රී.ල.වි.ප්‍ර. 260 මගින් ස්ථාපනය කරයි. |
| අ15 | සැලකියයුතු ඌණතා පිළිබඳ සන්නිවේදනය කළයුතු විස්තර වල මට්ටම, අවස්ථාවට අනුව විගණකගේ වෘත්තීයමය විනිශ්චයට අයත් කරුණකි. සන්නිවේදනය සඳහා උචිත විස්තර මට්ටම නිර්ණය කිරීමේදී විගණක සැලකිල්ල දක්විය හැකි සාධකවලට ඇතුලත් වියහැකි දෑවලට උදාහරණ :<br>• අස්තිත්වයේ ස්වභාවය. උදාහරණ ලෙස, පොදු අයිතියක් ඇති අස්තිත්වයක් සඳහා අවශ්‍ය කරන සන්නිවේදන පොදු අයිතියක් නොමැති අස්තිත්වයකින් වෙනස්විය හැකිය.<br>• අස්තිත්වයේ ප්‍රමාණය සහ සංකීර්ණභාවය. උදාහරණ ලෙස සංකීර්ණ අස්තිත්වයක් සඳහා අවශ්‍ය සන්නිවේදනය, සරල ව්‍යාපාර මෙහෙයුම් අස්තිත්වයක් සඳහා වෙනස්විය හැකිය.<br>• විගණක හඳුනාගත් සැලකිය යුතු ඌනතාවල ස්වභාවය<br>  ◦ අස්තිත්වයේ පාලන සංයුතිය. උදාහරණ ලෙස , අස්තිත්වයේ කර්මාන්තය හෝ බලපා ඇති ක්ෂේත්‍රයන් පිළිබඳ සැලකියයුතු පළපුරුද්දක් නොමැති සාමාජිකයන්, පාලන පිළිබඳ වගකීම දරණ අයට ඇතුලත් නම්, වැඩි විස්තර අවශ්‍ය විය හැකිය<br>  ◦ අභ්‍යන්තර පාලනයේ ඌනතාවල විශේෂිත වර්ගවල සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන්. |
| අ24 | පෙර කාලපරිච්ඡේදයේ සැලකියයුතු ඌණතා හැර, වෙනත් අභ්‍යන්තර පාලන ඌණතා විගණක කළමනාකරණයට සන්නිවේදනය කර ඇත්නම්, සහ කළමනාකරණය ඒවායේ පිරිවැය හෝ වෙනත් හේතු නිසා නිවැරදි කිරීමට තෝරාගෙන නොමැතිනම්, විගණක ප්‍රවර්තන කාලපරිච්ඡේදයේදී සන්නිවේදනය නැවත කිරීමට අවශ්‍ය නොවේ. අභ්‍යන්තර විගණන කාර්යය හෝ නියාමනයන් වැනි දෑ වෙනත් පාර්ශවයන් මගින් එවැනි ඌනතා පිළිබඳ තොරතුරු කළමනාකරණයට මීට පෙර සන්නිවේදනය කර ඇත්තම් එම තොරතුරු විගණක නැවත සන්නිවේදනය අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, කළමනාකරණයේ වෙනසක් ඇතිවී නම් හෝ විගණකගේ අවධානය සඳහා අළුත් තොරතුරු ලැබී, ඌණතා පිළිබඳ විගණකගේ සහ කළමනාකරණයේ කලින් අවබෝධයන් වෙනස් කරයි නම්, වෙනත් ඌණතා නැවත සන්නිවේදනය උචිත විය හැකිය. කෙසේ වෙතත්, කලින් සන්නිවේදනය කළ අභ්‍යන්තර |

| | |
|---|---|
| | පාලනයේ වෙනත් ඌණතා සඳහා පිළියම් යෙදීමට කළමනාකාරිත්වය අසමත් වී ඒවා සැලකියයුතු ඌණතා බවට පත්වී පාලනය පිළිබඳ වගකීම දරණ අයට සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාවය පැනනගී. මෙය සිද්ධිවලට විගණකගේ විනිශ්චය මත රදා පවතීද යන්න. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 300 - මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීම** | |
| 9 (අ) | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) මඟින් තීරණය කරනු ලබන, සැලසුම් කළ අවදානම් ඇගයීමේ ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලනිර්ණය හා ප්‍රමාණය |
| අ11 | කුඩා ආයතන විගණනයේදී ඉතා කුඩා කාර්යය භාර කණ්ඩායමක් මඟින් පමණක් සමස්ථ විගණනයම සිදුකෙරෙනු විය හැකිය. කුඩා ආයතනවල බොහෝ විගණනයන්ට බොහෝවිටම ඒ කාර්යයට සම්බන්ධවනුයේ විගණන කාර්යයෙහි නියුතු (ඇතැම් විට තනි පුද්ගලයකු) හවුල්කරු සහ ඔහුට සහාය දෙන එක් කණ්ඩායම් සාමාජිකයකු (ඇතැම් විට කිසිම කණ්ඩායම් සාමාජිකයෙකු රහිතව) පමණි. කුඩා කණ්ඩායමක කණ්ඩායම් සාමාජියකයින් අතර සමායෝජනය හා සන්නිවේදනය වඩා පහසුවේ. කුඩා ආයතන විගණනය සඳහා සමස්ථ විගණන ක්‍රමෝපාය ස්ථාපනය කිරීම සංකීර්ණ වූ හෝ කාලය ගතවන්නාවූ ව්‍යායාමයක් නොවේ. එය විගණනයේ සංකීර්ණත්වයක්, ආයතනයේ ප්‍රමාණයත්, විගණන කාර්යයෙහි නියුතු කණ්ඩායමේ විශාලත්වයත් අනුව වෙනස් වේ. උදාහරණ ලෙස පසුගිය විගණනයන් හිදී ලබාගත් සටහන් සමාලෝචනය කර අවසානයට සම්පූර්ණ කරන ලද විගණනයේ වැඩ පත්‍රිකා සහ විගණනයේදී හඳුනාගත් කරුණු අවධාරණය කරමින් සකස් කරන ලද වාර්තාවක අඩංගු කරුණු යාවත්කාලීන වනසේ අවශ්‍ය වෙනස්කම් කිරීම්, අයිතිකාර කළමනාකරු සමඟ සාකච්ජා කිරීමෙන් පසුව වර්තමාන කාලපරිච්ජේදය සඳහා සිදුකිරීමෙන් පසු එය ඡේද අංක 8 හි සඳහන් කරුණු වලට අනුකූල වේ නම් එවැන්නක් වර්තමාන විගණන කාර්යය සඳහා ලේඛණගත විගණන ක්‍රමෝපායක් ලෙස යොදාගත හැක. |
| 1 වන පරිශිෂ්ඨය | ……..<br>• අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් තිබේද යන්න සහ එසේ නම් විගණනයේ අරමුණ සඳහා කුමන ප්‍රමාණයක් කාර්යයේ වැඩ කිරීමට භාවිතා කිරීමට හැකිද යන්න. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 - අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම** | |
| | මෙම ලියවිල්ල අවසානයේදි, ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) වෙනමම ඇතුලත් කරයි. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 320 – විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී ප්‍රමාණාත්මකභාවය** | |
| | වෙනස්කම් නොමැත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 330 - තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර** | |
| 1 | මූල්‍ය ප්‍රකාශ විගණනයකදී ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ට අනුව විගණකවරයා විසින් හඳුනාගත් සහ තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් වලට ප්‍රතිචාර සැළසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට විගණකවරයාට ඇති වගකීම සම්බන්ධයෙන් මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරයි. |
| අ1. | මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහි තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් ආමන්ත්‍රණය කරන සමස්ථ ප්‍රතිචාර වලට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකිය<br>• වෘත්තීය සංශයදෘෂ්ඨිය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය කාර්යයභාර කණ්ඩායමට අවධාරණය කිරීම<br>• වඩා පලපුරුදු කාර්ය මණ්ඩලය හෝ විශේෂ කුසලතාවය ඇත්තවුන් අනුයුක්ත කිරීම හෝ ප්‍රවීනයන් ප්‍රයෝජනයට ගැනීම.<br>• වැඩි අධීක්ෂණයක් සැපයීම<br>• වැඩිදුර විගණන පටිපාටි ඉටු කිරීමට තෝරා ගැනීමේදී පුරෝකථනය කළ නොහැකි බව පිළිබඳව අමතර මූලිකාංග අන්තර්ගත කිරීම |

| | |
|---|---|
| | • විගණන පටිපාටිවල ස්වභාවය, කාල නිර්ණය හෝ ප්‍රමාණය සාමාන්‍ය වෙනස්කම් සිදුකිරීම, උදාහරණ වශයෙන් අතර වාරයේ දිනයක් වෙනුවට කාලපරිච්ඡේදය අවසානයේ තහවුරු පටිපාටි ඉටු කිරීම; හෝ වඩා මග පෙන්වන සුළු විගණක සාක්ෂි ලබා ගැනීමට විගණන පටිපාටියේ ස්වභාවය සංශෝධනය කිරීම. |
| අ60 | එවැනි අවස්ථාවලදී ගණුදෙණුවල වර්ග, ගිණුම්ශේෂ හෝ හෙළිදරව් කිරීම් සියල්ලම හෝ සමහරක් සඳහා තක්සේරු කළ අවධානම්වල සංශෝධිත සලකා බැලීම් මත පදනම්ව සැලසුම් කළ විගණක පටිපාටි නැවත අගය කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සංශෝධිත විගණකගේ තක්සේරුව මත තවදුරටත් උපදෙස් ඇතුලත් වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 402 - සේවා සංවිධානයක් සේවයේ යොදවන අස්තිත්වයක් විගණනයේදී සැළකිය යුතු කරුණු** | |
| 1 | භාවිත අස්තිත්වයක් විසින්, සේවා සංවිධානයක හෝ කිහිපයක සේවාවන් ලබා ගන්නා අවස්ථාවක දී, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට භාවිත විගණක සතු වගකිම පිළිබඳව, මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රී.ල.වි.ප්‍ර.) මඟින් කටයුතු කෙරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශන පිළිබඳ අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා සෑහෙන්නාවූ, විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය සහ එහි අවදානම් වලට ප්‍රතිචාර වශයෙන් ඉටු කළයුතු අතිරේක විගණන පටිපාටි ඇතුලුව භාවිත අස්තිත්වය පිළිබඳ අවබෝධය ලබාගැනීම පිණිස භාවිත විගණක කෙසේ ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 ව්‍යවහාර කරන්නේ කෙසේද යන්න විශේෂිතව එය ව්‍යාප්ත වේ. |
| 9 | ශ්‍රී.ල.වි.ප්‍ර 315 (සංශෝධිත) ප්‍රකාර භාවිත අස්තිත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නවිට, එහි මෙහෙයුම්වල දී, භාවිත අස්තිත්ත්වයක් විසින් සේවා සංවිධානයක සේවය ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුය: (යොමුව : අ1- අ2 ඡේද) |
| 10 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ප්‍රකාර විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳව, අවබෝධයක් ලබාගන්නවිට, සේවා සංවිධානය විසින් ක්‍රියාවලිගත කෙරෙන ගනුදෙනුවලට අදාළවන කරුණු ද ඇතුලුව සේවා සංවිධානය විසින් සපයනු ලබන සේවාවන්ට සම්බන්ධිත, භාවිත අස්තිත්වයේදී අදාළ පාලනයන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම භාවිත විගණක ඇගයිය යුතුය. (යොමුව: අ12- අ14) |
| අ1 | ….<br>• සේවා සංවිධානයේදී පාලනයන් මත , සේවා සංවිධානයේ අභ්‍යන්තර විගණක කාර්යයන් හෝ නියාමන අධිකාරින් , සේවා සංවිධානයේ වාර්තා<br>…. |
| අ14 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හි සටහන් කර ඇති පරිදි, සමහර අවදානම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ පටිපාටි මඟින් පමණක්, ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි බව හෝ ප්‍රායෝගික නොවන බව හෝ භාවිත විගණක විසින් විනිශ්චය කළ හැකිය. එවැනි අවදානම්, ශ්‍රමික සහභාගිත්වයක් කුඩාව හෝ නොමැතිව හෝ අධි ස්වයංක්‍රීය සැකසුම් ක්‍රියාවලියකට නිරන්තරව ඉඩ සලසා තිබීම හේතුවෙන් ඇති වූ, එදිනෙදා සිදුවන හෝ වැදගත් පන්තිවල ගනුදෙනු හෝ ගිණුම් ශේෂවල සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාකරණය සම්බන්ධයෙන් විය හැකිය. භාවිත අස්තිත්වය විසින් සේවා සංවිධානයක් යොදවා ගන්නා විට, එවැනි ස්වයංක්‍රීය ක්‍රියාවලි ගති ලක්ෂණ විශේෂයෙන් දක්නට ලැබේ. එවැනි අවස්ථාවල, එම අවදානම් මත, භාවිත අස්තිත්වයේ පාලනයන් විගණනයට අදාළවන අතර, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 9 වන හා 10 වන ඡේද ප්‍රකාර එම පාලනයන් පිළිබඳව භාවිත විගණක විසින් අවබෝධයක් ලබාගැනීම හා ඇගයිම අවශ්‍ය කෙරේ. |
| අ16 | සේවා සංවිධානයේ පාලනයන් පිළිබඳ විස්තරයක් හා සැලැස්ම පිළිබඳ වාර්තාවක් (1 වන වර්ගයේ වාර්තාවක්) හෝ පාලනයන් පිළිබඳ විස්තරයක් සහ සැලැස්ම හා එය ක්‍රියාත්මක වීමේ ඵලදායිත්වය දැක්වෙන වාර්තාවක් (2 වන වර්ගයේ වාර්තාවක්) හෝ සැපයීම සඳහා, සේවා සංවිධානය විසින්, සේවා විගණකවරයෙකු යෙදවිය හැකිය. 1 වන වර්ගයේ හෝ 2 වන වර්ගයේ |

| | |
|---|---|
| | වාර්තා, ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාරය පිළිබඳ ප්‍රමිතිය (ශ්‍රී.ල.ස.කා.ප්‍ර.) 3402 යටතේ හෝ බලය ලත් හෝ පිළිගත් ප්‍රමිති සම්පාදක සංවිධානයක් විසින් පිහිටුවනු ලැබූ ප්‍රමිති යටතේ නිකුත් කළ හැකිය. ('අ' වර්ගයේ හෝ 'ආ' වර්ගයේ වාර්තා වැනි වෙනස් නමකින් මේ වාර්තා හැඳින්වීමට ඉඩ තිබේ.) |
| අ22 (ඇ) | භාවිත අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ට තුඩු දිය හැකි සැකසීමේ දෝෂ වැළැක්වීමට සහ නිවරදි කර ගැනීමට සුදුසු ලෙස සේවා සංවිධානයේ පාලනයන් සැළසුම් කොට ක්‍රියාත්මක කරන්නේ ද යන්න. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 450 - විගණනය තුළදී හඳුනාගත් අවප්‍රකාශන ඇගැයීම** | |
| වෙනස්කම් නොමැත. | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 500 - විගණන සාක්ෂි** | |
| 2 | විගණන ක්‍රියාවලියේදී ලබාගන්නා සියළු විගණන සාක්ෂි වෙනුවෙන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාර වේ. වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර. විගණනයේ නිශ්චිත පැතිකඩක් සම්බන්ධයෙන් කටයුතු කෙරේ. (උදා: ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)) විශේෂිත මාතෘකාවක් සම්බන්ධයෙන් ලබාගත යුතු විගණන සාක්ෂි (උදාහරණ ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 570), විගණන සාක්ෂි ලබාගැනීම සඳහා නිශ්චිත පටිපාටීන් (උදාහරණ වශයෙන් ශ්‍රී.ල.වි.ප්‍ර. 520) සහ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත්තේද යන්න පිළිබඳව ඇගයීම (ශ්‍රී.ල.වි.ප්‍ර. 200 සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 300). |
| අ10 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 න් අවශ්‍ය කෙරෙන සහ තවදුරටත් පැහැදිලි කරන, විගණකගේ මතයට පදනම සඳහා වන සාධාරණ නිගමන වලට එළඹවීමට වන විගණන සාක්ෂි පහත සඳහන දෑ ඉටුකිරීමෙන් ලබාගනී.<br><br>(අ) අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සහ,<br><br>(ආ) අඩංගු අමතර විගණන ක්‍රියාපටිපාටි |
| අ45 | අභ්‍යන්තර සහ බාහිර දත්ත හෝ කළමනාකරණයේ විශේෂඥයෙකුගේ දත්තවල ස්වභාවය. |
| අ51 | සමහර අවස්ථාවලදී, අස්තිත්වයේ ඉදිරිපත් කරනු ලබන තොරතුරු වෙනත් විගණන අරමුණු සඳහා යොදාගැනීමට විගණක බලාපොරොත්තු විය හැකිය. උදාහරණ වශයෙන් අස්තිත්වය කාර්ය සාධන මිණුම් විශ්ලේෂණ පටිපාටි අරමුණු සඳහා භාවිතා කිරීම හෝ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් වල වාර්තා වැනි අධීක්ෂණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අස්තිත්වයේ තොරතුරු භාවිත කිරීම විගණක අපේක්ෂා කළ හැකිය. එවැනි අවස්ථාවලදී, ලබාගත් විගණන සාක්ෂිවල යෝග්‍යත්වය විගණකගේ අරමුණු සඳහා එම තොරතුරු ප්‍රමාණවත් ලෙස නිරවද්‍ය ද හෝ විස්තරාත්මක ද යන්න අනුව බලපායි. උදාහරණ ලෙස කළමනාකාරීත්වය භාවිත කරන කාර්ය සාධන මිණුම් ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කරගැනීම සඳහා සෑහෙන තරමට නිරවද්‍ය නොවිය හැකිය. |
| අ57 | වෙනස් මූලාශ්‍ර වලින් හෝ වෙනස් ස්වරූපයෙන් විගණන සාක්ෂි ලබාගැනීමෙන් විගණන සාක්ෂියක තනි අයිතමයක් විශ්වාසදායක නොවන බව ඇඟවීමක් වියහැකිය. එනම් එක් මූලාශ්‍රයකින් ලබාගත් හා විගණන සාක්ෂි වෙනස් මූලාශ්‍රයකින් ලබාගන්නා විගණන සාක්ෂි සමග අසංගත වීම වැනි. මේ සඳහා අවස්ථාවක් විය හැක්කේ උදාහරණ වශයෙන් කළමනාකාරිත්වයේ අභ්‍යන්තර විගණකවරුන් සහ වෙනත් විමසුම් වලට වන ප්‍රතිචාර කළමනාකරණය විමසුම් වලට ප්‍රතිචාර සනාථ කළයුතු වනවිට කළමනාකරණයේ ප්‍රතිචාර අසංගත වීම. සැලකිය යුතු අන්දමේ කරුණක් සම්බන්ධයෙන් විගණක හඳුනාගත් තොරතුරු විගණකගේ අවසන් නිගමනය සමග අසංගත නම් නිශ්චිත ලේඛණගත කිරීමේ අවශ්‍යතාවයක් ශ්‍රී.ල.වි.ප්‍ර. 230 අඩංගු වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 501 - විගණන සාක්ෂි - තෝරාගත් අයිතමයන් සඳහා වූ නිශ්චිත සැලකිල්ලට ගැනීම** | |
| | වෙනස්කම් නොමැත. |

| | |
|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 505 - බාහිර තහවුරු කිරීම්** | |
| අ17 | ප්‍රතිචාර විශ්වසනීයත්වයෙන් තොර බවට විගණක නිගමනය කරන විට සැලසුම් මට්ටමේදී ඇතිවන ප්‍රමාණාත්මක අවප්‍රකාශන ඇතිවීම් අවදානම් තක්සේරුව සංශෝධනය කිරීමට විගණකට අවශ්‍ය විය හැකි අතර සහ සැලසුම් කළ විගණන පිළිවෙත් ඒ අනුව වෙනස් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අනුව අවශ්‍ය වේ. උදාහරණ ලෙස විස්වසනීය නොවන ප්‍රතිචාරයන් වංචා අවදානමක් පෙන්නුම් කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 240 ට අනුව ඇගයීමක් කිරීම අවශ්‍ය කෙරේ. |
| අ19 | ප්‍රශ්නගත ගිණුම් සහ සැලසුම මඟින් විකල්ප විගණන පටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය කෙරෙහි බලපෑම් සිදුකරනු ලැබේ. තහවුරු කිරීමට ප්‍රතිචාර නොදැක්වීමක්, කලින් හඳුනාගත් ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානමක් පෙන්නුම් කළ හැකිය. එවැනි අවස්ථාවක ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ට අනුව විගණන විසින් සැලසුම් මට්ටමේ දී සාවද්‍ය අවප්‍රකාශන ඇති වීමේ තක්සේරුගත අවදානම සංශෝධනය කළ හැකි අතර සැලසුම්ගත විගණක පිළිවෙත් වෙනස් කරනු ලබයි. උදාහරණ ලෙස අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු තහවුරු කිරීම් හෝ අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි තහවුරු කිරීම් මඟින් කලින් හඳුනානොගත් වංචා අවදානම් සාධකයන් පෙන්නුම් කළහැකි වන අතර එසේ විට දී ශ්‍රී.ල.වි.ප්‍ර. 240ට අනුව ඇගයීමක් අවශ්‍ය වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 510 - ආරම්භක විගණන කාර්යයභාරය - ආරම්භක ශේෂ** | |
| 9 | පූර්ව කාලපරිච්ඡේදයෙහි මූල්‍ය ප්‍රකාශ පූර්ව විගණකවරයෙකු විසින් විගණනය කර තිබේ නම් හා විගණන මතයට විකරණයක් වී නම් විගණකවරයා, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 (සංශෝධිත) ට අනුකූලව ප්‍රවර්ථන කාලපරිච්ඡේදයේ මූල්‍ය වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පැවතීමේ අවදානම ඇගයීමේදී විගණන මතය එසේ වෙනස් කිරීමට හේතු වූ කරුණෙහි බලපෑම ඇගයීමට ලක් කළ යුතුය. |
| අ2 | ව්‍යවස්ථාපිතව පත්කරනු ලැබූ විගණකවරයා විසින් රාජ්‍ය අංශයේ අස්තිත්වයක විගණනය පුද්ගලික විගණන ආයතනයකට පවරන්නේ නම් සහ ව්‍යවස්ථාපිත විගණකවරයා විසින් රාජ්‍ය අංශයේ අස්තිත්වයෙහි මූල්‍යවාර්තා විගණනය පූර්ව කාලපරිච්ඡේදයෙහි විගණනය කළ ආයතනය හැර වෙනත් ආයතනයකට ලබාදෙන්නේ නම් එය ව්‍යවස්ථාපිතව පත් කරනලද පත්වීමෙහි වෙනස්වීමක් ලෙස සාමාන්‍යයෙන් සලකනු නොලැබේ. කෙසේ වුව ද පෞද්ගලික විගණන ආයතනයට විගණන කාර්යයභාරයේ ස්වභාවය අනුව, විගණකවරයාගේ වගකීම් සම්පූර්ණ කිරීමෙන්, විගණකවරයාගේ පුද්ගලික අංශයේ විගණකවරයා සම්බන්ධයෙන් එවැනි විගණන කාර්යයභාරයක් ආරම්භක විගණන පත්වීමක් ලෙස සැලකෙන බැවින් මෙම විගණන ප්‍රමිතය අදාල වෙයි. |
| **පරිශිෂ්ඨය (යොමුව ඡේද අ. 8)** | **විකරණය කළ මත සහිත විගණකවරුන්ගේ වාර්තා වලට නිදර්ශන**<br><br>**නිදර්ශන 1**<br><br>**මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>ABC සමාගමේ 20x1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ, සහ එදිනට අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් සහ අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් වූ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| | **තත්වාගණනය කළ මතය සඳහා පදනම**<br><br>20X1, ජුනි 30 දින සමාගමේ විගණකවරුන් ලෙස අප පත්කරන ලද අතර, එහෙත් වර්ෂ ආරම්භයේ පැවති භෞතික තොග ගණන් ගැනීම අපි නිරීක්ෂණය නොකෙලෙමු. 20x0 දෙසැම්බර් 31 දිනට පැවති භාණ්ඩ තොග ප්‍රමාණයන් සම්බන්ධයෙන් වෙනත් විකල්ප ක්‍රම වලින් සෑහීමකට පත්වන්නට අපට නොහැකිවිය. එමනිසා මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය නිශ්චය කිරීමේදී ආරම්භක තොග විෂයානුබද්ධ වන බැවින්, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තාගත වර්ෂය සඳහා වූ ලාභයට සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයට ගැලපීම් සිදුකිරීම අවශ්‍යවේදැයි අපට නිශ්චය කළ නොහැකි විය. |

| | |
|---|---|
| | **නිදර්ශන 2**<br><br>**මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>ABC සමාගමේ 2001 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| | **මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ මත තත්වාගණනය කළ මතයට පදනම**<br><br>20x1 ජුනි 30 දින, සමාගමේ විගණකවරුන් ලෙස අප පත්කරනු ලැබූ අතර එහෙයින් වර්ෂය ආරම්භයේ පැවති භෞතික තොග ගණන් ගැනීම අප විසින් නිරීක්ෂණය නොකරන ලදී. 20x0, දෙසැම්බර් 31 දිනට පැවති තොග ප්‍රමාණයන් සම්බන්ධයෙන් විකල්ප ක්‍රම වලින් සෑහීමට පත්වීමට අපට නොහැකිවිය. මූල්‍යකාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ නිශ්චය කිරීමේදී ආරම්භක තොග විෂයානුබද්ධ වන නිසා, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වාර්තාගත, වර්ෂය සඳහා වූ ලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වාර්තාගත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහයට ගැලපීම් අවශ්‍යව තිබුනේදැයි අපට නිශ්චය කළ නොහැකි විය. |
| | **මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ මත තත්වාගණනය කළ මතය.**<br><br>අපගේ මතය අනුව, ''තත්වාගණනය කළ මතය සඳහා පදනම'' ඡේදයේ විස්තර කරන ලද කරුණු නිසා සිදුවිය හැකි කිසියම් බලපෑම් හැර 20X1 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා ABC සමාගමේ මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, සියළුම ප්‍රමාණාත්මක අංශ වලින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව විස්තීරණ ආදායම්, ප්‍රකාශයෙන් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාධාරණව ඉදිරිපත් කරනු ලබයි. (හෝ සත්‍ය හා සාධාරණ ලෙස දක්වයි) |
| | **මූල්‍ය තත්වය මත මතය**<br><br>අපගේ මතය අනුව, ABC සමාගමේ මූල්‍ය තත්වය, 20x1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සියලු ප්‍රමාණාත්මක අංශයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කරයි. (හෝ සත්‍ය හා සාධාරණ ලෙස දක්වයි) |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 520 - විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි** | |
| 1 | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) විගණකගේ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි, තහවුරු ක්‍රියාපටිපාටි ("තහවුරු කිරිමේ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි") ලෙස යොදාගන්නා ආකාරය පිළිබඳව කටයුතු කෙරේ. එය එසේම මූල්‍ය ප්‍රකාශ මත සමස්ථ නිගමනයකට එළඹීමේ දී විගණකට සහාය වන, විගණනය අවසන්වීමට ආසන්නයේ ඉටුකළ යුතු විශ්ලේෂණාත්මක පටිපාටි පිළිබඳව විගණකගේ වගකීම පිළිබඳව කටයුතු කෙරේ. විශ්ලේෂණාත්මක පටිපාටි අවදානම් තක්සේරු පටිපාටි ලෙස යොදාගන්නා ආකාරය පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) කටයුතු කෙරේ. තක්සේරු කළ අවදානම් වලට ප්‍රතිචාර ලෙස විගණන පටිපාටි වල ස්වභාවය කාල නිර්ණය සහ ප්‍රමාණය පිළිබඳව අවශ්‍යතාවයන් සහ උපදේශන ශ්‍රී.ල.වි.ප්‍ර. 330 හි අඩංගු වේ. මෙම විගණන පටිපාටි තහවුරු කිරිමේ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටිවල ඇතුලත් වේ. |
| අ18 | මෙවැනි විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටීන් වල ප්‍රතිඵලයක් වශයෙන් මීට ප්‍රථම හඳුනානොගත් ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානමක්ද හඳුනාගත හැකිය. මෙවැනි අවස්ථාවලදී ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක අවදානම්වල විගණකගේ තක්සේරුව සංශෝධනය කිරීම සහ ඒ අනුව සැලසුම් කළ අතිරේක විගණන පටිපාටි වෙනස් කිරීම විගණක විසින් කළයුතු බව ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) න් අවශ්‍ය කෙරේ. |

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 530 - විගණන නියැදිකරණය**

**පරිශිෂ්ඨය 2**

උදාහරණ:

| සාධකය | නියැදි තරම කෙරෙහි වන බලපෑම | |
|---|---|---|
| 5 | නොවැදගත් බලපෑම | විශාලතම සංගහනයන් සම්බන්ධයෙන්, සත්‍ය සංගහනයේ තරම නියැදි තරම කෙරෙහි වන බලපෑම අඩුය. කෙසේ වෙතත් කුඩා සංගහනයන් සඳහා ප්‍රමාණාත්ක යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමේදී විකල්ප මාර්ගයන් වශයෙන් විගණන නියැදීම නිතරම කාර්යක්ෂම නොවනු ඇත. |

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 - සාධාරණ අගයට ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාල හෙළිදරව් කිරීම් ඇතුළත්ව ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම**

| | |
|---|---|
| 1 | මූල්‍ය ප්‍රකාශ විගණනයක සාධාරණ අගයට ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාල හෙළිදරව් කිරීම් ඇතුළත්ව, ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණකගේ වගකීම පිළිබඳව මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරයි. විශේෂයෙන්, ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 330 සහ අනෙකුත් අදාල ශ්‍රී.ල.වි.ප්‍ර. ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් භාවිතා කළයුතු වනුයේ කෙසේ ද යන්න මෙම ප්‍රමිතයෙන් පුළුල්ව ඉදිරිපත් කෙරෙයි. තනි ගිණුම් ඇස්තමේන්තු වල සාවද්‍ය ප්‍රකාශ සහ සිදුවිය හැකි කළමනාකරණයේ පක්ෂග්‍රාහි පෙන්නුම් කිරීම් මත අවශ්‍යතා සහ මාර්ගෝපදේශද එහි ඇතුළත් වෙයි |
| 8 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) ප්‍රමිතයෙන් අවශ්‍ය කෙරෙන පරිදි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සහ අස්තිත්වයේ අභ්‍යන්තර පාලනය ඇතුළත්ව අස්තිත්වයේ සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සම්බන්ධ ක්‍රියාකාරකම් ඉටුකරන විට, විගණක විසින් ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම හඳුනාගැනීම සහ ඇගයීම සඳහා පදනමක් සැපයීමට පහත දැක්වෙන දෑ පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය. (අ.12 ඡේදය බලන්න) |
| 10 | ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අවශ්‍ය කෙරෙන පරිදි ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීමේදී සහ තක්සේරු කිරීමේදී විගණක විසින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ආශ්‍රිත ඇස්තමේන්තු අවිනිශ්චිත බවේ ප්‍රමාණය ඇගයිය යුතු වෙයි. (අ.45 - අ.46 ඡේද බලන්න) |
| අ20 | කළමනාකරණය විසින් හඳුනාගැනීමට අසමත් වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා අවශ්‍යතාවය පැන නගින, ගණුදෙනු, සිද්ධීන් සහ තත්වයන් විගණනය අතරවාරයෙහිදී විගණක විසින් හඳුනාගනු ලැබිය හැකිය. කළමනාකාරීත්වය විසින් හඳුනාගැනීමට අසමත් වූ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වල අවදානම්, අස්තිත්වයෙහි අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාපටිපාටියට අදාලවන අභ්‍යන්තර පාලනයෙහි සැලකිය යුතු දුර්වලතාවයක් පවත්නේද යන්න නිර්ණය කිරීම ඇතුළත්ව විගණක හඳුනාගන්නා වාතාවරණයන් සම්බන්ධයෙන් ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[11] කටයුතු කරයි. |
| අ87 | ලක්ෂිය ඇස්තමේන්තුවක් හෝ පරාසයක් සංවර්ධනය කිරීමේදී යොදාගත හැකි අදාල දත්ත වල විකල්ප ප්‍රභවයන් විගණකට ලැබී තිබීම. |
| අ90 | පරාසයකට එරෙහිව ලක්ෂිය ඇස්තමේන්තුවක් විගණක සංවර්ධනය කරනවිට විගණකගේ හැකියාව භාවිතා කරනු ලබන මාදිළිය, ලැබී ඇති දත්ත වල ස්වභාවය සහ ප්‍රමාණය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුව සම්බන්ධව ඇස්තමේන්තුකරණ අවිනිශ්චිතතාවය ඇතුළත් ව විවිධ සාධක මත රඳා පවතී. තවදුරටත්, ලක්ෂිය ඇස්තමේන්තුවක් හෝ පරාසයක් සංවර්ධනය |

[11] ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 - අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම.

| | |
|---|---|
| | කරගැනීමේ තීරණය කෙරෙහි විකල්ප ප්‍රතිඵල සහ උපකල්පන සලකා බැලීමෙන් පසුව හෝ විශේෂිත මිණුම් කරන ක්‍රමයක් නිර්දේශ කිරීමක් (උදාහරණයක් ලෙස වට්ටම් කළ සම්භාවිතා බරතැබූ අපේක්ෂිත වටිනාකම) සිදුකරනු ලබන ව්‍යවහාර කළයුතු මූල්‍ය වාර්තා කරන රාමුව මගින් බලපෑම් සිදු කරනු ලබයි. |
| අ92 | කළමනාකරණය විසින් භාවිත කළ කරගත් උපකල්පන හෝ ක්‍රමයට වෙනස් උපකල්පන හෝ ක්‍රමයක් භාවිතාකරමින් විගණක ලක්ෂීය ඇස්තමේන්තුවක් සකස් කරන විට, ගිණුම්කරණ ඇස්තමේන්තුව සකස් කිරීමේදී කළමනාකරණය විසින් භාවිතාකරන ලද උපකල්පන හෝ ක්‍රමය සම්බන්ධයෙන් විගණක ප්‍රමාණවත් අවබෝධයක් ලබාගැනීම 13 (ඇ) (ස) ඡේදයෙන් අවශ්‍ය කෙරෙයි. විගණකගේ මෙම අවබෝධය යෝග්‍ය ලක්ෂීය ඇස්තමේන්තුව හෝ පරාසය ගොඩනැගීමට අදාල විය හැකි තොරතුරු විගණකට ලබාදිය හැකිය. තවදුරටත් එහි සැලකිය යුතු වෙනස්කම් කළමනාකරණය ලක්ෂීය ඇස්තමේන්තුවෙන් අවබෝධ කරගැනීමට ඇගයීමට එය විගණකට උපකාරීවෙයි. උදාහරණයක් වශයෙන්, කළමනාකාරීත්වය සමඟ සැසඳීමේදී විගණක විසින් වෙනස්, එහෙත් සමාන වලංගුතාවයකින් යුක්ත උපකල්පන භාවිතා කිරීම හේතුවෙන් වෙනසක් පැනනැගිය හැකිය. එමගින්, ගිණුම්කරණ ඇස්තමේන්තුව ඇතැම් උපකල්පනවලට අධිසංවේදීතාවයක් දක්වන බවත් ඒ නිසාම අධිඇස්තමේන්තුකරණ අවිනිශ්චිතභාවයකට භාජනය වන බවත් හඟවමින්, ගිණුම්කරණ ඇස්තමේන්තුව සැලකියයුතු අවදානමක් විය හැකි බවත් පෙන්නුම් කරනු ඇත. විකල්පයක් වශයෙන්, කළමනාකරණය විසින් සිදු කරන ලද සත්‍ය වරදක ප්‍රතිඵලය ලෙස වෙනසක් පැන නැගිය හැකිය. සිද්ධිය මත රඳාපවතිමින්, ගිණුම්කරණ ඇස්තමේන්තුව සකස් කිරීමෙහිදී කළමනාකරණය අනුගමනය කළ ප්‍රවිශ්ඨයෙහිදී භාවිතාකරන ලද උපකල්පන වල පදනම සහ ඒවායෙහි වලංගුතාවය සහ වෙනසක් පවත්නේනම් ඒ පිළිබඳවත් කළමනාකරණය සමඟ සාකච්ඡා කිරීම හා තීරණයකට එළඹීමෙහිදී උපකාරී වන බව විගණක වටහාගනු ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 550 - සම්බන්ධිත වාර්තාව** | |
| 1 | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය, මූල්‍ය ප්‍රකාශ විගණනයක සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු සම්බන්ධයෙන් විගණකගේ වගකීම පිළිබඳ කටයුතු කරයි. විශේෂයෙන් මෙය සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු ආශ්‍රිතව ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම සම්බන්ධයෙන් <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> ශ්‍රී.ල.වි.ප්‍ර. 330 සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 240 ව්‍යවහාර කළ යුත්තේ කෙසේදැයි විස්තර කරයි. |
| 11 | අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු ආශ්‍රිත ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් හඳුනාගැනීමට අදාළ තොරතුරු ලබා ගැනීමට 12-17 ඡේදවල පිහිටුවන ලද විගණන පටිපාටි සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් විගණක විසින් ඉටු කළයුතු විගණනය කරගෙන යාමේදී ඉටු කිරීමට <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 240 නියම කරයි. (යොමුව 78 ඡේදය) |
| 12 | කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාකච්ඡාව, අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු වලින් ප්‍රතිඵල දෙන වංචා සහ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් මූල්‍ය ප්‍රකාශ සැක සහිත බව විශේෂයෙන් සලකා බැලීම අතුළත් කළයුතු අතර එය <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 240 නියම කරයි. (යොමුව අ9 - ආ ඡේද) |
| 18 | ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> අවශ්‍යතා සම්පූර්ණ කිරීමේදී, විගණක සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු ආශ්‍රිතව ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම කළයුතු අතර ඕනෑම එවැනි අවදානම් සැලකිය යුතු අවදානම් දැයි නිශ්චය කරයි. මෙය නිශ්චය සිදු කිරීමේදී, විගණක සැලකිය යුතු අවදානම් පැන නැගීමට ඉඩ දෙන අස්තිත්තයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් පිට හඳුනාගත් සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සැලකිය යුතු වේ. |
| අ12 | කෙසේ නමුත් ආකෘතික රාමුව සම්බන්ධිත පාර්ශව අවශ්‍යතාවයන් පිහිටුවනු නොලබන අවස්ථාවක, අස්තිත්වයට එවැනි තොරතුරු පද්ධති සුදුසු ලෙස නොමැති විය හැකිය. එවැනි අවස්ථාවන් යටතේ කළමනාකරණය සියළුම සම්බන්ධිත පාර්ශවවල පාවැත්ම දැනුවත් වී නොතිබිය හැකිය. කෙසේ නමුත් මෙම ප්‍රමිතියේ පිහිටුවා ඇති සම්බන්ධිත පාර්ශව නිර්වචනය සම්පූර්ණ වන පාර්ශවයන් කළමනාකරණය දැනුවත් විය හැකි නිසා 13 ඡේදයෙන් විශේෂයෙන් නියම කළ විමසීම් සිදුකිරීමට අවශ්‍යතාවය තවමත් ව්‍යවහාර කරයි. එවැනි අවස්ථාවක කෙසේ නමුත් පහත සඳහන් තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් <u>ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)</u> අනුව ඉටු කළයුතු විගණකගේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් |

| | |
|---|---|
| | කොටසක් ලෙස පිහිටුවීමට අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශවයන්ගේ හඳුනාගැනීම සම්බන්ධයෙන් විගණකගේ විමසීම් විය හැකිය.<br>• අස්තිත්වයේ අයිතිය සහ පාලන ව්‍යූහයන්<br>• අස්තිත්වය සිදුකරන සහ සිදුකිරීමට සැලසුම් කරන ආයෝජන වර්ග<br>• අස්තිත්වයේ ව්‍යූහයේ ආකාරය සහ එය මූල්‍යකරණය කරන්නේ කෙසේද යන්න<br>පොදු පාලන සම්බන්ධතාවල විශේෂිත වූ අවස්ථාවකදී, කළමනාකරණය වශයෙන් එවැනි සම්බන්ධතාවයන් අස්තිත්වයට ආර්ථිකමය වැදගත්කමක් තිබේනම් ඒ පිළිබඳව වඩා දැනුවත් විය හැකි අතර අස්තිත්වය පාර්ශවයන් සමඟ වඩා වැදගත් පුරුදුවල නිරත වී හෝ සැලකිය යුතු ප්‍රමාණයකට සම්පත් බෙදාගෙන තිබේද යන්න මත වඩා කේන්ද්‍ර වී ඇත්නම් ඒවා සම්බන්ධිත පාර්ශවයන් දැයි විගණකගේ විමසීම් වඩා ඵලදායි විය හැකිය. |
| අ15 | අස්තිත්වය තුල වෙනත් දෑ අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනුවල දැනුම සහ එවැනි සම්බන්ධතා සහ ගණුදෙනු වලට අස්තිත්වයේ පාලන තිබීමට සලකා බැලිය හැකිය. ඒවා කළමනාකරණ කොටසක් ලෙස ඇති නොකරන ප්‍රමාණය දක්වා ඇතුලත් කළ හැකිය.<br>• ඒවා පාලනය සමඟ බැඳී තිබීම<br>• සැලකිය යුතු සහ ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් පරිබාහිරව යන දෙකම ගණුදෙනු පටන්ගැනීමට ක්‍රියාත්මක කිරීමට හෝ වාර්තා කිරීමට හැකි පුද්ගලයින් සහ එවැනි පුද්ගලයින් සුපරීක්ෂා කිරීම<br>• <u>අභ්‍යන්තර විගණන කාර්යය</u><br>• අභ්‍යන්තර නෛතික උපදේශනය<br>• ප්‍රධාන ආචාරධර්ම නිළධාරී හෝ ඒ හා සමාන පුද්ගලයා |
| අ17 | පාලන පරිසරය තේරුම් ගැනීම ලබා ගැනීමට <u>ශ්‍රී.ල.වි.ප්‍ර.315 (සංශෝධිත)</u> අවශ්‍යතාවය සපුරා ගැනීමෙදී, විගණක සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු ආශ්‍රිතව ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් අඩු කිරීමට අදාල පාලන පරිසරයේ ලක්ෂණ සලකා බැලිය හැකිය.<br>• සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල විශේෂිත වූ වර්ග වලට අස්තිත්වය විසින් එළඹිය හැකි පාලනය අවස්ථාවන්වලදී, අස්තිත්වයේ පුද්ගලයන්ට උචිත ලෙස සන්නිවේදනය කරන ලද අභ්‍යන්තර ආචාරධර්ම සංග්‍රහය.<br>• කළමනාකරණය සහ සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවලදී පාලනය සමඟ බැඳී තිබෙන විවෘත සහ ඇල්මෙහි කාලානුරූපව හෙළිදරව් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ පටිපාටි<br>• සම්බන්ධිත පාර්ශව ගණුදෙනු හඳුනාගැනීම, වාර්තා කිරීම, සාරාංශ කිරීම සහ හෙලිදරව් කිරීම සඳහා අස්තිත්ව තුල වගකීම්වල පැවරීම.<br>• සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල ව්‍යාපාරික තාර්කිකත්වය උචිත ලෙස පාලනය සමඟ බැඳුණු ඒවා සමඟ අභියෝග කර තිබේද යන්න ඇතුලත්ව කළමනාකරණය සහ අස්තිත්වයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් පරිබාහිරව සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල පාලන සමඟ බැඳුණු ඒවා අතර කාලානුරූපව හෙලිදරව් කිරීම සහ සාකච්ඡාව<br>• කළමනාකරණ ස්වාධීන තනි පුද්ගලයින් අයත්ව පාලනය සමඟ බැඳුණු ඒවායේ උපකමිටුවක් මගින් අනුමැතිය වැනි සත්‍ය හෝ ප්‍රත්‍යක්ෂ බැඳියාවේ ගැටුම් ඇතුළුව සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල අනුමැතිය සඳහා පැහැදිලි මග පෙන්වීම<br>• <u>යෝග්‍ය වන ලෙස අභ්‍යන්තර විගණන කාර්යය මගින් සිදුකරන සමලෝචන</u><br>• විගණක මගින් හෝ බාහිර නෛතික උපදේශක මගින් උපදෙස් ලබාගැනීම වැනි සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීමේ ගැටළු විසඳීමට කළමනාකරණය ගෙන ඇති කලින් ගත් පියවර<br>• යෝග්‍ය ලෙස අනතුරු ඇඟවීමේ ප්‍රතිපත්ති සහ පටිපාටිවල පැවැත්ම. |

| | |
|---|---|
| අ22 | විගණනය කරන අතරතුරදී, විගණක සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගණුදෙනු පිළිබඳ තොරතුරු සැපයි හැකි වාර්තා සහ ලියකියවිලි පරීක්ෂා කළ හැකිය.<br>උදාහරණ<br>• විගණක විසින් ලබා ගන්නා තෙවැනි පාර්ශව තහවුරු කිරීම් (බැංකු සහ නෛතික තහවුරු කිරීම්වලට අමතරව)<br>• අස්තිත්වයේ ආදායම් බදු වාර්තා<br>• නියාමක අධිකාරිවලට අස්තිත්වය විසින් සපයන තොරතුරු<br>• අස්තිත්වයේ ප්‍රධාන කොටස් හිමියන් හඳුනාගැනීමට කොටස් හිමියන්ගේ රෙජිස්ටරය<br>• කළමනාකරණය සහ පාලනය සමඟ බැඳුනු ඒවා සමඟ ඇල්මෙහි ගැටුම්වල ප්‍රකාශන<br>• අස්තිත්වයේ ආයෝජනවල සහ විශ්‍රාම සැලසුම්වල වාර්තා<br>• අස්තිත්වයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් පරිබාහිරව ඇති වැදගත් ගිවිසුම් සහ එකඟවීම<br>• අස්තිත්වයේ වෘත්තීය උපදේශකවරුන්ගේ විශේෂිත වූ ඉන්වොයිස් සහ ලියකියවිලි<br>• අස්තිත්වය මගින් අත්පත්කරගත් ජීවිත රක්ෂණ ඔප්පු<br>• කාලච්ඡේදය තුලදී අස්තිත්වය මගින් නැවත කතිකා කරගත් වැදගත් ගිවිසුම්<br>• අභ්‍යන්තර විගණන කාර්යයේ වාර්තා<br>• ආරක්ෂිත නියාමක සමඟ (උදාහරණ ලෙස සංස්ථා ප්‍රකාශය) අස්තිත්වයේ ගොනුගත කිරීම් ආශ්‍රිත ලියකියවිලි.<br>හඳුනාගත් හෝ හෙළිදරව් කළ සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන් සහ ගනුදෙනුවල පැවැත්ම එකඟවීම්වල පෙන්නුම් කළ හැකිය. (යොමුව 15 ඡේදය) |
| අ40 | කළමනාකරණය මගින් පාලනය සමඟ බැඳුනු ඒවා හෝ යෝග්‍ය ලෙස බලය දීම සහ අනුමැතිය අස්තිත්වය තුළ යෝග්‍ය මට්ටම්වලදී නියම ලෙස සලකාබැලිය හැකි සහ මූල්‍ය ප්‍රකාශවල නියම ලෙස නිරූපනය කර ඇති ඒවායේ නියමයන් සහ කොන්දේසිවල අස්තිත්වයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලින් පරිබාහිර සැලකියයුතු සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල කොටස්කරුවන් විගණන සාක්ෂි සැපයිය හැකිය. මෙම ස්වභාවයේ ගණුදෙනුවල පැවැත්ම, වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවධානම් පෙන්නුම කළ හැකි කළමනාකරණය සමඟ හෝ පාලනය සමඟ බැඳුණු ඒවා සමඟ සාකච්ඡාව මත පදනම් තාර්කික විස්තර කිරීම නොතිබිම එවැනි බලය දීම සහ අනුමැතියට යටත් නොවේ. මෙවැනි අවස්ථාවලදී ඒ සමාන ස්වභාවයේ වෙනත් ගණුදෙනු සඳහා අවදානයෙන් සිටීම විගණක අවශ්‍ය විය හැකිය. බලය දීම සහ අනුමැතිය තනිවම, කෙසේ නමුත් සම්බන්ධිත පාර්ශව සමඟ දුස්සන්දනය වීම තිබේ නම් හෝ සම්බන්ධිත පාර්ශවයක බලපෑම ප්‍රබල නම් හෝ වංචාවක් හේතුවෙන් ප්‍රමාණාත්මක අවදානමක නොමැති වේ යැයි නිගමනය කිරීමේදී ප්‍රමාණවත් නොවිය හැකිය. එවනි බලය දීම සහ අනුමැතිය සඵලදායි නොවිය හැකිය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 560 - පසුව සිදුවන සිදුවීම්** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 - අඛණ්ඩ පැවැත්ම** | |
| 10 | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 (සංශෝධිත) අනුව අවදානම් තක්සේරු කිරීමේ පටිපාටින් ඉටුකරන අවස්ථාවේ අස්තිත්වයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳ සැලකිය යුතු තරම් සැක පහළ කෙරෙන සිද්ධීන් හෝ තත්වයන් පිළිබඳ විගණකවරයා සලකා බැලිය යුතුය. එසේ කිරීමේදී කළමනාකරණය විසින් අස්තිත්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රාථමික තක්සේරුවක් කර තිබේද යන්න විගණක නිශ්චය කළ යුතුය. (යොමුව අ2-අ5) |
| 19 (ආ) | ඡේද අංක 18 සඳහන් කරුණු මූල්‍ය ප්‍රකාශයන්හි සටහනකට අවධානය යොමු කරමින් (යොමුව අ21 - අ22) |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 580 - ලිඛිත නියෝජනයන්** | |
| **අ3** | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකරණයේ වගකීම සහ අස්තිත්වයේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගැනීම සඳහා ඇති වගකීම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම |

| | |
|---|---|
| | සහ ඉදිරිපත් කිරීමේ සහ ඒවායේ ලිඛිත නියෝජනයන් පදනම් වන තහවුරු කිරීම් වෙනුවෙන් අස්තිත්වය විසින් අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් කළමනාකරණය සතු වීම අපේක්ෂා කරනු ලැබේ. |
| **පරිශිෂ්ඨය 1** | **ලිඛිත නියෝජනයන් සඳහා අවශ්‍යතාවයන් ඇතුලත්වන ශ්‍රී.ල.වි.ප්‍ර ලැයිස්තුව**<br><br>මෙම පරිශිෂ්ඨය 2014 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපාන අනෙකුත් ශ්‍රී.ල.වි.ප්‍ර වල ඇති විෂය කරුණු විශේෂිත වූ ලිඛිත නියෝජන වලට අදාල ඡේද හඳුනාගනු ලබයි. මෙම ලේඛනය අවශ්‍යතා සලකා බැලීම සඳහා සහ අදාල යෙදීම් සහ ශ්‍රී.ල.වි.ප්‍ර තුල ඇති අනෙකුත් පැහැදිලි කිරීම් සඳහා ආදේශකයන් නොවේ. |
| **පරිශිෂ්ඨය 2** | **නිදර්ශනාත්මක නියෝජන ලිපිය**<br><br>2014 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශය විගණනය සඳහා බලපාන මෙම ප්‍රමිතයෙන් සහ අනෙකුත් ශ්‍රී.ල.වි.ප්‍ර මඟින් අවශ්‍ය කරන ලිඛිත නියෝජන පහත නිදර්ශනාත්මක ලිපිය තුල ඇතුලත් වේ. මෙම නිදර්ශනයේ අදාල මූල්‍ය වාර්තාකරන රාමුව ව්‍යවහාර කළයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත බව උපකල්පනය කරන අතර ලිඛිත නියෝජන ලබාගැනීම සඳහා වන ශ්‍රී.ල.වි.ප්‍ර 570 හි අවශ්‍යතාවය අදාල නොවීම මෙන්ම. ඉල්ලුම් කරන ලද ලිඛිත නියෝජන සඳහා ව්‍යතිරේකයක් නොමැත. ව්‍යාතිරේකයන් තිබේනම් ව්‍යතිරේක නිරූපනය වීමට නියෝජනයන් සංශෝධනය කළ යුතුයි. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 600 - විශේෂ සලකා බැලීම් - සමූහ ව්‍යාපාරයන්හි මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකවරුන්ගේ කාර්යභාරයද ඇතුලත්ව)** | |
| අ2 | සමූහයක ව්‍යුහය සංරචකයන් හඳුනාගන්නා ආකාරය කෙරෙහි බලපෑම් සිදුකරයි. උදාහරණ වශයෙන් ගතහොත් සමූහයක මූල්‍ය වාර්තාකරන පද්ධතිය මව් සමාගම විසින් එකක් හෝ වැඩිගණනක් වූ පාලිත සමාගම්, බද්ධ ව්‍යාපාර හෝ ස්කන්ධ හෝ පිරිවැය ගිණුම්කරණ ක්‍රම මත ආයෝජිත, ප්‍රධාන කාර්යාලයකින් හෝ ශාඛා හෝ අංශ එකක් හෝ වැඩිගණනක් විසින් හෝ ඒ දෙකම ඒකාබද්ධව සකස් කළයුතු මූල්‍ය තොරතුරු සපයන ආයතනයක් මත පදනම් විය හැකිය. කෙසේවුවද සමහර සමූහයන් සිය මූල්‍ය වාර්තාකරණ පද්ධතිය කාර්යාංශ ක්‍රියාවලී නිෂ්පාදිත හෝ සේවා යටතේ (හෝ සේවා හෝ නිෂ්පාදන සමූහ අනුව) හෝ භූගෝලීය පිහිටීම් අනුව සංවිධානය කරනු විය හැකිය. මෙවැනි අවස්ථාවලදී සමූහය හෝ සංරචක කළමනාකරණය පිළියෙල කරනු ලබන මූල්‍ය තොරතුරු සමූහ මූල්‍ය ප්‍රකාශවල කාර්යය, ක්‍රියාවලී, නිෂ්පාදිත හෝ සේවා (හෝ සේවා හෝ නිෂ්පාදිත සමූහ අනුව) හෝ භූගෝලීය පිහිටීම අනුව අන්තර්ගත විය හැකිය. |
| අ23 | ආස්තිත්වය විසින් භාවිතා කරන වාර්තාකරණ රාමුව, ආස්තිත්වයෙහි ස්වභාවය, අරමුණු සහ ක්‍රමෝපායයන් සහ අදාල ව්‍යාපාරික අවදානම් මෙන්ම අස්තිත්වයේ මූල්‍ය කාර්යසාධනය මිනුම් කිරීම සහ සමාලෝචනයද ඇතුලත්ව කර්මාන්තය, නියාමනය සහ වෙනත් බාහිර සාධක අවබෝධ කරගැනීම සඳහා වන කරුණු සම්බන්ධව විගණකවරයාට මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 315 හි අන්තර්ගතවෙයි. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ පරිශිෂ්ඨ 2 හි ඒකාබද්ධ ක්‍රියාවලියද ඇතුලත්ව සමූහයකට අදාලවන විශේෂ කරුණු පිළිබඳ මග පෙන්වීම් අඩංගු වෙයි. |
| අ27 | …….<br>• සංරචකයක හෝ සමූහයට බලපාන සත්‍ය වශයෙන් සිදුවූ හෝ සිදුවී යයි සැකකෙරෙන හෝ චෝදනා කෙරෙන වංචා පිළිබඳව දන්නේ දැයි සමූහයේ පාලනය භාරව සිටිය අයගෙන් හෝ සමූහයේ කළමනාකාරිත්වයෙන් හෝ අභ්‍යන්තර විගණන කාර්යයේ ඇතුලත් අදාල පුද්ගලයින් හෝ (අදාල යයි සිතෙන්නේ නම් සංරචකයේ කළමනාකාරිත්වය, සංරචක විගණකවරුන් ගෙන් සහ වෙන අයගෙන්) සමූහ විගණන කණ්ඩායම විසින් කරනු ලැබූ විමසීම් වලට ප්‍රතිචාර. |

| | |
|---|---|
| අ51 | ……<br>• සංරචකයේ වැඩ සහ සමූහ විගණනය මත එම වැඩෙහි බලපෑම අභ්‍යන්තර විගණන කාර්යය ඉටුකර තිබේද යන්න |
| **පරිශිෂ්ඨය 01** | **සමූහ විගණන මතය පදනම් කරගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට සමූහ විගණන කණ්ඩායම අපොහොසත් වූ විට යොදාගන්නා තත්වාගණනය කළ මතයට උදාහරණ**<br><br>මෙම උදාහරණයේදී සමූහ විගණන කණ්ඩායමට, ගිණුම් වාර්තා වලට, කළමනාකාරීත්වයට හෝ සංරචකයේ විගණකවරයාට ප්‍රවේශයක් නොලැබීම නිසා ස්කන්ධ ක්‍රමය මගින් ගිණුම්ගත කළ සලකා බැලිය යුතු සංරචකයකට සම්බන්ධ ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිය. (රුපියල් මිලියන 60 ක වත්කම් පිළිඹිබු කිරිම මූල්‍ය තත්තව ප්‍රකශයේ හඳුනාගෙන ඇත්තේ රුපියල් මිලියන 15ක් වශයෙනි) |
| **පරිශිෂ්ඨය 01** | **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත වාර්ත**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ සහ එහි පරිපාලිතවල ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| පරිශිෂ්ඨය 01 | **තත්වාගණනය කළ මතය සඳහා පදනම**<br><br>වර්ෂය තුලදි අත්පත් කර ගනු ලැබූ විදේශ ආශ්‍රිත සමාගමක් වන XYZ සමාගමේ, ABC සමාගම විසින් කරන ලද අයෝජනය ස්කන්ධ ක්‍රමය අනුව ගිණුම් ගතකොට 20x1 දෙසැම්බර් මස 31වන දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශයේ රුපියල් මිලියන 15 ක් ලෙස ඉදිරියට ගෙනැවිත් ඇති අතර XYZ හි ශුද්ධ ආදායමෙන් ABC සමාගමේ කොටස වන රුපියල් මිලියනය එදිනට අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ අදායම් ප්‍රකාශයේ ඇතුලත්ය. 20x1 දෙසැම්බර් මස 31වන දිනට ABC සමාගම විසින් XYZ සමාගමෙහි කරනලද අයෝජනයෙහි ධාරණ අගය සහ වර්ෂය සඳහා XYZ සමාගමේ ශුද්ධ ආදායමෙන් ABC සමාගමේ කොටස පිළිබඳව ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීම XYZ සමාගමේ මූල්‍ය තොරතුරු වලට කළමනාකාරීත්වයට සහ එහි විගණකවරුන්ට අපගේ ප්‍රවේශය ලබා නොදීම හේතුකොට ගෙන අපට නොහැකිවිය එහි ප්‍රතිඵලය් වශයෙන් මෙම ප්‍රමාණයන් සඳහා කිසියම් ගැලපීම් කිරිම අවශ්‍යදැයි තීරණය කිරිමට අපට හැකියාවක් නොවීය. |
| **පරිශිෂ්ඨය 02**<br>ඡේද 1 | ……<br>• ස්වයං තක්සේරු වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීකම් ඇතුලත්ව පාලක සමීක්ෂණය |
| **පරිශිෂ්ඨය 02**<br>ඡේද 2 | අභ්‍යන්තර විගණනය සමූහ ව්‍යාප්ත පාලනවල කොටසක් වශයෙන් සැලකේ. උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යභාරය මධ්‍යගතකොට තිබීම. අභ්‍යන්තර විගණකගේ කාර්යයේ ආයතනයේ තත්වය සහ අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණාත්මක ලෙස අභ්‍යන්තර විගණකගේ විෂය මූලිකත්ව සහ විගණන කාර්යයේ ප්‍රවීණතා මට්ටම උදවූ කෙරේදැයි සහ සමූහ විගණන කණ්ඩායම කාර්යයේ වැඩ යොදාගැනීමට බලාපොරොත්තු වන අවස්ථාවක ක්‍රමවත්ව සහ විනායානුකූලව කාර්යය ව්‍යවහාර කරයිද යන්න සමූහ කාර්යයහාර විගණන කණ්ඩායමේ ඇගයීම ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) හි දැක්වේ. |
| **පරිශිෂ්ඨය 5** | ……<br>• පාලනය මත හෝ සංරචකවලට අදාලව ඉටුකරන ලද වැඩ මත පදනම්ව අභ්‍යන්තර විගණන කාර්යයේ සොයාගැනීම්. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 610 - අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනිම** | |
| මෙම ලියවිල්ල අවසානයේදී, ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) වෙනමම ඇතුලත් කරයි. | |

| | |
|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 620 - විගණකගේ විශේෂඥවරයෙකුගේ වැඩකටයුතු ප්‍රයෝජනයට ගැනීම** | |
| වෙනස්කම් නොමැත. | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 - මූල්‍ය ප්‍රකාශ මත වාර්තාකරණය සහ මතයකට එළඹීම.** | |
| **අ23** | ඇතැම් අධිකරණ බල ප්‍රදේශ වලදී කළමනාකරණයේ වගකීම නියම කිරීමේ නීතිය හෝ රෙගුලාසිය මගින් ගිණුම් පොත් සහ ලේඛන හෝ ගිණුම්කරණ පද්ධතියෙහි ප්‍රමාණවත් බව කෙරෙහි වන වගකීම විශේෂිත කොට දක්වනු විය හැකිය. පොත්, ලේඛන සහ පද්ධති අභ්‍යන්තර පාලනයෙහි (ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) නිර්වචනය කර ඇති පරිදි) සංකලිත කොටසක් වශයෙන්, ශ්‍රී.ල.වි.ප්‍ර. 210 සහ 26 වැනි ඡේදයේ වන විස්තර කිරීම් ඒවාට විශේෂ යොමුවක් නොදක්වයි. |
| **පරිශිෂ්ඨය 1 වන නිදර්ශන** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>මේ සමඟ ඇති ABC සමාගමෙහි 20x1 දෙසැම්බර් 31 දිනට <u>මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත්</u> මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| **3 වන නිදර්ශනය** | 20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ සහ එහි පරිපාලිතවල ඒකාබද්ධ <u>මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත්</u> මේ සමඟ ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 - ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්** | |
| මාතෘකාව අ4 | <u>*තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යත්වය*</u><br><br>කළමනාකාරිත්වය තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශන පැන නැගිය හැක්කේ,<br>………… |
| පරිශිෂ්ඨය - **නිදර්ශනය 1** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ <u>මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත්</u> මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.<br><br>**තත්වාගණනය කළ මතය සඳහා පදනම**<br><br><u>මූල්‍ය තත්ව ප්‍රකාශ</u> දින සමාගමේ තොග දැක්වෙනුයේ xxx ලෙසය. |
| නිදර්ශනය 2: | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ සහ එහි පරිපාලිතවල ඒකාබද්ධ <u>මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත්</u> මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |

| | |
|---|---|
| පරිශිෂ්ඨය - **නිදර්ශනය 3** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.<br><br>***තත්වාගණනය කළ මත සඳහා පදනම***<br><br>වර්ෂය තුලදි අත්පත් කර ගනු ලැබූ විදේශ ආශ්‍රිත සමාගමක් වන XYZ සමාගමේ, ABC සමාගම විසින් කරන ලද අයෝජනය ස්කන්ධ ක්‍රමය අනුව ගිණුම් ගතකොට 20x1 දෙසැම්බර් මස 31වන දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශයේ රුපියල් මිලියන 15 ක් ලෙස ඉදිරියට ගෙනැවිත් ඇති අතර XYZ හි ශුද්ධ ආදායමෙන් ABC සමාගමේ කොටස වන රුපියල් මිලියනය එදිනට අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ අදායම් ප්‍රකාශනයේ ඇතුලත්ය. 20x1 දෙසැම්බර් මස 31වන දිනට ABC සමාගම විසින් XYZ සමාගමෙහි කරන ලද අයෝජනයෙහි ධාරණ අගය සහ වර්ෂය සඳහා XYZ සමාගමේ ශුද්ධ ආදායමෙන් ABC සමාගමේ කොටස පිළිබඳව ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීම XYZ සමාගමේ මූල්‍ය තොරතුරු වලට කළමනාකරණය සහ XYZ විගණකවරුන් අපගේ ප්‍රවේශය ලබා නොදීම හේතුකොට ගෙන අපට නොහැකිවිය. එහි ප්‍රතිඵලය වශයෙන් එම අගයන් සඳහා කිසියම් ගැලපීම් කිරිම අවශ්‍යදැයි තීරණය කිරිමට අපට හැකියාවක් නොවීය. |
| පරිශිෂ්ඨය - **නිදර්ශනය 4** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| පරිශිෂ්ඨය - **නිදර්ශනය 5** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.<br><br>**මතය වියාචනය කිරීම සඳහා වූ පදනම**<br><br>20x1 දෙසැම්බර් මස 31 දින පසු වනතුරු අපව සමාගමේ විගණකවරුන් ලෙස පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් වර්ෂය ආරම්භයේ හෝ අවසානයේ භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය කිරීමට අපහට නොහැකි විය. 20x0 සහ 20x1 දෙසැම්බර් 31 දිනයන්හි මූල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් පිළිවෙළින් xxx හා xxx වූ තොග ප්‍රමාණයන් සම්බන්ධයෙන් විකල්ප මාර්ග යොදාගෙන ඒ පිළිබඳව අපහට සෑහීමකට පත්විය නොහැකි විය. එයට අමතරව ලැබියයුතු ගිණුම් සඳහා 20x1 සැප්තැම්බර් මස හඳුන්වාදුන් නව පරිගණක පද්ධතියේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබියයුතු ගිණුම්වල වැරදි ගණනාවක් මතුව ඇත. අපගේ විගණන වාර්තාවේ දිනය වනතුරුත්, කළමනාකරණය පද්ධති ඌණතා නිවැරදි කිරීම් සහ වැරදි නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියහ. 20x1 දෙසැම්බර් 31 දින ලැබියයුතු ගිණුම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුළත් මුලු වටිනාකම වූ xxx සනාථ කිරීමට හෝ වෙනත් විකල්ප ක්‍රම වලින් එය සත්‍යාපණය කිරීමට අපහට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස වාර්තා වී ඇති හෝ වාර්තා නොවී ඇති තොග සහ ලැබියයුතු ගිණුම් විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් සෑදෙන මූලිකාංගයන්ට සම්බන්ධයෙන් කිසියම් ගැලපුමක් පදනම් කිරීම අවශ්‍යදැයි නිර්ණය කිරීමට අපහට නොහැකි විය. |

| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 - ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු අවධාරණය කිරීමේ ඡේද** | |
|---|---|
| **පරිශිෂ්ඨය 3** | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.<br><br>**තත්වාගණනය කළ මතයක් සඳහා පදනම**<br><br>සමාගමේ කෙටි කාලීන අලෙවි කළ හැකි සුරැකුම්පත්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වෙනුයේ xxx ලෙසය. කළමනාකරණය මෙම සුරැකුම්පත් වෙළඳපොල මිලට අනුව අගය කර නොමැති නමුදු ඒ වෙනුවට ඒවා පිරිවැයට සඳහන් කර ඇති අතර, එය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලින් බැහැර වීමකි. සමාගමේ වාර්තා වලට අනුව, කළමනාකරණය අලෙවි කළ හැකි සුරැකුම්පත් වෙළඳපොල මිලට අනුව අගය කලේ නම්, සමාගම වර්ෂය සඳහා වන විස්තීරණ අදායම් ප්‍රකාශයේ උපලබ්ධි නොවූ xxx ක අලාභයක් හඳුනාගත යුතුව තිබුණි. මූල්‍ය තත්ව ප්‍රකාශයේ සුරැකුම්පත් වල 20x1, දෙසැම්බර් 31 දිනට ධාරණ අගය එම වටිනාකමින් අඩුවීමට තිබුණු අතර අදායම් බද්ද, ශුද්ධ අදායම සහ කොටස්කරුවන්ගේ ස්කන්ධය පිළිවෙලින් xxx, xxx, සහ xxx න් අඩුවීමට තිබුණි. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 710 - සන්සන්දනාත්මක තොරතුරු - අනුරූපී අගයන් සහ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ** | |
| **පරිශිෂ්ඨය – නිදර්ශනය 1 අනුරූපී අගයන්** (යොමුව: ඡේද. අ5) | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත . |
| **පරිශිෂ්ඨය – නිදර්ශනය 2 අනුරූපී අගයන්** (යොමුව: ඡේද. අ5) | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| පරිශිෂ්ඨය – **නිදර්ශනය 3 අනුරූපී අගයන්** (යොමුව: ඡේද. අ7) | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br><br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |

| | |
|---|---|
| **පරිශිෂ්ඨය – නිදර්ශනය 4 අනුරූපී අගයන්** (යොමුව: ඡේද. අ9 | **මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 720 - විගණිත මූල්‍ය ප්‍රකාශ වල අඩංගු ලිපිලේඛන වල සමන්විත වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම්** | |
| | වෙනස්කම් නොමැත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 - විශේෂිත වූ සලකාබැලීම් - විශේෂිත අරමුණු ආකෘතිමය රාමුව අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශවල විගණනයන්** | |
| 10 | අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ භාවිතා කිරීම තේරුම් ගැනීම ලබා ගැනීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) විගණක නියම කරයි. ගිවිසුමක ප්‍රතිපාදන අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශ අවස්ථාවකදී, විගණක එම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී කළමනාකරණය සිදුකළ ගිවිසුමේ සැලකියයුතු ඕනෑම අර්ථකථනය තේරුම් ගැනීමක් ලබා ගත යුතුයි. මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කළ තොරතුරු වල ප්‍රමාණාත්මක වෙනසක් වෙනත් සාධාරණ පිළිගැනීම සිදුකර තිබෙන විට අර්ථකථනයක් වැදගත් වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805 - විශේෂ සලකාබැලීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතමය විගණයන්** | |
| 4 | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලච්ඡේද සඳහා තනි මූල්‍ය ප්‍රකාශ හෝ විශේෂිත වූ මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතම විගණනයන් සඳහා බල පැවැත්වේ. නිශ්චිත වූ දිනයක පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශයක, තනි මූල්‍ය ප්‍රකාශ හෝ විශේෂිත වූ මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතමවල විගණනයන් කරන අවස්ථාවලදී, මෙම විගණන ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින හෝ ඊට පසු පිළියෙල කළ එවැනි තොරතුරු විගණනයන් සඳහා බලපැවැත් වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810 - සංක්ෂිත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීමට කාර්යයභාරයන්** | |
| **පරිශිෂ්ඨය නිදර්ශන 03** | **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත ස්වාධීන විගණකගේ වාර්තාව**<br>**මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව**<br>[යෝග්‍ය ලිපිනය]<br>20x1 දෙසැම්බර් මස 31 වන දිනට ABC සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරුද ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත. |
| **පරිශිෂ්ඨය නිදර්ශන 03** | **නිගමනය**<br>20x2 පෙබරවාරි 15 වන අපගේ වාර්තගත දිනයට තත්වාගනනය කළ විගණන මතය, විගණනය කළ මූල්‍ය ප්‍රකාශවල අවප්‍රකාශනය විස්තර කරයි. අපගේ තත්වාගනනය කළ විගණන මතයේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ සමාගමේ තොග xxx අගයකට පවතින කරුණ පදනම් වේ. තොග කළමනාකරණය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සඳහන් නොකර සම්පූර්ණයෙන් පිරිවැයට සඳහන් කර තිබෙන අතර එය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට පටහැනිව ඇතුලත් වේ. සමාගමේ වාර්තා, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට කළමනාකරණය සඳහන් කළයුතු බව, xxx අගය වන එහි ශුද්ධ උපලබ්ධි අගයට තොග ලියාහැරිය යුතු අවශ්‍ය බව සමාගමේ වාර්තා පෙන්වයි. ඒ අනුව xxx කින් විකුණුම් පිරිවැය වැඩි වී ඇති අතර ආදායම් බදු, ශුද්ධ ආදායම සහ කොටස් හිමියන්ගේ හිමිකම පිළිවෙළින් xxx, xxx සහ xxx අඩුවෙනි. ඉහත විස්තර කර දැ එම මූල්‍ය ප්‍රකාශ සියළුම ප්‍රමාණාත්මක අංශයන් වලදී (සත්‍ය හෝ සාධරණ බව දෙන) 20x1 දෙසැම්බර් 31 දිනට ABC සමාගමේ මූල්‍ය තත්වය සහ එහි වර්ෂ අවසානයේ මූල්‍ය කාර්යය සාධනය, මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සාධරණව ඉදිරිපත් කරඇති බව අපගේ තත්වාගනනය කළ මතයේ සඳහන් වේ. |

## ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 (සංශෝධිත)

## අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම.

(2015 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද වල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපවත්වයි.)

**පටුන**


| | ඡේදය |
|---|---|
| හැඳින්වීම | |
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. විෂය පථය ......................................... | 1 |
| බලපවත්වන දිනය ......................................... | 2 |
| **අරමුණ** ......................................... | **3** |
| නිර්වචන ......................................... | 4 |
| ලේඛනගත කිරීම ......................................... | 32 |
| **ව්‍යවහාරයකරණය සහ වෙනත් පහදා දීමේ දේවල්** | |
| අවධානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම් ......................... | අ1-අ23 |
| අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය ඇතුළුව අස්තිත්වය සහ එහි පරිසරය | |
| පිළිබඳව අවශ්‍ය කරන අවබෝධය ......................................... | අ24-අ117 |
| ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම .................. | අ118-අ143 |
| ලේඛනගත කිරීම ......................................... | අ144-අ147 |
| පරිශිෂ්ඨය-1:අභ්‍යන්තර පාලන සංරචක | |
| පරිශිෂ්ඨය 2: ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම පිළිබඳව ඇඟවීම් විය හැකි අන්දමේ තත්වයන් සහ සිදුවීම්. | |


ශ්‍රී.ල.වි.ප්‍ර. 200 ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ විගණනයක් පවත්වාගෙන යාමේ පද සම්බන්ධය සහිතව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 315 (සංශෝධිත) අස්තිත්වය සහ එහි වටපිටාව අවබෝධ කරගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම කියවිය යුතුය

**හැඳින්වීම**

**මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි විෂය පථය.**

1. අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය ඇතුළත්ව අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවශ්‍යකරන අවබෝධය මගින් මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීමෙහිදී විගණකවරයාගේ වගකීමට අදාලව මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය කටයුතු කරයි.

**බලපැවැත්වෙන දිනය**

2. 2015 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය කෙරෙහි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. බලපවත්වයි.

**අරමුණ**

3. අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය ඇතුළත්ව අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීම මගින් මූල්‍ය ප්‍රකාශ සහ සැදහුම් මට්ටම් වලදී වංචාවන් සහ වැරදීම් නිසා හෝ හේතුකොට ගෙන වුවද ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීමත්, එමගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානමට ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට පදනමක් සැපයීමත් විගණකවරයාගේ අරමුණය.

**නිර්වචන**

4. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි අරමුණු සඳහා පහත දැක්වෙන පද ඒවාට අනුයුක්ත අර්ථ ගනියි.

(අ) සැදහම් - සිදුවිය හැකි විවිධ වර්ග වල භව්‍ය අවප්‍රකාශ කෙරෙහි සැලකිලිමත් වීමට විගණකවරයා විසින් භාවිතයට ගනු ලබන මූල්‍ය ප්‍රකාශ වල ඉපහැදිලිව හෝ අන්අයුරකින් ඇතුලත් බවට කළමනාකාරිත්වය විසින කෙරෙන් නියෝජිතයන් වේ

(ආ) ව්‍යාපාරික අවදානම - අස්තිත්වයකට එහි අරමුණු සපුරාගැනීමේ හැකියාව කෙරෙහිත්, එහි උපායමාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහිත් අහිතකර බලපෑම් සිදුකරන ක්‍රියාකාරකම් හෝ අක්‍රීයවීම් හෝ අයෝග්‍ය අරමුණු සහ උපාය මාර්ග හේතුකොට ගෙන සැලකිය යුතු තත්වයන්, සිදුවීම්, වාතාවරණයන්ගේ ප්‍රතිඵලයක් වන අවධානමක්

(ඇ) අභ්‍යන්තර පාලනය - මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සඵලදායකත්වය සහ කාර්යක්ෂමභාවය සහ අදාල නීති සහ රෙගුලාසි සමග අනුකූල වීම පිළිබඳව අස්තිත්වයෙ අරමුණුවලට සාධාරණ සහතිකක් සැපයීම සඳහා පාලනය භාර අය කළමනාකාරීත්වය සහ අනිත් පිරිස් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබන ක්‍රියාවලියයි. අභ්‍යන්තර පාලනයෙහි සංරචක එකක හෝ කිහිපයක සංරචක වලටත් පාලනය යන පදය අදාල වෙයි

(ඈ) අවදානම් තක්සේරු ක්‍රියාවලිය - මූල්‍ය ප්‍රකාශ සහ සැදහුම් මට්ටම් වලදී වංචා හෝ අවදානම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් හඳුනාගැනීම සඳහා වූ අභ්‍යන්තර පාලනය ඇතුළුව අවතින්තවය හා එහි පරිසරය තේරුම් ගැනීම පිණිස ඉටු කරන විගණක පටිපාටිය

(ඉ) සැලකිය යුතු අවදානම - විගණකවරයාගේ විනිශ්චයට අනුව විශේෂ විගණන අවධානයක් අවශ්‍ය කෙරෙන හඳුනාගත් සහ තක්සේරු කළ අවප්‍රකාශ අවදානම

**අවශ්‍යතා**

**අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම්**

5. මූල්‍ය ප්‍රකාශ සහ සැදහුම් මට්ටම් වලදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා පදනමක් ලබා ගැනීමට විගණකවරයා විසින් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි ඉටුකළ යුතුය. කෙසේ වුවද හුදෙක් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි වලින් පමණක්ම විගණන මතය පදනම් කරගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි නොසැපයෙයි. (අ.1-අ.5 ඡේද බලන්න)

6. අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි වලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.

(අ) විගණකවරයාගේ විනිශ්චයට අනුව වංචාවන් සහ වැරදීම් හේතු කොටගත් අවප්‍රකාශ වල අවදානම් හඳුනාගැනීම සඳහා සහාය විය හැකි අන්දමේ තොරතුරු සතුයැයි සිතිය හැකි කළමනාකාරිත්වයේ, අභ්‍යන්තර විගණන කාර්යයේ නියුතු අදාල වන පුද්ගලයින් (එම කාර්යය පවතීනම්), සහ අස්තිත්වයෙහි අනෙකුත් අය කෙරෙන් තොරතුරු විමසා බැලීම (අ.6 ඡේදය සිට අ.13 බලන්න)

(ආ) විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි (අ.14-අ.17 ඡේද බලන්න)

(ඇ) නිරීක්‍ෂණය සහ පරීක්‍ෂා කිරීම (අ.18 ඡේදය බලන්න)

7. විගණකවරයාගේ සේවාදායක පිළිගැනීම හෝ අඛණ්ඩ ක්‍රියාවලිය හෝ මගින් ලබාගත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම තක්සේරු කිරීම කෙරෙහි අදාල වන්නේද යන්න කෙරෙහි විගණකවරයා සැලකිලිමත් විය යුතුය.

8. කාර්යයේ නියුතු හවුල්කරු අස්තිත්වයෙහි වෙනත් කාර්යන් ඉටු කර ඇත්නම් ලබාගත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීමට අදාල වන්නේද යන්න කෙරෙහි කාර්යයේ නියුතු හවුල්කරු සැලකිලිමත් විය යුතුය.

9. අස්තිත්වය සමග විගණකවරයාගේ පූර්ව අත්දැකීම් හරහා ලබාගත් තොරතුරු සහ පූර්ව විගණන වලදී ක්‍රියාත්මක කළ විගණන ක්‍රියාපටිපාටි වලින් ලබාගත් තොරතුරු ප්‍රයෝජනයට ගැනීමට විගණකවරයා අදහස් කරන්නේ නම් පූර්ව විගණනයට පසුව ප්‍රවර්ථන විගණනයෙහි අදාලත්වයට බලපෑම් සිදු කෙරෙන වෙනස්වීම් සිදුවී ඇත්ද යන්න විගණකවරයා නිශ්චය කරගත යුතුය. (අ.19 - අ.20 ඡේද බලන්න)

10. අස්තිත්වයෙහි මූල්‍ය ප්‍රකාශ වලට ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ කෙරෙහි පවත්නා නැඹුරුවත්, අස්තිත්වයෙහි සත්‍ය කරුණු සහ තත්වයනට භාවිත මූල්‍ය වාර්තාකරණ රාමුවෙහි ව්‍යවහාරකරණය කාර්යයේ නියුතු හවුල්කරු සහ අනෙකුත් කාර්යයේ නියුතු ප්‍රමුඛ සාමාජිකයින් විසින් සාකච්ඡා කළයුතුය. සාකච්ඡාවට සහභාගි නොවූ කාර්යයේ නියුතු කණ්ඩායම් සාමාජිකයින්ට කවර කරුණු සන්නිවේදනය කළයුතුද යන්න කාර්යයේ නියුතු හවුල්කරු විසින් නිශ්චය කළයුතුය. (අ.21 - අ.23 ඡේද බලන්න)

**අස්තිත්වයේ අභ්‍යන්තර පාලනය ඇතුළුව අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවශ්‍යකරන අවබෝධය**

*අස්තිත්වය සහ එහි පරිසරය*

11. විගණක පහත සඳහන් දෑ පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය.

(අ) අදාල කර්මාන්තය, නියාමනය අදාල මූල්‍ය වාර්තාකරණ රාමුව ඇතුළත්ව අනෙකුත් බාහිර සාධක (අ.24-අ.29 ඡේද බලන්න)

(ආ) පහත සඳහන් දෑ ඇතුළත්ව අස්තිත්‍වයෙහි ස්වභාවය

(i) එහි මෙහෙයුම්;

(ii) එහි හිමිකම සහ පාලන ව්‍යුහයන්;

(iii) අස්තිත්වය විසින් සිදුකරනු ලබන සහ සිදු කිරීමට සැලසුම් කළ ආයෝජන වර්ග. විශේෂිත අරමුණ අස්තිත්වයන්හි ආයෝජන ඇතුළත්ව, සහ

(iv) අස්තිත්වය ව්‍යුහගත කර ඇති ආකාරය සහ එය මූල්‍යකරණය කර ඇත්තේ කෙසේද යන්න

ගනුදෙනු පන්තින්, ගිණුම් ශේෂ සහ මූල්‍ය ප්‍රකාශ වල අපේක්‍ෂා කළහැකි හෙළිදරව් කිරීම් පිළිබඳව අවබෝධ කරගැනීමට මෙමගින් විගණකවරයාට හැකියාව ලැබෙයි. (අ.30-අ.34 ඡේද බලන්න)

(ඇ) අස්තිත්වයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාරකරණය, ඒවාට කරන ලද වෙනස් කිරීම් වලට හේතුද ඇතුළත්ව. අස්තිත්වයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති එහි ව්‍යාපාරයට යෝග්‍ය වන්නේද යන්නත් අදාල කර්මාන්තයෙහි භාවිත කරන මූල්‍ය වාර්තාකරණ අකෘතිමය රාමුව සමග අනුකූල වන්නේද යන්නත් විගණකවරයා ඇගයීමට ලක් කළයුතුය. (35 ඡේදය බලන්න)

(ඈ) ප්‍රතිඵල විලසින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානාත්මකම මතු වීමට ඉඩ ඇති අස්තිත්වයෙහි අරමුණු සහ උපායමාර්ග සහ සම්බන්ධිත වන ව්‍යාපාරික අවදානම්. (අ.36-අ.42 ඡේද බලන්න)

(ඉ) අස්තිත්වයෙහි මූල්‍ය කාර්යසාධනය මැණීම සහ සමාලෝචනය (අ.43-අ.48 ඡේද බලන්න)

*අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය*

12. විගණනයට අදාලව අභ්‍යන්තර පාලන පිළිබඳ අවබෝධයක් විගණකවරයා ලබාගත යුතුය. විගණනයට අදාල වන පාලන බොහෝමයක් මූල්‍ය වාර්තාකරණයට අදාල විය හැකි වුවද මූල්‍ය වාර්තාකරණයට අදාල වන පාලන

සියල්ලම විගණනයට අදාල නොවේ. පාලනයක් තනිව හෝ අනෙකුත් පාලක හා සම්බන්ධවී විගණනයට අදාල වන්නේද යන්න විගණකවරයාගේ වෘත්තීය විනිශ්චයට සම්බන්ධ කරුණකි. (අ.49-අ.72 ඡේද බලන්න)

අදාල පාලනවල අවබෝධයෙහි ස්වභාවය හා ප්‍රමාණය

13. විගණනයට අදාල අභ්‍යන්තර පාලන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේදී විගණක විසින් එම පාලන වල සැලසුම ඇගයීමට භාජනය කර අස්තිත්වයෙහි පුද්ගලයින් කෙරෙන් විමසීම් කිරීමට අමතරව පටිපාටි ක්‍රියාත්මක කිරීමෙන් ඒවා භාවිතයට යොදාගෙන ඇත්ද යන්න නිර්ණය කළයුතුය. (අ.73-අ.75 ඡේද බලන්න)

අභ්‍යන්තර පාලනයෙහි සංරචක

පාලන පරිසරය

14. පාලන පරිසරය පිළිබඳව අවබෝධයක් විගණක ලබාගත යුතුය. මෙම අවබෝධය ලබාගැනීමේ කොටසක් වශයෙන් විගණක විසින් පහත සඳහන් දෑ ඇගයීමට භාජනය කළයුතුවේ.

(අ) කළමනාකරණය විසින් පාලන කාර්යභාරය පවරී ඇති අයගේ අධීක්ෂණය සහිතව අවංකභාවය සහ සදාචාර සම්පන්න චර්යා රටාවන් තිබෙන සංස්කෘතියක් බිහිකර පවවත්වාගෙන යනු ලබන අතර සහ

(ආ) පාලන පරිසරයේ මූලිකාංගවල ශක්තීන් අභ්‍යන්තර පාලනයෙහි අනෙකුත් සංරචක සඳහා උචිත පදනම සාමූහික ලෙස සැලසුම් කරන්නේද යන්න සහ එම අනෙකුත් සංරචක පාලන පරිසරයේ ඌනතා මඟින් ක්ෂයවීමක් නොකෙරේදැයි බැලීම. (අ.76-අ.86 ඡේද බලන්න)

අස්තිත්වයෙහි අවදානම් ඇගයීම් ක්‍රියාවලිය

15. විගණක විසින්, අස්තිත්වය සතුව පහත සඳහන් දෑ පිළිබඳව ක්‍රියාවලියක් පවත්නේදැයි අවබෝධයක් ලද යුතුය.

(අ) මූල්‍ය වාර්තාකරණ අරමුණු වලට අදාලව ව්‍යාපාරික අවදානම් හඳුනාගැනීම.

(ආ) අවදානම් වල වැදගත්කම ඇස්තමේන්තු කිරීම

(ඇ) ඒවා සිදුවීමට ඇති හැකියාව තක්සේරු කිරීම සහ

(ඈ) එම අවදානම් ඇමතීම සඳහා ක්‍රියාමාර්ග තීරණය කිරීම. (අ.87 ඡේදය බලන්න)

16. අස්තිත්වය විසින් එවැනි ක්‍රියාවලියක් (මින් ඉදිරියට "අස්තිත්වයෙහි අවදානම් තක්සේරු ක්‍රියාවලිය නමින් හඳුන්වනු ලබන) ස්ථාපනය කර ඇත්නම් විගණක විසින් එම ක්‍රියාවලියත් එහි ප්‍රතිඵලත් පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. කළමනාකාරිත්වය විසින් හඳුනාගැනීමට අසමත්වී ඇති අවප්‍රකාශන සම්බන්ධ ප්‍රමාණාත්මක අවදානම් විගණක විසින් හඳුනාගනු ලබන්නේ නම් අස්තිත්වයෙහි අවදානම් තක්සේරු ක්‍රියාවිධිය මඟින් හඳුනාගත යුතුව තිබුණු ලෙස විගණක බලාපොරොත්තු වන අන්දමේ අභ්‍යන්තරික අවදානමක් එහි වේදැයි විගණක විසින් ඇගයිය යුතුය. එවැනි අවදානමක් පවත්නේ නම් යථෝක්ත ක්‍රියාවලිය එය හඳුනාගැනීමට අසමත් වූයේ කවර හේතුවක් නිසාද යන්න පිළිබඳව විගණක අවබෝධයක් ලබාගත යුතු අතර ක්‍රියාවලිය එහි වාතාවරණයට යෝග්‍ය වන්නේද යන්න ඇගයීම හෝ අස්තිත්වයෙහි අවදානම් තක්සේරු ක්‍රියාවලියට අදාලවන අභ්‍යන්තර පාලනයෙහි ඌනතාවයක් වේද යන්න නිශ්චය කිරීම විගණක විසින් සිදුකළ යුතුය.

17. අස්තිත්වය විසින් එවැනි ක්‍රියාවලියක් ස්ථාපනය කර නොමැති නම් හෝ තත්කාර්ය ක්‍රියාවලියක් අනුගමනය කරන්නේ නම් මූල්‍ය වාර්තාකරණ අරමුණුවලට අදාල ව්‍යාපාරික අවදානම් හඳුනාගනු ලැබ ඇත්තේද යන්නත් ඒවා කවර ආකාරයකින් ආමන්ත්‍රණය කර ඇත්තේද යන්නත් පිළිබඳව විගණක කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළයුතුය. අවදානම් තක්සේරු කිරීමේ ලේඛනගත ක්‍රියාවලියක් නොවීම තත්වයන් යටතේ යෝග්‍ය වන්නේද යන්න ඇගයීම හෝ එයින් අභ්‍යන්තර පාලනයෙහි සැලකිය යුතු ඌනතාවයක් නියෝජනය වන්නේද යන්න නිර්ණය කිරීමත් විගණක විසින් කළයුතුය. (අ.88 ඡේදය බලන්න)

සම්බන්ධිත ව්‍යාපාරික ක්‍රියාවලියන් ඇතුළත්ව මූල්‍ය වාර්තාකරණය සහ සන්නිවේදනයට අදාල තොරතුරු පද්ධතිය.

18. ව්‍යාපාරික ක්‍රම විධි ඇතුළත්ව මූල්‍ය වාර්තාකරණය සහ සන්නිවේදනයට අදාල තොරතුරු පද්ධතිය පිළිබඳ අවබෝධයක් පහත සඳහන් විෂය පථය ඇතුළුව විගණක ලබාගත යුතුය.

(අ) අස්තිත්වයෙහි මෙහෙයුම් වලදී මූල්‍ය ප්‍රකාශ වලට වැදගත් වන ගණුදෙනු පන්තිය

(ආ) ගණුදෙනු ආරම්භ කිරීම වාර්තා කිරීම, සකස් කිරීම, අවශ්‍ය පරිදි නිවැරදි කිරීම් සිදු කිරීම, පොදු ලෙජරයට මාරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කිරීම සිදු කෙරෙන තොරතුරු තාක්ෂණික (IT) සහ හස්ත ක්‍රමය දෙවර්ගයෙහිම ක්‍රියාපටිපාටි

(ඈ) ගනුදෙනු ආරම්භ කිරීම, ලේඛනගත කිරීම, සැකසීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන, මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් සහායක තොරතුරු, නිශ්චිත ගිණුම් සහ සම්බන්ධීත ගිණුම් ලේඛන, වැරදි තොරතුරු නිවැරදි කිරීම සහ තොරතුරු පොදු ලෙජරයට මාරු කරනු ලබන අන්දමද මීට ඇතුළත්ය. ලේඛන, හස්ත හෝ ඉලෙක්ට්‍රොනික යන ස්වරූපයෙන් කවර ආකාරයෙන් වුවද විය හැකිය.

(ඇ) මූල්‍ය ප්‍රකාශ වලට වැදගත් වන ගණුදෙනු හැර සිද්ධීන් සහ තත්වයන් තොරතුරු පද්ධතිය විසින් ග්‍රහණය කරගන්නේ කෙසේද යන්න

(ඉ) වැදගත් ගිණුම් ඇස්තමේන්තු සහ හෙළිදරව් කිරීම් ඇතුළත්ව අස්තිත්වයෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහිදී භාවිත කරනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය. සහ

(ඊ) පුනරාවර්තන නොවන, අසාමාන්‍ය ගනුදෙනු හෝ ගැලපුම් ලේඛනගත කිරීමට භාවිත කළ ප්‍රමිත නොවන ජර්නල් සටහන්ද ඇතුළත්ව ජර්නල් සටහන් ආවරණය කෙරෙන පාලනය. (අ.89-අ.93 ඡේද බලන්න)

19. පහත සඳහන් දෑ ඇතුළත්ව අස්තිත්වය විසින් මූල්‍ය වාර්තාකරණ භූමිකාව සහ වගකීම් සහ මූල්‍ය ප්‍රකාශ වලට සම්බන්ධ වැදගත් කරුණු සන්නිවේදනය කරන අන්දම පිළිබඳව විගණක අවබෝධයක් ලබාගත යුතුය. (අ.94-අ.95 ඡේද බලන්න)

(අ) පාලන කාර්යභාරය පැවරී ඇති අයවලුන් සහ කළමනාකාරිත්වය අතර සන්නිවේදන සහ

(ආ) නියාමන අධිකාරිය වැනි බාහිර පිරිස් සමග සන්නිවේදන

විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම්

20. සැඳහුම් මට්ටමෙහි ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් තක්සේරු කිරීමට සහ තක්සේරු කළ අවදානම් වලට ප්‍රතිචාර දක්වන අමතර විගණන පටිපාටි සැලසුම් කිරීමට අවශ්‍යවේයැයි විගණක තීරණය කරන විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් පිළිබඳව විගණක අවබෝධයක් ලබාගත යුතුය. සෑම සැලකියයුතු අන්දමේ ගනුදෙනු පන්තියකට, ගිණුම් ශේෂයකට සහ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමකට හෝ ඒවාට අදාල සෑම සැඳහුමකට අදාල වන සියළුම පාලන සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීම විගණනයකදී අවශ්‍ය නොකෙරෙයි. (අ.96-අ.102 ඡේද බලන්න)

21. අස්තිත්වයෙහි පාලන ක්‍රියාකාරකම් අවබෝධ කරගැනීමෙහිදී තොරතුරු තාක්‍ෂණය කෙරෙන් පැනනගින අවදානම් වලට අස්තිත්වයට කෙසේ ප්‍රතිචාර දැක්වූවේද යන්න පිළිබඳව විගණක අවබෝධයක් ලබාගත යුතුය. (අ.103-අ.105 ඡේද බලන්න.)

පාලනයන් අධීක්‍ෂණය

22. අස්තිත්වය මූල්‍ය වාර්තාකරණයෙහිදී යොදාගන්නා අවශ්‍ය අභ්‍යන්තර පාලන, විගණනයට අදාල එකී පාලන ක්‍රියාකාරකම්ද ඇතුළත්ව සහ එහි පාලන වල ඌනතාවයන් සම්බන්ධයෙන් පිළියම් කටයුතු කෙසේ ආරම්භ කරන්නේද යන්න පිළිබද වන ප්‍රමුඛ ක්‍රියාකාරකම් ගැන විගණකවරයා අවබෝධයක් ලබාගත යුතුය. (අ.98-අ.100 ඡේද බලන්න)

23. අස්තිත්වය සතුව අභ්‍යන්තර විගණන ක්‍රියාදාමයක්[1] වේනම්, විගණකවරයා අභ්‍යන්තර විගණන ක්‍රියාදාමයෙහි වගකීම් වල ස්වභාවය, එහි සංවිධානත්මක තත්වය සහ අභ්‍යන්තර විගණන ක්‍රියාදාමය මගින් ඉටු කරනු ලබන හෝ ඉටුකිරීමට ඇති ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය. (අ.109-අ.116) ඡේද බලන්න)

24. අස්තිත්වයෙහි අධීක්‍ෂණ ක්‍රියාකාරකම් වල භාවිතා කරනු ලබන තොරතුරු වල ප්‍රභවයන් සහ තොරතුරු අපේක්‍ෂිත පරමාර්ථය සඳහා ප්‍රමාණවත් විශ්වසනීයභාවයෙන් යුක්තසේ කළමනාකාරිත්වය සලකනුයේ කවර පදනමක් මතද යන්න (අ.117 ඡේදය බලන්න) පිළිබඳව විගණකවරයා අවබෝධයක් ලබාගත යුතුය.

**ප්‍රමාණාත්මක අවප්‍රකාශන වල අවදානම හඳුනාගැනීම් සහ තක්සේරු කිරීම**

25. අමතර විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සඳහා පදනමක් වශයෙන් පහත සඳහන් මට්ටම් වලදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම විගණක විසින් හඳුනාගත යුතුය.

[1] ශ්‍රී.ල.වි.ප්‍ර. 610 අභ්‍යන්තර විගණකගේ වැඩ භාවිතා කිරීම හි 12 ඡේදයෙහි "අභ්‍යන්තර විගණන ක්‍රියාදාමය" ශ්‍රී.ල.වි.ප්‍ර. සඳහා නිර්වචනය කර ඇත.

(අ) මූල්‍ය වාර්තාකරණ මට්ටම; සහ (අ 118-අ 121 ඡේද බලන්න)

(ආ) ගනුදෙනු පන්ති ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් සඳහා සැදහුම් මට්ටමේදී (අ.122-අ.126 ඡේද බලන්න)

26. මෙම අරමුණ සඳහා විගණක

(අ) අවදානම් වලට සම්බන්ධ අදාල පාලනයන් සහ මූල්‍ය ප්‍රකාශ වල ගණුදෙනු පන්තීන්. ගිණුම් ශේෂයන් හෙළිදරව් කිරීම් සැලකිල්ලට ගැනීම ඇතුළුව අස්තීත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයන් ලබා ගැනීම මගින් ක්‍රියාවලිය පුරාම වන අවධානම හඳුනාගැනීම. (අ.127-අ.128 ඡේද බලන්න)

(ආ) හඳුනාගත් අවදානම් තක්සේරු කළයුතු අතර එම අවදානම් මූල්‍ය ප්‍රකාශ වලට සමස්ත වශයෙන් ව්‍යාප්තවී බොහෝ සැදහුම් කිරීම් කෙරෙහි බලපෑම් සිදු කිරීමේ හැකියාවක් පවත්නේද යන්න ඇගයිය යුතුය.

(ඇ) විගණක පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන අදල පාලන සැලකිල්ලට ගෙන, සැදහුම් මට්ටමේ දී වැරදිය හැකි දෑ වලට හඳුනාගත් අවදනම් සම්බන්ධිත කිරීම (අ.129-අ.131 ඡේද බලන්න)

(ඈ) බහුවිධ අවප්‍රකාශද ඇතුළත්ව අවප්‍රකාශ පැවතීමේ හැකියාව සහ භව්‍ය අවප්‍රකාශය ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් විය හැකි විශාලත්වයෙන් යුක්ත වන්නේද යන්න කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

*විශේෂ විගණන අවධානය අවශ්‍ය කෙරෙන අවදානම්*

27. 25 වැනි ඡේදයෙහි විස්තර කර ඇති අවදානම් තක්සේරු කිරීමෙහි කොටසක් ලෙස විගණකවරයාගේ විනිශ්චයට අනුව, හඳුනාගනු ලැබූ අවදානම් අතරින් කිසිවක් හෝ සැලකිය යුතු අවදානමක් වන්නේද යන්න විගණක නිර්ණය කළයුතුය. මෙම විනිශ්චයෙහිදී විගණක අවදානමට අදාල හඳුනාගත් පාලන වල බලපෑම් ඉවත් කළයුතුය.

28. කවර අවදානම් සැලකියයුතු අවදානම් වේද යන්න විනිශ්චය කිරීමෙහිදී විගණකවරයා අවම වශයෙන් පහත දැක්වෙන දෑ සැලකිල්ලට ගත යුතුය.

(අ) අවදානම වංචාවක අවදානමක්ද යන වග

(ආ) අවදානම මෑත කාලීන ආර්ථික, ගිණුම්කරණ හෝ වෙනත් වර්ධන විකාශනයකට අදාල වන්නේද සහ ඒ හේතුවෙන් ඊට විශේෂ අවධානය යොමුවිය යුතුද යන්න

(ඇ) ගනුදෙනු වල සංකීර්ණ භාවය

(ඈ) අවදානම සම්බන්ධිත පාර්ශවයන් සමඟ වූ සැලකියයුතු ගණුදෙනු හා බැඳී පවත්නේද යන්න

(ඉ) අවදානමට සම්බන්ධිත මූල්‍ය තොරතුරු මිණුම් කිරීමෙහි විෂයානුබද්ධ භාවයෙහි මට්ටම, විශේෂයෙන්ම මිණුම් කිරීම් අවිනිශ්චිතාවය පුළුල් පරාසයක් ගන්නා මිණුම් කිරීම්; සහ

(ඊ) අස්තිත්වයෙහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බාහිර සැලකියයුතු ගණුදෙනු හෝ වෙනත් ආකාරයකින් අසාමාන්‍ය ලෙස පෙනීයන ගනුදෙනු අවදානමට සම්බන්ධවී ඇත්ද යන්න. ( අ132 - අ136 ඡේද බලන්න)

29. සැලකිය යුතු අවදානමක් පවතින බව විගණක නිර්ණය කරන්නේ නම් විගණකවරයා එම අවදානමට අදාල පාලන ක්‍රියාකාරකම් ඇතුළත්ව අස්තිත්වයෙහි පාලන ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුය.(ආ 137 -ආ 139 ඡේද බලන්න)

*තහවුරු කිරීමේ පටිපාටි මගින් පමණක් ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි සපයනු නොලබන අවදානම්*

30. තහවුරු කිරීමේ පටිපාටි වලින් පමණක් ඇතැම් අවදානම් පිළිබඳව ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි බව හෝ ප්‍රායෝගික නොවන බව විගණක විසින් විනිශ්චය කරනු විය හැකිය. එවැනි අවදානම් හස්ත මැදිහත්වීම අල්ප වන හෝ හස්ත මැදිහත්වීමක් නොමැති ස්වභාවය ගන්නා ඉහළ ස්වයංක්‍රීය ක්‍රියාවලි වලට අවකාශ සලසා ඇති සැලකියයුතු චර්යානුගත ගනුදෙනු කාණ්ඩ හෝ ගිණුම් ශේෂ වල වැරදි හෝ අසම්පූර්ණ සටහන් වීම් වලට අදාල විය හැකියි. එවැනි අවස්ථා වලදී එබඳු අවදානම් කෙරෙහි වන අස්තිත්වයෙහි පාලන විගණනයට අදාල වන අතර විගණකවරයා ඒ පිළිබඳව අවබෝධයක් ලබාගතයුතු වෙයි. (අ.140-අ142 ඡේද බලන්න)

*අවදානම් තක්සේරු කිරීම සංශෝධනය කිරීම*

31. සැදහුම් මට්ටමෙහිදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පිළිබඳ විගණකගේ තක්සේරුව විගණනය අතරවාරයෙහිදී අමතර විගණන සාක්ෂි ලබාගැනීම සමඟ වෙනස් විය හැකිය. විගණකවරයා විසින් වඩාදුරට විගණන පටිපාටි ඉටුකිරීම

මගින් විගණන සාක්ෂි ලබාගන්නා තත්වයන්හිදී හෝ නව තොරතුරු ලබාගන්නේ නම්, මේ දෙකින් එකක් විගණක මූලික අවස්ථාවෙහිදී තක්සේරු කිරීම සඳහා පදනම් කරගත් විගණන සාක්ෂි සමග අසන්තතික නොවන විට විගණක විසින් තක්සේරු කිරීම සංශෝධනය කර ඉදිරියට සැලසුම් කර ඇති විගණන ක්‍රියාපටිපාටි ඊට අනුකූලව වෙනස් කළයුතුය. (143 ඡේදය බලන්න)

**ලේඛනගත කිරීම**

32. විගණකවරයා විසින් විගණන ප්‍රලේඛන වල පහත සඳහන් දෑ ඇතුළත් කළයුතුය[2].

(අ) 10 වැනි ඡේදයට අනුව කාර්යයේ නියුතු කණ්ඩායම අතර සිදුවූ සාකච්ඡා සහ එළඹගත් වැදගත් තීරණ

(ආ) අස්තිත්වය සහ එහි පරිසරය ගැන 11 වැනි ඡේදයෙහි නියම කර ඇති ඇති එක් එක් පැතිකඩ සම්බන්ධයෙන් සහ 14-24 ඡේදවල නියම කර දක්වා ඇති එක් එක් අභ්‍යන්තර පාලන සංරචක සම්බන්ධයෙන් ලබාගත් අවබෝධයෙහි ප්‍රමුඛ මූලිකාංග; සංරචක අවබෝධය ලබාගත් තොරතුරු වල ප්‍රභවය සහ ඉටුකරන ලද අවදානම් තක්සේරු ක්‍රියා පටිපාටි.

(ඇ) මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහිදී සහ සැදහුම් මට්ටමෙහිදී 25 වැනි ඡේදයෙන් අවශ්‍ය කෙරෙන පරිදි හඳුනාගත් සහ තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම්; සහ

(ඈ) 27-30 ඡේද වල අවශ්‍යතාවයන්හි ප්‍රතිඵල ලෙස විගණකවරයා විසින් අවබෝධයක් ලබා ගන්නා ලද හඳුනාගත් අවදානම් සහ සම්බන්ධිත පාලන (අ.144-අ.147 ඡේද බලන්න)

**ව්‍යවහාරකරණය සහ වෙනත් පහදා දීමේ දෑවල්**

**අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම්** (5 ඡේදය බලන්න)

අ1 අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය ඇතුළත්ව (මින් ඉදිරියට "අස්තිත්වය අවබෝධකර ගැනීම" යනුවෙන් සඳහන් වන) අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම විගණනය පුරාම අඛණ්ඩව පවත්වාගෙන යන, තොරතුරු එක්රැස් කිරීමේත් යාවත්කාලීන කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේත් ගතික ක්‍රියාවලියකි. අවබෝධය මගින් විගණක විගණනය පුරාම, විගණනය සැලසුම් කරන සහ වෘත්තීය විනිශ්චය භාවිතා කරන අන්දමට අදාලවන නිර්දේශ රාමුවක් ස්ථාපනය කරනු ලබයි. උදාහරණ වශයෙන්

- මූල්‍ය ප්‍රකාශ වල අවප්‍රකාශ වල අවදානම තක්සේරු කිරීම.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 320[3] අනුව ප්‍රමාණාත්මක භාවය නිර්ණය කිරීම.
- ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීමෙහි සහ ව්‍යවහාරකරණයේ උචිතභාවය, මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව සලකා බැලීම;
- විශේෂ විගණන අවධානයක් අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනාගැනීම අවශ්‍ය විය හැකිය, උදාහරණ ලෙස සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය පිළිබඳ කළමනාකාරිත්වයෙහි භාවිතයේ යෝග්‍යතාවය හෝ ගණුදෙනු වල ව්‍යාපාරික අරමුණු සලකා බැලීම.
- විශ්ලේෂණාත්මක පටිපාටි ඉටු කිරීමේදී භාවිතය සඳහා අපේක්ෂා වර්ධනය කිරීම
- ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට අමතර වන විගණන පටිපාටි සැලසුම් කිරීම හා ඉටු කිරීම ඇතුළුව තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශන වලට ප්‍රතිචාර දැක්වීම සහ
- උපකල්පන වල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වයෙහි වාචික සහ ලිඛිත නියෝජිතයන්ගෙන් වැනි ලබාගත් විගණන සාක්ෂිවල ප්‍රමාණාත්මක බව සහ උචිත බව ඇගයීම.

අ2. අවදානම් තක්සේරු කිරීමේ පටිපාටි ඉටු කිරීමෙන් සහ සම්බන්ධිත ක්‍රියාකාරකම් මගින් ලබාගත් තොරතුරු විගණකවරයා විසින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් තක්සේරු කිරීම තහවුරු කරන විගණන සාක්ෂි ලෙස භාවිතා කරනු විය හැකිය. ඊට අමතරව විගණකවරයා විසින් ගනුදෙනු පන්තිවල, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් සහ සම්බන්ධිත සැදහුම් සහ පාලන වල මෙහෙයුම් සඵලදායිත්වය පිළිබඳවද විගණන සාක්ෂි, එම

[2] ශ්‍රී.ල.වි.ප්‍ර. ගණන ප්‍රලේඛන " 8-11 ඡේද සහ අ 6 ඡේදය"
[3] ශ්‍රී.ල.වි.ප්‍ර. 320 "විගණනයක් සැලසුම් කිරීමෙහිදී සහ ඉටු කිරීමෙහිදී ප්‍රමාණාත්මකභාවය"

ක්‍රියාපටිපාටි තහවුරු පටිපාටි හෝ පාලන පරීක්ෂා වශයෙන් විශේෂිතව සැලසුම් කර නොමැති වුවද, විගණකවරයා විසින් ලබාගනු විය හැකිය. අවදානම් තක්සේරු පටිපාටියට සමගාමීව තහවුරු කිරීමේ පටිපාටි හෝ පාලන පරීක්ෂා ක්‍රියාත්මක කිරීමටද, එසේ කිරීම කාර්යක්ෂම වන බැවින් විගණකවරයා විසින් තෝරා ගනු ලැබිය හැකිය.

අ3 අවශ්‍ය කරන අවබෝධයෙහි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා විගණකවරයා වෘත්තීය විනිශ්චය උපයෝගී කරගනියි. විගණකගේ ප්‍රාථමික සැලකිලිමත් වීම වනුයේ ලබාගෙන ඇති අවබෝධය මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි සඳහන් අරමුණු සපුරාගැනීමට ප්‍රමාණවත් වන්නේද යන්න කෙරෙහිය. විගණකවරයාට අවශ්‍ය කෙරෙන සමස්ථ අවබෝධයෙහි ගැඹුර අස්තිත්වය කළමනාකරණය සඳහා කළමනාකාරිත්වය සතු අවබෝධය තරම් ගැඹුරු නොවෙයි.

අ4. වැරදීම් හේතුකොටගත් අවදානම් සහ වංචා හේතු කොට ගත් අවදානම් යන දෙවර්ගයම තක්සේරු කළයුතු අවදානම් වලට ඇතුළත් වන අතර ඒ දෙවර්ගය ම මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි ආවරණය වෙයි. කෙසේ වුවද වංචාව කෙරෙහි වඩාත් සැලකිලිමත් විය යුතු වනුයෙන් වංචාවන් හේතුකොට ගන්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීමට භාවිතා කෙරෙන තොරතුරු ලබාගැනීමට අදාල වන අවදානම් තක්සේරු පටිපාටි සහ සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව වැඩිමනත් අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 240[4] අන්තර්ගතය.

අ5. අස්තිත්වය පිළිබඳ අවශ්‍ය කෙරෙන අවබෝධය ලබාගැනීමේදී 6 වැනි ඡේදයෙහි විස්තර කෙරෙන අවදානම් තක්සේරු කිරීමේ පටිපාටි සියල්ල ඉටු කිරීම විගණකවරයාගෙන් අවශ්‍ය කෙරෙන නමුත් (11-24 ඡේද බලන්න) එම අවබෝධය ලබාගැනීමේ එක් එක් පැතිකඩ සම්බන්ධයෙන් ඒ සියල්ල විගණක ඉටු කිරීම අවශ්‍ය නොකෙරෙයි. වෙනත් ක්‍රියාපටිපාටියකින් ලබාගත හැකි තොරතුරු ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සඳහා ආධාර වන විට එවැනි ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කරනු විය හැකිය. එවැනි ක්‍රියාපටිපාටි වලට පහත සඳහන් උදාහරණ ඇතුළත් ය.

- වානිජ සහ ආර්ථික සඟරා, විශ්ලේෂකවරුන්ගේ, බැංකුවල, හෝ වර්ගීකරණ ආයතන හෝ නියාමන හෝ මූල්‍ය ප්‍රකාශ වලින් ලබා ගත් තොරතුරු සමාලෝචනය කිරීම.

- අස්තිත්වයෙහි බාහිර නීති උපදේශකවරුන්ගෙන් හෝ අස්තිත්වය සේවය ලබාගන්නා තක්සේරු විශේෂඥයින් කෙරෙන් විමසීම් කිරීම.

*අස්තිත්වයෙහි කළමනාකාරිත්වයෙන්, අභ්‍යන්තර විගණන කාර්යයෙන් සහ අස්තිත්වයෙහි වෙනත් අයගෙන් විමසීම් කිරීම.(6 අ ඡේදය බලන්න)*

අ6. විගණකවරයා ලබාගන්නා තොරතුරු වලින් සැහෙන කොටසක් කළමනාකාරිත්වයෙන් සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ වගකීම දරන්නවුන් කෙරෙන් විගණකගේ විමසීම් කිරීම මගින් ලබාගනියි. විගණකවරයා විසින් අස්තිත්වයෙහි අභ්‍යන්තර විගණක කාර්යයක් ඇත්නම් එයිනුත්, අස්තිත්වයෙහි අනෙකුත් අයගෙනුත් කරනු ලබන විමසීම් හරහා තොරතුරු ලබාගනියි.

අ7. විගණකවරයා අස්තිත්වයෙහි අනෙකුත් අයගෙන් හෝ අනෙකුත් බලතල මට්ටම් වල සේවකයින් කෙරෙන් විමසීම් කිරීම හරහාද ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනාගැනීමේදී තොරතුරු හෝ වෙනත් ආකාර මගින්ද ලබාගනියි. උදාහරණයක් වශයෙන්.

- පාලන කාර්යභාරය දරන්නන්ට යොමු කෙරෙන විමසීම් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන පරිසරය අවබෝධකර ගැනීමට විගණකවරයාට උපකාරීවෙයි. මෙහිදී විගණකවරයාට සහයෝගය පිණිස එළදායී ද්විපාර්ශ්වීය සන්නිවේදනය පාලන බලධාරීන් කෙරෙන් තොරතුරු ලබාගැනීමට වැදගත් වන අන්දම ශ්‍රී.ල.වි.ප්‍ර. 260[5] හඳුනා ගනී.

- සංකීර්ණ හෝ අසාමාන්‍ය ගනුදෙනු ආරම්භ කිරීම, සැකසීම, හෝ ලේඛනගත කිරීම සම්බන්ධ සේවකයින්ගෙන් විමසීම් කිරීම එක්තරා ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීමෙහි සහ භාවිතා කිරීමෙහි උචිතභාවය ඇගයීමට විගණකට උපකාරී විය හැකිය.

- අස්තිත්වයෙහි සේවක මණ්ඩලයට අයත් නීති උපදේශකවරුන්ට යොමු කෙරෙන විමසීම් මඟින් නඩු හබ, නීති රෙගුලාසි අනුගමනය කිරීම, අස්තිත්වයට බලපෑම් කෙරෙන වංචා සහ වංචනික ලෙස සැකකරනු ලබන සිදුවීම්, ප්‍රතිඥාහාර, අලෙවියෙන් පසු බැදීම්, ව්‍යාපාරික හවුල්කරුවන් සමග (බද්ධ ව්‍යාපාර වැනි) විධිවිධාන සහ ගිවිසුම් වගන්ති වල අර්ථ වැනි කරුණු ලබාගත හැකිය.

[4] ශ්‍රී.ල.වි.ප්‍ර. 240 "මූල්‍ය ප්‍රකාශන විගණනයකදී වංචාවට සම්බන්ධ වන විගණකවරයාගේ වගකීම්" 12-24" ඡේද
[5] ශ්‍රී.ල.වි.ප්‍ර. 240 "මූල්‍ය ප්‍රකාශන විගණනයකදී වංචාවට සම්බන්ධ වන විගණකවරයාගේ වගකීම්" 12-24" ඡේද

- අලෙවිකරණ හෝ වෙළඳ කාර්ය මණ්ඩලයට යොමු කෙරෙන විමසීම් මඟින් අස්තිත්වයෙහි අලෙවිකරණ මූලෝපායයන්හි වෙනස්වීම්, විකුණුම් නැඹුරුතා හෝ එහි ගණුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් ගත කටයුතු පිළිබඳ අවබෝධය සැපයෙයි.

- අවදානම් කළමනාකරණ පද්ධතියට (හෝ එවැනි කාර්යභාර්යයන් ක්‍රියාත්මක කරන අයට) ගොනු කරන ලබන විමසීම් හරහා මූල්‍ය වාර්තාකරණය කෙරෙහි බලපාන මෙහෙයුම් සහ රෙගුලාසිමය අවදානම් පිළිබඳ තොරතුරු සපයනු ලබනු විය හැකිය.

- තොරතුරු පද්ධතියෙහි පුද්ගලයින්ට යොමු කෙරෙන විමසුම් මඟින් ක්‍රියාපද්ධතියේ වෙනස්වීම් ක්‍රියාපද්ධති හෝ පාලක පසුබට වීම හෝ තොරතුරු ක්‍රියාපද්ධතිය ආශ්‍රිත අනෙකුත් අවදානම් පිළිබඳව තොරතුරු සැපයෙනු විය හැකිය.

අ.8 අස්තිත්වය සහ එහි වටපිටාව අවබෝධ කරගැනීම අඛණ්ඩ ගතික ක්‍රියාදාමයක් වනුයෙන් විගණනය පුරාම විගණකවරයාගේ විමසීම් සිදුවේ.

අභ්‍යන්තර විගණන පද්ධතියෙන් විමසුම්

අ.9 අස්තිත්වයෙහි අභ්‍යන්තර විගණන පද්ධතියක් ඇත්තේනම් පද්ධතියෙහි අදාල පුද්ගලයන්ගෙන් කරනු ලබන විමසීම් අස්තිත්වය සහ එහි වටපිටාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීමෙහිදී මූල්‍ය ප්‍රකාශ සහ සැඳහුම් මට්ටම් වල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අවදානම් හඳුනාගැනීමෙහි සහ තක්සේරු කිරීමෙහි දී විගණකවරයාට ප්‍රයෝජනවත් තොරතුරු සැපයේ. අභ්‍යන්තර විගණන පද්ධතිය එහි කාර්යභාර්යය ක්‍රියාත්මක කිරීමෙහිදී අස්තිත්වයේ මෙහෙයුම් සහ ව්‍යාපාරික අවදානම් පිළිබඳව අභ්‍යන්තරික අවබෝධයක් ලබාගෙන තිබිය හැකි බැවින් ඒ කාර්යභාර්යයේ පදනමින් හඳුනාගනු ලැබූ පාලක ඌනතාවන් හෝ අවදානම් වැනි සොයාගැනීම් ඔවුන් සතුවිය හැකි බැවින් අස්තිත්වයේ අවදානම් තක්සේරු කිරීමට හෝ විගණනයේ වෙනත් අංශ අවබෝධ කරගැනීමෙහිදී විගණකවරයාගේ ව්‍යායාමයට අගනා දායකත්වයක් සැපයේ. ක්‍රියාත්මක කරනු ලබන විගණන පටිපාටි වල කාලපරාසයෙහි ස්වභාවය විකරණය කිරීමට හෝ ව්‍යාප්තිය අඩුකිරීමට අභ්‍යන්තර විගණන පද්ධතියෙහි මෙහෙයුම් ප්‍රතිඵල උපයෝගී කරගැනීමට විගණකවරයා අපේක්ෂා කරන්නේද නැද්ද යන්න සලකා බැලීමට ඒ අයුරින් අභ්‍යන්තර විගණන පද්ධතියෙහි මෙහෙයුම් ප්‍රතිඵල උපයෝගී කරගැනීමට විගණකවරයා අපේක්ෂා කරන්නේද නැද්ද යන්න සලකා බැලීමට ඒ අයුරින් විගණකවරයාගේ සැලසුම් සිදුකරනු ලැබේ.[6] බලයලත් පුද්ගලයින් සමඟ අභ්‍යන්තර විගණන පද්ධතිය ඉස්මතු කර ඇති කරුණු සහ පද්ධතියේ ස්වීය අවදානම් තක්සේරු කිරීම් පද්ධතියෙහි ප්‍රතිඵල සම්බන්ධයෙන් විශේෂිත අවධානය යොමු කරන විමසීම් සිදුවිය හැකිය.

අ.10 විගණකවරයාගේ විමසුම් වලට ලැබෙන ප්‍රතිචාර මත පදනම්ව අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණ සහ විගණන කටයුතු වලට අදාල විය හැකි සොයාගැනීම් පවත්නා බව පෙනී යන්නේ නම් අභ්‍යන්තර විගණන පද්ධතියේ අදාල වාර්තා කියවීම යෝග්‍ය ලෙස විගණකවරයා අදහස් කරනු ඇත. අභ්‍යන්තර විගණන පද්ධතියේ පරීක්ෂණ වල සොයාගැනීම් විස්තර කෙරෙන, කළමනාකාරිත්වය හෝ බලයලත් පුද්ගලයින් සඳහා සුදානම් කරනු ලැබ ඇති පද්ධතියේ උපායාමාර්ග සහ සැලසුම් ලිපිලේඛන සහ වාර්තා මෙහිදී අදාල වන අභ්‍යන්තර විගණන පද්ධතියෙහි වාර්තා පිළිබඳ උදාහරණ වලට ඇතුළත්ය.

අ.11 ඊට අමතරව ශ්‍රී.ල.වි.ප්‍ර. 240[7] අනුව සිදුවී ඇති, සැකකරනු ලබන හෝ ප්‍රෝක්ත වංචාවක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පද්ධතිය විගණකවරයාට තොරතුරු සපයන්නේ නම් වංචාව නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ හඳුනාගැනීමේදී විගණකවරයා එය සැලකිල්ලට ගත යුතුය.

අ.12 විමසීම් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණක පද්ධතියට ඇතුළත් අදාල පුද්ගලයින් වනුයේ විගණකවරයාගේ විනිශ්චයට අනුව ප්‍රමාණවත් දැනුමක් සහ පළපුරුද්ද සහිත උචිත බලතල ඇති, ප්‍රධාන අභ්‍යන්තර විගණන විධායක හෝ වාතාවරණයට අනුව පද්ධතිය තුළ වෙනත් පුද්ගලයින්ය. එම පුද්ගලයින් සමඟ වරින්වර රැස්වීම් පැවැත්වීම යෝග්‍ය විය හැකි බවද විගණකවරයාගේ සැලකිල්ලට භාජනය වනු ඇත.

රාජ්‍ය අංශයේ අස්තිත්ව සම්බන්ධයෙන් විශේෂිතව සැලකිලිමත් විය යුතු කරුණු. (යොමුව: 6(අ) ඡේදය).

අ.13 රාජ්‍ය අංශයේ අස්තිත්ව වල විගණනයන් සිදුකරන විගණකවරුන්ට අභ්‍යන්තර පාලනය සහ අදාල නීති රෙගුලාසි පිළිපැදීම සම්බන්ධ අමතර වගකීම් බොහෝ විට පැවරේ. අදාල වන්නා වූ නීති රෙගුලාසි නොපිළිපැදීමේ අවදානම

[6] අභ්‍යන්තර විගණන පද්ධතියේ 6 අදාල අවශ්‍යතා ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) හි අන්තර්ගතය.

[7] ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 240 - මූල්‍ය ප්‍රකාශන විගණනයක් කිරීමේදී වංචා සලකා බැලීමට විගණකවරයාගේ ඇති වගකීම්

සහ මූල්‍ය වාර්තාකරණ කෙරෙහි අදාල අභ්‍යන්තර පාලනයෙහි ඌනතා අවදානම හඳුනාගැනීමේදී අභ්‍යන්තර විගණන පද්ධතියෙහි අදාල පුද්ගලයින් කෙරෙන් කරනු ලබන විමසීම් විගණකවරයාට උපකාරී වනු ඇත.

*විශ්ලේෂණාත්මක පටිපාටි* (6 (ආ) ඡේදය බලන්න)

අ14. අවදානම් තක්සේරු පටිපාටි වශයෙන් විශ්ලේෂණාත්මක පටිපාටි ක්‍රියාත්මක කිරීමෙන් තක්සේරු කළ අවදානම් වලට ප්‍රතිචාර සැලසුම් කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් පදනමක් සකස් කරගැනීම සඳහා විගණක නොදත් එහෙත් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ තක්සේරු කිරීමෙහිදී උපකාරී විය හැකි අස්තිත්වයෙහි පැතිකඩවල් හඳුනා ගැනෙනු විය හැකිය. අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි වශයෙන් ඉටු කෙරෙන විශ්ලේෂණ ක්‍රියාපටිපාටි වලට මූල්‍යමය සහ මූල්‍යමය නොවන දෙආකාරයෙහිම තොරතුරු ඇතුලත්විය හැකිය. උදාහරණ ලෙස විකුණුම් සහ විකුණුම්කරන භූමියෙහි වර්ග අඩි ප්‍රමාණය හෝ විකුණුම් කළ භාණ්ඩ පරිමාව අතර සම්බන්ධතාවය.

අ15. අසාමාන්‍ය සිදුවීම් හෝ ගනුදෙනු, විගණනය කෙරෙහි බලපෑමක් සිදු කෙරෙන අන්දමේ ඇඟවීම කෙරෙන වටිනාකම්, අනුපාත සහ පැවැත්ම හඳුනාගැනීම සඳහා විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි උපකාරීවිය හැකිය. හඳුනාගනු ලබන අසාමාන්‍ය හෝ අනපේක්ෂිත සම්බන්ධතා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් විශේෂයෙන් වංචාවන් හේතුකොටගත් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වල අවදානම් හඳුනාගැනීමේදී විගණකවරයාට සහාය විය හැකිය.

අ16. කෙසේ වුවද ඉහළ මට්ටමක සමාහරණය වූ දත්තයන් එවැනි විශ්ලේෂණ පටිපාටියකදී භාවිත කරන ලද නම් (අවදානම් ඇගයීමේ පටිපාටි වශයෙන් විශ්ලේෂණාත්මක පටිපාටි ඉටු කරනු ලබන විට සිදුවන පරිදි) එවැනි විශ්ලේෂණාත්මක පටිපාටි වල ප්‍රතිඵල මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබිය හැකිද යන්න පිළිබඳව පුළුල් මූලික ඇඟවීමක් සපයනු ලබයි. ඒ අනුව, එවැනි අවස්ථාවලදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීමේදී එක්රැස් කරගෙන ඇති තොරතුරු එකී විශ්ලේෂණාත්මක පටිපාටි වල ප්‍රතිඵලද සමඟ සැලකිල්ලට ගැනීම විශ්ලේෂනාත්මක පටිපාටියෙහි ප්‍රතිඵල අවබෝධ කරගැනීමටත්, ඇගයීමටත් විගණකවරයාට උපකාරී විය හැකිය.

කුඩා පරිමාණ අස්තිත්වයන් සම්බන්ධයෙන් විශේෂිත වන සැලකිය යුතු කරුණු

අ17. විශ්ලේෂණාත්මක පටිපාටි අරමුණු සඳහා උපයෝගී කරගත හැකි අතුරු හෝ මාසික මූල්‍ය තොරතුරු ඇතැම් වඩාත් කුඩා අස්තිත්වයන් හි නොතිබිය හැකිය. මෙවැනි තත්වයන් යටතේ විගණනය සැලසුම් කිරීම අරමුණු කරගත් සීමිත විශ්ලේෂණාත්මක පටිපාටි ක්‍රියාත්මක කිරීමට හෝ විමසා බැලීමෙන් තොරතුරු සමහරක් ලබාගැනීමටත් විගණකවරයාට හැකියාව තිබිය හැකි නමුත් අස්තිත්වයෙහි මෑත කාලීන මූල්‍ය ප්‍රකාශ කෙටුම්පතක් ලබාගත හැකි විට ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වල අවදානම හඳුනාගැනීමට විශ්ලේෂණාත්මක පටිපාටි ක්‍රියාත්මක කිරීමට විගණකවරයාට අවශ්‍ය විය හැකිය.

*නිරීක්ෂණය සහ පරීක්ෂා කිරීම* (6 (ඇ) ඡේදය බලන්න)

අ18. නිරීක්ෂණයට සහ පරීක්ෂණයට කළමනාකරණයේ සහ අනෙකුත් අයගේ විමසීම් වලට සහාය විය හැකි වන අතර අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ තොරතුරු සැපයිය හැකි වේ. එවැනි විගණන පටිපාටි වලදී උදාහරණ ලෙස ඇතුලත් වන්නේ පහත දැක්වෙන නිරීක්ෂණ සහ පරීක්ෂා කිරීම් ඇතුළත් ය.

- අස්තිත්වයෙහි මෙහෙයුම්
- ලියකියවිලි (ව්‍යාපාර සැලසුම් සහ උපායමාර්ග වැනි), ලේඛන සහ අභ්‍යන්තර පාලන අත්පොත්.
- කළමනාකාරිත්වය විසින් පිළියෙල කරන ලද (ත්‍රෛමාසික පාලන වාර්තා සහ අතුරු මූල්‍ය ප්‍රකාශ වැනි) සහ පාලන බලතල ඇත්තවුන් විසින් පිළියෙල කළ (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් වැනි) වාර්තා
- අස්තිත්වයෙහි පරිශ්‍ර සහ පිරියත පහසුකම්

*පෙර කාලපරිච්ඡේද වල ලබාගත් තොරතුරු* (9 ඡේදය බලන්න)

අ19. අස්තිත්වය සමඟ විගණකගේ පෙරවූ අත්දැකීම් සහ කළින් විගණන වලදී ඉටු කළ විගණන පටිපාටි මඟින් පහත දැක්වෙන ආකාරයේ කරුණු පිළිබඳව තොරතුරු විගණකවරයාට සැපයෙනු විය හැකිය;

- අතීත අවප්‍රකාශ සහ එම අවප්‍රකාශ කාලීන පදනමක් අනුව නිවැරදි කරන ලද්දේද යන වග
- අස්තිත්වයෙහි සහ එහි පරිසරයේ ස්වභාවය සහ (අභ්‍යන්තර පාලනයෙහි ඌනතාවයන්ද ඇතුළත්ව) අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය.

- පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදයෙහි පටන් අස්තිත්වය සහ එහි මෙහෙයුම් භාජනයවී තිබිය හැකි අවප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට අස්තිත්වය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලබාගැනීමට විගණකවරයාට උපකාරී විය හැකි සැලකිය යුතු වෙනස්වීම්.

අ20. පෙර කාලපරිච්ඡේද වලදී ලබාගත් තොරතුරු ප්‍රවර්ථන විගණනය සඳහා භාවිතා කිරීමට විගණක අදහස් කරන්නේ නම් එම තොරතුරු වල අදාලත්වය තවදුරටත් පවත්නේද යන්න නිර්ණය කිරීම විගණකවරයාගෙන් අවශ්‍ය කෙරෙයි.

ඇතැම් වෙනස්වීම් වල, උදාහරණයක් ලෙස පාලන පරිසරයේ වෙනස්වීම් පසුගිය වර්ෂයෙහි ලබාගත් තොරතුරු කෙරෙහි බලපෑම් සිදුකළ හැකිවීම ඊට හේතුවය. එවැනි තොරතුරු වල අදාලත්වය කෙරෙහි බලපෑම් සිදු කළ හැකි අන්දමේ වෙනස්වීම් සිදුවී ඇත්ද යන්න නිශ්චය කිරීම සඳහා විගණකවරයා විමසීම් සිදුකිරීම සහ අදාල ක්‍රියා පද්ධතිවල ඔස්සේ ගමන් කිරීම වැනි වෙනත් විගණක පටිපාටි විගණකවරයා විසින් යොදා ගනු විය හැකිය.

*කාර්යයේ නියුතු කණ්ඩායම අතර සාකච්ඡා* (10 ඡේදය බලන්න)

අ21. අස්තිත්වයෙහි මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අවප්‍රකාශන වලට නැඹුරු විමට ඇති ඉඩකඩ සම්බන්ධයෙන් කාර්යයේ නියුතු කණ්ඩායම් අතර සාකච්ඡා කිරීම මඟින්;

- කාර්යයේ නියුතු හවුල්කරු ඇතුළත්ව කාර්යයේ නියුතු කණ්ඩායමෙහි වැඩි අත්දැකීම් ඇති සාමාජිකයින්ට අස්තිත්වය පිළිබඳව ඔවුන්ගේ දැනුම මත පදනම්ව ඔවුන්ගේ ඇතුළු නුවණ හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් සලසනු ලබයි.

- අස්තිත්වයට බලපෑම් විය හැකි ව්‍යාපාරික අවදානම් පිළිබඳවත්, වංචාවන් හෝ වැරදීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලට නැඹුරු විය හැක්කේ කවර අවස්ථාවලදී කිනම් ආකාරයකින්ද යන්න පිළිබඳවත් තොරතුරු හුවමාරු කරගැනීමට කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ට ඉඩ සැලසෙයි.

- පැවරුම් කණ්ඩායමේ සාමාජිකයින්ට ඔවුන්ට විශේෂිතව නියමිත ක්ෂේත්‍රයන්හි මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැවතීමේ හැකියාව සම්බන්ධව වැඩි අවබෝධයක් ලබාගැනීමට සහය වන අතර ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විගණන පටිපාටිවල ප්‍රතිඵල ඉදිරි විගණන පටිපාටිවල ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය ඇතුළත්ව විගණනයෙහි අනෙකුත් අංශ කෙරෙහි බලපානු ඇති අන්දම අවබෝධකර ගැනීමටද ඔවුන්ට උපකාරී වෙයි.

- ප්‍රමාණාත්මක අව ප්‍රකාශවල අවදානම තක්සේරු කිරීමෙහිදී හෝ එකී අවදානම් ආමන්ත්‍රණය කිරීමේ විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී බලපෑම් සිදුකළ හැකි වන, විගණනයෙහිදී ලබාගත් නව තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා පැවරුම් කණ්ඩායම් සාමාජිකයින්ට පදනමක් සකස් කරනු ලබයි.

වංචා සහගත[8] අවදානම් පිළිබඳව කාර්යේ නියුතු කණ්ඩායම අතර සාකච්ඡා සඳහා වැඩිමනත් අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 240න් සලසනු ලබයි.

අ22. එක් තනි සාකච්ඡාවකට කාර්යයේ නියුතු කණ්ඩායමෙහි සියලුම සාමාජිකයින් ඇතුළත් කිරීමට අවශ්‍ය නොවන අතර (උදාහරණයක් ලෙස බහු ස්ථානීය විගණනයක් වැනි) සාකච්ඡාවෙහිදී එළඹුණු නිගමන පිළිබඳව කාර්යභායේ නියුතු කණ්ඩායමෙහි සියළුම සාමාජිකයින් දැනුවත් කිරීමද අවශ්‍ය නොවේ. කාර්යභාරයේ නියුතු හවුල්කරු විසින් කාර්යභාරයේ නියුතු කණ්ඩායමෙහි ප්‍රමුඛ සාමාජිකයින් සමග, උචිත යැයි සැලකෙන්නේ නම් නිශ්චිත කුසලතා හෝ දැනුම සහිත අය සහ සංරචකයන් විගණන සම්බන්ධයෙන් වගකිව යුත්තන්ද ඇතුළත්ව, කරුණු සාකච්ඡා කරමින් අනෙකුත් අය සමඟ සාකච්ඡා සඳහා බලය පවරමින් කාර්ය භාරයේ නියුතු කණ්ඩායම සමඟ පැවැත්විය යුතු සන්නිවේදනයෙහි ප්‍රමාණය කෙරෙහි සැලකිලිමත්ව සාකච්ඡා පවත්වනු විය හැකිය. කාර්ය භාරයේ නියුතු කළමනාකරුගේ එකගතාවය සහිත සන්නිවේදන සැලැසුමක් ප්‍රයෝජනවත් විය හැකිය.

කුඩා අස්තිත්වයන් සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණු

අ23. බොහෝ කුඩා පරිමාන විගණන සියල්ලම සිදු කෙරෙනුයේ (තනි වෘත්තිකයකු විය හැකි) කාර්යභාරයේ නියුතු හවුල්කරු විසිනි. එවැනි තත්වයන්හිදි විගණනය පුද්ගලිකව සැලසුම් කිරීම මෙහෙයවා ඇති කාර්යභාරයේ නියුතු

---

[8] ශ්‍රී.ල.වි.ප්‍ර. 240, 15 වැනි ඡේදය බලන්න.

හවුල්කරුට අස්තිත්වයෙ මූල්‍ය ප්‍රකාශන වල වංචා හෝ වැරදීම් හේතුකොටගත් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ කෙරෙන් සැලකිලිමත් වීමේ වගකීම පැවරෙයි.

**අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය ඇතුළත්ව අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවශ්‍ය කෙරෙන අවබෝධය**

**අස්තිත්වය සහ එහි පරිසරය**

*කර්මාන්තමය, නියාමන සහ අනෙකුත් බාහිර සාධක* (11.(අ) ඡේදය බලන්න)

කර්මාන්තමය සාධක

අ24. තරගකාරී වාතාවරණය, සැපයුම්කරුවන් සහ ගණුදෙනුකරුවන් සමග සම්බන්ධතා සහ තාක්ෂණික දියුණුව වැනි කර්මාන්තමය තත්වයන් කර්මාන්තමය සාධක වලට ඇතුළත්ය. විගණකවරයා සැලකිලිමත් වන කරුණු වලට පහත සඳහන් උදාහරණ ඇතුළත් විය හැකිය.

- ඉල්ලුමද ඇතුළත්ව වෙළෙඳපොල සහ තරගකාරිත්වය, ධාරිතාව සහ මිල තරගකාරිත්වය
- චක්‍රීය හෝ වරානු කළ ක්‍රියාකාරකම්
- අස්තිත්වයේ නිෂ්පාදිතයන්ට අදාල වන නිෂ්පාදන තාක්ෂණය
- බලශක්ති සැපයුම සහ පිරිවැය

අ25 අස්තිත්වය ක්‍රියාත්මක වන කර්මාන්තය තුළ ව්‍යාපාරයෙහි ස්වභාවය හෝ රෙගුලාසි මට්ටම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ සම්බන්ධ විශේෂිත අවදානම් පැන නැගිය හැකිය. උදාහරණ ලෙස දිගුකාලීන කොන්ත්‍රාත්තු වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගීමට හේතු කාරක වන සැලකියයුතු ආදායම් ඇස්තමේන්තු පැවතිය හැකිය. එවැනි අවස්ථා වලදී ඊට අදාල ප්‍රමාණවත් දැණුම සහ අත්දැකීම් ඇති සාමාජිකයින් කාර්යභාරයේ නියුතු කණ්ඩායමට ඇතුළත්වීම වැදගත්ය[9]

නියාමන සාධක

අ26. අදාල නියාමන සාධකවලට නියාමන වාතාවරණය ඇතුළත්වෙයි. නියාමන වටපිටාව මඟින් ආවරණය කරනු ලබන වෙනත් කරුණුද සමග අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සහ නෛතික හා දේශපාලන පරිසරය ඇතුළත්ය. විගණකවරයා සැලකිලිමත් විය යුතු කරුණු වලට පහත සඳහන් දෑ ඇතුළත් වෙයි.

- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කර්මාන්තයට නිශ්චිත පරිචයන්
- නියාමනය කරන ලද කර්මාන්තයක් උදෙසා වන නියාමන රාමුව
- සෘජු අධීක්ෂණ ක්‍රියාකාරකම් ඇතුළත්ව අස්තිත්වයෙහි මෙහෙයුම් කෙරෙහි සැලකියයුතු ලෙස බලපෑම් සිදුකරන ව්‍යවස්ථාමය සහ රෙගුලාසි
- බදුකරණය (සංස්ථාපිත බදු සහ වෙනත්)
- අස්තිත්වයෙහි තත්කාලීන ව්‍යාපාරික ක්‍රියා මෙහෙයවීම කෙරෙහි බලපෑම් කරන, විදේශ විනිමය පාලනය ඇතුළත්ව මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මුදල්, මුල්‍යමය දිරිගැන්වීම් (උදාහරණ වශයෙන් රජයේ ආධාර වැඩසටහන්) තීරුබදු හෝ වානිජ්‍ය සීමාකිරීම් ප්‍රතිපත්ති වැනි රාජ්‍ය ප්‍රතිපත්ති
- කර්මාන්තය, අස්තිත්වයෙහි ව්‍යාපාරයත් කෙරෙහි බලපෑම් සිදුකෙරෙන පාරිසරික අවශ්‍යතාවයන්

අ27. අස්තිත්වයට සහ එය ක්‍රියාත්මක වන කර්මාන්තයට හෝ අංශයට අදාල වන උපයෝගී නෛතික සහ නියාමන ආකෘතිමය රාමුවට අදාල ඇතැම් නිශ්චිත අවශ්‍යතා ශ්‍රී.ල.වි.ප්‍ර. 250 ඇතුළත්ය.[10]

**රාජ්‍ය අංශයෙහි අස්තිත්වයට විශේෂිතවූ සැලකිලිමත් විම**

අ28. රාජ්‍ය අංශයේ අස්තිත්වයන්හි විගණනයෙහිදී නීතිය, රෙගුලාසි වෙනත් අධිකාරී අස්තිත්වයෙහි මෙහෙයුම් කෙරෙහි බලපෑම් සිදුකරයි. අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමෙහිදී එවැනි මූලිකාංග සලකා බැලීම අවශ්‍ය කෙරේ

[9] ශ්‍රී.ල.වි.ප්‍ර. 220 ''මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන තත්වය පාලනය'' 14 ඡේදය
[10] ශ්‍රී.ල.වි.ප්‍ර. 250 "මූල්‍ය ප්‍රකාශන විගණනයකදී නීති සහ රෙගුලාසි කෙරෙහි සැලකිලිමත් වීම" 12 වැනි ඡේදය

වෙනත් බාහිර සාධක

අ29. විගණකගේ සැලකිල්ලට යොමු විය යුතු අනෙකුත් බාහිර සාධක පිළිබඳ උදාහරණ වලට සමාන්‍ය ආර්ථික තත්වයන්, පොලී අනුපාත සහ මූල්‍යකරණය ලබාගත හැකි බව සහ උද්ධමනය හෝ ව්‍යවහාර මුදල් ප්‍රත්‍යාගණනය ඇතුළත්ය.

*අස්තිත්වයෙහි ස්වභාවය* (11 (ආ) ඡේදය බලන්න)

අ30. අස්තිත්වයක ස්වභාවය පිළිබඳ අවබෝධය මඟින් විගණකවරයාට අවබෝධ කරගත හැකි කරුණු වලට පහත සඳහන් දෑ ඇතුළත් වෙයි.

- අස්තිත්වයට සංකීර්ණ ව්‍යුහයක්, උදාහරණ වශයෙන් විවිධ ස්ථාන වල පරිපාලිත හෝ වෙනත් සංරචක, ඇත්තේද යන්න. සංකීර්ණ ව්‍යුහ මඟින් බෝහෝ විට ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගීමට හේතු කාරක විය හැකි මතභේදයට පාදකවන කරුණු හඳුන්වාදෙනු ලබයි. එවැනි කරුණු වලට කීර්තිනාමය, බද්ධ ව්‍යාපාර, ආයෝජන හෝ විශේෂිත පරමාර්ථ සඳහා වන අස්තිත්‍වයන් උචිතවන ගිණුම්කරණය කර ඇත්ද යන්න ඊට ඇතුළත් විය හැකිය.
- හිමිකම, සහ හිමිකරුවන් සහ වෙනත් පුද්ගලයින් හෝ අස්තිත්වයන් අතර සම්බන්ධතා, සම්බන්ධීත පාර්ශව සමග ගනුදෙනු යථාපරිදි හඳුනාගනු ලැබ සහ ගිණුම්ගත කරනු ලැබ ඇත්ද යන්න නිර්ණය කිරීමෙහිදී මෙම අවබෝධය උපකාරීවෙයි. සම්බන්ධිත පාර්ශව සම්බන්ධයෙන් අදාල වන සැලකිලිමත් විය යුතු කරුණු වල අවශ්‍යතාවය ස්ථාපනය කිරීමත් මාර්ගෝපදේශ සැපයීමත් ශ්‍රී.ල.වි.ප්‍ර. 550[11] මඟින් සිදුකෙරෙයි.

අ31. අස්තිත්වයෙහි ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේදී විගණකවරයා සැලකිලිමත් වන කරුණු සම්බන්ධ උදාහරණ වලට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකිය.

- පහත දක්වා ඇති අන්දමේ ව්‍යාපාරික මෙහෙයුම්
    - අන්තර්ජාල විකුණුම් සහ අලෙවිකරණ ක්‍රියාකාරකම් වැනි විද්‍යුත් වාණිජමය සහභාගීත්වය ඇතුළුව ආදායම් ප්‍රභවය නිශ්පාදන හෝ සේවා සහ වෙළඳපල වල ස්වභාවය.
    - මෙහෙයුම් හසුරුවන ආකාරය (උදාහරණ වශයෙන් නිෂ්පාදනයේ ක්‍රම සහ පියවර, හෝ පාරිසරික අවදානම් වලට නිරාවරණය වූ ක්‍රියාකාරකම් වැනි)
    - සන්ධාන, බද්ධ ව්‍යාපාර, සහ ක්‍රියාකාරකම් බාහිරකරණ
    - භූගෝලීය බෙදීයාම් සහ කර්මාන්ත කණ්ඩනය
    - නිෂ්පාදන පහසුකම්, ගුදම්, සහ කාර්යාල වල පිහිටීම සහ තොගවල ප්‍රමාණයන් සහ පිහිටීම්
    - ප්‍රමුඛ ගනුදෙනු කරුවන් සහ වැදගත් සැපයුම් කරුවන්, රැකියා වැඩ පිළිවෙළ (වෘත්තීය සමිති සමග ගිවිසුම් පැවතීම, විශ්‍රාම වැටුප් සහ වෙනත් පශ්චාත් සේවා ප්‍රතිලාභ කොටස් විකල්ප හෝ දිරිගැන්වීම් ප්‍රසාද දීමනා වැඩ පිළිවෙළ සහ රැකියාවෙහි යෙදවීම පිළිබඳව අදාල වන රජයේ රෙගුලාසි ඇතුළත්ව)
    - පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ වියදම්
    - සම්බන්ධීත පාර්ශ්ව සමග ගණුදෙනු
- පහත දැක්වෙන අන්දමේ ආයෝජන සහ ආයෝජන ක්‍රියාකාරකම්
    - සැලසුම් කළ හෝ මෑතදී සිදු කරන ලද අත්පත්කර ගැනීම් හෝ නිදහස් කිරීම
    - සුරැකුම් සහ ණය ආයෝජන සහ පැවරීම්
    - ප්‍රාග්ධන ආයෝජන ක්‍රියාකාරකම්
    - හවුල් ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර සහ විශේෂිත පරමාර්ථ අස්තිත්‍වයන්. ඇතුළු ඒකාබද්ධ නොකළ අස්තිත්වයේ ආයෝජනය
- පහත දැක්වෙන අන්දමේ මූල්‍යනය සහ මූල්‍යන ක්‍රියාකාරකය

[11] ශ්‍රී.ල.වි.ප්‍ර. 550 සම්බන්ධීත පාර්ශව"

- ප්‍රධාන පරිපාලිත සහ ආශ්‍රිත අස්තිත්වයන්, ඒකාබද්ධ කල සහ ඒකාබද්ධ නොකළ ව්‍යුහය ඇතුළත්ව.
- ණය ව්‍යුහය සහ අදාල කොන්දේසි, ශේෂ පත්‍රයට පරිබාහිර මූල්‍ය සැපයුම් සහ කල්බඳු විධිවිධාන.
- ප්‍රතිලාභ ලබන හිමිකරුවන් (දේශිය, විදේශීය, ව්‍යාපාරික ප්‍රසිද්ධිය සහ අත්දැකීම්) සහ සම්බන්ධිත පාර්ශව
- ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර භාවිතය

- පහත සඳහන් වන අන්දමේ මූල්‍ය වාර්තාකරණය
  - ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කර්මාන්තයට විශේෂිත පරිචයන්; කර්මාන්තයට විශේෂිත සැලකියයුතු කාණ්ඩ ප්‍රභේදයන් (උදාහරණ වශයෙන් බැංකු සම්බන්ධයෙන් ණය සහ ආයෝජන, හෝ ඖෂධ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු) ඇතුළත්ව
  - අයභාර හඳුනාගැනීමේ පරිචයන්
  - සාධාරණ අගය සඳහා ගිණුම්කරණය
  - විදේශ ව්‍යවහාර මුදල් වත්කම්, වගකීම් සහ ගනුදෙනු
  - අසාමාන්‍ය හෝ සංකීර්ණ ගනුදෙනු සඳහා ගිණුම්කරණය, මතභේදයකට තුඩු දෙන හෝ නැගීගෙන එන (උදාහරණ ලෙස කොටස් නිකුතු පදනම් වු හානිපූරණ ගිණුම්ගත කිරීම) ක්ෂේත්‍රයන්හි ගනුදෙනු ඇතුළත්ව.

අ32. පෙර කාලපරිච්ඡේදවල අස්තිත්වයෙහි සිදුවූ සැලකියුතු අන්දමේ වෙනස්වීම් වලින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගීම හෝ වෙනස්වීම් සිදුවිය හැකිය.

විශේෂිත අරමුණු අස්තිත්වයන්හි ස්වභාවය

අ33. ඇතැම් විට විශේෂ අරමුණුගත වාහකයන් ලෙස සඳහන් කරනු ලබන විශේෂ අරමුණු ගත අස්තිත්වයන්යනු කල් බදු දීමක් ක්‍රියාත්මත කරනු ලැබීමක් හෝ මූල්‍ය වත්කම් සුරක්ෂිත කරනය හෝ පර්යේෂණ හා සංවර්ධිත ක්‍රියාවලියන්හි යෙදීම බඳු පටු වූද මැනවින් නිර්වචනය කලා වූද අරමුණක් සඳහා සාමාන්‍යයෙන් පිහිටුවනු ලද අස්තිත්වයකි එය සංස්ථාවක්, භාරයක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාගත නොකළ අස්තිත්වයක් වැනි කිසියම් ස්වරූපයක් ගත හැකිය. විශේෂිත අරමුණුගත අස්තිත්වය වෙනුවෙන් බිහිකරනු ලැබූ අස්තිත්වය වත්කම් පැවරිය හැකි අතර අස්තිත්වයේ වත්කම් භාජනය සඳහා අයිතිය ලබා ගැනීම හෝ පසුව අස්තිත්වය සඳහා සේවා ඉටු කිරීමද කළ හැකි අතර අනෙකුත් පාර්ශව වලට පසුව කී අස්තිත්වයට අරමුදල් සැපයීම කළ හැකි වනු ඇත ඇතැම් තත්වයන් හිදී විශේෂිත අරමුණ අස්තීත්වයක් අස්තිත්වයක් අස්තිත්වයෙහි අදාළ පාර්ශවයක් විය බව ශ්‍රී.ල.වි.ප්‍ර. 550[12] හි දැක්වේ.

අ34. පාලනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්ද හෝ විශේෂිත අරමුණු ගත අස්තිත්වය ඒකාබද්ධ කරනය සඳහා සලකා බැලිය යුතු වන්නේ කවර අවස්ථාවන් යටතේද පිළිබඳ විස්තරාත්මක කොන්දේසිවලට වාර්තාකරණ ආකෘතිමය රාමුවේ බොහෝ විට නිශ්චිතව දැක්වේ එබඳු රාමුවල දැක්වෙන අවස්ථා අර්ථකථනය කිරීම සඳහා විශේෂ අරමුණු ගත අස්තිත්වයට සම්බන්ධ ඒ අදාල ගිවිසුම පිළිබඳ විස්තරාත්මක දැණුමක් බොහෝ විට අවශ්‍ය කෙරේ.

*අස්තිත්වයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාරකරණය.* (11 (ඇ) ඡේදය බලන්න)

අ35. අස්තිත්වයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාරකරණය පිළිබඳ අවබෝධය මඟින් පහත දැක්වෙන කරුණු ආවරණය කරනු ලබයි.

- සැලකිය යුතු සහ අසාමාන්‍ය ගනුදෙනු ගිණුම්ගත කිරීමේදී අස්තිත්වය භාවිතා කරන ක්‍රම
- විශ්වාසය තැබිය හැකි හෝ එකඟතාවයන් නොපවත්නා මතභේදයකට තුඩුදෙන හෝ හෝ නැගීගෙන එන ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වල බලපෑම
- අස්තිත්වයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම්
- අස්තිත්වයට අළුත් දේ විය හැකි මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ නීති රෙගුලාසි සහ එම අවශ්‍යතා අස්තිත්වය විසින් පිළිපදිනු ලබන්නේ කවර අවස්ථාවල කිනම් ආකාරයෙන්ද යන්න

[12] ශ්‍රී.ල.වි.ප්‍ර. 550 අ 7 ඡේදය

*අරමුණු සහ ක්‍රමෝපාය සහ අදාල ව්‍යාපාරික අවදානම්* (11 (ඈ) ඡේදය බලන්න)

අ36. කර්මාන්ත, නියාමන සහ අනෙකුත් අභ්‍යන්තර සහ බාහිර සාධක වලට සම්බන්ධවන අයුරින් අස්තිත්වය එහි ව්‍යාපාරය මෙහෙයවයි. මෙම සාධක වලට ප්‍රතිචාර දැක්වීමට අස්තිත්වයෙහි කළමනාකාරිත්වය හෝ පාලන කාර්යභාරය දරණ අය අස්තිත්වයෙහි සමස්ත සැලසුම් සඳහාවන අරමුණු නිර්වචනය කරති. උපායමාර්ග යනු අස්තිත්වයට එහි අරමුණු සපුරා ගනුවස් කළමනාකාරිත්වය විසින් අදහස් කරනු ලබන ප්‍රවේශයන්ය. අස්තිත්වයෙහි අරමුණු සහ ක්‍රමෝපාය කාලයත් සමඟ වෙනස් විය හැකිය.

අ37. ව්‍යාපාරික අවදානම තුළ මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම ඇතුළත් වුවද එය ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම වඩා පුළුල්ය. වෙනස්වීමෙන් හෝ සංකීර්ණත්වයෙන් ව්‍යාපාරික අවදානම පැනනැගිය හැකිය. වෙනසක් සඳහා අවශ්‍යතාවය හඳුනාගැනීමට අපොහොසත් වීම වුවද ව්‍යාපාරික අවදානම පැන නැගීමට හේතු විය හැකිය. උදාහරණ ලෙස පහත සඳහන් කරුණු වලින් ව්‍යාපාරික අවදානම පැන නැගිය හැකිය.

- අසාර්ථක විය හැකි නව නිෂ්පාදන හෝ සේවාවන් වර්ධනය කිරීම
- සාර්ථකව දියුණු කළ වෙළෙඳපලක් වුවද නිෂ්පාදිතයකට හෝ සේවාවකට සහාය වීමට ප්‍රමාණවත් නොවීම.
- නිෂ්පාදිතයක හෝ සේවාවක ඇති වගකීම් සහ පිළිගැනීම් අවදානම් උද්ගත කරන දෝෂ

අ38. ව්‍යාපාරික අවදානම් බහුතරයක් අවසානයේ මූල්‍යමය වශයෙන් ප්‍රතිවිපාක ඇතිකරන බැවින්ද, ඒ නිසාම මූල්‍ය ප්‍රකාශ මත බලපෑමක් ඇතිවන හෙයින්ද අස්තිත්වය මුහුණ දෙන ව්‍යාපාරික අවදානම් පිළිබඳ අවබෝධයක් මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනාගැනීමේ හැකියාව වැඩි කරනු ලබයි. එසේ වුවද, සියළුම ව්‍යාපාරික අවදානම් ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගීමට හේතුකාරක නොවන බැවින් සියළුම ව්‍යාපාරික අවදානම් හඳුනාගැනීම හෝ තක්සේරු කිරීම සඳහා වගකීම විගණකවරයාට නොපැවරෙයි.

අ39. මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානමක් සිදු කෙරෙන අන්දමේ අස්තිත්වයෙහි අරමුණු, ක්‍රමෝපාය සහ අදාල ව්‍යාපාරික අවදානම් පිළිබඳව අවබෝධයක් ලබාගැනීමෙහිදී විගණකගේ සැලකිල්ල යොමු විය යුතු කරුණු සඳහා උදාහරණ වලට පහත සඳහන් දෑ ඇතුළත් වෙයි.

- කර්මාන්ත වර්ධනය (උදාහරණයක් වශයෙන් කර්මාන්තයෙහි වෙනස්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි කටයුතු කිරීමට පිරිස් හෝ විශේෂඥතාවයක් අස්තිත්වයට නොමැතිවීම භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- නව නිෂ්පාදනය සහ සේවාවන් (උදාහරණයක් වශයෙන් නිෂ්පාදිත වගකීම ඉහළ යෑමක් පැවතීම භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- ව්‍යාපාරය පුළුල්වීම (උදාහරණයක් වශයෙන් ඉල්ලුම නිවැරදිව ඇස්තමේන්තු කර නොතිබීම භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- නව ගිණුම්කරණ අවශ්‍යතා (උදාහරණයක් වශයෙන් අසම්පූර්ණ හෝ අයෝග්‍ය ක්‍රියාත්මක කිරීම් හෝ පිරිවැය ඉහළ යෑම භව්‍ය සම්න්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- නියාමන අවශ්‍යතා (උදාහරණයක් වශයෙන් නීතිමය නිරාවරණයෙහි වැඩිවීම භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- ප්‍රවර්ථන සහ අපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා (උදාහරණයක් වශයෙන් අවශ්‍යතාවයන්ට මුහුණදීමට අස්තිත්වයට නොහැකිවීමෙන් සිදුවන මූල්‍යන අලාභ භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- තොරතුරු තාක්ෂණය භාවිතය (උදාහරණයක් වශයෙන් ක්‍රියාපද්ධති සහ ක්‍රියාවලි නොගැලපීම් භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)
- උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ බලපෑම්, විශේෂයෙන් නව ගිණුම්කරණ අවශ්‍යතා වලට යොමු කෙරෙන බලපෑම් (උදාහරණයක් වශයෙන් අසම්පූර්ණ හෝ අයෝග්‍ය ක්‍රියාත්මක කිරීම් භව්‍ය සම්බන්ධිත ව්‍යාපාරික අවදානමක් විය හැකිය)

අ40. ව්‍යාපාරික අවදානමක ක්ෂණික ප්‍රතිවිපාක ලෙස ගණුදෙනු පන්තීන්, ගිණුම් ශේෂ, කෙරෙහිත්, සැඳහුම් මට්ටම් සහ මූල්‍ය ප්‍රකාශ මට්ටම් වලදීත් පන්තියකට ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වල අවදානමක් තිබිය හැකිය උදාහරණයක් වශයෙන් සංකෝචනය වෙමින් පවත්නා ගණුදෙනුකරුවන් සමුදායයක් කෙරෙන් පැනනගින ව්‍යාපාරික අවදානම ලැබිය යුතු දැවල තක්සේරුව ආශ්‍රිත ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම ඉහළ නංවනු විය හැකිය. කෙසේ

වුවද, විශේෂයෙන් සංකෝචනය වන ආර්ථිකයක් සමග සංයෝජනයෙන් එම අවදානම ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පයෙහි අදාලත්වය තක්සේරු කිරීමෙහිදී විගණකගේ සැලකිල්ලට යොමුවන දිගු කාලීන ප්‍රතිවිපාක ඇති කරනු විය හැකිය. එබැවින් ව්‍යාපාරික අවදානමක ප්‍රතිඵලය ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් වනු ඇත්ද යන්න අස්තිත්වයෙහි වාතාවරණයට සාපේක්ෂව සලකා බලනු ඇත. ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හැඟවෙන තත්වයන් සහ සිදුවීම් වලට උදාහරණ 2වැනි පරිශිෂ්ඨයෙහි සඳහන් වී තිබෙයි.

අ41. සාමාන්‍යයෙන් ව්‍යාපාරික අවදානම් හඳුනාගන්නා කළමනාකාරිත්වය ඒවා ආමන්ත්‍රණය කිරීමට ප්‍රවේශයන් ගොඩනගා ගනියි. එවැනි අවදානම් තක්සේරු ක්‍රියාවලියක් අභ්‍යන්තර පාලනයෙහි කොටසක් වන අතර 15 වැනි ඡේදයෙහි සහ අ.87-අ.88 ඡේද වල සාකච්ඡා කෙරෙයි.

රාජ්‍ය අංශයේ අස්තිත්වයන්ට විශේෂිත සැලකියයුතු කරුණු

අ42. රාජ්‍ය අංශයේ අස්තිත්වයන් විගණනය සඳහා වන "කළමනාකාරිත්වයෙහි අරමුණු" කෙරෙහි මහජන වගකීම් පිළිබඳව සැලකිලිමත් විය යුතු වීම මගින් බලපෑම් සිදු කරනු ලැබිය හැකි අතර ඊට නීතිමය, රෙගුලාසිමය හෝ වෙනත් බලතල සහිත ආයතන ප්‍රභවයන් කරගත් අරමුණු ඇතුළත් විය හැකිය.

*අස්තිත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය මිණුම් කිරීම සහ සමාලෝචනය* (11 (ඉ) ඡේදය බලන්න)

අ43 වැදගත් යැයි සලකනු ලබන දෑ කළමනාකාරිත්වය සහ අනෙකුත් අය විසින් මිණුම් කර සමාලෝචනයට භාජනය කරනු ලබයි. කාර්ය සාධන මිණුම්කරණය, අභ්‍යන්තරික වේවා, බාහිර වේවා, අස්තිත්වය කෙරෙහි පීඩනයක් ඇති කරයි. මෙම පීඩනය පෙරලා ව්‍යාපාරික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශ අවප්‍රකාශ ලෙස ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වය කෙරෙහි පෙළඹවීම් සිදුකරයි. ඒ අනුව අස්තිත්වයෙහි කාර්ය සාධන මිණුම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට කළමනාකාරිත්වයෙහි ක්‍රියාකාරකම් වංචාවන්ද ඇතුළත්ව ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වල අවදානම ඉහළ නැංවීමට මෙම පීඩනය ඉවහල් වී දැයි සැලකිලිමත් වීම සඳහා විගණකට සහය වෙයි. අවධානම් සහ වංචා සම්බන්ධයෙන් වන උපදේශන සහ අවශයතාවයන් සඳහා ශ්‍රී.ල.වි.ප්‍ර. 240 බලන්න.

අ44. ඒවායෙහි අරමුණු අතිඡාදනය විය හැකි වූවත් මූල්‍යමය කාර්යය සාධනය මිණුම් කිරීම සහ සමාලෝචනයත් පාලන අධීක්ෂණයන් (අ.106-අ.117 ඡේදවල අභ්‍යන්තර පාලනවල සංරචකයන් ලෙස සාකච්ඡා කෙරෙන) එක සමාන නොවේ.

- කාර්ය සාධනය මිණුම් කිරීම සහ සමාලෝචනය දිශාගත වනුයේ කළමනාකාරිත්වය (හෝ තුන්වැනි පාර්ශව) විසින් නියම කළ අරමුණු ව්‍යාපාරික කාර්‍ය සාධනය මගින් සපුරාලන්නේ ද යන්න කෙරෙහිය.
- පාලන අධීක්ෂණය විශේෂයෙන් සැලකිලිමත් වනුයේ අභ්‍යන්තර පාලනයෙහි මෙහෙයුම් සඵලදායිත්වය කෙරෙහිය.

කෙසේ වුවද ඇතැම් අවස්ථාවල කාර්ය සාධන දර්ශක මගින්ද අභ්‍යන්තර පාලනයෙහි ඌනතා හඳුනාගැනීමට උපකාරී වන තොරතුරු කළමනාකාරිත්වයට සැපයෙයි.

අ45. මූල්‍ය කාර්ය සාධනය මිණුම් කිරීම සහ සමාලෝචනය සඳහා කළමනාකාරිත්වය විසින් භාවිතාකරනු ලබන, එමෙන්ම විගණකවරයා සැලකිලිමත් විය හැකි අභ්‍යන්තරිකව ජනනය වූ තොරතුරු වලට පහත දැක්වෙන උදාහරණ ඇතුළත්ය.

- ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක (මූල්‍යමය සහ මූල්‍යමය නොවන) සහ ප්‍රමුඛ අනුපාත, උපනතීන් සහ මෙහෙයුම් සංඛ්‍යාලේඛන
- කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට සාපේක්ෂිත මූල්‍යමය කාර්ය සාධන විශ්ලේෂණ
- අයවැය ලේඛන, පුරෝකථන, විචලතා විශ්ලේෂණ, ඛණ්ඩ තොරතුරු සහ ආංශික දෙපාර්තමේන්තුමය හෝ වෙනත් මට්ටම් වල කාර්ය සාධන වාර්තා
- සේවක කාර්ය සාධන මිණුම් සහ දිරිගැන්වීම් හානිපූරණ ප්‍රතිපත්ති
- අස්තිත්වයක කාර්‍ය සාධනය තරඟකරුවන්ගේ කාර්ය සාධනය සමග සැසඳීම.

අ46. බාහිර පාර්ශව විසින් ද අස්තිත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය මිණුම් කිරීමත් සමාලෝචනයත් සිදු කරනු විය හැකිය. උදාහරණයක් වශයෙන් විශ්ලේෂක වාර්තා සහ ණය ඇගයීමේ නියෝජිතත්ව වාර්තා මගින් විගණකවරයාට ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් විය හැකිය. එවැනි වාර්තා බොහෝවිට විගණනය කරනු ලබන අස්තිත්වයෙන් ලබාගත හැකිය.

අ47. කළමනාකාරිත්වයට සිය අභිමතාර්ථ මාර්ගය නිර්ණය කිරීමට සහ (ඇතැම් අවස්ථාවල අව ප්‍රකාශ අනාවරණය සහ කාලානුරූපව නිවැරදි කිරීම ඇතුළත්ව) නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය කෙරෙන ප්‍රතිඵල හෝ උපනතීන් අභ්‍යන්තරික මිණුම් කිරීම් මගින් කාලෝචිත පදනමක් මත හුවාදක්වනු විය හැකිය. සම්බන්ධිත මූල්‍ය

ප්‍රකාශ තොරතුරු වල අවප්‍රකාශ වල අවදානම පවත්නා බවද කාර්ය සාධන මිණුම් කිරීම මගින් විගණකවරයාට හැඟවීම් කරනු ඇත. උදාහරණයක් වශයෙන් එකම කර්මාන්තයෙහි වෙනත් අස්තිත්වයන් සමඟ සැසඳීමෙහිදී අස්තිත්වයට අසාමාන්‍ය සීඝ්‍ර වර්ධනයක් හෝ ලාභදායිත්‍වයක් පවත්නා බවට කාර්ය සාධන මිණුම් වලින් ඇඟවීම් කරනු විය හැකිය. එවැනි තොරතුරු විශේෂයෙන් කාර්ය සාධනය පදනම් කරගන්නා ප්‍රසාද දීමනා හෝ දිරිගැන්වීම් පාරිතෝෂික වැනි වෙනත් සාධක සමග බැදී ඇත්නම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහිදී කළමනාකාරීත්වයෙහි පක්ෂග්‍රාහී වීමේ භව්‍ය අවදානම අඟවනු විය හැකිය.

කුඩා අස්තිත්වයන්ට විශේෂිතවන සැලකිලිමත් විය යුතු කරුණු

අ48. මූල්‍ය කාර්ය සාධනය මිණුම් කිරීමෙහි සහ සමාලෝචනය කිරීමෙහි ක්‍රියාවලි බොහෝවිට වඩා කුඩා අස්තිත්වයන් සතු නොවේ. කළමනාකාරීත්වයෙන් විමසීම් කිරීමෙන් මූල්‍ය කාර්ය සාධනය ඇගයීම සහ අවශ්‍ය කටයුතු කිරීම උදෙසා ඔවුන් ඇතැම් ප්‍රමුඛ දර්ශක කෙරෙහි විශ්වාසය තබන බව අනාවරණය විය හැකිය. එවැනි විමසීමකදී කාර්ය සාධනය මිණුම් කිරීමක් හෝ සමාලෝචනය කිරීමක් සිදු නොමැති බව හැඟවෙන්නේ නම් අනාවරණය කරගැනීම් හෝ නිවැරදි කිරීමක් සිදු නොවන අවප්‍රකාශ වල ඉහළ අවදානමක් තිබිය හැකිය.

**අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය** (12 වැනි ඡේදය බලන්න.)

අ49. අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් මගින් විශ්වාස භව්‍ය අවප්‍රකාශවල සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශ කෙරෙහි බලපෑම් කරන සාධක හඳුනාගැනීමටත් ඉදිරි විගණන පටිපාටි වල ස්වභාවය, කාලනිර්ණය සහ ප්‍රමාණය පිළිබඳ සැලසුම් කිරීමෙහිදීත් විගණකගේ සහාය සැපයෙයි.

අ50. අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් ව්‍යවහාරය කරන දැවල් අංශ හතරකින් ඉදිරිපත් කරනු ලබයි.

- අභ්‍යන්තර පාලනයෙහි සාමාන්‍ය ස්වභාවය සහ ගති ලක්ෂණ
- විගණනයට අදාල පාලන
- අදාල පාලන පිළිබඳ අවබෝධයෙහි ස්වභාවය සහ ප්‍රමාණය
- අභ්‍යන්තර පාලනයෙහි සංරචක

*අභ්‍යන්තර පාලනයෙහි සාමාන්‍ය ස්වභාවය සහ ගති ලක්ෂණ.*

අභ්‍යන්තර පාලනයෙහි අරමුණ.

අ51.පහත දැක්වෙන කරුණු හරහා අස්තිත්වයෙහි කවර හෝ පරමාර්ථ සපුරා ගැනීම කෙරෙහි තර්ජනයක් වන හඳුනාගත් ව්‍යාපාරික අවදානම් ආමන්ත්‍රණය කිරීමට අභ්‍යන්තර පාලන සැලසුම් කර, ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබයි.

- අස්තිත්වයෙහි මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්‍වය
- එහි මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය සහ සඵලදායකත්වය
- අදාල නීති හා රෙගුලාසි අනුගමනය කිරීම

අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යන අන්දම අස්තිත්වයේ ප්‍රමාණය සහ සංකීර්ණභාවය අනුව වෙනස් වේ.

කුඩා අස්තිත්වයන්ට විශේෂිත කරුණු

අ52. කුඩා අස්තිත්වයන් විසින් අරමුණු ඉටුකර ගැනීම සඳහා අඩු ව්‍යුහගත විධි උපක්‍රම සහ වඩා සරල ක්‍රියාවලි භාවිතා කරනු විය හැකිය.

අභ්‍යන්තර පාලනයෙහි සීමා

අ53. අභ්‍යන්තර පාලනය කෙතරම් සඵලදායී වුවද එමඟින් අස්තිත්වයකට ලබාදිය හැකි වනුයේ අස්තිත්වයෙහි මූල්‍ය වාර්තාකරණ අරමුණු වල කාර්ය සාධන පිළිබඳ හේතු සහගත සහතිකවීමක් පමණකි. ඒවායෙහි කාර්ය සාධනයෙහි භව්‍යතාවය කෙරෙහි අභ්‍යන්තර පාලනයෙහි ආවේනික සීමාවන් මගින් බලපෑම් සිදු කිරීමේ හැකියාවක් පවතියි. තීරණ ගැනීමෙහිදී මානුෂීය විනිශ්චය දෝෂ සහිත විය හැකි වීමත්, මානුෂීය වැරදි හේතුවෙන් අභ්‍යන්තර පාලනයෙහි බිඳවැටීම් සිදු විය හැකි වීමත් වැනි යථාර්ථයන්හි ප්‍රතිඵල මීට ඇතුළත් වෙයි. උදාහරණයක් වශයෙන්

පාලනයක් සැලසුමෙහිදී හෝ පාලනයකට මාරු වීමෙහිදී වරදක් සිදු වී තිබිය හැකිය. ඒ අන්දමින්ම අභ්‍යන්තර පාලන අරමුණ සඳහා සැපයෙන තොරතුරු (උදාහරණයක් වශයෙන් ව්‍යතිරේක වාර්තාවක්) එම තොරතුරු සමාලෝචනය කිරීමෙහි වගකිවයුතු පුද්ගලයාට එහි අරමුණ පිළිබඳ අවබෝධයක් නොමැති වීම හෝ ඔහු උචිත ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් සඵලදායීව භාවිතා නොවීම වැනි තත්වයක් නිසා පාලනයක ක්‍රියාකාරිත්වය සඵලදායී නොවිය හැකිය.

අ54. ඊට අමතරව පුද්ගලයින් දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් අතර දුස්සනදානය හෝ අනුචිත කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර පාලනය මැදිහත් වී අක්‍රිය කරමින් ක්‍රියා කිරීම මඟින් පාලන මගහැර යාම සිදුවිය හැකිය. උදාහරණ වශයෙන් කළමනාකාරිත්වය අස්තිත්වයෙහි සම්මත වෙළෙඳ කොන්ත්‍රාත්තු වගන්ති සහ කොන්දේසි වලට වෙනස්ව ගනුදෙනුකරුවන් සමඟ පරිබාහිර ගිවිසුම් වලට එළඹීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අව්ධිමත් අයභාර හඳුනාගැනීමක් සිදුවිය හැකිය. එසේම විශේෂිත ණය සීමාවන් ඉක්මවන ගනුදෙනු හඳුනා ගැනීමට සැලසුම් කරන ලද මෘදුකාංග වැඩසටහනක සංස්කරණ පරීක්ෂා අභිබවා යාම හෝ අඩාල කිරීම ද සිදුවිය හැකිය.

අ55.ඊටත් අමතරව පාලන සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමෙහිදී එය ක්‍රියාත්මක කිරීමට තෝරා ගන්නා පාලන වල ස්වභාවය සහ ප්‍රමාණයත්, එය උපකල්පනය කිරීමට තෝරාගන්නා අවදානම් වල ස්වභාවය සහ ප්‍රමාණයත් සම්බන්ධව කළමනාකාරිත්වය විනිශ්චයන්ට එළඹෙනු ද විය හැකිය.

කුඩා අස්තිත්වයන්ට විශේෂිතව සලකා බැලිය යුතු කරුණු

අ56. කුඩා අස්තිත්වයකට බොහෝ විට ඇත්තේ වඩා අඩු සංඛ්‍යාවක් නිසා වැඩ බෙදීම ප්‍රායෝගිකත්වයේ ප්‍රමාණය සීමිත විය හැකිය. කෙසේ වුවද හිමිකරු විසින් පාලනය කරනු ලබන කුඩා අස්තිත්වයක හිමිකරු කළමනාකරුට විශාල අස්තිත්වයකට වඩා පහසුවෙන් සඵලදායී අධීක්ෂණයක් සිදු කළ හැකි විය හැකිය. කාර්යභාරයන් කාණ්ඩගත කිරීම සඳහා සාමාන්‍යයෙන් පවත්නා සීමිත හැකියාව මෙම අධීක්ෂණය මඟින් ආවරණය වෙයි.

අ57. අනෙක් අතට අභ්‍යන්තර පාලන පද්ධතිය එතරම් ව්‍යුහගත නොවීම නිසා හිමිකරු කළමනාකරුට පාලනයන් අභිබවා කටයුතු කිරීමට හැකි විය. වංචාවන් නිසා ඇති වන ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනාගැනීමේදී විගණක මෙය සැලකිල්ලට ගනී.

අභ්‍යන්තර පාලනය සංරචක වලට බෙදීම

අ58. අභ්‍යන්තර පාලනය ශ්‍රී.ල.වි.ප්‍ර. වල අරමුණු සඳහා පහත සඳහන් සංරචක පහට වෙන් කිරීම මඟින් අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනයේ එකිනෙකට වෙනස් පැතිකඩ විගණනය කෙරෙහි බලපානු ලබන අන්දම සලකා බැලීම සඳහා ප්‍රයෝජනවත් ආකෘතිමය රාමුවක් විගණකට සැපයෙයි.

(අ) පාලන පරිසරය

(ආ) අස්තිත්වයෙහි අවදානම් තක්සේරු කිරීමේ පටිපාටිය

(ඇ) මූල්‍ය වාර්තාකරණයටත්, සන්නිවේදනයටත් අදාල වන ව්‍යාපාර සම්බන්ධි; ක්‍රියාවලිය තොරතුරු පද්ධතිය

(ඈ) පාලන ක්‍රියාකාරකම් ; සහ

(ඉ) පාලනයන් අධීක්ෂණය

මෙම බෙදීම මඟින් අස්තිත්වයක් කවර ආකාරයකින් අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාම සිදු කරන්නේද යන්න හෝ කිසියම් විශේෂ සංරචයක් කවරාකාරයකින් වර්ගීකරණය කරන්නේද යන්න අවශ්‍යයෙන්ම පිළිඹිබු නොකෙරෙයි. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි විස්තර කෙරෙන සියලුම සංරචක ආමන්ත්‍රණය කර ඇත්තේ නම්, අභ්‍යන්තර පාලන වල විවිධ අංශ සහ ඒවායේ විගණන බලපෑම් විස්තර කිරීමේදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර හි භාවිත කෙරෙන නාමකරණයට වෙනස් නාමකරණයක් හෝ ආකෘතිමය රාමුවක් විගණකට භාවිතා කළ හැකිය.

අ59. මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාල වන පරිදි පාලන සංරචක පහට අදාල භාවිත පරිශීලකයන් ඉදිරි අ. 76 - අ. 117 ඡේද වල නියම තිබෙයි. අභ්‍යන්තර පාලන වල මෙම සංරචක සම්බන්ධයෙන් වැඩිමනත් පැහැදිලි කිරීම් 1. පරිශිෂ්ඨයෙහි ඉදිරිපත් කෙරෙයි. අභ්‍යන්තර පාලනය විගණකවරයාගේ අවදානම් හඳුනාගැනීමට සම්බන්ධ මිනිස් ක්‍රියාකාරී සහ ස්වයං ක්‍රියාකාරී මූලිකාංග වල ගතිලක්ෂණ

අ60. අස්තිත්වයක අභ්‍යන්තර පාලන පද්ධතිය මිනිස් ක්‍රියාකාරී මූලිකාංග වලින්ද, බොහෝ විට ස්වයං ක්‍රියාකාරී මූලිකාංග වලින්ද සමන්විත වේ. මිනිස් ක්‍රියාකාරී හෝ ස්වයං ක්‍රියාකාරී මූලිකාංග විගණකවරයාගේ අවදානම් තක්සේරු කිරීම සහ ඒ මත පදනම් වන ඉදිරි විගණන ක්‍රියාවලි වලට අදාල වෙයි.

අ61. අභ්‍යන්තර පාලනයෙහි මිනිස් ක්‍රියාකාරී හෝ ස්වයං ක්‍රියාකාරී මූලිකාංග භාවිතය මඟින් ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වාර්තා කිරීම සිදු කෙරෙන ආකාරය කෙරෙහිද බලපෑම් කළ හැකිය.

- මිනිස් ක්‍රියාකාරී පද්ධතියක පාලක වලට ගනුදෙනු අනුමත කිරීම් සහ සමාලෝචන, සහ සංසන්දනය කිරීම සහ සංසන්සනය කළ අයිතම වල පසු විපරම වැනි පටිපාටි ඇතුළත් විය හැකිය. විකල්ප වශයෙන් ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ගනුදෙනු වාර්තා කිරීම සඳහා ස්වයං ක්‍රියාකාරී පටිපාටි අනුගමනය කරනු විය හැකි අතර එහිදී ඉලෙක්ට්‍රොනික සටහන් ආකෘති මගින් කඩදාසි ලියවිලි ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

- තොරතුරු තාක්‍ෂණ පද්ධතියක් පාලන ස්වයංක්‍රීය පාලන (උදාහරණයක් වශයෙන් පරිගණක වැඩසටහනක ගැබ් වූ පාලන) සහ මිනිස් ක්‍රියාකාරී පාලන වල සංයෝජනයකින් සමන්විත විය හැකිය. එසේම තව දුරටත් මිනිස් ක්‍රියාකාරී පාලන තොරතුරු තාක්‍ෂණයෙන් ස්වාධීන විය හැකිය, තොරතුරු තාක්‍ෂණයෙන් ඉදිරිපත් කරන තොරතුරු පාවිච්චි කරනු විය හැකිය, හෝ තොරතුරු තාක්‍ෂණයෙහිත් ස්වයං ක්‍රියාකාරී පාලන වලත් ව්‍යතිරේඛ පිළිබඳව කටයුතු කිරීමටත් සීමා විය හැකිය. මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කිරීම සඳහා වාර්තා ක්‍රියාවලිය හෝ ගණුදෙනු වාර්තා කිරීමට හෝ අනෙකුත් මූල්‍ය දත්ත ගැන ක්‍රියා ආරම්භ කිරීමට තොරතුරු තාක්‍ෂණය යොදා ගැනෙන විට පද්ධති සහ වැසටහන් වල ප්‍රමාණාමක ගිණුම් සඳහා අනුරූපවන්නා වූ ස්ථිරසාර මතයය සම්බන්ධ පාලනය ඇතුලත් විය හැකිය. නැතහොත් තොරතුරු තාක්‍ෂණය මත රඳා පවත්නා හස්ත පාලනයන්ගේ ඵලදායී ක්‍රියාකාරීත්වය කෙරෙහි තීරණාත්මක විය හැකිය.

අස්තිත්වයක අභ්‍යන්තර පාලනයෙහි මිනිස් ක්‍රියාකාරී සහ ස්වයං ක්‍රියාකාරී මූලිකාංග වල මිශ්‍රණය අස්තිත්‍වයෙහි තොරතුරු තාක්‍ෂණ සේවා භාවිතයෙහි ස්වභාවයත් සංකීර්ණත්වයත් මත විවිධත්වයක් දක්වයි.

අ62. අස්තිත්වයකට පහත සඳහන් දෑ සඳහා හැකියාව ලබා දීමෙන් තොරතුරු තාක්‍ෂණය බෙහෙවින් අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනයට ප්‍රතිලාභ ලබා දෙයි.

- කළින් අර්ථ දක්වා ඇති ව්‍යාපාරික රීති ඒකාකාරී ලෙස ව්‍යවහාර කිරීම සහ විශාල පරිමාවේ ගනුදෙනු සහ දත්ත සැකසුම් කිරීමෙහිදී සංකීර්ණ ගණනය කිරීම් සිදු කිරීම.
- තොරතුරු ලබා ගත හැකි ක්‍රම, කාලීන බව සහ තොරතුරු වල නිරවද්‍යභාවය ඉහළ නැංවීම.
- තොරතුරු වැඩි දුරටත් විශ්ලේෂණය කිරීම පහසු කිරීම.
- අස්තිත්වයේ ක්‍රියාකාරකම්, එහි ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි වල කාර්ය සාධනය අධීක්‍ෂණය කිරීමේ හැකියාව ඉහළ නැංවීම.
- පාලන මගහැරීමේ අවදානම අඩුකිරීම; සහ
- ව්‍යවහාර විධි, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති කෙරෙහි ආරක්‍ෂක පාලන ක්‍රියාත්මක කිරීමෙන් කාර්යයන් වෙන් කිරීමෙහි සඵලදායීතාවය ලබාගැනීමේ හැකියාව ඉහළ නැංවීම.

අ63. තොරතුරු තාක්‍ෂණය අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනයට ද ආරූඪකරගත් නිශ්චිත අවදානම් ස්වරූපයෙන් බලපෑම් ඇති කරයි, උදාහරණ වලට පහත සඳහන් දෑ ඇතුළත් ය.

- වැරදි සහිතව දත්ත සැකසුම් සිදුකරන හෝ වැරදි සහිත දත්ත සැකසුම් කරන හෝ ඒ දෙකම සිදුකරන පද්ධති හෝ වැඩසටහන් මත විශ්වාසය තැබීම.
- අනුමත නොකළ හෝ නොපවත්නා ගනුදෙනු වාර්තා කිරීම හෝ ගනුදෙනු වැරදි ලෙස සටහන් කිරීම ඇතුළත්ව දත්ත විනාශ වීම හෝ අවිධිමත් අයුරින් දත්ත වෙනස් කිරීම සිදුවන අන්දමේ අනුමැතිය නොමැතිව දත්ත වලට ප්‍රවේශ වීම
- පොදු දත්ත පදනමට බහු සංඛ්‍යාවක් භාවිත කරන්නේ සංඛ්‍යාවක් ප්‍රවේශ වීමෙන් එවැනි අවධානම් පැන නැගිය හැකිය.
- තොරතුරු තාක්‍ෂණයට සම්බන්ධ පුද්ගලයින්ට ඔවුන්ගේ කාර්යභාරයෙහි කටයුතු වලට අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා දත්තයන්ට ප්‍රවේශ වීමේ වරප්‍රසාද ලැබීමේ හැකියාව තිබීමෙන් කාර්යභාරයන් වෙන් කිරීම බිඳ වැටීම.
- ප්‍රධාන ගොනු වල දත්ත වලට අනුමැතිය නොමැතිව වෙනස් කිරීම්
- පද්ධති හෝ වැඩසටහන් වලට අනුමැතිය නොමැතිව වෙනස් කිරීම්
- පද්ධති හෝ වැඩසටහන් වලට අවශ්‍ය වෙනස් කිරීම් කිරීමට අපොහොසත් වීම
- අනුචිත මිනිස් මැදිහත් වීම්
- අවශ්‍ය පරිදි දත්ත වලට ප්‍රවිශ්ඨ වීමට නොහැකි වීම හෝ දත්ත නැති වීමේ භව්‍යතාවය

අ64. පහත දැක්වෙන අන්දමේ තත්වයන්හිදී විනිශ්චයන් සහ අභිමතයන් අවශ්‍ය කෙරෙන විට අභ්‍යන්තර පාලනයෙහි මිනිස් ක්‍රියාකාරී මූලිකාංග වඩා සුදුසු විය හැකිය.

- විශාල, අසමාන්‍ය හෝ පුනරාවර්තනය නොවන ගනුදෙනු
- වැරදි නිර්වචනය, කිරීමට අපේක්ෂා කිරීමට හෝ අර්ථකථනය කිරීම අපහසු තත්වයන්
- පවත්නා සවයංක්‍රීය පාලනයක විෂය පථයෙන් පරිබාහිර පාලන ප්‍රතිචාරයක් අවශ්‍ය කෙරෙන අන්දමේ වෙනස් වන තත්වයන්හිදී
- සවයංක්‍රීය පාලන වල සඵලදායිත්වය අධීක්ෂණය කිරීමෙහිදී

අ65. වඩා පහසුවෙන් මගහැරිය හැකි වීම, නොතකා හැරිය හැකි වීම හෝ ඉක්මවා යා හැකි වීමද එමෙන්ම සුළු වැරදි සහ දෝෂ වලට භාජනය වීමට වැඩිපුර හැකියාවක් ඇති බැවින්ද අභ්‍යන්තර පාලන වල මිනිස් ක්‍රියාකාරී මූලිකාංග ස්වයං ක්‍රියාකාරී අභ්‍යන්තර පාලන වලට වඩා විශ්වසනීයත්වයෙන් අඩු විය හැකිය. එබැවින් මිනිස් ක්‍රියාකාරී පාලන මූලිකාංගයක භාවිතයෙහි සංගතතාවය උපකල්පනය කළ නොහැකිය. පහත දැක්වෙන තත්වයන් සඳහා මිනිස් ක්‍රියාකාරී පාලන මූලිකාංග සුදුසු බවින් අඩු විය හැකිය.

- ඉහළ පරිමාවක් ඇති හෝ පුනරාවර්තන ගනුදෙනු සහිත හෝ, බලාපොරොත්තු විය හැකි හෝ කල් ඇතිව අපේක්ෂා කළ හැකි, වැරදි සහිත අවස්ථා වලදී ස්වයංක්‍රිය කල පාලන පරාමිති මඟින් ඒවා වලක්වාලීම හෝ අනාවරණය කරගෙන නිවැරදි කිරීම හෝ කළ හැකිය,
- පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂිත ක්‍රම විධි ප්‍රමාණවත්ව සැලසුම් කර ස්වයං ක්‍රියාකාරී කළ හැකි පාලන ක්‍රියාකාරකම් පවත්නා විට

අ66. අභ්‍යන්තර පාලනයට ඇති අවදානම් වල ප්‍රමාණය සහ ස්වභාවය අස්තිත්වයෙහි තොරතුරු පද්ධතියෙහි ස්වභාවය සහ ගති ලක්ෂණ වලට අනුව වෙනස් වීම් වලට භාජනය වෙයි. අස්තිත්වයෙහි තොරතුරු පද්ධතියෙහි ගති ලක්ෂණ වල මග පෙන්වීමට අනුව සඵලදායී පාලන ස්ථාපනය කිරීමෙන් අභ්‍යන්තර පාලනයෙහි මිනිස් ක්‍රියාකාරී මූලිකාංග භාවිත කිරීමෙන් හෝ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමෙන් පැන නගින අවදානම් වලට අස්තිත්වය ප්‍රතිචාර දක්වයි.

විගණනයට අදාල වන පාලන

අ67. අස්තිත්වයක අරමුණු සහ ඒවා සපුරා ගැනීම පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීම උදෙසා අස්තිත්වය ක්‍රියාත්මක කරන පාලන අතර සෘජු සබඳතාවයක් වෙයි. අස්තිත්වයෙහි අරමුණුත් ඒ නිසාම පාලන මූල්‍ය වාර්තාකරණය, මෙහෙයුම් සහ අනුකූලත්වය කෙරෙහි සම්බන්ධිත වෙයි; එසේ වුවද මෙම සියළුම අරමුණු සහ පාලන විගණකවරයාගේ අවදානම් තක්සේරු කිරීමට අදාල නොවෙයි.

අ68. පාලනයක් තනිව හෝ වෙනත් පාලන සමග සංයෝජනය වීමෙන් විගණනයට අදාල වන්නේදැයි යන්න පිළිබඳව විගණකවරයාගේ විනිශ්චයට අදාල වන සාධක වලට පහත දැක්වෙන කරුණු ඇතුළත් වෙයි.

- ප්‍රමාණාත්මක බව
- සම්බන්ධිත අවදානමෙහි වැදගත් බව
- අස්තිත්වයෙහි ප්‍රමාණය
- අස්තිත්වයේ ව්‍යාපාරයෙහි ස්වභාවය, එහි සංවිධානය සහ හිමිකමේ ගතිලක්ෂණ ඇතුළත්ව
- අස්තිත්වයෙහි මෙහෙයුම් වල විවිධාංගික භාවය සහ සංකීර්ණත්වය
- උචිත නිතීමය සහ නියාමන අවශ්‍යතා
- තත්වයන් සහ අභ්‍යන්තර පාලනයේ උචිත සංරචකයන්
- සේවා සංවිධාන භාවිතයත් ඇතුළත්ව අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලන වල කොටස් වන පද්ධති වල ස්වභාවය සහ සංකීර්ණත්වය
- විශේෂිත පාලනයක් තනිව හෝ වෙනත් පාලන සමග සංයෝජනයෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වැලැක්වීම හෝ අනාවරණය කිරීම සහ නිවැරදි කිරීම සිදු කරන්නේද එසේ නම් ඒ කවර ආකාරයෙන්ද යන්න.

අ69. අස්තිත්වය විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු වල නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වයට අදාල වන පාලන පිළිබඳ තොරතුරු අතිරේක විගණක පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට විගණක අපේක්ෂා කරන්නේ නම් ඒවා විගණනයට අදාල විය හැකිය. විගණක පටිපාටි වලට ව්‍යවහාර කරන විගණක

ඇගයීම්කරණ හෝ භාවිතා කරන දත්ත ඒවා අදාල වන්නේ නම් මෙහෙයුම් සහ අනුකූල වීමේ අරමුණු වලට අදාල වන පාලනයන් විගණනයකටද අදාල විය හැකිය.

අ70. අනවසර අත්පත් කර ගැනීමෙන්, භාවිතයෙන් හෝ පැවරීමෙන් වත්කම් ආරක්‍ෂා කර ගැනීම සඳහා වන අභ්‍යන්තර පාලනයට මූල්‍ය වාර්තාකරණය සහ මෙහෙයුම් අරමුණු යන දෙවර්ගයටම සම්බන්ධ පාලන ඇතුළත්ය. එවැනි පාලන කෙරෙහි විගණකවරයාගේ සැලකිල්ල මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වයට අදාල වන පාලන වලට සීමා වෙයි.

අ71. සාමාන්‍යයෙන් විගණනයකට අදාල නොවන අරමුණු වලට සම්බන්ධ පාලන අස්තිත්වයක ඇති නිසා ඒවා සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවයක් නොවෙයි. උදාහරණයක් වශයෙන් කාර්යක්‍ෂමව සහ සඵලදායීව මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම උදෙසා සැපයුනු (ගුවන් ගමන් පද්ධතියක ගුවන් නියමිත ගමන් වාර සැලසුම් පවත්වාගෙන යාමට යොදාගන්නා ස්වයංක්‍රිය පාලන වැනි) ස්වයං ක්‍රියාකාරී සංකීර්ණ කරන ලද පද්ධති මත අස්තිත්වය විශ්වාසය තබා කටයුතු කරනු ඇති නමුත් සාමාන්‍යයෙන් මෙම පාලන විගණනයට අදාල නොවිය හැකිය. ඊට අමතරව සමස්ථ වශයෙන් අස්තිත්වයට හෝ එහි කවර හෝ මෙහෙයුම් ඒකකයකට හෝ ව්‍යාපාර ක්‍රියාවලීන්ට අභ්‍යන්තර පාලන ව්‍යවහාර වුවද ව්‍යාපාරයේ එක් එක් මෙහෙයුම් ඒකක සහ ව්‍යාපාර ක්‍රියාවලි වලට අදාල අභ්‍යන්තර පාලන පිළිබඳ අවබෝධයක් විගණනයට අදාල නොවිය හැකිය.

රාජ්‍ය අංශයේ අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ72. රාජ්‍ය අංශයේ විගණකවරුන්ට බොහෝ විට අභ්‍යන්තර පාලනයට සම්බන්ධ අමතර වගකීම් පැවරී තිබෙයි, ස්ථාපිත පරිචය සංග්‍රහය අනුගමනය කිරීම සම්බන්ධව වාර්තා කිරීම උදාහරණයකි. නීතිය රෙගුලාසි හෝ වෙනත් අධිකාරි නියෝග සමග අනුකූලවීම පිළිබඳව වාර්තා කිරීමේ වගකීමද රාජ්‍ය අංශයේ විගණකවරුන්ට අයත්ය. ප්‍රතිඵලයක් වශයෙන් අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් ඔවුන්ගේ සමාලෝචනය වඩාත් පුළුල් මෙන්ම විස්තරාත්මක විය හැකිය.

සම්බන්ධිත පාලන පිළිබඳ අවබෝධයෙහි ස්වභාවය සහ ප්‍රමාණය (13 ඡේදය බලන්න)

අ73. පාලනයක් සැලසුම් කිරීම ඇගයීමේදී පාලනය තනිව හෝ අනෙකුත් පාලන සමග සංයෝජනය වී ප්‍රමාණාත්මක අවප්‍රකාශ ඵලදායී ලෙස වැලැක්වීමට, අනාවරණය කිරීමට සහ නිවැරදි කිරීමට පාලනයට හැකියාව තිබේද යන්න පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය කෙරේ. පාලනයක් ක්‍රියාවට නැංවීම යනුවෙන් අදහස් කෙරෙනුයේ පාලනය පවත්නා බවත්, අස්තිත්වය විසින් එය භාවිත කරනු ලබන බවත්ය. සඵලදායී නොවන පාලනයක ක්‍රියාකාරීත්වය ඇගයීමෙන් ලද හැකි ප්‍රයෝජනය අල්පය, එබැවින් පාලනයක් සැලසුම් කිරීම ප්‍රථමයෙන් සැලකිල්ලට ගනු ලබයි. අයෝග්‍ය අයුරින් සැලසුම් කරන ලද පාලනයක් මඟින් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අන්දමේ ඌනතාවයක් නියෝජනය කරනු ලැබිය හැකිය.

අ74. අදාල පාලන වල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව විගණන සාක්ෂි ලබාගැනීම සඳහා වන අවදානම් තක්සේරු කිරීම් පටිපාටි වලට පහත දක්වෙන දෑ ඇතුළත් විය හැකිය.

- අස්තිත්වයට අනුයුක්ත සේවක මණ්ඩලය කෙරෙන් විමසීම් කිරීම
- විශේෂිත පාලන වල භාවිතය නිරීක්ෂණය කිරීම
- ලිපි ලේඛන සහ වාර්තා පරීක්‍ෂා කිරීම
- මූල්‍ය වාර්තාකරණයට අදාල තොරතුරු පද්ධතිය හරහා ගනුදෙනු අනුරේඛනය කිරීම

එවැනි අරමුණු උදෙසා විමසීම් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ.

අ75. පාලන වල සංගතික මෙහෙයුම් සලසන කිසියම් ස්වයං යන්ත්‍රණයක් ඇත්තේ නම් හැරුණු විට අස්තිත්වයෙහි පාලන පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම එකී පාලන වල මෙහෙයුම් සඵලදායිත්වය පරීක්‍ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. උදාහරණයක් ලෙස කාලයේ යම් මෙහොතක් තුළ කිසියම් අවස්ථාවක මිනිස් ක්‍රියාකාරී පාලනයක් ක්‍රියාත්මක කරනු ලැබීම පිළිබඳව විගණන සාක්ෂි ලබා ගැනීම මගින් විගණන කාලපරිච්ඡේදයට අදාල වන වෙනත් අවස්ථා වලදීත් පාලනයෙහි මෙහෙයුම් ඵලදායිත්වය පිළිබඳව විගණන සාක්ෂි නොසැපයෙයි. කෙසේ වුවද තොරතුරු තාක්‍ෂණයෙහි ආවේණික සංගතික භාවය හේතුවෙන් (අ.62 ඡේදය බලන්න) ස්වයංක්‍රීය පාලනයක් ක්‍රියාත්මක කරන ලද්දේද යන්න නිර්ණය කිරීම සඳහා විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී වැඩසටහන් වෙනස් වීම් වැනි අවස්ථා වලදී මෙන් පාලන වල විගණකවරයාගේ තක්සේරුව සහ පරීක්‍ෂණය මත එකී පාලනයේ

සඵලදායිත්වය පරීක්ෂා කිරීම පිළිබඳව පරීක්ෂාවක් ලෙස ප්‍රයෝජනවත් විය හැකිය. පාලන වල මෙහෙයුම් සඵලදායිත්‍වය පිළිබඳ පරීක්ෂා ශ්‍රී.ලං.වි.ප්‍ර. 330[13] වැඩිදුරටත් විස්තර වෙයි.

*අභ්‍යන්තර පාලනයේ සංරචක - පාලන පරිසරය* (14 ඡේදය බලන්න)

අ76. අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනය සහ අස්තීත්වයට එහි වැදගත්කම පිළිබඳ ඕනෑකමක් අති පාලන කාර්යභාර අයවලුන්ගේ සහ කළමනාකාරිත්වයේ ආකල්ප දැනුවත් බව ක්‍රියාවන් සහ පාලනයේ සහ කළමනාකරණයේ කාර්යයන් පාලන පරිසරයට ඇතුලත්ය. පාලන පරිසරය මඟින් අස්තිත්වයක චර්යා විලාසය සකස් කරමින් ඊට අයත්වන්නවුන් කෙරෙහි පාලනය සම්බන්ධ හැඟීම් කෙරෙහි බලපෑම් සිදු කරයි.

අ77. පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමෙහිදී අදාල විය හැකි පාලන පරිසරයේ මූලිකාංග වලට පහත සඳහන් දෑ ඇතුළත් වෙයි.

(අ) අවංකභාවය සහ සදාචාරාත්මක අගයන් සන්නිවේදනය සහ බලාත්මක කිරීම මේවා පාලන සැලසුම් කිරීම, පරිපාලනය සහ අධීක්ෂණයෙහි සඵලදායිත්වය කෙරෙහි බලපෑම් කරන අත්‍යාවශ්‍ය මූලිකාංග යන්ය.

(ආ) හැකියාවට කැපවීම - විශේෂිත කාර්යයන් සඳහා හැකියාවේ මට්ටම් සම්බන්ධයෙන් කළමනාකාරිත්වයෙහි සැලකිලිමත්භාවය සහ එකී මට්ටම් අවශ්‍ය ප්‍රගුණත්‍වය සහ දැනීම බවට පරිවර්තනය කරනුයේ කෙසේද යන්න

(ඇ) පාලන කාර්යයේ භාර ඇත්තවුන්ගේ සහභාගිත්‍වය - පාලන කාර්ය භාරය පැවරී ඇත්තවුන්ගේ පහත සඳහන් වන අන්දමේ ගුණාංග

- කළමනාකාරිත්වය කෙරෙන් ඔවුන්ගේ ස්වාධීනත්වය
- ඔවුන්ගේ පලපුරුද්ද සහ ශ්‍රේෂ්ඨත්වය
- ඔවුන්ගේ සහභාගීත්වයෙහි සහ ඔවුන්ට ලැබූ තොරතුරු වල ප්‍රමාණය සහ ක්‍රියාකාරකම් සියුම්ව පිරික්සීම
- දුෂ්කර ගැටළු මතු කිරීමේ සහ ඒවා කළමනාකාරිත්වය සමඟ සැලසුමක් සමඟ ඉදිරියට ගෙන යාමේ ප්‍රමාණය සහ අභ්‍යන්තර හා බාහිර විගණක වරුන් සමග ඔවුන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය ඇතුලු ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට උචිත භාවය.

(ඈ) කළමනාකාරිත්වයෙහි දර්ශනය සහ මෙහෙයුම් ශෛලිය - පහත දැක්වෙන අන්දමේ කළමනාකාරිත්වයෙහි ගති ලක්ෂණ

- ව්‍යාපාරික අවදානම් භාර ගැනීමේ සහ කළමනාකරණය කිරීමේ මග
- මූල්‍ය වාර්තාකරණය කෙරෙහි දක්වන ආකල්ප සහ ක්‍රියාකාරකම්
- තොරතුරු සැකසීමෙහි සහ ගිණුම්කරණ ක්‍රියාවලියෙහිත් සේවක මණ්ඩලය සම්බන්ධයෙනුත් දරන ආකල්ප

(ඉ) සංවිධාන ව්‍යුහය - එහි පරමාර්ථ අස්තීත්වයේ අරමුණු සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සඳහා වන ආකෘතිමය රාමුව

(ඊ) බලය සහ වගකීම පැවරීම - මෙහෙයුම් ක්‍රියාකාරකම් උදෙසා බලය සහ වගකීම පවරනු ලබන්නේ කෙසේද යන්න සහ වාර්තාකරණ සම්බන්ධතා සහ බලය පැවරීමේ අනුපිළිවෙළවල් ස්ථාපනය කරනුයේ කෙසේද යන්න

(උ) මානව සම්පත් ප්‍රතිපත්ති සහ පරිචයන් - උදාහරණ වශයෙන් බඳවා ගැනීම, හැඩගැසීම, පුහුණු කිරීම, ඇගයීම, උපදෙස් දීම, උසස් වීම් ලබා දිම, වන්දි සහ පිලියම් යෙදවීමේ ක්‍රියාකාරකම්

පාලන පරිසරයේ මූලිකාංග සඳහා විගණන සාක්ෂි

අ78. ලිපි ලේඛන පරීක්ෂා නිරීක්ෂණය කිරිම හරහා විමසීම් සනාථ කිරීම වැනි වෙනත් අවදානම් තක්සේරු කිරීම් පටිපාටි සහ විමසීම් වල සංයෝජනයක් මඟින් අදාල විගණන සාක්ෂි ලබා ගත හැක. උදාහරණ වශයෙන් කළමනාකාරිත්වය එහි ව්‍යාපාරික පුරුදු සහ සදාචාරාත්මක හැසිරීම් සේවකයන්ට සන්නිවේදනය කරන්නේ කවර ආකාරයකටද යන්න පිළිබඳව කළමනාකාරිත්වයෙන් සහ සේවකයින් සමග තොරතුරු විමසා බැලීමෙන් විගණකවරයා අවබෝධයක් ලබා ගනියි. අනතුරුව අදාල පාලන, උදාහරණ වශයෙන් කළමනාකාරිත්වයට ලිඛිත ආචාරධර්ම පද්ධතියක් ඇත්තේද, සහ එම ආචාරධර්ම පද්ධතියට අනුව කළමනාකාරිත්වය ක්‍රියාකරන්නේද යන්න

[13] ශ්‍රී.ල.වි.ප්‍ර 330, "තක්සේරු කළ අවදානම් වලට විගණකවරයාගේ ප්‍රතිචාර"

වැනි කරුණු කෙරෙහි සැලකිලිමත් වීමෙන් නියමාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේද යන්න විගණකවරයා නිර්ණය කරයි.

අ.79 අභ්‍යන්තර පාලනයෙහි විගණනයට අදාල වන පාලක වල අභ්‍යන්තර විගණක පද්ධතිය විසින් හඳුනාගත් ඌනතා සම්බන්ධයෙන් වූ සොයාගැනීම් සහ නිර්දේශ කිරීම් වලට කළමනාකාරිත්වය කවර අන්දමින් ප්‍රතිචාර දක්වා ඇත්ද යන්න කෙරෙහි එවැනි ප්‍රතිචාර ක්‍රියාත්මක කර ඇත්තේ කෙසේද යන්නත්, ඒවා විගණක පද්ධතිය මඟින් පසුව ඇගයීමට ලක්කරනු ලැබ ඇත්ද යන්නත් ඇතුළත්ව විගණකවරයාගේ සැලකිල්ල යොමුවනු ඇත.

ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම තක්සේරු කිරිම මත පාලන පරිසරයේ බලපෑම

අ80. ප්‍රමාණාත්මක අවප්‍රකාශ තක්සේරු කිරීමෙහිදී අස්තිත්වයෙහි පාලන පරිසරයේ ඇතැම් මූලිකාංග මඟින් පෘථුල බලපෑමක් සිදුකරනු ලබයි. උදාහරණයක් ලෙස බලය පවරනු ලැබූවන්ගේ කාර්යභාරයක් වනුයේ වෙළඳපොල ඉල්ලුම් කෙරෙන් පැනනැගිය හැකි මූල්‍ය වාර්තාකරණයට අදාලව කළමනාකාරිත්වය මත සිදු කරනු ලබන පීඩනය තුළනය කිරීම බැවින් අස්තිත්වයක පාලන වල ක්‍රියාකාරිත්වය කෙරෙහි පාලන බලය පවරනු ලැබූවන් කෙරෙන් සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ලබයි. එබැවින් පාලන බලය පවරනු ලැබූවන්ගේ සහභාගිත්වයට සාපේක්ෂව පාලන පරිසරය සැලසුම් කිරීමෙහි ඵලදායිත්‍වය කෙරෙහි පහත දක්වා ඇති අන්දමේ කරුණු වලින් බලපෑම් සිදු කරනු ලබයි.

- කළමනාකාරිත්වය කෙරෙන් ඔවුන්ගේ ස්වාධීන බව සහ කළමනාකාරිත්වයේ ක්‍රියාකාරකම් ඇගයීමට මොවුන්ට ඇති හැකියාව
- අස්තිත්වයෙහි ව්‍යාපාරික ගනුදෙනු ඔවුන් අවබෝධ කරගනීද
- අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්ද යන්න ඔවුන් අගය කර ඇති ප්‍රමාණය

අ81. ක්‍රියාකාරී සහ ස්වාධීන අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙහි දර්ශනය සහ මෙහෙයුම් රටාව කෙරෙහි බලපෑම් කළ හැකිය. කෙසේ වුවද අනෙකුත් මූලිකාංග වල බලපෑම වඩා සීමිත විය හැකිය. උදාහරණයක් වශයෙන් මූල්‍ය, ගිණුම්කරණ සහ තොරතුරු තාක්ෂණික නිපුනතා ඇති සේවකයන් සේවයේ යෙදවීමේ මානව සම්පත් ප්‍රතිපත්තියකින් මූල්‍ය තොරතුරු සකස් කිරීමේ ක්‍රියාවලියෙහි වැරදි වල අවදානම අඩුකිරීමක් සිදු විය හැකි වුවද ඒවා ඉහළ කළමනාකාරිත්වය විසින් අතිශය අගතිගාමී අයුරින් ඉපැයීම් වැඩීයෙන් සඳහන් කිරීම එමගින් මැඩලනු නොලබයි.

අ82. විගණකවරයා ප්‍රමාණාත්මක අවප්‍රකාශ තක්සේරු කරන විට සතුටුදායක පාලන පරිසරයක් පැවතීම ධනාත්මක සාධකයක් විය හැකිය. වංචා අවදානම අඩු කිරීමට එය උපකාරී විය හැකි වුවද සතුටුදායක පාලන පරිසරයක් පමණක් සම්පූර්ණ වංචා වැලැක්වීමේ සාධකයක් නොවේ. විලෝම වශයෙන් පාලන පරිසරයේ ඌනතා මඟින් පාලන වල ඵලදායිත්‍වය, විශේෂයෙන් වංචා සම්බන්ධයෙන්, ක්ෂයවීයාමක් කරනු ලැබිය හැකිය. උදාහරණයක් වශයෙන් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් කැපකිරීමට කළමනාකාරිත්වයෙහි අසමත්වීම පරිගණක පද්ධති හෝ දත්තයන්ට අයෝග්‍ය වෙනස් කිරීම් සිදු කිරීමේ අවකාශ සැලසීම හෝ අනුමත නොකළ ගනුදෙනු සැකසීමට ඉඩකඩ සැලසීමෙන් අභ්‍යන්තර පාලනය කෙරෙහි අහිතකර බලපෑම් සිදු කළ හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර 330[14] හි පැහැදිලි කර ඇති අන්දමට පාලන පරිසරය විගණකවරයාගේ අමතර පටිපාටි වල ස්වභාවය, කාලනියමය සහ වානිජ්‍ය කෙරෙහිද බලපෑම් සිදු කරයි.

අ83. පාලන පරිසරයෙන්ම පමණක්ම ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් වැලැක්වීම, සොයාගැනීම හෝ නිවැරදි කිරීම සිදු නොකෙරෙයි. එසේ වුවද එයින් අනෙකුත් පාලන වල (උදාහරණ වශයෙන් පාලක අධීක්ෂණය, සහ විශේෂිත පාලක ක්‍රියාකාරකම් වල මෙහෙයවීම්) සඵලදායිත්‍වය ඇගයීමද ඒ හරහා විගණකවරයාගේ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම ඇගයීම් කෙරෙහිද බලපෑම් සිදු කරනු විය හැකිය.

කුඩා අස්තිත්වයන් කෙරෙහි විශේෂිතව සැලකිලිමත් විය යුතු කරුණු

අ84. කුඩා අස්තිත්වයන් තුල පාලන පරිසරය වඩා විශාල අස්තිත්වයන්ගෙන් වෙනස් විය හැකිය. උදාහරණයක් වශයෙන් කුඩා අස්තිත්වයන්හි පාලන කාර්ය භාරය දරන ඇත්තවුන්ට ස්වාධීන හෝ බාහිර සාමාජිකයකු ඇතුළත් නොවිය හැකි අතර පාලන කාර්යභාරය වෙනත් හිමිකරුවන් නොමැති අවස්ථාවන්හිදී හිමිකාර කළමනාකරු විසින් සෘජුව දරනු විය හැකිය. පාලන පරිසරයෙහි ස්වභාවය මඟින් අනෙකුත් පාලන වල සැලකිය යුතුභාවය හෝ එවැන්නක් නොපැවතීම කෙරෙහිද බලපෑම් සිදු කරනු විය හැකිය. උදාහරණයක් ලෙස කුඩා ව්‍යාපාරයක කාර්යභාරයන් වෙන් කිරීමේ අඩුපාඩුවක් නිසා පැන නගින ඇතැම් අවදානම් හිමිකාර කළමනාකරුගේ ක්‍රියාකාරී

[14] ශ්‍රී.ලං.වි.ප 330, අ. 2 - අ. 3 ඡේද

මැදිහත් වීමෙන් ලිහිල් කල හැකිය. කෙසේ වුවද එයින් අනෙකුත් අවදානම් වැඩිකරනු විය හැකිය. පාලන අභිබවා යාමේ අවදානම ඊට උදාහරණයකි.

අ85. ඊට අමතරව, විශේෂයෙන් කළමනාකාරිත්වය සහ අනෙකුත් පුද්ගලයන් අතර සන්නිවේදනය අවිධිමත්, එහෙත් ඵලදායී වන, වඩා කුඩා අස්තිත්වයන්හි පාලන පරිසරයෙහි මූලිකාංග සඳහා විගණන සාක්ෂි ලේඛනගත ස්වරූපයෙන් නොමැති විය හැකිය. උදාහරණයක් ලෙස කුඩා අස්තිත්වයන්හි ලේඛණගත ආචාර ධර්ම පද්ධතියක් නොමැති කමින් ඒ වෙනුවට වාචික සන්නිවේදනයත් කළමනාකාරීත්වයෙහි ආදර්ශයත් මගින් ඒකීය සහ සදාචාරාත්මක චර්යාව අවධාරණය කෙරෙන සංස්කෘතියක් නිර්මාණය විය හැකිය.

අ86. ඒ නිසාවෙන් කළමනාකාරිත්වයෙහි හෝ හිමිකරු කළමනාකරුගේ ආකල්ප සහ ක්‍රියාකාරකම් පිළිබඳ දැනීම කුඩා අස්තිත්වයක පාලන පරිසරය අවබෝධ කරගැනීම සඳහා විගණකවරයාට විශේෂයෙන් වැදගත් වෙයි.

*අභ්‍යන්තර පාලනයෙහි සංරචකයන් - අස්තිත්වයෙහි අවදානම් තක්සේරු පටිපාටිය* - (15 ඡේදය බලන්න)

අ87. කළමනාකාරිත්වය අවදානම් කළමනාකරණය කිරීම නිර්ණය කල යුත්තේ කෙසේද යන්න පිළිබඳ පදනම අස්තිත්වයෙහි අවදානම් තක්සේරු පටිපාටිය මගින් සකස් කරනු ලබයි. අස්තිත්වයෙහි ස්වභාවය, ප්‍රමාණය සහ සංකීර්ණත්‍වය ඇතුළුව එම ක්‍රියාවලිය වාතාවරණයට යෝග්‍ය වන්නේ නම් එය ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවධානම හඳුනාගැනීමේදී විගණකට උපකාරී වේ අස්තීත්වයේ අවධානම් තක්සේරු ක්‍රියාවලිය වාතාවරණයන්ට යෝග්‍ය වන්නේද යන්න විනිශ්චය කළයුතු කරුණකි.

කුඩා අස්තිත්වයන්ට විශේෂිතව සැලකිය යුතු කරුණු - (17 ඡේදය බලන්න)

අ88. කුඩා අස්තිත්වයක ස්ථාපිත කල අවදානම් තක්සේරු පටිපාටියක් තිබිය නො හැකිය. එවැනි අවස්ථා වලදී කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයන් කෙරෙහි සෘජුව අවදානම් හඳුනාගනු විය හැකිය. වාතාවරණය කවර ආකාරයක වුවද හඳුනාගත් අවදානම් පරීක්ෂාවට භාජනය කිරීමත් කළමනාකාරිත්වය විසින් ඒ අවදානම් ආමන්ත්‍රණය කරන ආකාරයත් අවශ්‍යතාවයකි.

අභ්‍යන්තර පාලනයෙහි සංරචක - මූල්‍ය වාර්තාකරණයට අදාල ව්‍යාපාරික ක්‍රියාවලියට සම්බන්ධ ඇතුලත් තොරතුරු පද්ධතිය

මූල්‍ය වාර්තාකරණයට අදාල ව්‍යාපාරික ක්‍රියාවලියට සම්බන්ධව ඇතුළත්ව තොරතුරු පද්ධතිය (18 ඡේදය බලන්න)

අ89. ගිණුම්කරණ පද්ධතියද ඇතුළත් වන මූල්‍ය වාර්තාකරණ අරමුණු කෙරෙහි අදාල වන තොරතුරු පද්ධතිය පහත දැක්වෙන අවශ්‍යතා උදෙසා සැලසුම් කර ස්ථාපනය කරන ලද පටිපාටි සහ වාර්තා වලින් සමන්විතය.

- අස්තිත්වයෙහි ගනුදෙනු (මෙම සිදු වීම් සහ තත්‍වයන්) ආරම්භ කිරීම, ලේඛනගත කිරීම, සැකසුම් කිරීම සහ වාර්තා කිරීම සහ සම්බන්ධිත වත්කම් වගකීම් සහ ස්කන්ධය සඳහා වගකිවයුතු භාවය පවත්වා ගැනීම
- වැරදි ලෙස ගනුදෙනු සැකසුම් කිරීම නිරවුල් කිරීම, උදාහරණයක් ලෙස අවිනිශ්චිත අයිතම කාලීන පදනමකින් ඉවත් කිරීම අනුගමනය කරනු ලබන ස්වයං ක්‍රියා ලිපිගොනු සහ පටිපාටි
- පද්ධතිය ඉක්මවා යාම හෝ පාලන මගහැරයාම් වෙනුවෙන් සැකසීම සහ ගිණුම්කරණය
- ගනුදෙනු සැකසුම පද්ධති වලින් පොදු ලෙජරයට තොරතුරු මාරු කිරීම
- ගනුදෙනු හැර මූල්‍ය වාර්තාකරණයට අදාල වන සිදු වීම් සහ තත්‍වයන් සම්බන්ධ, වත්කම් ක්ෂය වීම, ක්‍රමක්ෂය, සහ ලැබිය යුතු ගිණුම් අයකර ගැනීමේ හැකියාවෙහි වෙනස් වීම් වැනි තොරතුරු ග්‍රහණය කර ගැනීම; සහ
- අදාල මූල්‍ය වාර්තාකරණ රාමුවෙන් හෙළිදරව් කිරීමට අවශ්‍ය කෙරෙන තොරතුරු රැස්කිරීම, සටහන් වීම සැකසුම් කිරීම, සාරාශ කිරීම සහ මූල්‍ය ප්‍රකාශ වල යථා පරිදි වාර්තා කිරීම තහවුරු කිරීම.

ජර්නල් සටහන්

අ90. පුනරාවර්තනය මත පදනමකින් ගනුදෙනු වාර්තා කිරීමට අවශ්‍ය ප්‍රමිත ජර්නල් සටහන් අස්තිත්වයක තොරතුරු පද්ධතියට සංකේතමය ලෙස ඇතුළත්ය. විකුණුම්, මිලදී ගැනීම් සහ මුදලින් කරනු ලබන වියදම් පොදු ලෙජරයෙහි සටහන් කිරීමේ ජර්නල් සටහන් හෝ ලැබිය යුතු ගිණුම් වල එකතු කර ගත නොහැකි ප්‍රමාණයන්හි ඇස්තමේන්තු වල වෙනස් කිරීම් වැනි කළමනාකාරීත්වය විසින් කාලාවර්තීව සිදුකරන ගිණුම් ඇස්තමේන්තු ලේඛන ගත කරන ජර්නල් සටහන් ඒ සඳහා වන උදාහරණ වලට ඇතුළත් විය හැකිය.

අ91. පුනරාවර්තනය නොවන, අසාමාන්‍ය ගනුදෙනු ලේඛනගත කිරීමටත් ගැලපිලි කිරීමටත් ප්‍රමිත නොවන ජර්නල් සටහන්ද අස්තිත්වයක මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියෙහි ඇතළත්ය. එවැනි සටහන් සම්බන්ධයෙන් උදාහරණ වලට ඒකාබද්ධ කිරීමේ ගැලපුම් ව්‍යාපාර සංයෝජනයක් හෝ අපහරණයක් හෝ වත්කමක් හානිකරණය කිරීමේ

පුනරාවර්තනය නොවන ඇස්තමේන්තුවකට අදාල සටහන් ඇතුළත් වෙයි. අතින් සටහන් කරනු ලබන සාමාන්‍ය ලෙජර පද්ධති වල ප්‍රමිත නොවන ජර්නල් සටහන් ලෙජර්, ජර්නල සහ උපකාරක ලිපි ලේඛන පරීක්‍ෂා කිරීම හරහා හඳුනාගත හැකිය. පොදු ලෙජරය පවත්වා ගෙන යාමට සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ස්වයංක්‍රීය පටිපාටි භාවිතාකරනු ලබන විට එවැනි සටහනක් පවත්නේ ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පමණක් වන අතර එබැවින් පරිගණක සහාය විගණක ශිල්ප ක්‍රම හරහා වඩා පහසුවෙන් හඳුනාගත හැකිය.

සම්බන්ධිත ව්‍යාපාරික ක්‍රියාවලීන්

අ92. අස්තිත්වයක ව්‍යාපාරික ක්‍රියාවලීන් යනු;

- අස්තිත්වයක නිපැයුම් සහ සේවාවන් සංවර්ධනයට, මිලදී ගැනීමට, නිෂ්පාදනයට, විකිණීමට සහ බෙදාහැරීමට
- නීති සහ රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීමට; සහ
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ තොරතුරු ඇතුළත්ව තොරතුරු ලේඛනගත කිරීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් වේ.

තොරතුරු පද්ධතිය මඟින් සටහන් කළ, සකස් කළ සහ වාර්තා කළ ගනුදෙනු වල ප්‍රතිඵලය ව්‍යාපාරික ක්‍රියාවලියක් වේ. ගනුදෙනු ආරම්භ වූ ආකාරය ඇතුළත්ව අස්තිත්වයෙහි ව්‍යාපාරික ක්‍රියාවලි පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම අස්තිත්වයෙහි වාතාවරණයට උචිත වන අන්දමට මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අදාල වන අස්තිත්වයෙහි තොරතුරු පද්ධතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට විගණකට සහාය වෙයි.

කුඩා අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ93. කුඩා අස්තිත්වයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාල වන තොරතුරු පද්ධති හා ඒ හා සම්බන්ධ ව්‍යාපාරික ක්‍රියාවලි වඩා විශාල අස්තිත්වයන්හි තරම් අසංකලිෂ්ට නොවියහැකි වුවද ඒවායෙහි කාර්යභාරය එවැනිම සැලකිය යුතු ස්වභාවයක් ගනියි. ක්‍රියාකාරී කළමනාකාරිත්වය සහභාගී වීම සහිත කුඩා අස්තිත්ව වලට ගිණුම්කරණ පටිපාටි වල පුළුල් විවරණාත්මක විස්තර කිරීම්, අසංකලිෂ්ට ගිණුම්කරණ ලේඛනගත කිරීමේ පටිපාටි, හෝ ලිඛිත ප්‍රතිපත්ති අවශ්‍ය නොවිය හැකිය. ඒ අනුව වඩා කුඩා අස්තිත්වයක් විගණනයෙහිදී අස්තිත්වයෙහි පද්ධති සහ ක්‍රියාවලි අවබෝධ කර ගැනීම වඩා පහසු විය හැකි අතර ලිපිලේඛන සමාලෝචනයට වඩා විමර්ශණය මත රඳා පැවතිය හැකිය. කෙසේ වුවද අවබෝධයක් ලබාගැනීමේ වැදගත්කම එසේම පවතී.

සන්නිවේදනය (19 ඡේදය බලන්න)

අ94. මූල්‍ය වාර්තාකරණ කාර්යභාරයේ සහ වගකීම් සහ මූල්‍ය වාර්තාකරණයට අදාල වැදගත් කරුනුත් පිළිබඳව අස්තිත්වය මඟින් සන්නිවේදනය කිරීමේදී මූල්‍ය වාර්තාකරණයට අදාල වන අභ්‍යන්තර පාලනයට සම්බන්ධ තනි තනි කාර්යභාර සහ වගකීම් පිළිබඳව අවබෝධයක් ලබා දීමට අවශ්‍ය කෙරේ. මූල්‍ය වාර්තාකරන තොරතුරු පද්ධතියෙහි ඔවුනොවුන්ගේ ක්‍රියාකාරකම් අනෙකුත් අයගේ වැඩවලට කොතෙක් දුරට සම්බන්ධ ව්‍යතිරේකයන් අස්තිත්වය තුල යෝග්‍ය ඉහළ තලයකට වාර්තා කිරීමේ විධි ක්‍රම කාර්ය මණ්ඩල තේරුම්ගෙන තිබීම වැනි කරුණු එයට ඇතුලත්ය. සන්නිවේදනය ප්‍රතිපත්ති අත්පොත් සහ මූල්‍ය වාර්තා අත්පොත් ආකාරයෙන් සිදු විය හැකිය. විවෘත සන්නිවේදන මාර්ග බැහැරලීම් වාර්තා කරනු ලැබීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි කටයුතු කිරීම සහතික කිරීමෙහිදී උපකාරී වෙයි.

කුඩා අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ95. වගකීම් මට්ටම් අඩුවීමත්, කළමනාකාරීත්වයෙහි දෘශ්‍ය මානභාවය සහ නිදහස්ව ඇති භාවය වඩා විශාල වීමත් නිසා විශාල අස්තිත්වයකට වඩා කුඩා අස්තිත්වයක සන්නිවේදනය සරල ව්‍යුහයක් ගන්නා අතර පහසුවෙන් සපුරාගැනීමටද හැකිවෙයි.

විගණනයට අදාල *අභ්‍යන්තර පාලනයේ සංරචක* - පාලන ක්‍රියාකාරකම් (20 ඡේදය බලන්න)

අ96. කළමනාකාරිත්වයෙහි නියෝග ක්‍රියාත්මක වන බව සහතික වීම උදෙසා සහාය වන ප්‍රතිපත්ති සහ පටිපාටි පාලන ක්‍රියාකාරකම්ය. තොරතුරු තාක්‍ෂණික පද්ධතියක වේවා, මිනිස් ක්‍රියාකාරී පද්ධතියක වේවා, පාලන ක්‍රියාකාරකම් විවිධ අරමුණු සහිත වන අතර විවිධ සංවිධානාත්මක සහ කාර්යබද්ධ මට්ටම් වල ව්‍යවහාර වෙයි. විශේෂිත පාලන ක්‍රියාකාරකම් සඳහා උදාහරණ වලට පහත දැක්වෙන දේ වලට අදාල විශේෂිත පාලන ක්‍රියාකාරකම් ඇතුළත්ය.

- අනුමැතිය දීම
- කාර්ය සාධන සමාලෝචන

- තොරතුරු සැකසුම් කිරීම
- භෞතික පාලක
- කාර්ය භාරයන් වෙන් කිරීම

අ97. විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් වනුයේ;

- ඒ ගණයෙහි ලා සැලකිය යුතු, ප්‍රමාණාත්මක අවදානම් වලට අදාල වන්නා වූ පාලන ක්‍රියාකාරකම් වන සහ අනුපිළිවෙළින් 29 වැනි සහ 30 වැනි ඡේද වලින් අවශ්‍ය කෙරෙන පරිදි තහවුරු පටිපාටි වලින් පමණක් ප්‍රමාණවත් විගණන සාක්ෂි නොසැපයෙන අවදානම් වලට අදාල වන පාලන ක්‍රියාකාරකම්; හෝ
- විගණකවරයාගේ විනිශ්වයට අනුව අදාල වනසේ සලකනු ලබන පාලන ක්‍රියාකාරකම්

අ98. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් පැන නැගිය හැකි සේ විගණකවරයා හඳුනාගෙන ඇති අවදානම සහ තහවුරු පරීක්ෂාවෙහි ප්‍රමාණය නිගමනය කිරීමේදී පාලනයෙහි මෙහෙයුම් සඵලදායිත්‍වය පරීක්ෂා කිරීමට උචිත වනු ඇතැයි විගණකවරයා අදහස් කරන්නේද යන්න මඟින් පාලන ක්‍රියාකාරකමක් විගණනයට අදාල වන්නේද යන්න පිළිබඳව විගණකගේ විනිශ්වයට බලපෑම් සිදු කරනු ලබයි.

අ99. ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම වැඩි වීමට ඉඩ ඇති ලෙස විගණකවරයා විසින් සලකනු ලබන ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරන පාලන ක්‍රියාකාරකම් හඳුනාගැනීම සහ අවබෝධ කරගැනීම කෙරෙහි විගණකවරයාගේ අවධානය යොමු වී තිබිය හැකිය. සෑම එකින්ම එකම අරමුණ සපුරාලන බහුවිධ පාලක ක්‍රියාකාරකම් එවැනි අරමුණකට අදාල පාලන ක්‍රියාකාරකම් සෑම එකක් පිළිබඳව වෙන් වශයෙන් අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍යය.

අ100.අභ්‍යන්තර පාලනයෙහි අනෙකුත් සංරචක පිළිබඳ අවබෝධයෙන් පාලන ක්‍රියාකාරකම් ඇතිබව හෝ නැති බව පිළිබඳව විගණකවරයා ලබාගත් දැනීම පාලන ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධ කරගැනීමට අමතර අවධානයක් යොමු කළ යුතු වන්නේද යන්න නිශ්වය කිරිම සඳහා විගණකවරයාට උපකාරී වෙයි.

කුඩා අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ101.කුඩා අස්තිත්වයන්හි පාලන ක්‍රියාකාරකම් වල සංකල්පමය අන්තර්ගතය වඩා විශාල අස්තිත්වයන්ට සමාන වීමේ හැකියාවක් පවත්නා නමුත් ඒවා ක්‍රියාත්මක වන විධිය විවිධ විය හැකිය. ඊට අමතරව, කළමනාකාරිත්වය විසින් ව්‍යවහාර කරනු ලබන පාලන හේතු කොට ගෙන ඇතැම් පාලන ක්‍රියාකාරකම් අදාල නොවන බව කුඩා අස්තිත්වයන්ට දැනෙනවා විය හැකිය. උදාහරණයක් වශයෙන් ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සැලසීමෙහි සහ සැලකිය යුතු මිලදී ගැනීම් සම්බන්ධයෙන් තනි බලය කළමනාකාරිත්වය සතු වන විට එමගින් වැදගත් ගිණුම් ශේෂයන් කෙරෙහි දැඩි පාලනයක් මෙන්ම වඩා විස්තරාත්මක පාලන ක්‍රියාකාරකම් හීන වීම හෝ ඉවත්වීම සිදු විය හැකිය.

අ102.වඩා කුඩා අස්තිත්වයක් විගණනය සඳහා අදාල වන පාලන ක්‍රියාකාරකම්, වලට ආදායම්, මිලදී ගැනීම් සහ සේවක වියදම් වැනි ප්‍රධාන ගනුදෙනු චක්‍ර වලට අදාල වනු විය හැකිය.

තොරතුරු තාක්ෂණයෙන් පැන නගින අවදානම් (21 ඡේදය බලන්න)

අ103.පාලන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කෙරෙහි තොරතුරු තාක්ෂණ භාවිතය බලපෑම් සිදු කරයි. විගණකගේ සාපේක්ෂ වැදගත්කම පිළිබඳ අදහස අනුව තොරතුරු තාක්ෂණ පද්ධති ඵලදායී වනුයේ ඒ පද්ධති මගින් පැනනගින තොරතුරු වල පරිපූර්ණත්වයත්, දත්ත වල සුරක්ෂිතතාවයත් පවත්වාගෙන යාමත්, පොදු සඵලදායී තාක්ෂණික පාලන සහ ව්‍යාවහාරික පාලන අන්තර්ගතව තිබීමත් මතය.

අ104.පොදු තොරතුරු තාක්ෂණික පාලන වනුයේ බොහෝ භාවිතයන්ට සම්බන්ධ සහ භාවිත පාලන වලට සඵලදායී ක්‍රියාකාරිත්‍වයට සහාය වන ප්‍රතිපත්ති සහ පටිපාටිය. ඒවා ප්‍රධාන පරිගණකය කුඩා පරිගණකය සහ අවසාන පරිභෝජක වාතාවරණයට ව්‍යවහාර වෙයි. තොරතුරු වල පරිපූර්ණත්‍වය සහ දත්ත වල සුරක්ෂිතභාවය පවත්වාගන්නා තොරතුරු තාක්ෂණික පාලක වල පොදුවේ පහත දක්වෙන දෑ මත පාලනයක් ඇතුළත් වෙයි.

- දත්ත කේන්ද්‍රය සහ ජාල මෙහෙයුම්
- පද්ධති මෘදුකාංග අත්කර ගැනිම, වෙනස් කිරීම සහ නඩත්තුව
- වැඩසටහන් වෙනස් කිරීම
- ප්‍රවේශ වීම් ආරක්ෂණය
- ව්‍යවහාර පද්ධති අත්කර ගැනීම, ප්‍රවර්ධනය සහ නඩත්තුව

ඉහත අ 63 ඡේදයෙහි සඳහන් වූ අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මේවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කෙරෙයි.

අ105.යෙදුම් පාලන වනුයේ ව්‍යාපාරික ක්‍රියාවලි මට්ටමෙහි ආකෘතික ලෙස ක්‍රියාත්මක වන සහ තනි යෙදවුම් වලින් ගනුදෙනු සැකසීමෙහිදී අදාල වන මිනිස් ක්‍රියාකාරි හෝ ස්වයං ක්‍රියාකාරී පටිපාටිය. යෙදුම් පාලන නිවාරණ හෝ අනාවරණ ස්වභාවයෙහි විය හැකි අතර ගිණුම්කරණ ලේඛන වල අවංකභාවය සහතික කිරීම උදෙසා සැලසුම්කෙරේ. ඒ අනුව යෙදුම් පාලන ගනුදෙනු හෝ වෙනත් මූල්‍යමය දත්ත ආරම්භ කිරිමට, සටහන් කිරිමට, සකස් කිරීමට සහ වාර්තා කිරීමට උපයෝගී කරගනු ලබන පටිපාටි වලට සම්බන්ධ වෙයි. ගනුදෙනු සිදු වූ බව, අනුමත කරනු ලැබ ඇති බව සහ අංග සම්පූර්ණවත් නිවැරදිවත් සටහන් කර සහ සකස් කර ඇති බව තහවුරු කිරිමට මෙම පාලන උපකාරී වෙයි. යෙදවුම් දත්ත සංස්කරණ පරීක්ෂා සහ ව්‍යතිරේඛ වාර්තා සම්බන්ධ මිනිස් ක්‍රියාකාරී ඇණවුම් වල අංකන රටාව පරීක්ෂා කිරීම් හෝ දත්ත කැවීම් පියවරෙහිදී නිවැරදි කිරීම් උදාහරණ වලට ඇතුළත්ය.

*අභ්‍යන්තර පාලනයෙහි සංරචක* - පාලන අධීක්ෂණය (22 ඡේදය බලන්න)

අ106.පාලන අධීක්ෂණය යනු අභ්‍යන්තර පාලන කාර්ය සාධනයේ සඵලදායිත්වය කාලයානුරූප තක්සේරු කිරීමේ ක්‍රියාවලියකි. කාලානුරූප පදනමකින් පාලන වල සඵලදායිත්‍වය තක්සේරු කිරීමත් අවශ්‍ය පරිදි නිවැරදි කිරීම් සිදු කිරීමත් ඊට ඇතුළත්ය. සිදු වෙමින් පවත්නා ක්‍රියාකාරකම්, වෙනත් අන්දමේ ඇගයීම් හෝ ඒ දෙකෙහි සංයෝජිතයන් හරහා කළමනාකාරිත්වය පාලන අධීක්ෂණය සපුරා ගනියි. සිදු වෙමින් පවත්නා ක්‍රියාකාරකම් බොහෝ විට අස්තිත්වයක සාමාන්‍ය පුනරාවර්තන වන ක්‍රියාකාරකම් හා බැඳී පවත්නා අතර විධිමත් කළමනාකරණ හා සුපරීක්ෂණ ක්‍රියාකාරකම් වලින් සමන්විත වෙයි.

අ107.ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සහ ගැටළු වැඩිදියුණු කළයුතු කරන අබණ්ඩමත වැනි බාහිර පාර්ශවයන් සමඟ සන්නිවේදනයන්ගෙන් ලබා ගත් තොරතුරු භාවිතා කිරීමේ කළමනාකාරිත්වයෙහි අධීක්ෂණ ක්‍රියාකාරකම් වල අන්තර්ගත විය හැකිය.

කුඩා අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ108. කළමනාකාරිත්වයෙහි පාලන අධීක්ෂණය බොහෝ විට කළමනාකාරිත්වයෙහි හෝ හිමිකාර කළමනාකරුගේ සමීප මෙහෙයුම් මැදිහත් වීම මඟින් ඉටු කර ගැනෙයි. මෙම මැදිහත් වීමෙන් බොහෝ විට පාලනයට පිළියම් යෙදිය යුතු අන්දමේ මූල්‍යමය දත්ත වල වැරදි සහ අපේක්ෂා කෙරෙන් සැලකිය යුතු විචලනයන් හඳුනා ගැනෙයි.

අස්තිත්වයේ අභ්‍යන්තර විගණන කාර්යය (23 වැනි ඡේදය බලන්න)

අ.109 අභ්‍යන්තර විගණන පද්ධතියක් අස්තිත්වයෙහි පවත්නේ නම් එම පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම මගින් අස්තිත්වයේ අභ්‍යන්තර පාලනය, විශේෂයෙන් අස්තිත්යේ මූල්‍ය වාර්තාකරණය අධීක්ෂණයෙහිදී අභ්‍යන්තර විගණන පද්ධතිය මඟින් ඉටුකරනු ලබන කාර්යභාර්යය ඇතුළත්ව අස්තිත්වයත් එහි වටපිටාවත් අවබෝධ කරගැනීමෙහිදී විගණකවරයාට දායකත්වය සපයනු ලබයි. මෙම අවබෝධය, මෙම ශ්‍රී.ල.වි.ප්‍රමිතයෙහි 6(අ) ඡේදයෙහි විගණකවරයාගේ විමසීම් මඟින් ලබාගන්නා තොරතුරුද සමග ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට ඍජුවම අදාල වන තොරතුරු ද විගණකවරයාට සපයනු විය හැකිය.

අ.110 අභ්‍යන්තර විගණන පද්ධතියක අරමුණු සහ විෂයපථය පද්ධතියෙහි අධිකාරී බලය සහ වගකීම්භාරය ඇතුළත්ව ආයතනය තුළ එහි ස්ථාවරයෙහි සහ වගකීම් වල ස්වභාවය මත ලොකු පරාසයක වෙනස් වන අතර අස්තිත්යේ ප්‍රමාණය සහ ආකෘතිය මත මෙන්ම කළමනාකාරිත්වයේ සහ අදාල තැන්හිදී බලය පැවරී ඇත්තවුන්ගේ අවශ්‍යතා මත රඳා පවතියි. මෙම කරුණු අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියක හෝ වගන්ති සංග්‍රහයක විස්තරාත්මකව සඳහන් වනු ඇත.

අ.111 අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ පාලන ක්‍රියාදාමය පිරිසැලසුම් කිරීම සහ එහි ඵලදායිත්‍වය සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට සහ බලය පැවරී ඇත්තවුන්ට තහවුරුවක් සැපයීමට පටිපාටි ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල ඇගයීම අභ්‍යන්තර විගණන පද්ධතියක වගකීම් වලට ඇතුළත් විය හැකිය. එසේ වන්නේ නම් අභ්‍යන්තර විගණන පද්ධතිය විසින් අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනයෙහි වැදගත් භූමිකාවක් ආවරණය කරනු ඇත. එසේ වුවද අභ්‍යන්තර විගණන පද්ධතියේ වගකීම් ආර්ථිකය, මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය සහ ඵලදායීත්‍වය ඇගයීම කෙරෙහි කේන්ද්‍රගත විය හැකි අතර, එසේ වන්නේ නම් පද්ධතියේ කාර්යයන් අස්තිත්‍වයේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි ඍජුව අදාල නොවනු විය හැකිය.

අ.112 මෙම ශ්‍රී.ල.වි.ප්‍ර හි 6(අ) ඡේදයට අනුගතව අභ්‍යන්තර විගණන පද්ධතියේ අදාල පුද්ගලයින් කෙරෙන් විගණකවරයාගේ විමසීම් අභ්‍යන්තර විගණන පද්ධතියෙහි වගකීම් වල ස්වභාවය අවබෝධ කරගැනීමට විගණකවරයාට උපකාරී වෙයි. පද්ධතියෙහි වගකීම් අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණයට අදාල වන්නේ යැයි විගණකවරයා නිශ්චය කරන්නේ නම් කාලපරිච්ඡේදයට අදාල අභ්‍යන්තර විගණන පද්ධතියේ විගණන සැලැස්මක් අත්තේ නම් එය සමාලෝචනයෙන් හෝ එම සැලැස්ම පද්ධතිය තුළ අදාල පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීමේත් විගණකවරයා ක්‍රියාත්මක කරනු ලබන හෝ ක්‍රියාත්මක කිරීමට ඇති පටිපාටි පිළිබඳව වැඩිමනත් අවබෝධයක් ලබාගනු ඇත.

අ.113 අභ්‍යන්තර විගණන පද්ධතියෙහි වගකීම් සහ සත්‍යාපන ක්‍රියාකාරකම්වල ස්වභාවය අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණයට අදාල වන්නේ නම් විගණන සාක්ෂි ලබාගැනීමේදී විගණකවරයා විසින් සෘජුව ක්‍රියාත්මක කිරීමට අදහස් කරන විගණන පටිපාටි වල කාලය නිර්ණයෙහි ස්වභාවය විකරණය කිරීමට හෝ ඒවායෙහි ව්‍යාප්තිය අඩු කිරීමටත් අභ්‍යන්තර විගණක පද්ධතියේ කාර්යයන් භාවිත කිරීමටද විගණකවරයාට හැකිවනු ඇත. අස්තිත්වයක අභ්‍යන්තර විගණන පද්ධතියක්, උදාහරණ වශයෙන් පූර්ව විගණනයන්හි අත්දැකීම් මත හෝ විගණකවරයාගේ අවදානම් තක්සේරු කිරීම් පටිපාටි මත පදනම්ව අස්තිත්වයේ ප්‍රමාණයටත් එහි මෙහෙයුම් වලටත් සාපේක්ෂව ප්‍රමාණවත් සහ යෝග්‍ය සම්පත් සහිත අභ්‍යන්තර විගණක පද්ධතියක් අස්තිත්‍වය සතුව පවත්නා බවත් බලය පැවරී ඇත්තවුන්ට සෘජුව වාර්තා කිරීමේ සබඳතාවයක් පවත්නා බවත් පෙනීයන විට අස්තිත්වයේ අභ්‍යන්තර විගණන පද්ධතියේ කාර්යයන් භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව වැඩි ඉඩකඩක් විගණකවරුන්ට පැවතීමේ අවකාශ තිබිය හැකිය.

අ.114 අභ්‍යන්තර විගණක පද්ධතිය පිළිබඳව විගණකවරයාගේ ප්‍රාථමික අවබෝධය පදනම් කරගනිමින් විගණකවරයා ක්‍රියාත්මක කිරීමට අරමුණු කරන විගණක පටිපාටි වල ස්වභාවය හෝ කාලනිර්ණය විකරණය කිරීමට හෝ ව්‍යාප්තිය අඩු කිරීමට අභ්‍යන්තර විගණක පද්ධතියේ කාර්යයන් භාවිත කිරීමට විගණකවරයා අපේක්ෂා කරන්නේ නම් ශ්‍රී.ල.වි.ප්‍ර 610 (සංශෝධිත) අදාල වෙයි.

අ.115 ශ්‍රී.ල.වි.ප්‍ර 610 (සංශෝධිත) යටතේ වැඩිදුරටත් සාකච්ඡා කෙරෙන පරිදි අභ්‍යන්තර විගණක පද්ධතියක ක්‍රියාකාරකම් මූල්‍ය වාර්තාකරණයට අදාල වන, අස්තිත්‍වය සාවද්‍ය ප්‍රකාශ වලක්වාගැනීම හෝ අනාවරණය කරගැනීම සිදුකරන්නේ කවර ආකාරයකින්ද යන්නට දායක වන කළමනාකාරිත්ව ගිණුම්කරණ තොරතුරු සමාලෝචනය වැනි අනෙකුත් අධීක්ෂණ පාලක වලින් පැහැදිලිවම වෙනස් වෙයි.

අ.116 ගිවිසුම්ගත වීමෙහිදී කල්තබා අස්තිත්වයේ අභ්‍යන්තර විගණක පද්ධතියෙහි යෝග්‍ය පුද්ගලයින් සමග සන්නිවේදනයන් ස්ථාපනය සහ ගිවිසුම් කාලපරිච්ඡේදය පුරා අඛණ්ඩව එම සන්නිවේදනයන් පවත්වා ගැනීම මඟින් ඵලදායි ලෙස තොරතුරු හුවමාරු කරගැනීම පහසු කරනු ලබයි. විගණකවරයාගේ කාර්යය කෙරෙහි බලපෑම් සිදුකෙරෙන වැදගත් කරුණු ඇතිවන විට ඒ කරුණු පිළිබඳව අභ්‍යන්තර විගණක පද්ධතිය විසින් විගණකවරයා දැනුවත් කරන වාතාවරණයක් එයින් නිර්මාණය වෙයි. විගණකවරයා විසින් වෘත්තීය සංශයභාවයෙන්, විගණන සාක්ෂි ලෙස භාවිතා කරන ලියකියවිලි සහ විමසීම් වල විශ්වසනීයත්‍වය ප්‍රශ්න කෙරෙන තත්‍වයක් උද්ගත කරන තොරතුරු කෙරෙහි අවදියෙන් සිටීම ඇතුළත්ව විගණනය සැලසුම් කිරීමේත්, ක්‍රියාත්මක කිරීමේත් වැදගත්කම ශ්‍රී.ල.වි.ප්‍ර 200 හි සාකච්ඡා කෙරෙයි. ඒ අනුව ගිවිසුම්ගත කාලය පුරාම අභ්‍යන්තර විගණන පද්ධතිය සමඟ සන්නිවේදනයෙහි එවැනි තොරතුරු විගණකවරයාගේ අවධානයට යොමු කිරීමට අභ්‍යන්තර විගණකවරුන්ට අවකාශ සැලසෙයි. අනතුරුව විගණකවරයාගේ ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීමේදී සහ තක්සේරු කිරීමෙහිදී ඒ තොරතුරු සැලකිල්ලට ගැනීමට විගණකවරයාට හැකිවෙයි.

තොරතුරු මූලාශ්‍ර (24 වැනි ඡේදය බලන්න)

අ117. අධීක්ෂණයෙහිදී භාවිතා කෙරෙන තොරතුරු බොහෝ දෙයක් අස්තිත්‍වයෙහි තොරතුරු පද්ධතියෙන් ඉදිරිපත් කෙරෙනු විය හැකිය. අධීක්ෂණය සඳහා භාවිතා කෙරෙන තොරතුරු නිවැරදි යැයි එවැනි උපකල්පනයකට පදනමක් නොමැතිව කළමනාකරණය උපකල්පනය කරන්නේ නම්, එහි අධීක්ෂණ ක්‍රියාකාරකම් වලින් කළමනාකාරිත්වය වැරදි නිගමන කරා මෙහෙයවීමේ හැකියාව ඇති වැරදි එම තොරතුරු වල පවතිනවා විය හැකිය.එහෙයින් අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලනයෙහි කොටසක් ලෙස අධීක්ෂණ ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමේදී විගණකවරයා කෙරෙන් පහත සඳහන් දෑ පිළිබඳව අවබෝධයක් අවශ්‍ය කෙරෙයි.

- අස්තිත්වයෙහි අධීක්ෂණ ක්‍රියාකාරකම් වලට සම්බන්ධිත තොරතුරු වල මූලාශ්‍ර
- අරමුණ සඳහා තොරතුරු ප්‍රමාණවත් වන බවට කළමනාකාරිත්වය සැලකිල්ලට ගත් පදනම

**ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම (24 වැනි ඡේදය බලන්න)**

*මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහිදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම තක්සේරු කිරීම (24 (අ) ඡේදය බලන්න)*

අ118. සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වල ප්‍රථුලව සම්බන්ධ සහ බොහෝ සැදහුම්වලට භව්‍ය ලෙස බලපෑම් සිදු කළ හැකි අවදානම් මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහිදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් ලෙස හැඳින්වෙයි. මේ අන්දමේ

අවදානම් අවශ්‍යයෙන්ම, ගනුදෙනු පන්තිය, ගිණුම් ශේෂය හෝ හෙළිදරව් කිරීම් මට්ටමේදී නිශ්චිත සැදහුම් සමග හඳුනාගත හැකි අවදානම් වියයුතුම නොවේ. වැඩි වශයෙන් එමගින් පිළිඹිබු වනුයේ සැදහුම් මට්ටමෙහි අවප්‍රකාශ වල අවදානම වැඩි කරවන අන්දමේ වාතාවරණයක් වන අතර කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර පාලන අභිබවා යාම උදාහරණයකි. මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහි අවදානම්, වංචා මඟින් පැනනගින අවදානම කෙරෙහි විගණකගේ සැලකිල්ල යොමු වීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම අදාල විය හැකිය.

අ119. මූල්‍ය ප්‍රකාශ මට්ටමෙහි අවදානම් (මෙම අවදානම් හීන වෙමින් පවත්නා ආර්ථික තත්වයන් වැනි වෙනත් සාධක වලටද අදාල විය හැකි නමුත්) විශේෂයෙන්ම ඌන පාලන පරිසරයකින් උත්පාදනය වනු විය හැකිය. උදාහරණ වශයෙන් කළමනාකාරිත්වයෙහි නිපුනතාවය මඳ වීම වැනි ඌනතා මූල්‍ය ප්‍රකාශ මත වඩා පෘථුල බලපෑමක් දක්විය හැකි අතර ඒ කෙරෙහි සමස්ත ප්‍රතිචාරයක් විගණකවරයා වෙතින් අවශ්‍ය කෙරෙනු විය හැකිය.

අ120. අභ්‍යන්තර පාලනය පිළිබඳව විගණකවරයාගේ අවබෝධයෙන් අස්තිත්වයෙහි මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සැක උද්ගත විය හැකිය. උදාහරණ

- අස්තිත්‍වයෙහි කළමනාකාරිත්වයේ අවංකභාවය සම්බන්ධයෙන් පවත්නා තත්ව බරපතල වීමෙන් මූල්‍ය ප්‍රකාශ වල කළමනාකාරිත්වයෙහි අවනිදේශන වල අවදානම විගණනයක් සිදු කළ නොහැකි යැයි විගණකවරයාට අවසාන තීරණයකට එළඹෙන්නට හේතු විය හැකි තරමට පැවතිය හැකිය.
- අස්තිත්වයෙහි ලේඛනවල තත්වය සහ විශ්වසනීයත්‍වය මූල්‍ය ප්‍රකාශ මත කොන්දේසි සහිත කළ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සහාය වන ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගත නොහැකි යැයි විගණකට අවසාන නිගමනයකට එළඹීමට හේතු විය හැකිය.

අ121. විගණකට කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කිරීමට හෝ මතයක් වියාචනය කිරීමට හෝ, ඇතැම් අවස්ථා වලදී අවශ්‍ය විය හැකි පරිදි අදාල නීති හෝ රෙගුලාසි අනුව ඉවත් විය හැකි වන විට කාර්යභාරයෙන් ඉවත් වීම නිර්ණය කිරීම සඳහා වන අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 705[15]න් ස්ථාපනය කර ඇත.

*සැදහුම් මට්ටමෙහිදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම තක්සේරු කිරීම (25 (ආ)ඡේදය බලන්න)*

අ122. ගනුදෙනු පන්තීන්, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් සම්බන්ධ සැදහුම් මට්ටමෙහිදී අවශ්‍ය ප්‍රමාණවත්, උචිත විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා අමතර විගණන පටිපාටි වල ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීමෙහි ලා ඍජුව උපකාරී වනුයෙන් එවැනි කරුණු පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය වෙයි. සැදහුම් මට්ටමෙහිදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම් හඳුනාගැනීමේදී සහ තක්සේරු කිරීමේදී හඳුනාගත් අවදානම් වඩා පෘථුලව සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ වලට අදාල වන බවත් භව්‍ය වශයෙන්, බොහෝ සැදහුම් කෙරෙහි බලපෑම් සිදු කිරීමේ හැකියාවෙන් යුක්ත බවත් විගණක තීරණය කරනු විය හැකිය.

අ123. මූල්‍ය ප්‍රකාශ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාර ලෙස නියෝජනය කිරීමේදී කළමනාකාරිත්වය ඇතුළත් වීම හෝ ගම්‍යව හෝ ප්‍රකාශිතව මූල්‍ය ප්‍රකාශ වල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල විවිධ සංරචක පිළිගැනීම, මිණුම් කිරීම, ඉදිරිපත් කිරීම, ස්ථිර ලෙස සැදහුම් කරනු ලබයි.

අ124. පැවතිය හැකි විවිධ වර්ගවල භව්‍ය සාවද්‍ය ප්‍රකාශ සලකා බැලීමට විගණකවරයා භාවිතා කරන සැදහුම් පහත සඳහන් ප්‍රබේධ තුනට ඇතුළත් වන අතර පහත දක්වෙන ස්වරූප ගනියි.

(අ) විගණනයට යටත් කාලපරිච්ඡේදයෙහි ගනුදෙනු පන්තීන් සහ සිදුවීම් පිළිබඳ සැදහුම්;

(i) සිදු වීම සටහන් කල ගනුදෙනු සහ සිද්ධීන් සිදු වී ඇති අතර අස්තිත්‍වයට අදාල වෙයි.

(ii) පරිපූර්ණත්‍වය - සටහන් කළ යුතුව තිබූ සියළුම ගනුදෙනු සහ සිද්ධීන් සටහන් කරනු ලැබ තිබෙයි.

(iii) නිරවද්‍යතාවය - සටහන් ගනුදෙනු වලට සහ සිද්ධින්ට සම්බන්ධ වටිනාකම් සහ අනෙකුත් දත්ත යථා පරිදි සටහන් කර ඇත.

(iv) ලුහුකම්- ගනුදෙනු සහ සිද්ධීන් නිවැරදි ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළළ සටහන් කරනු ලැබ තිබෙයි.

(v) වර්ගීකරණය - ගනුදෙනු සහ සිද්ධීන් නියමිත ගිණුම් වල සටහන් කරනු ලැබ තිබෙයි.

[15] ශ්‍රී.ල.වි.ප්‍ර. 705, "ස්වාධීන විගණකවරයාගේ වාර්තාවෙහි මතයට 025 විකරණය කිරීම"

(ආ) කාලපරිච්ඡේදය අවසානයේ ගිණුම් ශේෂ පිළිබඳ සැදහුම්-

(i) පැවැත්ම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ අයිතිය පැවැත්ම.

(ii) අයිතිවාසිකම් සහ බැඳීම් - අස්තිත්වය වත්කම් වල අයිතිවාසිකම දරයි හෝ පාලනය කරයි, වගකීම් අස්තිත්වයෙහි බැඳීම් වෙයි.

(iii) පරිපූර්ණත්වය - සටහන් කළ යුතුව තිබූ සියළුම වත්කම්, වගකීම් සහ ස්කන්ධ අයිතීන් සටහන් කරනු ලැබ තිබෙයි.

(iv) තක්සේරු කිරීම සහ වෙන් කිරීම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ අයිතීන් නියමිත වටිනාකම් වලින් මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් කර ඇති අතර තක්සෙරු කිරීම් හෝ වෙන් කිරීම් ගැලපිලි වල ප්‍රතිඵල යථා පරිදි සටහන් කරනු ලැබ තිබෙයි.

(ඇ) ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම පිළිබඳ සැදහුම්-

(i) සිදුවීම් සහ අයිතිවාසිකම් සහ වගකීම් හෙළිදරව් කර ඇති සිද්ධීන් ගනුදෙනු සහ අනෙකුත් කරුණු සිදු වී ඇති අතර අස්තිත්වයට අදාල වෙයි.

(ii) පරිපූර්ණත්වය - මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් කළයුතුව තිබුණු සියළුම හෙළිදරව් කිරීම් ඇතුළත් කරනු ලැබ තිබෙයි.

(iii) වර්ගීකරණය කිරීම සහ අවබෝධ කරගත හැකි බව - මූල්‍යමය තොරතුරු යථා පරිදි ඉදිරිපත් කර සහ විස්තර කර ඇති අතර හෙළිදරව් කිරීම් පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

(iv) නිරවද්‍යතාවය සහ තක්සේරු කිරීම - මූල්‍යමය සහ අනෙකුත් තොරතුරු සාධාරණ ලෙස සහ උචිත වටිනාකම් වලින් හෙළිදරව් කර ඇත.

අ125. විගණක ඉහත විස්තර කළ සැදහුම් භාවිත කරයි හෝ ඉහත විස්තර කළ සියලුම පැතිකඩ ආවරණය වන්නේනම් ඒවා වෙනස් ආකාරයකට ප්‍රකාශ කරනු විය හැකිය. උදාහරණ වශයෙන් විගණක ගනුදෙනු සහ සිද්ධීන් සම්බන්ධයෙන් වන සැදහුම් ගිණුම් ශේෂ සමඟ වන සැදහුම් සමඟ සංයෝජනය කිරීමට තෝරාගනු විය හැකිය.

රාජ්‍ය අංශයෙහි අස්තිත්වයන්ට විශේෂිත සැලකිය යුතු කරුණු

අ126. රාජ්‍ය අංශයෙහි අස්තිත්වයන්හි මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සැදහුම් සිදු කිරීමෙහිදී අ 124 ඡේදයෙහි පෙන්වා දී ඇති සැදහුම් වලට අමතරව ගනුදෙනු සහ සිද්ධීන් නීත්‍යානුකූලව රෙගුලාසි වලට හෝ වෙනත් අධිකාරී වලට අනුව සිදු කර ඇති බව කළමනාකාරිත්වය විසින් තහවුරු කරනු ලැබිය හැකිය. එවැනි සැදහුම් මූල්‍ය ප්‍රකාශ විගණනයෙහි විෂය පථයෙහි ලා ගැනෙයි.

*ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනාගැනීමේ ක්‍රියාවලිය* ( 26 (අ) ඡේදය බලන්න)

අ127. පාලකයන් සැලසුම් කිරීමේදී සහ ඒවා ක්‍රියාත්මක කලේද යන්න නිර්ණය කිරීමේදී ලබා ගන්නා විගණන සාක්ෂි ඇතුළුව අවධානම් තක්සේරු පටිපාටි ඉටු කිරීමෙන් රැස් කර ගන්නා තොරතුරු අවධානම් තක්සේරු සහයට විගණන සාක්ෂිය ලෙස භාවිතා කෙරේ. අවධානම් තක්සේරුව ඔබ්බට ඉටු කළයුතු විගණන පටිපාටි වල ස්වාභයේ කාල නිර්ණය සහ ප්‍රමාණය නිරණය කරයි.

අ128. ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක අවධානම් වල පැවැත්ම ඇඟවිය හැකි තත්වයන් සහ සිද්ධීන් වලට උදාහරණ දෙකම පරිශිෂ්ඨය ලබා දේ.

*සැදහුම් වලට සම්බන්ධිත පාලන* (26 (ඇ) ඡේදය බලන්න)

අ129. විශේෂිත සැදහුම් කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වැලැක්වීමට හෝ අනාවරණය කරගැනීමට නිවැරදි කිරීම විය හැක. පාලන අවදානම් තක්සේරු කිරීමෙහිදී විගණනක විසින් හඳුනාගනු ලැබිය හැකිය. පාලන ක්‍රියාකාරකම් මඟින්ම තනි තනිව අවදානම් ආමන්ත්‍රණය කිරීමක් බොහෝ විට සිදු නොකරන බැවින් පාලන පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා ඒවා පවත්නා ක්‍රියාවලි සහ පද්ධති සම්බන්ධය ඒවා සැදහුම් වලට සම්බන්ධ කිරීමත් පොදුවේ ප්‍රයෝජනවත් වෙයි. බොහෝ විට බහුවිධ පාලක ක්‍රියාකාරකම් පමණක්, අභ්‍යන්තර පාලනයේ අනෙකුත් සංරචක සමඟ එක්ව ගත් කළ අවදානමක් ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් වනු ඇත.

අ130. විලෝම වශයෙන් ඇතැම් පාලන ක්‍රියාකාරකම් මඟින් එක්තරා ගනුදෙනු කාණ්ඩයක හෝ ගිණුම් ශේෂයක අන්තර්ගත වූ තනි සැදහුමක් කෙරෙහි විශේෂිත බලපෑමක් තිබිය හැකිය. උදාහරණ වශයෙන් අස්තිත්වයක් එහි පුද්ගලයන් විසින් වාර්ෂික භෞතික තොගය නිසියාකාරව ගණන් කර වාර්තා ගත කිරීම සහතික කරනු පිණිස ස්ථාපනය කර ඇති පාලන ක්‍රියාකාරකම් තොග ගිණුම් ශේෂයෙහි පැවැත්මටත් පරිපූර්ණත්ව සැදහුමන් සම්බන්ධයෙන් සෘජුව අදාල වෙයි.

අ131. පාලන ඍජුව හෝ වක්‍රව සැදහුම් අදාල විය හැකිය. සම්බන්ධතාවය වඩාත් ඍජු නොවන තාක් දුරට අවප්‍රකාශ වැලැක්වීමට හෝ හෙළිකිරීමට සහ නිවැරදි කිරීමට එම සැදහුමේ සඵලදායීත්‍වය අඩු වෙයි. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය නියමිත ගබඩාවල විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳව සාරාංශයක විකුණුම් කළමනාකරුවකුගේ සමාලෝචනය වක්‍රලෙස සම්බන්ධ වනුයේ විකුණුම් අයහාරයේ සැදහුම්වල පරිපූර්ණත්‍වය සඳහා පමණකි. ඒ අනුව එකී සැදමහුමේ අවදානම අඩු කිරීම සඳහා එහි සඵලදායිත්‍වය එම සැහුම් ප්‍රකාශයට වඩාත් ඍජුව අදාල වන, නැව් ගත කිරීම් ලියවිලි බිල්පත් ලියවිලි සමග ගැලපීමෙන් පාලන වලට අඩුවෙයි.

*සැලකිය යුතු අවදානම්*

සැලකිය යුතු අවදානම් හඳුනාගැනීම (28 වැනි ඡේදය බලන්න.)

අ132. සැලකිය යුතු අවදානම් බොහෝ විට සැලකිය යුතු නිත්‍ය නොවන ගනුදෙනු වලට හෝ විනිශ්චයට අදාල කරුණු වලට සම්බන්ධ වෙයි. නිත්‍ය නොවන ගනුදෙනු, ඒවායෙහි ප්‍රමාණය හෝ ස්වභාවය හේතුවෙන් අසාමාන්‍ය ගනුදෙනු වන අතර එහෙයින් කලාතුරකින් සිදුවෙයි. විනිශ්චයට අදාල කරුණු වලට සැලකිය යුතු අන්දමේ මිණුම්කරණ අනියත ගිණුම්කරණ ඇස්තමේන්තු වර්ධනය ඇතුළත් විය හැකිය. ක්‍රමානුකූල සැකසීමට භාජනය වන නිතර සිදුවෙන, අසංකීර්ණ ගනුදෙනු වලදී සැලකිය යුතු අවදානම් උද්ගත වීමේ හැකියාව අඩුය.

අ133. පහත සඳහන් දෑ වැනි කරුණු වලින් පැන නගින කලාතුරකින් සිදුවන සැලකිය යුතු අන්දමේ ගණුදෙනු වලින් වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වල අවදානම වැඩිවිය හැකිය.

- ගිණුම්කරණය කරන අන්දම නිශ්චය කිරීමේදී කළමනාකාරිත්වය විශාල ලෙස මැදිහත් වීම.
- දත්ත රැස් කිරීම සහ සකස් කිරීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් විශාල ලෙස මැදිහත් වීම.
- සංකීර්ණ ගණනය කිරීම් හෝ ගිණුම්කරණ මූලධර්මයන්
- අවදානම් මත කෙරෙන ඵලදායි පාලන ක්‍රියාත්මක කිරීම අස්තිත්‍වයට අපහසු කළ හැකි අන්දමේ කලාතුරකින් සිදුවන ගනුදෙනු වල ස්වභාවය

අ134. පහත දැක්වෙන දෑ වැනි කරුණු කෙරෙන් පැනනගින ගිණුම්කරණ ඇස්තමේන්තු වර්ධනය සඳහා අවශ්‍ය සැලකිය යුතු විනිශ්චයට අදාල කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වල අවදානම වඩා විශාල විය හැකිය.

- ගිණුම්කරණ ඇස්තමේන්තු හෝ ආදායම් හඳුනාගැනීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති එකිනෙකින් වෙනස් වන අර්ථකථනයන්ට යටත් විය හැකි වීම.
- අවශ්‍ය විනිශ්චය විෂයානුගත හෝ සංකීර්ණ හෝ අනාගත සිදුවීම් වල බලපෑම් සම්බන්ධ උපකල්පන (උදාහරණයක් ලෙස සාධාරණ අගය පිළිබඳ විනිශ්චය) අවශ්‍ය කෙරෙන ආකාරයෙහි විය හැකිය.

අ135. අවදානමක් සැලකිය යුතු ලෙස හඳුනා ගැනීම සඳහා වන අමතර විගණන පටිපාටි සඳහා අදාල වන ප්‍රථිඵලය ශ්‍රී.ල.වි.ප්‍ර 330 හි විස්තර වෙයි.[16]

**වංචා හේතු කොටගෙන ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් සම්බන්ධ සැලකිය යුතු අවදානම්**

අ136. වංචා හේතු කොට ගත් ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට අදාල අමතර අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 240 සලසයි.[17] සැලකිය යුතු අවදානම් වලට සම්බන්ධ පාලන හඳුනාගැනීම. (29 වැනි ඡේදය බලන්න)

අ137. සැලකිය යුතු ඒ අනුව කලාතුරකින් වන හෝ විනිශ්චයාත්මක කරුණු වලට අදාල අවදානම් බොහෝ විට චර්යානුගත පාලන වලට යටත් නොවිය හැකි නමුත් එවැනි අවදානම් පිළිබඳව කටයුතු කිරීම අරමුණු කර ගත් වෙනත් ප්‍රතිචාර කළමනාකාරිත්වය සතු විය හැකිය. ඒ අනුව කලාතුරකින් වන හෝ විනිශ්චයාත්මක කරුණු කෙරෙන් පැනනගින සැලකිය යුතු අවදානම් සඳහා අස්තිත්වය විසින් පාලන නිර්මාණය කර සහ ක්‍රියාත්මක කර ඇත්ද යන්න සම්බන්ධයෙන් විගණකවරයාගේ අවබෝධයට කළමනාකාරිත්වය එකී අවදානම් වලට ප්‍රතිචාර දක්වන්නේද යන්නත්, කෙසේ ප්‍රතිචාර දක්වන්නේද යන්නත් ඇතුළත් වෙයි.

[16] ශ්‍රී.ල.වි.ප්‍ර. 330, ඡේද 15 සහ 21
[17] ශ්‍රී.ල.වි.ප්‍ර. 240, ඡේද 25 - 27

එවැනි ප්‍රතිචාර වලට;

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හෝ විශේෂඥයින් විසින් උපකල්පන සමාලෝචනය කිරීම වැනි පාලන ක්‍රියාකාරකම්
- ඇස්තමේන්තු කිරීම සඳහා ලේඛනගත ක්‍රියාවලි
- පාලන කාර්යභාරයේ නියැලී ඇත්තවුන්ගේ අනුමැති ඇතුළත් විය හැකිය.

අ138. උදාහරණයක් වශයෙන්, වැදගත් නඩුවක නිවේදනයක් ලැබීම වැනි වරක පමණක් සිදුවන සිදුවීම් වලදී එය උචිත විශේෂඥවරුන්ට (අභ්‍යන්තරික හෝ බාහිර නීති උපදේශකවරුන් වැනි) යොමු කර ඇත්ද, භව්‍ය බලපෑම පිළිබඳව තක්සේරුවක් කර ඇත්ද සහ වාතාවරණයන් මූල්‍ය ප්‍රකාශ වල කවර ආකාරයකින් හෙළිදරව් කිරීමට යෝජනා කර ඇත්ද යන කරුණු අස්තිත්වයෙහි ප්‍රතිචාරය සම්බන්ධයෙන් සැලකිල්ලට ගන්නා කරුණු වලට ඇතුළත් විය හැකිය.

අ139. ඇතැම් අවස්ථාවලදී කළමනාකාරිත්වය විසින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වල සැලකිය යුතු අවදානම් සම්බන්ධයෙන්, මෙම ප්‍රමාණාත්මක අවදානම් මත පාලන ක්‍රියාත්මක කිරීමෙන් යථා පරිදි ප්‍රතිචාර දක්වා නොතිබිය හැකිය. එවැනි පාලන ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය අපොහොසත් වීම අභ්‍යන්තර පාලන වල සැලකිය යුතු ඌනතාවයක් හඟවන්නකි.[18]

තහවුරු පටිපාටි වලින් පමණක් ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි නොසැපයෙන අවදානම් (ඡේද 30 බලන්න)

අ140. අව ප්‍රකාශ වල අවදානම් චර්යානුගත ගනුදෙනු හෝ ගිණුම් ශේෂ සටහන් කිරීමට සහ විශ්වසනීය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සෘජුව අදාල විය හැකිය. එවැනි අවදානම් වලට අස්තිත්වයක අයභාරය, මිලදී ගැනීම් සහ මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් වැනි චර්යානුගත සහ සැලකිය යුතු ගනුදෙනු කාණ්ඩ වැරදි සහගතව සහ අසම්පූර්ණ ලෙස සැකසීම් ඇතුළත් විය හැකිය.

අ141. එවැනි චර්යානුගත ව්‍යාපාරික ගනුදෙනු සුළු මිනිස් මැදිහත් වීමක් සහිතව හෝ මිනිස් මැදිහත් වීමක් නොමැතිව අතිශයින්ම ස්වයංක්‍රීය සැකසුම් වලට යටත් වන විට අවදානමට අදාලව තහවුරු පරිපාටි පමණක් ක්‍රියාත්මක කළ නොහැකි විය හැකිය. උදාහරණ වශයෙන් අස්තිත්වයෙහි තොරතුරු වලින් සැලකිය යුතු තරම් විශාල කොටසක් ආරම්භ කිරීම, සටහන් කිරීම. සැකසීම හෝ වාර්තා කිරීම සංකුලිත පද්ධතියක මෙන් ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පමණක් සිදු කෙරෙන වාතාවරණයකදී විගණකවරයා මේ තත්වය සැලකිල්ලට ගනියි. එවැනි අවස්ථා වලදී;

- විගණන සාක්ෂි ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් පමණක් තිබිය හැකි අතර එහි ප්‍රමාණාත්මක තත්‍වයත් උචිතභාවයත් එහි නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්‍වය කෙරෙහි වන පාලක වල ඵලදායිත්‍වය මත සාමාන්‍යයෙන් රඳා පවතියි.
- තොරතුරු අයෝග්‍ය ලෙස ආරම්භ කිරීම් හෝ වෙනස් කිරීම් සිදුවීමමත් සොයාගනු නොලැබීමත් වීමේ භව්‍යතාවය උචිත පාලන සඵලදායීව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වඩා ඉහළ මට්ටමක පැවතිය හැකිය.

අ142. එවැනි අවදානම් හඳුනාගැනීම පිණිස වන වැඩිදුර විගණක පටිපාටි වල වැදගත්කම ශ්‍රී.ල.වි.ප්‍ර 330 විස්තර වෙයි.[19]

අවදානම් තක්සේරු කිරීම සංශෝධනය (31 ඡේදය බලන්න)

අ143. අවදානම් තක්සේරු කිරීම සඳහා පදනම් කරගත් තොරතුරු වලට සැලකිය යුතු අන්දමින් වෙනස් තොරතුරු විගණනය තුළදී විගණකවරයාගේ අවධානයට යොමු විය හැකිය. උදාහරණ වශයෙන් අවදානම් තක්සේරු කිරීම ඇතැම් පාලන සඵලදායිව ක්‍රියාත්මක වන්නේය යන අපේක්ෂාව මත පදනම් වී තිබිය හැකිය. එකී පාලන පරීක්ෂාවන් ඉටු කිරීමෙහිදී එම පාලන විගණනය අතරවාරයෙහි අදාල වන අවස්ථා වලදී සඵලදායිව ක්‍රියාත්මක නොවූ බවට විගණන සාක්ෂි විගණකවරයා ලබාගනු විය හැකිය. එසේම තහවුරු පටිපාටි ඉටු කිරීමේදී විගණකගේ අවදානම් තක්සේරු සමඟ විශාල වශයෙන් වටිනාකමින් සහ සංකේතයෙන් වැඩියෙන් සංගත වන අවප්‍රකාශ විගණකවරයා විසින් අනාවරණය කරගනු විය හැකිය. එවැනි වාතාවරණයන්හිදී අවධානම් තක්සේරු කිරීම මඟින් අස්තිත්‍වයෙහි සත්‍ය වාතාවරණයන් උචිත ලෙස පිළිඹිබු නොකෙරෙනු ඇති අතර ප්‍රමාණාත්මක අවප්‍රකාශ අනාවරණය කර ගැනීම සඳහා සැලසුම් කළ ඉදිරි විගණන පටිපාටි සඵලදායී නොවිය හැකිය. අමතර මාර්ගෝපදේශ සඳහා ශ්‍රී.ල.වි.ප්‍ර. 330 බලන්න.

[18] ශ්‍රී.ල.වි.ප්‍ර. 265, "පාලන කාර්යභාර දරන්නන්ට සහ කළමනාකාරීත්වයට අභ්‍යන්තර පාලනයේ ඌනතා සන්නිවේදනය'' ඡේද අ7

[19] ශ්‍රී.ල.වි.ප්‍ර. 330, ඡේදය 28

**ලේඛනගත කිරිම (32 ඡේදය බලන්න)**

අ144. 32 වන ඡේදයේ අවශ්‍යතාවයන් ලේඛනගත කිරීම කුමන අන්දමින්ද යන්න වෘත්තීමය විනිශ්චයන් යොදාගනිමින් නිගමනය කළ යුත්තේ විගණකය. උදාහරණයක් ලෙස කුඩා අස්තිත්වයන් විගණනයෙහිදී ලේඛනගත කිරීම විගණකගේ සමස්ථ ක්‍රමෝපාය සහ විගණන සැලැස්ම විගණකගේ ලේඛණගත කිරීමට අන්තර්ගත විය හැකිය.[20] එලෙසම උදාහරණයක් ලෙස අවදානම් තක්සේරුවේ ප්‍රතිඵල වෙනම ලේඛනගත කිරීම හෝ විගණකවරයාගේ වැඩිදුර පරිපාටි වල කොටසක් ලෙස ලේඛනගත කරනු විය හැකිය.[21] ලේඛනගත කිරීමේ ස්වරූපය සහ ප්‍රමාණය කෙරෙහි අස්තිත්වයෙහි ස්වභාවය, ප්‍රමාණය, සංකීර්ණත්වය සහ එහි අභ්‍යන්තර පාලනය, අස්තිත්වයෙන් ලබාගත හැකි තොරතුරු සහ විගණන අතරවාරයෙහි භාවිතා කරනු ලබන විගණන ක්‍රමවේදය සහ තාක්‍ෂණයෙන් බලපෑම් සිදු කෙරෙයි.

අ145. මූල්‍ය වාර්තාකරණයට අදාලව සංකුල නොවන ව්‍යාපාර සහ ක්‍රියාවලි සහිත අස්තිත්වයන් සඳහා ලේඛනගත කිරීම ස්වරූපයෙන් සරල මෙන්ම සාපේක්‍ෂව සංක්‍ෂිප්ත විය හැකිය. අස්තිත්වය පිළිබඳව විගණකවරයාගේ අවබෝධයත් ඊට සම්බන්ධිත කරුණුත් සම්පූර්ණ වශයෙන්ම ලේඛනගත කිරීම අවශ්‍ය නොවේ. විගණකවරයා විසින් ලේඛනගත කරනු ලබන ප්‍රමුඛ මූලිකාංග වලට ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් තක්සේරු කිරීමේදී විගණක පදනම් කරගත් මූලිකාංග ඇතුළත් වෙයි.

අ146. ලේඛනගත කිරීමේ ප්‍රමාණය මගින් විගණන කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ පලපුරුද්ද සහ හැකියාවන්ද පිළිඹිබු කරනු විය හැකිය. ශ්‍රී.ල.වි.ප්‍ර. 230 හි අවශ්‍යතාවයන් සෑම විටම සපුරුලන විට අඩු පලපුරුද්දක් ඇත්තවුන්ගෙන් සමන්විත විගණන කාර්ය භාරයේ නියුතු කණ්ඩායමක් විසින් භාරගන්නා ලද විගණනයන්හිදී ඔවුන්ට අස්තිත්‍වය පිළිබඳව උචිත අවබෝධයක් ලබාගැනීමට සහාය වීම සඳහා පලපුරුද්ද ඇත්තවුන් ඇතුළත් වන කණ්ඩායමකට වඩා විස්තරාත්මක ලේඛනගත කිරීම් අවශ්‍ය කෙරෙනු විය හැකිය.

අ147. පුනාවර්තනය වන විගණන සඳහා අස්තිත්වයෙහි ව්‍යාපාර හෝ ක්‍රියාවලි වල වෙනස් වීම් පිළිඹිබු කිරීමට අවශ්‍ය කෙරෙන පරිදි ඇතැම් ලේඛන ඉදිරියට ගෙන යාම, යාවත්කාලීන කිරීම සිදුවිය හැකිය.

**පරිශිෂ්ඨය - 1**
(4 (ඇ), 14 - 24, අ 76 - අ 117 ඡේද බලන්න)

**අභ්‍යන්තර පාලන සංරචක**

1. මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධ වන බැවින් ඡේද 4 (ඇ), 14 - 24 සහ අ 76 - අ 117 හි නියම කර ඇති අභ්‍යන්තර පාලන සංරචක මෙම පරිශිෂ්ඨයෙන් වැඩි දුරටත් විස්තර කරනු ලබයි.

**පාලන පරිසරය**

2. පාලන පරිසරය පහත දැක්වෙන මූලිකාංග වලින් ආවරණය වෙයි.

(අ) *අවංකත්වය සහ සදාචාරමය අගයයන් සන්නිවේදනය සහ බලාත්මක කිරීම*

පාලන වල සඵලදායිත්‍වයට ඒවා ඇතිකරන කරන, පාලනය කරන සහ සමීක්‍ෂණය කරන පුද්ගලයින්ගේ අවංකත්වය සහ සදාචාරමය අගයයන් ඉක්මවිය නොහැකිය. අවංකත්වය සහ සදාචාරමය චර්යාව අස්තිත්වයෙහි ආචාරධර්ම සහ චර්යාත්මක හැසිරීම් මට්ටම්, ඒවා සන්නිවේදනය කෙරෙන අන්දම සහ ප්‍රායෝගිකව සවිගණ්වනු ලබන අන්දමෙහිත් ප්‍රතිඵලයන්ය. උදාහරණයක් වශයෙන් වංක, නීති විරෝධි හෝ සාදාචාර විරෝධී ක්‍රියා වල නිරත වීමට පුද්ගලයින් පොළඹවන දිරිගැන්වීම් හෝ බලපෑම් ඉවත් කිරීම හෝ අඩු කිරීම සඳහා වන කළමනාකාරිත්වයෙහි ක්‍රියාකාරකම් අවංකත්වය සහ සදාචාරමය අගයයන් බලාත්මක කිරීමට ඇතුළත්ය. ප්‍රතිපත්ති ප්‍රකාශන සහ අචාරධර්ම පද්ධති සන්නිවේදනය හරහා හැසිරීම් මට්ටම් පුද්ගලයින්ට සන්නිවේදනය කිරීම අවංකත්වය සහ සදාචාරමය අගයයන් පිළිබඳව අස්තිත්වයෙහි ප්‍රතිපත්ති සන්නිවේදනයට ඇතුළත්ය.

[20] ශ්‍රී.ල.වි.ප්‍ර. 300, "මූල්‍ය ප්‍රකාශන විගණනයක් සැලසුම් කිරීම." ඡේද 7 සහ 9

21 ශ්‍රී.ල.වි.ප්‍ර. 330, ඡේදය 28

(ආ) *හැකියාවට කැපවීම*

හැකියාව යනු පුද්ගලයකුගේ කාර්යය නිර්වචනය කරන කර්තව්‍යය සපුරාලීමට අවශ්‍ය දැනීම සහ නිපුනත්වයයි.

(ඇ) *පාලන කාර්යභාරය පැවරී ඇත්තවුන්ගේ සහභාගිත්වය*

පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන් විසින් අස්තිත්වයක පාලනය වී ඥානය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුවේ. පාලන කාර්ය භාරය පැවරී ඇත්තවුන්ගේ ප්‍රයෝජනය උදෙසා සැකසුණු පරිචය සංයුතියන්ගෙන් සහ අනෙකුත් නීති සහ රෙගුලාසි හෝ මාර්ගෝපදේශ තුළ පාලන කාර්ය භාරය පැවරී ඇත්තවුන්ගේ වගකීම් භාරයෙහි වැදගත්කම හඳුනා ගනු ලබයි. පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන්ගේ අනෙකුත් වගකීම් වලට ඇතුලත් වනුයේ රහස්‍ය සහ අනවසර දෑ අනාවරණයකර ගැනීම් පටිපාටි සැලසුම් කිරීම සහ ඒවා ඵලදායී ලෙස මෙහෙය වීම සහ අස්තිත්වයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණයයි.

(ඈ) *කළමනාකාරිත්වයෙහි දර්ශණය සහ මෙහෙයුම් ශෛලිය*

කළමනාකාරිත්වයෙහි දර්ශණය සහ මෙහෙයුම් ශෛලිය පුළුල් ගති ලක්ෂණ පරාසයකින් අනාවරණය වේ. උදාහරණයක් වශයෙන් තිබෙන විකල්ප ගිණුම්කරණ මූලධර්ම හෝ ගිණුම් ඇස්තමේන්තු වර්ධනයේදී හෘදය සාක්ෂිය හා සම්ප්‍රදායානුකූල වීම අතුරෙන් සම්ප්‍රදායානුකූල හෝ ප්‍රවේගකාරී තෝරා ගැනීම් තුලින් මූල්‍ය වාර්තාකරණය කෙරෙහි කළමනාකරණයේ ආකල්ප හා ක්‍රියාවන් පෙනී යා හැකිය.

(ඉ) *සංවිධාන ව්‍යුහය*

ප්‍රමුඛ බලතල ක්ෂෙත්‍ර සහ වගකීම්ද, උචිත රේඛීය වාර්තාකරණ සැලකිල්ලට ගැනීම අදාල සංවිධාන ව්‍යුහයක් ස්ථාපනය කිරීමට ඇතුළත්ය. අස්තිත්වයක සංවිධාන ව්‍යුහයෙහි යෝග්‍යතාවය එහි විශාලත්වයත්, එහි ක්‍රියාකාරකම් වල ස්වභාවයත් මත පාර්ශ්වික වශයෙන් රඳා පවතියි.

(ඊ) *බලතල සහ වගකීම පැවරීම*

යෝග්‍ය ව්‍යාපාරික පරිචයන්ට සම්බන්ධ ප්‍රතිපත්ති, ප්‍රමුඛ පුද්ගලයින්ගේ දැනීම සහ පලපුරුද්ද, සහ පැවරී ඇති කාර්යයන් කරගෙන යාම සඳහා සපයනු ලබන සම්පත් බලතල සහ වගකීම් පැවරීමට ඇතුළත් විය හැකිය. අමතර වශයෙන් සියළුම පුද්ගලයින් අස්තිත්වයෙහි අරමුණු පිළිබඳව අවබෝධයෙන් යුක්ත වන බව, ඔවුන්ගේ තනි ක්‍රියාකාරකම් අන්‍යෝන්‍ය වශයෙන් කෙසේ සමායෝජනය වන්නේද යන්න සහ එමගින් එකී අරමුණු වලට කවර ආකාරයකින් කුමක් සඳහා ඔවුන් දායක වන්නේද යන්න හඳුනාගැනීමත් සහතික වන අයුරින් ප්‍රතිපත්ති සහ සන්නිවේදන මෙහෙය වීම ඊට ඇතුළත් විය හැකිය.

(උ) මානව සම්පත් ප්‍රතිපත්ති සහ පරිචයන්

අස්තිත්වයක පාලන විඥානයට සම්බන්ධ වැදගත් කරුණු මානව සම්පත් ප්‍රතිපත්ති සහ පරිචයන් කෙරෙන් බොහෝ විට ප්‍රදර්ශනවේ. උදාහරණයක් ලෙස අධ්‍යාපනික පසුබිම, පූර්ව කාර්යය පලපුරුද්ද, පෙර නිපුනතා සහ අවංකත්වය සහ සදාචාරමය චර්යාව පිළිබඳ සාක්ෂි කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත්ව උසස්ම සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවා ගැනීම සඳහා වන ප්‍රමිත වලින් නිපුන සහ විශ්වාසවන්ත පුද්ගලයින් කෙරෙහි අස්තිත්වයේ කැපවීම විදහා දක්වෙයි. අනාගත අභිවෘද්ධිය සඳහා වන ක්‍රියාකලාප සහ වගකීම් සන්නිවේදනය කෙරෙන එමෙන්ම පුහුණු පාසල සහ සම්මන්ත්‍රණ ඇතුළත් පුහුණු කිරීම් ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත කාර්ය සාධන සහ චර්යා මට්ටම් විදහා දක්වෙයි. කාලාවර්තී කාර්ය සාධන ඇගයීම් හරහා මෙහෙයවන උසස් වීම් සුදුසුකම් සහිත පුද්ගලයින් වඩා ඉහළ වගකීම් මට්ටම් වලට උසස්වීම් කිරීම සඳහා අස්තිත්වයෙහි කැපවීම හුවා දක්වයි.

**අස්තිත්වයෙහි අවදානම් තක්සේරු ක්‍රියාවලිය**

3. මූල්‍ය වාර්තාකරණයේ අරමුණ සඳහා අස්තිත්වයේ අවධානම් තක්සේරු ක්‍රියාවලියද අස්තිත්වයට අදාල වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල වූ ව්‍යාපාරික අවධානම් කළමනාකරණය විසින් හඳුනා ගන්නේ කෙසේද යන්නත් ඒවායේ වැදගත් කම ඇස්තමේන්තු කිරීමත් ඒවා හට ගැන්මේ ප්‍රවණතාව තක්සේරු කිරීම සහ ප්‍රතිචාර දැක්වීම් වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම සහ ඒවායේ ස්වභාවයන් මතුවන ප්‍රතිඵල පාලනය කර ගැනීමත් යන කරුණු ඇතුලත් වේ. උදාහරණයක් ලෙස අස්තිත්වය වාර්තාගත නොවූ ගනුදෙනු තිබීමේ හැකියාව සැලකිල්ලට ගන්නා අන්දම හෝ මූල්‍ය ප්‍රකාශ වල වාර්තාගත සැලකිය යුතු ඇස්තමේන්තු හඳුනාගන්නා අන්දම සහ විශ්ලේෂණය කරන අන්දම සම්බන්ධයෙන් අස්තිත්වයේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය කටයුතු කරනු විය හැකිය.

4. විශ්වසනීය මූල්‍ය වාර්තාකරණයට අදාල වන අවදානම් වලට කළමනාකාරිත්වයෙහි සැඳහුම් සමග අනුකූල වන අයුරින් අස්තිත්වයෙහි මූල්‍යමය දත්ත ආරම්භ කිරීම, වාර්තාගත කිරීම, සැකසීම සහ වාර්තා කිරීමේ හැකියාව කෙරෙහි අහිතකර බලපෑම් සිදු කෙරෙන අන්දමින් ඇතිවිය හැකි බාහිර සහ අභ්‍යන්තර සිද්ධි, ගනුදෙනු හෝ

වාතාවරණයන් ඇතුළත්ය. කළමනාකාරිත්වය විසින් විශේෂිත අවදානම් සම්බන්ධව කටයුතු කිරීමට සැලසුම්, වැඩසටහන් හෝ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හෝ පිරිවැය හෝ වෙනත් කරුණු සලකා බැලීමෙන් අවදානමක් භාරගනු හෝ විය හැකිය. පහත දැක්වෙන අන්දමේ තත්වයන් හේතුවෙන් අවදානම් පැන නැගීම හෝ වෙනස් වීම සිදුවිය හැකිය.

- *මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම්*

  නියාමන හෝ මෙහෙයුම් වාතාවරණයෙහි වෙනස් වීම් වල ප්‍රතිඵල වශයෙන් තරගකාරිත්වයෙහි තියුණු බව සහ සැලකිය යුතු අන්දමින් වෙනස් අවදානම් වල වෙනස් වීම් සිදුවිය හැකිය.

- *නවක සේවකයන්*

  නවක සේවකයන්ට අභ්‍යන්තර පාලන කෙරෙහි වෙනස් දෘෂ්ටිපථයක් හෝ අවබෝධයක් තිබිය හැකිය.

- *නව හෝ වැඩිදියුණු කළ තොරතුරු පද්ධති*

  තොරතුරු පද්ධතියක සැලකිය යුතු සහ සීඝ්‍ර වෙනස් වීම් වලින් අභ්‍යන්තර පාලනයට සම්බන්ධ අවධානම වෙනස් විය හැකිය.

- *සීඝ්‍ර වර්ධන*

  තොරතුරු පද්ධති වල සැලකිය යුතු සහ සීඝ්‍ර ප්‍රසාරණය මගින් පාලන කෙරෙහි දැඩි පීඩාවක් ඇති කරමින් පාලන බිඳවැටීමේ අවදානම වැඩි කරනු ලැබිය හැකිය.

- *නව තාක්‍ෂණය*

  නිශ්පාදන ක්‍රියාවලියට හෝ තොරතුරු පද්ධතියට නව තාක්‍ෂණයන් අන්තර්ගත කිරීම මගින් අභ්‍යන්තර පාලනය ආශ්‍රිත අවදානම් වෙනස් විය හැකිය.

- *නව ව්‍යාපාර මාදිලි, නිෂ්පාදිත හෝ ක්‍රියාකාරකම්*

  අස්තිත්වයට අල්ප පලපුරුද්දක් ඇති ව්‍යාපාර ක්‍ෂේත්‍රයන්ට හෝ ගනුදෙනු වලට අවතීර්ණ වීම මගින් අභ්‍යන්තර පාලනය ආශ්‍රිත නව අවදානම් ඇතුලු කරනුවා විය හැකිය.

- *සංස්ථායික ප්‍රතිව්‍යුහ ගතකරණය*

  ප්‍රතිව්‍යුහ ගත කිරීම සේවක මණ්ඩලය අඩුකිරීම්, සහ අධීක්‍ෂණයෙහි වෙනස්වීම් සහ කාර්යයභාරයන් වෙන් කිරීම වැනි දෑ සමග එක්ව යනු විය හැකිය එය අභ්‍යන්තර පාලනය ආශ්‍රිත අවදානම් වෙනස් විය හැකිය.

- *වර්ධනය වන විදේශ මෙහෙයුම්*

  විදේශ මෙහෙයුම් වර්ධනය හෝ අත්පත් කර ගැනීම මගින් අභ්‍යන්තර පාලනයට බලපෑම් සිදුවිය හැකි නව සහ බොහෝ විට අනන්‍යය අවදානම් දැරීමට සිදුවිය හැකිය උදාහරණ වශයෙන් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වලින් ඇතිවන අමතර හෝ වෙනස් වූ අවදානම්

- *නව ගිණුම්කරණ ප්‍රකාශයට පත්කිරීම්*

  නව ගිණුම්කරණ මූලධර්ම යොදා ගැනීමෙන් හෝ ගිණුම්කරණ මූලධර්ම වෙනස් කිරීමෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අවදානම් කෙරෙහි බලපෑම් සිදුවිය හැකිය.

**සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලිය ඇතුළුව මූල්‍ය වාර්තා කරණයට සහ සන්නිවේදනයට අදාල තොරතුරු පද්ධතිය**

5. තොරතුරු පද්ධතියක් යටිතල (භෞතික හා දෘඩාංග සංරචක) මෘදුකාංග, පුද්ගලයින්, පටිපාටි, සහ දත්ත වලින් සංයුක්ත වෙයි. බොහෝ තොරතුරු පද්ධති වල තොරතුරු තාක්‍ෂණය (IT) පෘථුල ලෙස භාවිත කෙරෙයි.

6. මූල්‍ය වාර්තාකරණ පද්ධතියද අන්තර්ගත වන මූල්‍ය වාර්තාකරණ අරමුණු වලට අදාල තොරතුරු පද්ධතිය මගින් පහත සඳහන් ක්‍රම ආවරණය කිරීමත් වාර්තාගත කිරීමත් සිදු කෙරෙයි.

   - සියළුම වලංගු ගනුදෙනු හඳුනාගැනීම සහ වාර්තාගත කිරීම.

- මූල්‍ය වාර්තාකරණය සඳහා යථාපරිදි ගනුදෙනු වර්ගීකරණයට අවකාශ සැලසෙන අයුරින් ප්‍රමාණවත් විස්තර සහිතව කාලීන පදනමකින් ගනුදෙනු විස්තර කිරීම.
- ගනුදෙනු වල යථායෝග්‍ය මුදල් වටිනාකම මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කිරීමට අවකාශ සැලසෙන ආකාරයකින් ගනුදෙනු වල වටිනාකම මැනීම.
- ගනුදෙනු නියමිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයෙහි වාර්තාගත කිරීමට අවකාශ සැලසෙන අයුරින් ගනුදෙනු සිදු වූ කාලපරිච්ඡේදය නිශ්චය කිරීම.
- ගනුදෙනු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් යථාපරිදි මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කිරීම.

7. පද්ධති ජනිත තොරතුරු වල තත්වය මගින් අස්තිත්වයෙහි ක්‍රියාකාරකම් කළමනාකරණයෙහි සහ පාලනයෙහි ලා උචිත තීරණ ගැනීමෙහිත්, විශ්වසනීය මූල්‍ය වාර්තා පිළියෙල කිරීමෙහිත් කළමනාකාරිත්වයෙහි හැකියාව කෙරෙහි බලපෑම් සිදු කරනු ලබයි.

8. මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන වලට අයත් ස්වකීය කාර්යභාරයන් සහ වගකීම් ඇතුළත් වන සන්නිවේදනය ප්‍රතිපත්ති සංග්‍රහ, ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ සංග්‍රහ, සහ සිහිවීම් සටහන් වැනි ස්වරූපයෙන් විය හැකිය. සන්නිවේදනය විද්‍යුතව, වාචිකව හෝ කළමනාකාරිත්වයෙහි ක්‍රියාකාරකය හරහා විය හැකිය.

**පාලන ක්‍රියාකාරකම්**

9. විගණනයකට අදාල විය හැකි පාලන ක්‍රියාකාරකම් පහත දැක්වෙන කරුණු වලට සම්බන්ධ ප්‍රතිපත්ති සහ පටිපාටි වශයෙන් ප්‍රභේද කෙරෙනු ඇති

- *කාර්යසාධන සමාලෝචන*

  අයවැය ගත පුරෝකතන හා පෙරවූ කාලපරිච්ඡේදවල කාර්ය සාධන සමග සෘජු කාර්ය සාධන සමාලෝචන සහ විශ්ලේෂණයන් මෙහෙයුම් හෝ මූල්‍ය සම්බන්ධ විවිධ දත්ත කට්ටල පිළිබඳ සම්බන්ධතා වන්නේද විමර්ශණශීලී හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ වූ විශ්ලේෂණද සමග එකිනෙකට සම්බන්ධ කොට අභ්‍යන්තර දත්ත භාහිර තොරතුරු මූලාශ්‍ර සමග සංසන්දනය කරමින් සහ ශ්‍රිතමය හෝ ක්‍රියාකාරීත්වය වශයෙන් කරන ලද කාර්ය සාධන සමාලෝචනය මෙම පාලන ක්‍රියාවලීන්ට අයත්ය.

- *තොරතුරු සැකසීම*

  තොරතුරු පද්ධති පාලන ක්‍රියාකාරකම් වල පුළුල් කාණ්ඩ දෙක වනුයේ එක් එක් යෙදවුම් සැකසීමේදී ව්‍යවහාර වන යෙදවුම් පාලන යෙදවුම් කිහිපයකට සම්බන්ධ වන සහ තොරතුරු පද්ධති වල, අඛණ්ඩ නිරවද්‍ය ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමට උපකාරී වෙමින් යෙදවුම් පාලන වල සඵලදායි ක්‍රියාකාරිත්වයට සහාය සැපයෙන ප්‍රතිපත්ති සහ පටිපාටි වන පොදු තොරතුරු තාක්ෂණික පාලකය. යෙදවුම් පාලන සඳහා උදාහරණ වලට වාර්තා වල අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම ගිණුම් සහ ශේෂ පිරික්සුම් පවත්වා ගෙන යාම සහ සමාලෝචනය, යෙදවුම් දත්තවල සංස්කරණ පරීක්ෂා සහ සංඛ්‍යාත්මක අනුපිළිවෙළ පරීක්ෂා වැනි ස්වංක්‍රීය පාලන සහ ව්‍යතිරේඛ වාර්තා සම්බන්ධව මිනිස් ක්‍රියාකාරි පසුවිපරම් කිරීම ඇතුළත් වෙයි. පොදු තොරතුරු තාක්ෂණික පාලන සඳහා උදාහරණ වලට වැඩසටහන් වෙනස් වීම් පාලන, වැඩසටහන් හෝ දත්ත වලට ප්‍රවිශ්ඨය සීමා කෙරෙන පාලන නවතමයෙන් වෙළඳපලට නිකුත් කල මෘදුකාංග කට්ටල භාවිතයෙන් ක්‍රියාත්මක කිරීම මත බලපැවැත්වෙන පාලන හා විගණක සොයාගැනීම් මාර්ගයක් ඉතිරි නොකර මූල්‍ය දත්ත හෝ වාර්තා වෙනස් කළ හැකි පද්ධති මූලිකාංග සම්බන්ධ පාලන ඇතුළත්ය.

- *භෞතික පාලන* පහත සඳහන් දෑ ආවරණය කරයි.
  - වත්කම් වල භෞතික සුරක්ෂිතතාවය, වත්කම් සහ වාර්තා කෙරෙහි සුරක්ෂිත පහසුකම් වැනි ප්‍රමාණවත් ආරක්ෂා ඇතුළත්ව
  - පරිගණක වැඩසටහන් සහ දත්ත ලිපිගොනු වලට ප්‍රවිශ්ට වීම සඳහා අනුමැතිය ලබා දීම.
  - පාලන වාර්තා වල පෙන්වා දී ඇති ප්‍රමාණයන් කාලාවර්තීව ගණනය කිරීම සහ සැසඳීම (උදාහරණයක් වශයෙන් මුදල්, සුරැකුම් සහ තොග ගණන් කිරීම් ගිණුම් වාර්තා සමග සැසඳීම)

  වත්කම් සොරකම් කරනු ලැබීම වැලැක්වීම අරමුණු කරගත් භෞතික පාලන කෙතරම් ප්‍රමාණයකට අභිප්‍රායිකද යන්න මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ විශ්වසනීයත්වය කෙරෙහි අදාල වනුයෙන් වත්කම් සාවද්‍ය පරිහරනයට ඉහළ නැඹුරුතාවයක් ඇති අන්දමේ වාතාවරණයන් පවත්නා විට විගණනය ඒ මත රඳා පවතියි.

- *කාර්යභාරයන් වෙන්කිරීම*

  ගනුදෙනු අනුමත කිරීම, ගනුදෙනු වාර්තාගත කිරීම සහ වත්කම් වල භාරකාරත්වය පවත්වාගෙන යාම වෙනස් පුද්ගලයින්ට පැවරීම කිරීම මෙමගින් අදහස් කෙරෙයි. පුද්ගලයෙකුගේ සාමාන්‍ය කාර්යභාරයෙහිදී

වැරදි කිරීම සහ වැරදි සැඟවීම යන දෙකම සිදු කළ හැකි තත්වයකට කිසිදු පුද්ගලයකුට පැමිණීමට ඇති අවකාශ අඩුකිරීම කාරයභාරයන් වෙන් කිරීමේ අභිප්‍රාය වේ.

10. කළමනාකාරිත්වය හෝ පාලන කාර්යභාරය දරන්නන් විසින් ස්ථාපනය කරන ලද ඉහළ මට්ටමෙහි උචිත ප්‍රතිපත්ති බලපැවැත්ම මත ඇතැම් පාලන ක්‍රියාකාරකම් රඳා පවතිනු විය හැකිය. උදාහරණ වශයෙන් පාලන බලතල පැවරී ඇත්තවුන් විසින් නියම කළ ආයෝජන නිර්ණායක වැනි ස්ථාපිත මාර්ගෝපදේශ යටතේ අනුමත කිරිමේ බලතල පවරනු ලැබීම හැකිය; විකල්ප වශයෙන් ප්‍රධාන අත්පත් කර ගැනීම්, හෝ විකිණීම වැනි චර්යානුගත නොවන ගනුදෙනු වලට ඇතැම් විට කොටස්හිමියන්ගේ ද ඇතුළත්ව ඉහළ මට්ටම් වල විශේෂිත අනුමතය අවශ්‍ය කෙරෙනු විය හැකිය.

**පාලන අධීක්ෂණය**

11. අඛණ්ඩ ක්‍රියාකාරී පදනමකින් අභ්‍යන්තර පාලන ස්ථාපනය කර පවත්වාගෙන යාම වැදගත් කළමනාකාරිත්ව වගකීමකි. අදහස් කෙරෙන අයුරින් පාලන ක්‍රියාත්මක වන්නේද වෙනස් වන තත්වයන්හිදී ඒවා වෙනස් කරනු ලබන්නේද යන්න පිළිබඳව සැලකිලිමත් වීම කළමනාකාරිත්වයෙහි පාලන අධීක්ෂණයට ඇතුළත්ය. බැංකු සැසඳුම් කාලීන පදනමින් පිළියෙල කිරීම, වෙළඳ කොන්ත්‍රාත්තු වගන්ති මත අස්තිත්වයෙහි ප්‍රතිපත්ති වෙළඳ කාර්යමණ්ඩලයෙහි අනුගතභාවය පිළිබඳව අභ්‍යන්තර විගණකවරුන්ගේ ඇගයීම සහ අස්තිත්වයෙහි ආචාරධර්ම හෝ ව්‍යාපාරික පරිචයන් පිළිපැදීමක් පිළිබඳව නෛතික දෙපාර්තමේන්තුවක අධීක්ෂණය වැනි දෑ කෙරෙහි කළමනාකාරිත්වය සමාලෝචනයක් සිදු කරන්නේද යන්න සැලකිල්ලට ගැනීම වැනි ක්‍රියාකාරකම් පාලන අධීක්ෂණයට ඇතුළත් විය හැකිය. කාලයත් සමග නිරන්තරයෙන් පාලන අඛණ්ඩව ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම උදෙසා ද අධීක්ෂණය ක්‍රියාත්මක කරනු ලබයි. උදාහරණ වශයෙන් බැංකු සැසඳුම් වල කාලීනත්වය සහ නිරවද්‍යතාවය අධීක්ෂණය නොකරන්නේ නම් කාර්ය මණ්ඩලය ඒවා පිළියෙල කිරීම නතර කරන්නට ඉඩ ඇත.

12. අභ්‍යන්තර විගණකවරුන් හෝ සමාන කාර්යයන් ඉටු කරන කාර්ය මණ්ඩල වෙනත් ඇගයීම් හරහා අස්තිත්වයෙහි පාලන අධීක්ෂණයට දායක විය හැකිය. අභ්‍යන්තර පාලනයෙහි සඵලදායිත්වය කෙරෙහි සැලකිය යුතු අන්දමින් අවධානය යොමුකරමින් කරමින් අභ්‍යන්තර පාලන වල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු නිරන්තරයෙන් ඉදිරිපත් කිරීම සාමාන්‍යයෙන් ඔවුන් විසින් සිදු කරනු ලබන අතර අභ්‍යන්තර පාලනයෙහි ප්‍රභලතාවයන් සහ ඌනතාවයන් සන්නිවේදනයද අභ්‍යන්තර පාලනය වඩා යහපත කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමද සිදු කරනු ලබයි.

13. බාහිර පාර්ශවයන්ගෙන් වන සන්නිවේදනය කෙරෙන් ලබා ගන්නා ලද ගැටළු හෝ වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍රයන් උද්දීපනය කර දක්වෙන තොරතුරු අධීක්ෂණ ක්‍රියාකාරකම් වලට ඇතුළත් විය හැකිය. ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ඉන්වොයිස් ගෙවීමෙන් ව්‍යංගව බිල්පත් වල දත්ත තහවුරු කරනු හෝ ඔවුන්ගේ අයකිරීම් පිළිබඳව පැමිණිලි කරනු හෝ විය හැකිය. ඊට අමතරව නියාමන කටයුතු කරන්නවුන් විසින් අභ්‍යන්තර පාලනයෙහි ක්‍රියාකාරිත්වයට බලපෑම් සිදුකෙරෙන කරුණු පිළිබඳව අස්තිත්වයට සන්නිවේදනය කරනු විය හැකිය. බැංකු වල නියාමන නියෝජ්‍යත්‍ව විසින් සිදු කෙරෙන විභාග විමර්ශණ සම්බන්ධ සන්නිවේදන ඊට උදාහරණයකි. එමෙන්ම අධීක්ෂණ ක්‍රියාකාරකම් ඉටු කිරීමෙහිදී අභ්‍යන්තර පාලනයට අදාලව බාහිර විගණකවරුන්ගේ සන්නිවේදන කළමනාකාරිත්වය සැලකිල්ලට ගනු විය හැකිය. (2වන පරිශිෂ්ඨය අ 33 අ 115 ඡේද බලන්න)

**ප්‍රමාණාත්මක අවප්‍රකාශ හැඟවෙන තත්‍වයන් සහ සිදුවීම්**

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අවදානම පවත්නා බැව් හැඟවෙන තත්වයන්ට සහ සිදුවීම් වලට උදාහරණ පහත දැක්වෙයි. ඉදිරිපත් කර ඇති උදාහරණ වලින් පුළුල් පරාසයක තත්‍වයන් සහ සිදුවීම් ආවරණය වෙයි; කෙසේ වුවද සියළුම තත්වයන් සහ සිදු වීම් සෑම විගණන කාර්යභාරයකටම අදාල නොවන අතර උදාහරණ ලැයිස්තුව අවශ්‍යයෙන්ම පරිපූර්ණ නොවේ.

- ආර්ථික වශයෙන් අස්ථාවර කලාප වල මෙහෙයුම්, උදාහරණ වශයෙන් ව්‍යවහාර මුදල් වල සැලකිය යුතු අවප්‍රමාණ කිරීම් හෝ ඉහළ උද්ධමන ආර්ථිකයක් ඇති රටවල්
- වෙනස් වන සුළු වෙළඳපොලට නිරාවරණය වූ මෙහෙයුම්, උදාහරණ වශයෙන් අනාගත වෙළඳාම්
- ඉහළ මට්ටමක සංකීර්ණ රෙගුලාසි වලට යටත් වන මෙහෙයුම්
- වැදගත් ගනුදෙනුකරුවන් අහිමි වීම ඇතුළත්ව අඛණ්ඩ පැවැත්ම සහ ද්‍රවශීලතා පිළිබඳ ගැටළු
- ප්‍රාග්ධන සහ ණය පහසුකම් ලබාගත හැකි කමේ සීමා කිරීම්
- අස්තිත්වය මෙහෙයුම්කරන කර්මාන්තයෙහි වෙනස්වීම්
- සැපයුම් දාමයෙහි වෙනස්වීම්
- නව නිෂ්පාදිත හෝ සේවා වර්ධනය කිරීම හෝ ඉදිරිපත් කිරීම හෝ නව ව්‍යාපාර මාර්ගයන්ට පිවිසීම
- නව පිහිටීම් කරා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම

- විශාල අත්පත් කර ගැනීමක් හෝ ප්‍රතිසංවිධානවයන් හෝ වෙනත් අසාමාන්‍ය සිදුවීම් වැනි අස්තිත්වයේ වෙනස් වීම්.
- විකිණීමට ඉඩ ඇති අස්තිත්වයන් හෝ ව්‍යාපාරික ඛණ්ඩ
- සංකීර්ණ සන්ධානගතවීම් සහ බද්ධ ව්‍යාපාර පැවතීම
- ශේෂ පත්‍රයෙන් පරිබාහිර මූල්‍ය කටයුතු විශේෂ අරමුණු අස්තිත්ව සහ වෙනත් සංකීර්ණ මූල්‍ය විධිවිධාන
- සම්බන්ධිත පාර්ශ්ව සමඟ සැලකිය යුතු ගනුදෙනු
- යෝග්‍ය ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ නිපුණත්වයක් ඇති සේවක හිඟ වීම
- ප්‍රමුඛ විධායකවරුන් ඉවත්ව යාම ඇතුළත්ව ප්‍රධාන සේවක මණ්ඩලයේ වෙනස් වීම්
- විශේෂයෙන් කළමනාකාරිත්වය විසින් ආමන්ත්‍රණය නොකෙරෙන අභ්‍යන්තර පාලන වල ඌනතා
- අස්තිත්වයෙහි තොරතුරු තාක්‍ෂණික ක්‍රමෝපායේ සහ එහි ව්‍යාපාරික ක්‍රමෝපාය අතර අසන්තතිකතා
- තොරතුරු තාක්‍ෂණ පරිසරයෙහි වෙනස්වීම්
- මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ යුතු නව තොරතුරු තාක්‍ෂණ පද්ධති සවි කිරීම
- රාජ්‍ය හෝ නියාමන ආයතන මගින් අස්තිත්වයෙහි මෙහෙයුම් හෝ මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් කරනු ලබන විමසීම්
- පූර්ව අව ප්‍රකාශ වැරදි වල ඉතිහාසය, හෝ කාලපරිච්ඡේදය අවසානයේදී සැලකිය යුතු අන්දමේ වටිනාකමක ගැලපීම්
- කාලපරිච්ඡේදය අවසානයෙහි අන්තර් සමාගම් ගනුදෙනු සහ විශාල අයභාර ගනුදෙනු ඇතුළත්ව සැලකිය යුතු අන්දමේ වටිනාකම්වල චර්යානුගත නොවන හෝ ක්‍රමානුකූල නොවන ගනුදෙනු
- කළමනාකාරීත්වයේ අභිප්‍රාය පදනම් කරගෙන වාර්තාගත කළ ගනුදෙනු, උදාහරණ වශයෙන් ණය ප්‍රති මූල්‍යකරණය, විකිණීම සඳහා වන වත්කම් සහ විකිණිය හැකි සුරැකුම් වර්ගීකරණය
- නව ගිණුම්කරණ මත ප්‍රකාශයට පත්කර ව්‍යවහාර කරණය
- සංකීර්ණ ක්‍රියාවලි සම්බන්ධවන ගිණුම්කරණ මිණුම්
- ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළත්ව සැලකිය යුතු මිණුම්කරණ අවිනිශ්චිතතාවයන් සම්බන්ධවන සිදුවීම් හෝ ගනුදෙනු,
- විසඳුම් අපේක්‍ෂිත නඩු සහ අසම්භාව්‍ය බැරකම්, උදාහරණ වශයෙන් වෙළඳාම් ප්‍රතිඥාභාර, මූල්‍ය ඇපවීම්, සහ පාරිසරික හානි යලි ප්‍රකෘතිමත් කිරීම.

**පරිශිෂ්ඨය - 2**
(යොමුව: අ.40 - අ.128 ඡේද)

**ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අවදානම් පිළිබඳ හැඟවීම් සිදුකරන තත්‍වයන් සහ සිදුවීම්**

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අවදානම් පිළිබඳව හැඟවීම් සිදුකරන තත්වයන් සහ සිදුවීම් වලට උදාහරණ පහත සඳහන් වේ. පුළුල් පරාසයක තත්වයන් සහ සිදුවීම් මෙම උදාහරණ වලින් ආවරණය කෙරෙයි. කෙසේ වුවද සෑම විගණන පැවරුමකටම අදාල වන තත්වයන් සහ සිදුවීම් මෙම උදාහරණ වල ඇතුළත් නොවන අතර උදාහරණ ලැයිස්තුව අවශ්‍යයෙන්ම අංග සම්පූර්ණ ද නොවේ.

- ආර්ථිකව අස්ථාවර කලාපයන්හි මෙහෙයුම්, උදාහරණ වශයෙන් සැලකිය යුතු මුදල් අවප්‍රමාණ කිරීම් හෝ ඉහළ උද්ධමන ආර්ථික පවත්නා රටවල්.
- විචලනය වන වෙළඳපලට නිරාවරණය වූ මෙහෙයුම්, උදාහරණ වශයෙන් අනාගත වාණිජ කටයුතු.
- ඉහල සංකීර්ණතා පවත්නා රෙගුලාසි වලට භාජනය වන මෙහෙයුම්.
- වැදගත් ගණුදෙනුකරුවන් අහිමිවීම ඇතුළත්ව ප්‍රවර්ථන ව්‍යාපාරික සහ ද්‍රවශීලතා තත්‍වයන්.
- ප්‍රාග්ධන සහ ණය ගැණුම් කෙරෙහි පවත්නා අවහිරතා
- අස්තිත්වය ක්‍රියාත්මක වන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වෙනස්වීම්
- සැපයුම් දාමයෙහි වෙනස්වීම්.
- නව නිෂ්පාදිත හෝ සේවාවන් ප්‍රවර්ධනය හෝ ඉදිරිපත් කිරීම හෝ නව ව්‍යාපාරික ක්ෂේත්‍රයන්ට පිවිසීම.
- නව ස්ථානවලට ව්‍යාප්ත වීම.
- විශාල අත්පත් කරගැනීම් හෝ ප්‍රතිසංවිධානය කිරීම් හෝ වෙනත් එවැනි සිදුවීම් වැනි අස්තිත්වයේ වෙනස්වීම්.
- විකිණීමට සිදුවිය හැකි අස්තිත්වහෝ ව්‍යාපාර ඛණ්ඩ.
- සංකීර්ණ සන්ධානගත වීම් සහ බද්ධ ව්‍යාපාර පැවතීම.
- ශේෂපත්‍ර පරිබාහිර මූල්‍ය සැපයුම්, විශේෂ පරමාර්ථ අස්තිත්ව, සහ වෙනත් සංකීර්ණ මූල්‍ය විධිවිධාන භාවිතය.
- ආශ්‍රිත පාර්ශව සමඟ සැලකිය යුතු ගණුදෙනු.

- උචිත ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ නිපුණතා ඇති පුද්ගලයින් හිඟවීම.
- ප්‍රමුඛ විධායක නිළධාරීන් ඇතුළත්ව ප්‍රමුඛ පුද්ගලයින් වෙනස් වීම්.
- අභ්‍යන්තර පාලනයෙහි ඌනතා, විශේෂයෙන් කළමනාකාරිත්වය විසින් ආමන්ත්‍රණය නොකළ ඌනතා.
- අස්තිත්වයේ තොරතුරු තාක්‍ෂණ මූලෝපාය සහ එහි ව්‍යාපාර මූලෝපාය අතර අසංගතතාව
- තොරතුරු තාක්‍ෂණ වටපිටාවෙහි වෙනස්වීම්.
- මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ නව තොරතුරු තාක්‍ෂණ පද්ධති ස්ථාපනය කිරීම.
- නියාමක හෝ රාජ්‍ය ආයතන මඟින් අස්තිත්වයේ මෙහෙයුම් සහ මූල්‍යමය ප්‍රතිඵල විමසීමට භාජනය වීම.
- පූර්ව සාවද්‍ය ප්‍රකාශ, වැරදි වල ඉතිහාසය හෝ කාලපරිච්ඡේදය අන්තයෙහි සැලකිය යුතු ප්‍රමාණයේ ගැළපිලි.
- කාලපරිච්ඡේදය අන්තයෙහි අන්තර් සමාගම් ගණුදෙනු සහ විශාල ආදායම් ගණුදෙනු ඇතුළත්ව චර්යානුගත නොවන හෝ අක්‍රමික ගණුදෙනු සැලකිය යුතු ප්‍රමාණයක් තිබීම.
- කළමනාකාරිත්වයේ අරමුණු මත පදනම් නොවන අයුරින් වාර්තා කළ ගණුදෙනු, උදාහරණ වශයෙන් ණය ප්‍රතිමූල්‍යකරණය, විකිණීමට ඇති වත්කම් සහ විකිණිය හැකි සුරැකුම් කාණ්ඩගත කිරීම්.
- නව ගිණුම්කරණ මතවාද යොදාගැනීම.
- සංකීර්ණ සැකසුම් කිරීම් අවශ්‍ය කෙරෙන ගිණුම්කරණ මිණුම් විධි.
- ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළත්ව සැලකිය යුතු මිණුම්කරණ අවිනිශ්චිතතාවයක් හා බැඳී පවත්නා සිදුවීම් සහ ගණුදෙනු.
- පොරොත්තු නෛතික කටයුතු සහ අසම්භාව්‍ය වගකීම්, උදාහරණ වශයෙන් වෙළඳ වගකීම් සහතික, මූල්‍ය ඇප සහතික සහ පාරසරික ප්‍රතිකාරක අවශ්‍යතා.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 610 (සංශෝධිත)

## අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම

(2015 ජනවාරි මස 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේදයන් සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනයන් සම්බන්ධයෙන් බලපැවැත්වේ)

**පටුන**


| | ඡේද |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතියේ විෂයපථය.......................................................... | 1-4 |
| ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හා ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) අතර සම්බන්ධතාවය........................................................................................ | 5-8 |
| විගණනය සම්බන්ධයෙන් බාහිර විගණකගේ වගකීම ............................................. | 9 |
| **බලපවත්වන දිනය** ........................................................................................ | 10 |
| **අරමුණු** ....................................................................................................... | 11 |
| **නිර්වචනය** .................................................................................................. | 12 |
| **අවශ්‍යතාවන්** | |
| කිනම් ප්‍රමාණයකට කවර වපසරියකට අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් ප්‍රයෝජනයට ගත හැකිදැයි නිශ්චය කිරීම ........................................ | 13-18 |
| අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් ප්‍රයෝජනයට ගැනීම ..................... | 19-23 |
| ලේඛනගත කිරීම ............................................................................................... | 24 |
| **ව්‍යවහාරකරණය සහ වෙනත් විස්තර කිරීමේ දෑ** | |
| අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ නිර්වචනය ..................................................... | A1-A4 |
| කිනම් ප්‍රමාණයකට කවර වපසරියකට අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස ප්‍රයෝජනයට ගත හැකිදැයි නිශ්චය කිරීම ...................... | A5-A23 |
| අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස ප්‍රයෝජනයට ගැනීම ……............... | A24-A30 |


ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ විගණනයන් පවත්වාගන යාමෙහි පද සම්බන්ධය* සහිතව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 610 (සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම* කියවිය යුතුය.

**හැඳින්වීම**

මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂයපථය

1. විගණන සාක්ෂි ලබාගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් බාහිර විගණකවරයා විසින් භාවිතා කරන්නේ නම් එවිට ඔහුගේ වගකීම් සම්බන්ධයෙන් මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කෙරේ.

2. අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යභාරයක් නොමැති අවස්ථාවලදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාර නොවේ (යොමුව: ඡේදය A2)

3. අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යභාරයක් ඇත්තේ වුවද, පහත සඳහන් අවස්ථාවලදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

(අ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වගකීම් සහ ක්‍රියාකාරකම් විගණනයට අදාල නොවන්නේ නම්: හෝ

(ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[22] යටතේ ඉටුකළ ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලයක් වශයෙන් කාර්යයන් පිළිබඳව බාහිර විගණකවරයා ලබාගන්නා ලද මූලික අවබෝධය පදනම්ව විගණන සාක්ෂි ලබාගැනීමේදී අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කිරීමට බාහිර විගණකවරයා බලාපොරොත්තු නොවන විට.

බාහිර විගණකවරයා විසින් ඍජුව ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටිවල කාලනිර්ණ හෝ ස්වභාවය වෙනස් කිරීම හෝ වපසරිය අවම කිරීමෙහිලා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් ප්‍රයෝජනයට ගැනීම මෙම විගණන ප්‍රමිතියෙන් අවශ්‍ය නොකරයි. එම සමස්ත විගණන ක්‍රමෝපාය පිහිටුවා ගැනීම බාහිර විගණකවරයාගේ තීරණයක් ලෙස පවතිනු ලබයි.

4. සමහර අධිකරණ බල ප්‍රදේශයන් තුල අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් බාහිර විගණකවරයා විසින් භාවිතා කිරීම නීති හෝ රෙගුලාසි මඟින් යම් ප්‍රමාණයකට සීමාකොට හෝ තහනම් කොට හෝ තිබිය හැකිය. ශ්‍රී.ල.වි.ප්‍ර. මුල්‍ය ප්‍රකාශ විගණනය[23] සම්බන්ධයෙන් බලපවත්වන කිසියම් රෙගුලාසි හෝ නීති රීති ඉක්මවායාමට කටයුතු නොකරයි. එබැවින් එවැනි සීමා කිරීම් හෝ තහනම් කිරීම් බාහිර විගණකවරයා විසින් ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලතාවය දැක්විය යුතු වීමේ අවශ්‍යතාවයෙන් වලක්වාලනු නොලබයි.

**ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හා ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත) අතර පවත්නා සම්බන්ධතාවය**

5. බොහෝ අස්තිත්වයන් සිය අභ්‍යන්තර පාලනයේ සහ පාලන ව්‍යුහයේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයභාරය පිහිටුවනු ලබයි. කළමනාකාරීත්වයේ හා අදාලවන පරිදි පාලනය භාරව සිටින අයගේද අවශ්‍යතාවන්ට අනුව සහ අස්තිත්වයේ ප්‍රමාණය හා එහි ව්‍යුහය මතද රඳාපවතිමින් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ අරමුණු හා විෂයපථය, එහි වගකිවයුතුභාවයේ ස්වභාවය හා කාර්යයභාරයේ අධිකාරිය සහ වගකීමද ඇතුලුව එහි සංවිධාන තත්වය සහ වගකීමේ ස්වභාවය බොහෝ පුළුල් ලෙස වෙනස්වනු ඇත.

6. බාහිර විගණකවරයා විසින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධ කරගැනීමේලා අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ දැනුම සහ අත්දැකීම් කෙසේ විය යුතුදැයි යන්න පිළිබඳව කටයුතු කළයුතු ආකාරය ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) වල දැක්වේ. බාහිර හා අභ්‍යන්තර විගණකවරුන් අතර ඇතිවන සඵල සන්නිවේදනය බාහිර විගණකවරයාගේ කටයුතුවලට බලපෑහැකි වැදගත්කමක් ඇති කරුණු පිළිබඳව බාහිර විගණකවරයාවෙත දැනුම් දීම සඳහා කවරාකාර පරිසරයක් නිර්මාණය කරන්නේ දැයි යන්න ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[24] මඟින් පැහැදිලි කරනු ලබයි.

7. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධාන ව්‍යුහාත්මක කාර්යය තත්වය සහ අදාලවන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගත කාර්යයන්ට ප්‍රමාණවත් ලෙස සහාය දක්වන්නේ යයිද, අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණත්වය සහ එම කාර්යභාරය විධිමත් සහ ශික්ෂණාත්මක එළඹීමක්

---

[22] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධය තුලින් ප්‍රමාණාත්මකවූ අවප්‍රකාශවල අවදානම් තක්සේරු කරගැනීම සහ හඳුනාගැනීම.

[23] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, ජාත්‍යන්තර විගණන ප්‍රමිත වලට අනුකූලවන පරිදි විගණනයක් මෙහෙයවීමේදී ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු, ඡේද A55

[24] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) - A116 ඡේදය

යොදාගන්නේයයිද යන පදනම මත රඳාපවතිමින් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් සාධනීය සහ උණපුරණීය ලෙසට බාහිර විගණකවරයා විසින් යොදා ගැනීමේ හැකියාව ඇත. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (ප්‍රතිශෝධිත) යටතේ ඉටුකළ ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලයක් ලෙස, අභ්‍යන්තර විගණන කාරයභාරය පිළිබඳව ලබාගත් බාහිර විගණකගේ මූලික අවබෝධය මත පදනම්ව අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩ ලබාගත් විගණන සාක්ෂිවල කොටසක් ලෙස බාහිර විගණක[25] භාවිතා කිරීමට අපේක්‍ෂා කරන විටකදී බාහිර විගණකගේ වගකීම පිළිබඳව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ආමන්ත්‍රණය කෙරේ. එවැනි වැඩ භාවිතා කිරීම හේතුවෙන් බාහිර විගණකවරයා විසින් ඍජුවම ඉටුකලයුතු විගණන ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය අඩුකිරීම හෝ කාලනිර්ණයන්ගේ ස්වභාවය නවීකරණය කිරීම කරනු ලබනු ඇත.

8. අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටු කරන ක්‍රියාපටිපාටි වලට සමාන ක්‍රියාපටිපාටින් ඉටුකරන පුද්ගලයින් කිසියම් අස්තිත්වයක සිටිය හැකිය. කෙසේ වුවත් තත්වපාලනයද ඇතුලත් ක්‍රමවත් සහ ශික්‍ෂණික පදනමකින් යුතුව අරමුණුගත සහ නිපුණ කාර්යභාරයකින් ඉටුකරනු ලබතොත් පමණක් එවැනි පටිපාටීන් ශ්‍රී.ල.වි.ප්‍ර. 330[26] ප්‍රකාරව අභ්‍යන්තර පාලනයේ සහ සාක්ෂි ලබාගැනීම පිළිබඳව එම පාලනයේ බලාත්මකභාවය පිළිබඳ තක්සේරු කළ අවදානමට විගණකවරයාගේ ප්‍රතිචාර දැක්වීමේ කොටසක් වශයෙන් සැලකිල්ලට භාජනය කළ හැකිය.

**විගණනය සම්බන්ධයෙන් බාහිර විගණකගේ වගකීම**

9. ප්‍රකාශකරන ලද විගණන මතය පිළිබඳ පරම වගකීම බාහිර විගණකවරයා සතුවන අතර භාරගත් කාර්යභාරය පිළිබඳ වගකීම අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කිරීම හේතුවෙන් ලුහු නොවන්නේය. අභ්‍යන්තර විගණන කාර්යභාරය බාහිර විගණකවරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන ආකාරයේ විගණන ක්‍රියාපටිපාටි හා සමානව විගණන ක්‍රියාපටිපාටි යොදාගනු ලබන්නේ වුවද, අභ්‍යන්තර විගණන කාර්යභාරය හෝ අභ්‍යන්තර විගණකවරයා ශ්‍රී.ල.වි.ප්‍ර. 200[27]යටතේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී බාහිර විගණකවරයාගෙන් බලාපොරොත්තුවන ආකාරයට අස්තිත්වයෙන් ස්වාධීනව කටයුතු නොකරයි. එම හේතුවෙන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. මඟින් කරනු ලබන්නේ අභ්‍යන්තර විගණකවරුන් ඉටු කරන කාර්යයන් බාහිර විගණකවරුන් විසින් භාවිතා කිරීමට හැකියාව සඳහා අවශ්‍යකරන තත්වයන් පිළිබඳ නිර්වචනයක් දීමය. මේ සමඟම අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩ විගණන අරමුණ සඳහා ප්‍රමාණවත් වන බවට ප්‍රමාණවත් සහ උචිත සාක්ෂි ලබාගැනීමේ ක්‍රියාත්මක උත්සාහය සඳහා වන නිර්වචනය කිරීමද එයින් සිදුවේ. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් නියම ප්‍රමාණයට වඩා හෝ අයුතු ලෙස භාවිතා කිරීම වළක්වාලීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව බාහිර විගණකවරයාගේ විනිශ්චයට එළඹීමේ ආකෘතිමය රාමුවක් සැපයීම සඳහා මෙම අවශ්‍යතාවන් සැලසුම් කොට ඇත.

**බලපවත්වන දිනය**

10. 2015 ජනවාරි මස 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිඡේදයන් සඳහා වන මුල්‍ය ප්‍රකාශ විගණනයන් සඳහා මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. බලපැවැත්වේ.

**අරමුණු**

11. අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යභාරයක් ඇති විට සහ බාහිර විගණකවරයා විසින් එම කාර්යභාරයේ වැඩ කොටස් ඍජුවම බාහිර විගණකවරයා විසින් ඉටුකරනු ලබන විගණන ක්‍රියාපටිපාටී සම්බන්ධ ස්වභාවය සහ කාලනිර්ණයන් වෙනස් කිරීම කිරීම හෝ ප්‍රමාණය අඩුකිරීම සඳහා යොදාගැනීමට බලාපොරොත්තුවීම බාහිර විගණකවරයාගේ අරමුණ වනවිට;

(අ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් ප්‍රයෝජනයට ගත හැකිද, එසේ නම් කුමන අවකාශයකටද, කුමන ප්‍රමාණයකටද යන්න නිශ්චය කිරීමට සහ එසේ නිශ්චය කිරීමෙන් අනතුරුව:

(ආ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් ප්‍රයෝජනයට ගන්නේ නම් විගණන අරමුණු සඳහා එම වැඩ කොටස් ප්‍රමාණවත් වන්නේද යන්න නිශ්චය කිරීමට වේ.

**නිර්වචනය**

12. ශ්‍රී.ල.වි.ප්‍ර. අරමුණු සඳහා පහත සඳහන් පද වලට පහත සඳහන් තේරුම් අදාල වන්නේය

[25] 13 සිට 23 දක්වාවූ ඡේද බලන්න
[26] ශ්‍රී.ල.වි.ප්‍ර. 330, *තක්සේරු කළ අවදානමට විගණනයේ ප්‍රතිචාර*
[27] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 14 ඡේදය

අභ්‍යන්තර විගණන කාර්යයභාරය - අස්තිත්වයක පාලනය, අවදානම් කළමනාකාරීත්වය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ නිසි සඵලදායකත්වය ඇගයීම සහ වර්ධනය කිරීම සඳහා සැලසුම් කළ එම අස්තිත්වය විසින් ඉටුකරනු ලබන සහතිකවීමේ සහ උපදේශන ක්‍රියාකාරකම්වල කාර්යභාරය. (යොමුව: ඡේද A1–A4 )

**අවශ්‍යතාවන්**

**අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩ කොටස් කුමන ප්‍රමාණයකට සහ කුමන වපසරියකට භාවිතා කළ හැකිදැයි යන්න නිශ්චය කිරීම.**

***අභ්‍යන්තර විගණන කාර්යභාරය ඇගයීම***

13. අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩ කොටස් විගණනයේ අරමුණු සඳහා භාවිතා කළ හැකිදැයි පහත සඳහන් දෑ අගයමින් බාහිර විගණකවරයා විසින් නිශ්චය කළයුතුය:

(අ) අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ සංවිධාන තත්වය සහ අදාල පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණගතභාවයට සහායවන ප්‍රමාණය. (යොමුව: ඡේද. A5–A9)

(ආ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණතා මට්ටම: සහ (යොමුව: ඡේද. A5–A9)

(ඇ) තත්ව පාලනයද ඇතුලත්ව අභ්‍යන්තර විගණන කාර්යයභාරය විසින් විධිමත් හා ශික්ෂිත එළඹීමක් ක්‍රියාවේ යොදවයිද යන්න (යොමුව: ඡේද. A10–A11).

14. බාහිර විගණකවරයා විසින් පහත සඳහන් ලෙස නිශ්චය කරයි නම් එවැනි අවස්ථාවලදී අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් තම කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතුය:

(අ) සංවිධාන ව්‍යුහයේ තත්වය සහ අදාල ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යයභාරයේ අරමුණුගතභාවය කෙරෙහි ප්‍රමාණවත්ව සහාය නොදක්වයි නම්;

(ආ) කාර්යභාරය ප්‍රමාණවත් නිපුණත්වයෙන් තොරනම්; සහ

(ඇ) තත්වපාලනයද ඇතුලත්ව, අභ්‍යන්තර විගණන කාර්යයභාරය විසින් විධිමත් හා ශික්ෂිත එළඹීමක් ක්‍රියාවේ යොදවන්නේ නැති නම් (යොමුව: ඡේද. A12–A14)

**අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩ කොටස් භාවිතා කළහැකි ස්වභාවය හා ප්‍රමාණය නිශ්චය කිරීම**

15. අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩකොටස් කිනම් අවකාශයක් තුල කවර ප්‍රමාණයකට ප්‍රයෝජනයට ගත හැකිද යන්න නිශ්චය කිරීමේ පදනම වශයෙන්, අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටු කරනු ලැබ ඇති හෝ ඉටුකිරීමට සැලසුම් කර ඇති වැඩ කොටස් වල විෂයපථය හා ස්වභාවය සහ බාහිර විගණකවරයාගේ සමස්ථ විගණන උපායමාර්ග වලට සහ විගණන සැලසුමට අභ්‍යන්තර විගණන කාර්යභාරය මඟින් ඇති සහ අදාලත්වය බාහිර විගණකවරයා විසින් සැලකිල්ලට ගත යුතුය. (යොමුව: ඡේද A15–A17)

16. තම විගණන කාර්යභාරයට අදාල සියලු වැදගත් විනිශ්චයයන් බාහිර විගණකවරයා විසින් ගතයුතු අතර අභ්‍යන්තර විගණන කාර්යයභාරයේ වැඩකොටස් නුසුදුසු ලෙස භාවිතා කිරීම වලක්වා ගෙන එම වැඩ කොටස් අවම ලෙස භාවිතා කොට තම ඍජු ක්‍රියාකාරීකම් වැඩියෙන් ඉටුකිරීමට බාහිර විගණකවරයා සැලසුම් කළයුතුය. (යොමුව: ඡේද A15–A17 )

(අ) විනිශ්චයයන් බහුලව සම්බන්ධ වන්නේ :

(i) අදාල විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ඉටුකිරීමේදී සහ
(ii) රැස්කර ගන්නා ලද විගණන සාක්ෂි අගයීමේදී (යොමුව: ඡේද A18–A19 )

(ආ) සැලකියයුතු ලෙස හඳුනාගත් අවදානම් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වමින් සැඳහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පැවතීමේ අවදානම ඉහළ ලෙස තක්සේරුවී ඇතිවිට (යොමුව: ඡේද A20–A22 )

(ඇ) අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා සංවිධාන ව්‍යුහයේ පවත්නා තත්වය පහත් මට්ටමක පැවතීම සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස සහායවීම පහත් මට්ටමක පවතින විට: සහ

(ඈ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණතාවය පහත මට්ටමක පවතින විට

17. ප්‍රකාශිත විගණන මතය බාහිර විගණකවරයාගේ තනි වගකීමක් බව දී ඇති බව සලකමින්, සමාහාර වශයෙන් සැලසුම් කරන ලද ප්‍රමාණය තුල අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලය බාහිර විගණකවරයා තවදුරටත් ප්‍රමාණවත් ලෙසට විගණනය හා සම්බන්ධවීම බවට බාහිර විගණකවරයා විසින් ඇගයීමක් කළයුතුය. (යොමුව: ඡේද A15–A22)

18. ශ්‍රී.ල.වි.ප්‍ර. 260[28] ට අනුකූලව විගණනයේ සැලසුම් කළ විෂයපථය හා කාලනිර්ණය පිළිබඳව සමාලෝචනයක් අස්තිත්වයේ පාලනයභාරව සිටින අය වෙත සන්නිවේදනය කිරීමේදී අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කටයුතු බාහිර විගණකවරයා විසින් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධ සැලසුම් කර ඇති ආකාරයද සන්නිවේදනය කළයුතුය.(යොමුව:ඡේදය A23)

## අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කිරීම

19. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කිරීමට බාහිර විගණකවරයා සැලසුම් කරන්නේ නම් එම කාර්යභාරයේ වැඩ කොටස් සැලසුම් ගත භාවිතා කිරීම සම්බන්ධයෙන් අදාලවන ඔවුන්ගේ සම්බන්ධීකරනය කිරීමේ පදනමක් ලෙසට අභ්‍යන්තර විගණන කාර්යභාරය සමඟ සාකච්ඡා කළයුතුය. (යොමුව: ඡේද A24–A26)

20. අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටුකළ විගණන පටිපාටිවල ප්‍රමාණය සහ ස්වභාවය සහ සම්බන්ධිත තීරණයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට කාර්යභාරයේ වැඩ බාහිර විගණක භාවිතා කිරීමට සැලසුම් කරනවිට එම කාර්යයන්හි වැඩ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක වාර්තා බාහිර විගණක විසින් කියවිය යුතුය.

21. විගණන අරමුණු සඳහා, බාහිර විගණක භාවිතා කිරිමට සැලසුම් කළ අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩවල ප්‍රධාන අංග සමස්තයක් වශයෙන් ගෙන ඒවායේ ප්‍රමාණවත්භාවය නිශ්චය කිරීම සඳහා පහත සඳහන් අගයීම් ද ඇතුලත්ව ප්‍රමාණවත් විගණන ක්‍රියාපටිපාටි බාහිර විගණක විසින් ඉටුකලයුතුය;

(අ) කාර්යභාරයේ වැඩ කොටස් නිසි ලෙස සැලසුම් කොට තිබේද, ඉටුකර තිබේද, අධීක්ෂණය කොට තිබේ ද, සමාලෝචනයට භාජනය කොට තිබේද, ලේඛණගතකොට තිබේ ද යන්න.

(ආ) කාර්යභාරයට සාධාරන නිගමනයන්ට එළඹීමට හැකිවන ආකාරයට ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබාගෙන තිබේද යන්න; සහ

(ඇ) එළඹගත් නිගමනයන් අදාල තත්වයන් යටතේ උචිත වන්නේද යන්න සහ කාර්යභාරය විසින් සකස් කරන ලද වාර්තා ඉටු කරනු ලැබූ වැඩ කොටස් සමඟ අනුකූල වන්නේද යන්න. (යොමුව: ඡේද A 27–A 30)

22. බාහිර විගණකවරයාගේ විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය හා ප්‍රමාණය පහත සඳහන් දෑ සම්බන්ධ ඇගයීම් වලට ප්‍රතිචාර වශයෙන් විය යුතුය.

(අ) සම්බන්ධීවන විනිශ්චයන්ගේ ප්‍රමාණය;

(ආ) තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් මත;

(ඇ) අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට, අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධාන තත්වය සහ අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සහාය දක්වන ප්‍රමාණය,
සහ

(ඈ) කාර්යභාරයේ නිපුණතා මට්ටම[29]. (යොමුව: ඡේද A 27–A 29)

සහ යම් වැඩ කොටසක් යලි ඉටු කරවීමද ඇතුලත් විය යුතුය. (යොමුව: ඡේදය A 30)

[28] ශ්‍රී.ල.වි.ප්‍ර. 260, පාලන කාර්යභාරය දරන අය සමඟ සන්නිවේදනය

[29] 16 වන ඡේදය බලන්න

23. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ 13 ඡේදයේ වන අභ්‍යන්තර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ නිගමනයන් සහ විගණන අරමුනු සඳහා මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ 16 - 17 ඡේදවල වන කාර්යභාරයන් භාවිතා කිරීම සඳහා ඒවායේ ප්‍රමාණය සහ ස්වභාවය නිශ්චය කිරීම උචිත ලෙස පවතින්නේද යන්නද බාහිර විගණකවරයා විසින් ඇගයිය යුතුය.

**ලේඛනගතකරණය**

24. බාහිර විගණකවරයා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කරන්නේ නම් බාහිර විගණක විසින් පහත සඳහන් පරිදි ඒවා සිය විගණන ලේඛණගත කිරීම්වල අඩංගු කළයුතුය.

(අ)

(i) කාර්යභාරයේ සංවිධාන තරාතිරම සහ අදාලවන ප්‍රතිපත්ති සහ පද්ධතීන් ප්‍රමාණවත් ලෙසට අභ්‍යන්තර විගණන කාර්යභාරයේ අරමුණුගතභාවයට සහාය දක්වයිද යන්න

(ii) කාර්යභාරයේ නිපුණතා මට්ටම, සහ

(iii) කාර්යභාරය විසින් තත්ත්ව පාලනයද ඇතුලත්ව ක්‍රමවත් සහ ශික්ෂිත එළඹීමක් යොදාගනීද යන්නෙහි ඇගයීමක්;

(ආ) භාවිතා කරනු ලැබූ වැඩකොටස්වල ස්වභාවය සහ ප්‍රමාණය සහ එම තීරණයට පදනම; සහ

(ඇ) භාවිතා කළ වැඩකොටස්වල ප්‍රමාණවත්භාවය ඇගයීම සඳහා බාහිර විගණකවරයා ඉටු කළ විගණන ක්‍රියාපටිපාටි.

***

**ව්‍යවහාරකරණය සහ වෙනත් විස්තර කිරීමේ දෑ**
**අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිර්වචනය** (යොමුව: ඡේද 2,12)

අ1. අස්තිත්වයේ පාලන ක්‍රියාවලියේ අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය වඩා යහපත් බවට පමුණුවාලීමට සහ ඇගයීමට සැලසුම් කළ සහතිකවීමේ සහ උපදේශන ක්‍රියාකාරකම් නියම වශයෙන් අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීකම්වල අරමුණු සහ විෂයපථයට ඇතුලත්වේ.

උදාහරණ වශයෙන් පහත දෑ;

***පාලනය සම්බන්ධිත ක්‍රියාකාරකම්***

- ආයතනයේ උචිත විෂයපථයන්ට, ආචාරධර්ම සහ සාරධර්ම, කාර්යසාධන කළමනාකරණය සහ ගිණුම් කටයුතුභාවය, අවදානම් සහ පාලන තොරතුරු මත සහ පාලන කාර්යභාරය දරන්නන්, බාහිර හා අභ්‍යන්තර විගණකවරුන් සහ පාලන කළමනාකාරීත්වය, අතර සන්නිවේදනයේ සඵලදායකත්වය එහි අරමුණු සාර්ථක කරගැනීමට අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීකම් ක්‍රියාවලිය තක්සේරු කළ හැකිය.

***අවදානම් කළමනාකරණය සම්බන්ධිත ක්‍රියාකාරකම්***

- සැලකියයුතු අන්දමේ අවදානමට අනාවරණයන් හඳුනාගැනීම සහ ඇගයීමට කටයුතු කිරීම මඟින් සහ (මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ සඵලදායකත්වය ඇතුලුව) අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සම්බන්ධව දායක වීමත් මඟින් අභ්‍යන්තර විගණන කාර්යභාරය අස්තිත්වයට සහාය දැක්විය හැකිය.

- වංචා අනාවරණය කරගැනීමට අස්තිත්වයට සහාය වීමට අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටි ඉටුකළ හැකිය.

***අභ්‍යන්තර පාලනයට සම්බන්ධිත ක්‍රියාකාරකම්***

- අභ්‍යන්තර පාලනය ඇගයීම. පාලනයන් සම්බන්ධව සමාලෝචනය කිරීම, ඒවායේ මෙහෙයුම් ඇගයීම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේ විශේෂ වගකීම අභ්‍යන්තර විගණන

කාර්යයභාරයට පැවරිය හැකිය. එසේ කිරීම මගින් පාලනයන් සම්බන්ධ සහතිකවීමක් අභ්‍යන්තර විගණන කාර්යයභාරය විසින් ලබාදේ. උදාහරණ වශයෙන් විගණනයට අදාලවන පාලනයද ඇතුලුව අභ්‍යන්තර පාලනයේ මෙහෙයුම් සඵලදායකත්වය සපුරාලීම, සැලසුම් කිරීම සම්බන්ධවන පාලන කාර්යභාරය දරන්නන්ට සහ කළමනාකාරීත්වයට සහතිකවීමක් ලබාදීමට අභ්‍යන්තර විගණන කාර්යභාරය පරීක්‍ෂණ හෝ වෙනත් ක්‍රියාපටිපාටි සැලසුම්කර ඉටුකළ හැකිය.

- මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු පරීක්‍ෂා කිරීම. මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ යොදා ගන්නා විධි සමාලෝචනයට භාජනය කිරීම සඳහාත් ක්‍රියාපටිපාටි සහ ශේෂයන් සහ ගණුදෙනු විස්තරාත්මක පරීක්‍ෂාවද ඇතුලුව තනි අයිතමයන් පිළිබඳව විශේෂිත විමසීම් කිරීම සඳහාත් අභ්‍යන්තර විගණන කාර්යභාරය යොදවනු ලැබිය හැකිය.

- මෙහෙයුම් ක්‍රියාකාරීකම් සමාලෝචනය. අස්තිත්වයක මූල්‍ය නොවන ක්‍රියාකාරීකම්ද ඇතුලත්ව මෙහෙයුම් ක්‍රියාකාරීකම් වල කාර්යක්‍ෂමතාවයල සඵලදායකත්වය හා සකසුරුවම්භාවය සමාලෝචනයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයභාරය යොදවනු ලැබිය හැකිය.

- නීති-රීති සහ රෙගුලාසි වලට අනුකූලතාවය දැක්වීම සමාලෝචනය කිරීම. නීති-රීති, රෙගුලාසි හා වෙනත් බාහිර අවශ්‍යතා වලට සහ කළමනාකරණ ප්‍රතිපත්ති, නියෝග මෙන්ම නියමයන් සහ වෙනත් අභ්‍යන්තර අවශ්‍යතා වලට අනුකූලතාවය දැක්වීම සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරය යොදවනු ලැබිය හැකිය.

අ2. අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටුකරන කාර්යභාරයන්ට සමාන කාර්යභාරයන් අස්තිත්වයක වෙනත් තනතුරු නාමයන් යටතේ සිටින කාර්යභාරයන් විසින්ද ඉටුකරනු ලැබිය හැකිය. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ ක්‍රියාකාරීකම් වලින් කොටසක් හෝ සම්පූර්ණ වශයෙන් තුන්වන පාර්ශවයක සේවා සපයන්නෙකුට බාහිරකරණය කළහැකිය. කාර්යභාරයේ තනතුර නාමය හෝ එය ඉටුකරනු ලබන්නේ අස්තිත්වය විසින්ද යන්න හෝ තුන්වන පාර්ශවයක සේවා සපයන්නෙක්ද යන්න එම කාර්යභාරයේ වැඩ බාහිර විගණකට භාවිතා කළහැකිද හෝ නොහැකිද යන්න නිර්ණය කිරීමට එකමඑක හේතුව නොවේ. වඩා නිවරදිව කිවහොත් අදාල වන්නේ ක්‍රියාකාරීකම්වල ස්වභාවය, සංවිධාන ව්‍යුහයේ අභ්‍යන්තර විගණන කාර්යභාරයේ තත්වය සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවය කෙරෙහි අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි දක්වන සහාය; කාර්යභාරයේ නිපුණත්වය; සහ කාර්යභාරයේ විධිමත් සහ ශික්ෂිත එළඹීමයි. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් වලට මෙම ගතිලක්‍ෂණයන්ගෙන් සපිරි වෙනත් කාර්යභාරයන් හෝ තුන්වන පාර්ශවයක සේවා සපයන්නන් විසින් ඉටුකරන කාර්යභාරයන්ද මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ ඇතුලත්ය.

අ3. මෙයට අමතරව අභ්‍යන්තර විගණන කාර්යභාරයට බාහිරව මෙහෙයුම් සහ කළමනාකාරීත්ව රාජකාරි සහ වගකීම් ඇති අස්තිත්වය තුල ඇති අයවලුන් ශ්‍රී.ල.වි.ප්‍ර. 330[30] ය ප්‍රකාරව පරීක්‍ෂා කළහැකි අන්දමේ පාලන ක්‍රියාකාරකම් ඔවුන් විසින් ඉටුකළ හැකි වුවත් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ කොටසක් ලෙස ඒවා සැලකීම වැලැක්විය හැකි බැවින් ඒ අයවලුන්ගේ අරමුණුගතභාවයට වන තර්ජනයන්ට සාමාන්‍යයෙන් මුහුණදේ. මේ හේතුකොටගෙන හිමිකරු-කළමනාකරුවකු විසින් ඉටුකරනු ලබන පාලනයන් අධීක්‍ෂණය කිරීම අභ්‍යන්තර විගණන කාර්භාරය හා සමාන ලෙසට නොසලකනු ලබන්නේය.

අ4. අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සහ බාහිර විගණකගේ අරමුණු වෙනස් වන අතරතුර අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් මූල්‍ය ප්‍රකාශ මත බාහිර විගණක මූල්‍ය ප්‍රකාශ විගණනයකදී ඉටුකරනු ලබන කාර්යභාරයම ඉටුකරනු ලැබිය හැකිය. එසේ වන විට බාහිර විගණකවරයා විසින් පහත සඳහන් එක් හෝ ඊට වැඩි ආකාරයෙන් විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කළ හැකිය.

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්හි අවදානම පිළිබඳව බාහිර විගණකවරයාගේ තක්සේරුවට අදාලවන තොරතුරු ලබාගැනීම. මේ සම්බන්ධයෙන් වන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[31] අනුව ආ්‍යන්තර විගණන කාර්යභාරයේ වගකීම් වල ස්වභාවය, සංවිධාන ව්‍යුහය තුල එහි තත්වය සහ ඉටුකරන ලැබූ හෝ ඉටුකිරීමට අදහස් කරන ක්‍රියාකාරීකම් පිළිබඳව අභ්‍යන්තර විගණන කාර්යභාරය තුළ සිටින (අස්තිත්වය තුල එවැනි කාරයභාරයක් ඇති නම්) අදාලවන පුද්ගලයන්ගෙන් විමසීම්කර බාහිර විගණකවරයා අවබෝධයක් ලබාගතයුතු වන්නේය, හෝ

---

[30] 8 වන ඡේදය බලන්න
[31] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (ප්‍රතිශෝධිත) 6 (a) ඡේදය

- නීති-රීති හෝ රෙගුලාසි මඟින් තහනම් කොට හෝ සීමා කොට නැතිනම් මිස ප්‍රමාණවත් අගයීමකින් අනතුරුව අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් කාලපරිච්ඡේදය තුල ඉටුකළ වැඩ කොටස් බාහිර විගණක විසින් සෘජුව ලබාගතයුතු විගණන සාක්ෂි වලට පාර්ශවීය ආදේශකයක් ලෙස භාවිතා කිරීමට බාහිර විගණකවරයා තීරණය කළ හැකිය.[32]

**අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටුකළ වැඩකොටස් කවර අවකාශයක කොතෙක්වූ ප්‍රමාණයකට භාවිතා කළයුතුදැයි නිගමනය කිරීම**

*අභ්‍යන්තර විගණන කාර්යභාරය ඇගයීමට ලක්කිරීම*

අරමුණුගතභාවය සහ නිපුණතාවය ( යොමුව: ඡේද. 13(අ)–(ආ) )

අ5. විගණන අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කළහැකිද යන්න සම්බන්ධයෙන් සහ එවැනි තත්වයක් යටතේ කුමන ස්වාභාවයක සහ ප්‍රමාණයක අභ්‍යන්තර විගණන කාර්භාරයේ වැඩ කොටස් භාවිතා කළ හැක්කේ දැයි නිගමනය කිරීමේදී බාහිර විගණකවරයා සිය වෘත්තීමය විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබයි.

අ6. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධානමය තත්වය සහ අභ්‍යන්තර විගණකවරයන්ගේ අරමුණුගතභාවය කෙරෙහි සහාය දක්වන අදාල වන්නාවූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සහ කාර්යභාරයේ නිපුණතා මට්ටම එම කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කළයුතුද යන්න නිශ්චය කිරීමේදී විශේෂ වැදගත්කමක් ගනු ලබන අතරම එසේ වන විට එම තත්වයන් යටතේ එම කාර්යභාරයේ වැඩකොටස් කවර ස්වභාවයෙන් කවර වපසරියක් තුල භාවිතා කළයුතු දැයි යන්න අදාල වේ.

අ7. අරමුණුගතභාවය යනුවෙන් අදහස් කරන්නේ පක්ෂග්‍රාහී බවක් ඇති නොවන ලෙස, බැඳියාව පිළිබඳ ගැටුමකින් සහ වෘත්තීයමය විනිශ්චය ඉක්මවායාම පිණිස වෙනත් අය කරන අනිසි බලපෑම් වලින් තොරව එවැනි කාර්යයන් ඉටුකිරීමේ හැකියාව වේ. බාහිර විගණකවරයාගේ ඇගයීම සම්බන්ධයෙන් බලපෑහැකි සාධක වලට පහත දෑ අඩංගු වේ:

- කාර්යභාරයේ අධිකාරීය, වගකිවයුතු බව ඇතුලුව අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධානමය තත්වය පක්ෂග්‍රාහී බවකින්, බැඳියා පිළිබඳ ගැටුමකින් සහ වෘත්තීයමය විනිශ්චය ඉක්මවායාම පිණිස වෙනත් අය කරන අනිසි බලපෑම් වලින් නිදහස්ව කටයුතු කිරීමට අවශ්‍ය සහාය දක්වන්නේද යන්න. උදාහරණ වශයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරය වාර්තා කරනු ලබන්නේ පාලනය භාරව සිටින අයට හෝ නිසි අධිකාරී බලයෙන් යුතු නිලධාරියකුටද යන්න හෝ කාර්යභාරය වාර්තා කරනු ලබන්නේ කළමනාකාරීත්වයට නම් එයට පාලනය භාරව සිටින අය වෙත සෘජු ප්‍රවේශයක් පවත්නේද යන්න.
- අභ්‍යන්තර විගණන කාර්යභාරය කිසියම් ගැටුම්කාරී වගකීම්වලින් නිදහස්ද යන්න. උදාහරණ වශයෙන් ගතහොත් අභ්‍යන්තර විගණන කාර්යභාරයෙන් බාහිරවූ කළමනාකරණ හෝ මෙහෙයුම් රාජකාරි වගකීම් වලින් යුක්තද යන්න.
- පාලනය භාරව සිටින අය අභ්‍යන්තර විගණන කාර්යභාරයට සම්බන්ධ වෘත්තීයමය තීරණ අධීක්ෂණය කරයිද යන්න. උදාහරණ වශයෙන් දක්වතොත් උචිත වැටුප් හා වේතන ප්‍රතිපත්ති නිගමනය කරයිද.
- පාලනය භාරව සිටින අය හෝ කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර විගණන කාර්යභාරය මත කිසියම් සංශෝධනයන් හෝ සීමාකිරීම් පණවා ඇතිද යන්න. උදාහරණ වශයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ හෙළිදරව් කරගැනීම් බාහිර විගණකවරයාවෙත සන්නිවේදනය කිරීමේදී.
- අභ්‍යන්තර විගණකවරුන් අදාල වෘත්තීය ආයතන වල සාමාජිකයන්ද යන්න සහ එම වෘත්තීය ආයතනවල අරමුණුගතභාවයට අදාල වෘත්තීය ප්‍රමිතවලට අනුකූලතාවය දැක්විය යුතු බවට සිය සාමාජිකයන්ට නියම කොට ඇත්තේද යන්න හෝ ඔවුන්ගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති එකී අරමුණු සාක්ෂාත් කරනු ලබන්නේද යන්න.

[32] 13 - 23 ඡේද බලන්න

අ8. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණත්වය යනුවෙන් අදහස් කරන්නේ භාරගත් කාර්යභාරය මනා සැලකිල්ලෙන් යුතුව හා අදාලවන වෘත්තීය ප්‍රමිත වලට අනුකූලව ඉටුකිරීමට අවශ්‍ය මට්ටමකින් කාර්යභාරයේ සමස්ත දැනුම සහ කුසලතා අත්පත්කරගැනීම සහ පවත්වාගන යාමට ඇති හැකියාව වේ. බාහිර විගණකගේ නිශ්චය කිරීම් වලට බලපෑහැකි සාධක පහත දැක්වේ.

- අභ්‍යන්තර විගණන කාර්යයභාරය අස්තිත්ත්වයේ ප්‍රමානයට සහ එහි මෙහෙයුම් වල ස්වභාවයට සාපේක්ෂව අවශ්‍යවන්නාවූ යෝග්‍ය හෝ ප්‍රමාණවත් සම්පත් වලින් යුක්ත වන්නේද.

- අභ්‍යන්තර විගණන කාර්භාරයන් ඉටුකිරීම පිණිස අවශ්‍යවන්නාවූ අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ යෙදවීම සම්බන්ධව ස්ථාපිත කළ ප්‍රතිපත්තීන් තිබෙන්නේද යන්න.

- අභ්‍යන්තර විගණකවරුන්ට විගණනය ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රායෝගික/ තාක්ෂණික පුහුණුව සහ කුසලතාවය තිබේද යන්න. මෙම තක්සේරුව කිරීමේදී බාහිර විගණක සැලකිල්ලට ගතහැකි අදාල නිර්ණායකයනට ඇතුලත් වියහැක්කේ උදාහරණ වශයෙන් කිවහොත් අභ්‍යන්තර විගණකවරුන් සතුව පවතින අදාල වෘත්තීය පළපුරුද්ද හා තනතුරු නාමයයි.

- අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණය සහ අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සම්බන්ධිත අවශ්‍ය දැනුම අභ්‍යන්තර විගණකවරයා සතුව පවත්නේද යන්න සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ වැඩකොටස් ඉටුකිරීම සඳහා අවශ්‍ය කුසලතාවන් අභ්‍යන්තර විගණන කාර්යභාරය සතුව තිබේද යන්නයි. (උදාහරණ වශයෙන් දක්වතොත් කර්මාන්ත - විශේෂිත දැනුම)

- අඛණ්ඩ වෘත්තීය හැකියා වර්ධන අවශ්‍යතා නියමයන්ද අඩංගුව අදාල විගණන ප්‍රමිත වලට අනුකූලතාවය දැක්වීමේ බැඳීම ඇති අදාල වෘත්තීය ආයතනවල සාමාජිකත්වය අභ්‍යන්තර විගණකවරුන් දරනු ලබන්නේද යන්න.

අ9. අරමුණුගතභාවය සහ නිපුණතාවය අඛණ්ඩව පවතින්නක් ලෙස හැඟීමක් නැතිකරගත යුතුය. අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රමානවත් ලෙස සහාය දක්වන විට හා සංවිධානය තුල අභ්‍යන්තර විගණන කාර්යභාරයේ තරාතිරම ඉහළ වන විට බාහිර විගණක විසින් පුලුල් පරාසයක් තුල අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතයට ගැනීමේ කැමැත්ත දැක්වීමේ හැකියාව වැඩිවනු ඇත. කෙසේ වෙතත් අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රබල සහායක් ලබාදෙන සංවිධානමය තත්වය සහ අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තිබීම මඟින් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ ප්‍රමාණවත් ප්‍රවීණතාවයන් නැති වීම හිලව් කළ නොහැකිය.

ඒහා සමානව අභ්‍යන්තර විගණන ස්වරූපයේ අරමුණුගතභාවයට ප්‍රමාණවත් සහායක් ලබා නොදෙන සංවිධානමය තත්වය සහ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි විගණන කාර්යභාරයේ නිපුණත්වය ඉහළ මට්ටමකට තිබීමෙන් හිලව් කළ නොහැකිය.

**විධිමත් හා ශික්ෂිත එළඹීමක් ව්‍යවහාරකරණය (යොමුව: 13 (ඇ) ඡේදය)**

අ10. සැලසුම් කිරීමට කාර්යය ඉටුකිරීමට අධීක්ෂණය කිරීමට සමාලෝචනය කිරීමට සහ එහි ක්‍රියාකාරීකම් ලේඛනාරූඪ කිරීම සම්බන්ධයෙන් විධිමත් හා ශික්ෂිත ව්‍යවහාරකරණයක් යොදාගැනීම හේතු කොට ගෙන, අභ්‍යන්තර විගණන කාර්යභාරයේ කටයුතු අස්තිත්වයක් තුල ඉටු කරනු ලබන වෙනත් පාලන ක්‍රියාකාරීකම් අධීක්ෂණ කටයුතු වලින් වෙන්කොට දැක්විය හැකිය.

අ11. අභ්‍යන්තර විගණන කාර්යභාරය විධිමත් හා ශික්ෂිත ව්‍යවහාරකරණයක් යොදාගන්නේදැයි බාහිර විගණකවරයා විසින් නිශ්චය කිරීම සඳහා බලපෑහැකි සාධක වලට පහත සඳහන් දේ ඇතුලත් වේ.

- ලිඛිතව පවත්නාවූ අභ්‍යන්තර විගණන වැඩ සටහනක් හෝ අවදානම් තක්සේරු කිරීම, කාර්ය වැඩසටහන්, ලේඛනගත කිරීම සහ වාර්තාකරණය වැනි විෂයපථයන් ආවරණයවන ලේඛනගත අභ්‍යන්තර විගණන පටිපාටිවල පැවැත්ම, ඒවායේ ප්‍රමාණවත්භාවය සහ භාවිතා කිරීම සහ ඒවායේ ස්වභාවය සහ ප්‍රමාණය අස්තිත්වයේ තරම සහ ගැලපෙන අන්දමට තිබීම.

- අභ්‍යන්තර විගණන කාර්යභාරය සතුව යෝග්‍ය තත්ව පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පවතීද යන්න. උදාහරන වශයෙන් දක්වතොත් අභ්‍යන්තර විගණන කාර්යභාරයට ව්‍යවහාරවන තත්ව පාලනය පිළිබඳ

ශ්‍රී ලංකා ප්‍රමිත 1 SLSQC 1[33]හි ඇති ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි. (නායකත්වය මානව සම්පත් සහ කාර්යභාර ඉටුකිරීම වැනි) හෝ අභ්‍යන්තර විගණකවරුන් සඳහා අදාල වෘත්තීය අයතන විසින් නියමකළ තත්ත්ව පාලන ප්‍රමිති අවශ්‍යතාවන්. එවැනි ආයතන විසින් වාරික බාහිර තත්ත්ව තක්සේරු කිරීම් පැවැත්වීම වැනි වෙනත් නියමිත අවශ්‍යතාවන් පිහිටුවනු ලැබිය හැකිය.

**අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිත කළ නොහැකි තත්වයන් (යොමුව: ඡේදය (අ) 14)**

අ12. අභ්‍යන්තර විගණන කාර්යභාරයට ඇති සංවිධානයේ තත්වය සහ අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුනුගතභාවය කෙරෙහි ප්‍රමාණවත් ලෙස සහායක් දක්වන්නේද යන්නත්, අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණතා මට්ටමත් සහ එය විධිමත් සහ ශික්ෂිත එළඹීමක් යොදාගන්නේද යන්නත් පිළිබඳව වන බාහිර විගණකගේ අගයීම කාර්යභාරයේ වැඩකොටස් වල තත්වය පිළිබඳව ඇති අවදානම අවශ්‍ය ප්‍රමාණයට වඩා වැදගත් දැයි ඇඟවිය හැකි නිසා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ කිසිම වැඩ කොටසක් විගණන සාක්ෂි ලෙසට ප්‍රයෝජනය ගැනීම උචිත නොවන බවත් නිගමනය කෙරෙනු ඇත.

අ13. විගණන අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කිරීම නුසුදුසු යයි නිගමනය කිරීමට බොහෝ විට තනි සාධකයන් ප්‍රමාණවත් නැති බැවින් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ ඡේද A7, A8 සහ A11 සඳහන් සාධක තනි වශයෙන් හෝ සමාහරනයක් වශයෙන් සලකා බැලීම වැදගත් වේ. උදාහරණ වශයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධාන තත්වය අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ඇති තර්ජන අගයීම සඳහා විශේෂිත වැදගත්කමක් ගනී. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ඡේද A7 යටතේ විස්තර කර ඇති ආකාරයට සමාන වෙනත් සාධක මඟින් අවදානම් පිළිගතහැකි මට්ටමට අවම කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂාකාරී පියවර සාමූහික ලෙසින් ගෙන ඇති නම් මිස අභ්‍යන්තර විගණන කාර්යභාරය කළමනාකරණයට වාර්තා කරන්නේ නම් එය අභ්‍යන්තර විගණන කාර්යභාරයට ඇති සැලකියයුතු අන්දමේ තර්ජනයක් ලෙස සැලකෙන්නේය.

අ14. මෙයට අමතරව බාහිර විගණක, විගණන සේවාදායකටද, අභ්‍යන්තර සේවා ලබාදීමේ කාර්යයක් භාරගන්නාවිට සහ එම සේවාවල ප්‍රතිඵල විගණනය පවත්වාගනයාමේදී භාවිතා කරනු ලැබුව හොත් එවිට ස්වයං-සමාලෝචන තර්ජනයක් උපද්දන බව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අචාරධර්ම සංග්‍රහයේ ප්‍රකාශ කෙරේ[34]. මෙයට හේතුවන්නේ විගණන සමාගමේ සාමාජිකයන් නොවන පුද්ගලයන් විසින් අභ්‍යන්තර විගණන කාර්යභාරයන් ඉටුකිරීමේදී යොදවනු ලැබිය හැකි වෘත්තීය සංශය-දෘශ්ඨිභාවය කාර්යභාරයේ නියුතු කණ්ඩායම එම මට්ටමට නොයොදවා හෝ අභ්‍යන්තර විගණන සේවාවෙන් ලබාගත් ප්‍රතිඵල නිසිලෙස ඇගයීමක් නොකර අභ්‍යන්තර විගණන සේවාවෙන් ලබාගත් ප්‍රතිඵල ඔවුන් භාවිතා කිරීමේ හැකියාව නිසාය. එක්තරා තත්වයන්හිදී ව්‍යවහාරවන වාරණද වෙනත් තත්වයන් යටතේ තර්ජන පිළිගතහැකි මට්ටමට අඩුකිරීමට ව්‍යවහාර කළහැකි ආරක්ෂක පියවරද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අචාරධර්ම[35] සංග්‍රහයේ සාකච්ඡා කෙරේ.

***අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කළහැකි ස්වභාවය සහ ප්‍රමාණය නිශ්චය කිරීම***

භාවිතා කළ හැකි අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ වල ස්වභාවය සහ ප්‍රමාණය නිශ්චය කිරීමේදි බලපාන සාධක (යොමුව: ඡේද 15-17)

අ15. විගණනයේ අරමුණ සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කළහැකි බවට බාහිර විගණකවරයා වරෙක නිශ්චය කළ විට සැලකිය යුතු පළමුවන කරුණ වන්නේ සැලසුම් කර ඇති අභ්‍යන්තර විගණන කාර්යභාරයේ විෂයපථය හා ස්වභාවය ඉටු කර තිබේද හෝ ඉටුකිරීමට සැලසුම් කර තිබේද යන්න හෝ එය සමස්ත විගණනයට අදාල වන්නේද යන්න සහ විගණන සැලස්ම ශ්‍රී.ල.වි.ප්‍ර. 300[36] අනුව ස්ථාපනය කර ඇතිද යන්නයි.

---

[33] තත්ව පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිත : (SLSQC)1 *විගණනයක් ඉටුකරන හා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන සමාගම් සහ වෙනත් සහතික වීමේ සහ සම්බන්දිත සේවා කාර්යභාරයන්ට බලපාන තත්ත්ව පාලනය*

[34] ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීආයතනයේ *වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය* (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (චර්යාධර්ම සංග්‍රහය), 290,199 කොටස)

[35] ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ චර්යාධර්ම සංග්‍රහය. 290,195-290.200

[36] ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 300 - මූල්‍ය ප්‍රකාශන විගණනයක් සැලසුම් කිරීම.

අ16. බාහිර විගණකවරයා විසින් භාවිතා කළ හැකි අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් පිළිබඳ උදාහරණ වලට පහත සඳහන් දේ ඇතුලත්වේ.

- පාලනයන්ගේ මෙහෙයුම් වල සඵලදායකත්වය පරීක්ෂාවට ලක්කිරීම
- සීමිත විනිශ්චයනට අදාල වන තහවුරුකිරීමේ ක්‍රියාපටිපාටි
- තොග ගණන් කිරීම නිරීක්ෂණය
- මූල්‍ය වාර්තාකරණයට අදාල ගණුදෙනු තොරතුරු පද්ධතිය හරහා සොයා යාම
- නියාමන අවශ්‍යතාවලට අනුකූලත්වය දැක්වීම් සම්බන්ධව පරීක්ෂා කිරීම
- සමහර තත්වයන් යටතේ සමූහයේ වැදගත් සංරචකයක් නොවන පරිපාලිතයන්හි මූල්‍ය තොරතුරු විගණනය හෝ සමාලෝචනය (ශ්‍රී.ල.වි.ප්‍ර. 600 යේ දැක්වෙන අවශ්‍යතා සමග නොගැටෙන විට)[37]

අ17. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ භාවිතයට ගැනීම පිළිබඳව බාහිර විගණකවරයාගේ සැලසුම් කිරීමෙහි ස්වභාවය හා ප්‍රමාණය නිශ්චය කිරීමට බලපෑමක් විය හැක්කේ, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 16 වන ඡේදයේ වන අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණතා මට්ටම සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා වන සංවිධානයේ තත්වය අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිගත හැකි ලෙස දක්වන සහාය පිළිබඳව බාහිර විගණකවරයා විසින් ගනු ලබන අගය කිරීමේ ප්‍රමාණය මත වේ. බාහිර විගණකවරයාගේ නිගමන කෙරෙහි එළඹීමට අවශ්‍ය යෙදවුම් වන්නේ සැදහුම් මට්ටමේදී කරනු ලබන ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පැවතීමේ තක්සේරු කළ අවදානම් සහ එවැනි වැඩකොටස් සැලසුම් කිරීමට, ඉටුකිරීමට සහ ඇගයීමට අවශ්‍ය විනිශ්චයේ ප්‍රමාණයයි. තවදුරටත් කිවහොත් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් විගණන අරමුණු සඳහා බාහිර විගණකට භාවිතා කළ නොහැකි අවස්ථාවන් ශ්‍රී.ල.වි.ප්‍ර.යේ 14 වන ඡේදය යටතේ විස්තර කර ඇත.

**විගණන ක්‍රියාපටිපාටියක් සැලසුම් කිරීම හා ඉටුකිරීම සහ ප්‍රතිඵල ඇගයීම පිළිබඳ විනිශ්චයයන් (යොමුව: 16 ඡේදය)**

අ18. විගණන ක්‍රියාපටිපාටියක් සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී සහ විගණන සාක්ෂි ඇගයීමේදී එළඹීමට අවශ්‍යවන විනිශ්චයයන් ප්‍රබල වන විට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 16 වන ඡේදයට අනුව තවදුරටත් ක්‍රියාපටිපාටි වැඩි සංඛ්‍යාවක් ඍජුව ඉටුකිරීමට බාහිර විගණකවරයාට සිදුවේ. මක්නිසාදයත් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කිරීමෙන් පමණක්ම බාහිර විගණකවරයා වෙත ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාදෙන්නේ නැති බැවිනි.

අ19. ප්‍රකාශිත විගණන මතය බාහිර විගණකවරයාගේ තනි වගකීමක් වීම හේතුවෙන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 16 වන ඡේදයට අනුව බාහිර විගණකවරයා සිය විගණන කාර්යභාරයේදී වැදගත් විනිශ්චයයන්ට එළඹීම අවශ්‍ය කෙරේ. වැදගත් විනිශ්චයයන් යන්නට පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් තක්සේරු කිරීම.
- ඉටුකරනු ලැබූ පරීක්ෂණයන්ගේ ප්‍රමාණවත් බව ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය කළමනාකරණය විසින් භාවිතා කිරීමේ යෝග්‍යතාවය ඇගයීම.
- සැලකියයුතු අන්දමේ ගිණුම් ඇස්තමේන්තු ඇගයීම සහ
- මූල්‍ය ප්‍රකාශ තුලින් කෙරෙන හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත්භාවය සහ විගණකවරයාගේ වාර්තාවට බලපාන වෙනත් කරුණු ඇගයීම.

***ප්‍රමාණාත්මක අවප්‍රකාශවල තක්සේරු කළ අවදානම (යොමුව: ඡේදය 16ඃආ)***

අ20. යම් ගිණුම් ශේෂයක, ගණුදෙනු පංතියක හෝ හෙළිදරව් කිරීමක් මත සැදහුම් මට්ටමේදී වන ප්‍රමාණාත්මක අවප්‍රකාශවල තක්සේරු කළ අවදානම් ඉහළ මට්ටමක වන කල්හි බොහෝ විට විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම, ඉටුකිරීම සහ ඒවායේ ප්‍රතිඵල ඇගයීමේදී බොහෝ විනිශ්චයයන් සම්බන්ධවේ. එවැනි අවස්ථාවලදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 16 වන ඡේදයට අනුව බාහිර විගණකවරයා විසින් බොහෝ ඍජු විගණන ක්‍රියාපටිපාටීන් ඉටු කිරීම අවශ්‍යකරන අතර විගණන සාක්ෂි ලබාගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් කරනු ලැබූ

[37] ශ්‍රී.ල.වි.ප්‍ර. 600 විශේෂ සලකා බැලීම් - *සමූහවල මූල්‍ය ප්‍රකාශනය විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩකොටස්ද ඇතුලුව)*

වැඩකොටස් වඩා අඩු ලෙස භාවිතයට ගත යුතුය. තවදුරටත් කිවහොත් ශ්‍රී.ල.වි.ප්‍ර. 200[38] හි විස්තර කර ඇති පරිදි ප්‍රමාණාත්මක තක්සේරුවූ අවප්‍රකාශ අවදානම ඉහළ වන විට විගණකවරයා ලබාගත යුතු විගණන සාක්ෂි වඩාත් ඒත්තුගන්වන සුළු විය යුතුය. එහෙයින් බාහිර විගණකවරයා සෘජුවම බොහෝ වැඩකොටස් ඉටුකිරීම අවශ්‍යවනු ඇත.

අ21. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[39]වල විස්තර කර ඇති පරිදි සැලකියයුතු අන්දමේ අවදානම් සඳහා විශේෂ විගණන අවධානයක් අවශ්‍ය වේ, ඒ අනුව සැලකියයුතු අන්දමේ අවදානම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ බාහිර විගණකවරයා විසින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව සීමිත විනිශ්චයයක් ලබාදීමට අවශ්‍යවන්නාවූ ක්‍රියාපටිපාටි වලට සීමාවේ. මීට අමතරව ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැවතීමේ අවදානම පහත් මට්ටමට නොවන විට හැර අභ්‍යන්තර විගණන කාර්යභාරයේ පමණක්ම වැඩ බාහිර විගණකවරයා විසින් භාවිතාකිරීම විගණන අවදානම් පිළිගත හැකිතරම්වූ පහත් මට්ටමකට අඩු නොකළහැකි සහ බාහිර විගණකවරයාගේ පරීක්ෂණ සෘජු ලෙස ඉටුකිරීමේ අවශ්‍යතාවය අතහැරදැමීමට තරම් ප්‍රමාණවත් නොවනු ඇත.

අ22. ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පැවතීමේ අවදානම් සම්බන්ධ බාහිර විගණකවරයාගේ තක්සේරු කිරීම් නැවත ඇගයීමට බාහිර විගණකවරයාට සිදුවනු ඇත. මෙහි ප්‍රතිවිපාක වශයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කළයුතුද යන්නත් තවදුරටත් ශ්‍රී.ල.වි.ප්‍ර. යෙදවිය යුතුද නැතිද යන්නත් පිළිබඳ බාහිර විගණවරයාගේ නිගමන වලට බලපෑමක් ඇතිවනු ඇත.

පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය (යොමුව: ඡේදය 18 )

අ23. ශ්‍රී.ල.වි.ප්‍ර. 260[40] වලට අනුව විගණනයේ සැලසුම් කරන ලද විෂයපථය සහ කාලනිර්ණයේ සමස්ත විග්‍රහයක් පාලනය භාරව සිටින අයවෙත බාහිර විගණක සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ කොටස් භාවිතා කිරීමේ සැලසුම් බාහිර විගණකවරයාගේ සමස්ත විගණන උපාය මාර්ගයන්හි අත්‍යාවශ්‍යම කොටසක් වන හෙයින් එම යෝජිත විගණන එළඹීම පිළිබඳව පාලනය භාරව සිටින අය එය පිළිබඳව අවබෝධ කරගැනීම අදාල වේ.

**අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් භාවිතා කිරිම**

*අභ්‍යන්තර විගණන කාර්යභාරය සමඟ සාකච්ඡා කිරීම සහ සම්බන්ධීකරණය (යොමුව: ඡේදය 19 )*

අ24. අදාල ක්‍රියාකාරීකම් සම්බන්ධීකරණය කිරිමේ පදනමක් ලෙස ඒ අයවලුන්ගේ වැඩකොටස් භාවිතා කිරිමේ සැලසුම් සම්බන්ධව අභ්‍යන්තර විගණන කාර්යභාරය සමඟ සාකච්ඡා කිරීමේදී පහත සඳහන් දෑ ආමන්ත්‍රණය කිරීම ප්‍රයෝජනවත් විය හැකිය:

- එම වැඩ සඳහා වන කාලනිර්ණයන්
- ඉටුකරනු ලැබූ වැඩ කොටස් වල ස්වභාවය
- විගණනයෙන් ආවරණය වූ ප්‍රමාණය
- සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ප්‍රමාණාත්මකභාවය (සහ අදාල වන්නේ නම් විශේෂ ගණු-දෙනු පංතිවල, ගිණුම් ශේෂ වල හෝ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණාත්මකභාවයේ මට්ටම හෝ මට්ටම්) සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණවත්භාවය
- යෝජිත අයිතම තෝරා ගැනීමේ ක්‍රමවේදය සහ නියැදිවල තරම්
- ඉටුකළ වැඩකොටස් ලේඛනගතකරනය
- සමාලෝචන හා වාර්තාකරන ක්‍රියාපටිපාටි

[38] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, A 29 ඡේදය
[39] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) 4(e) ඡේදය
[40] ශ්‍රී.ල.වි.ප්‍ර. 261, 15 ඡේදය

අ25. පහත සඳහන් දෑ වන විට බාහිර විගණක හා අභ්‍යන්තර විගණන කාර්යභාරය අතර සම්බන්ධීකරණය සඵලවේ; උදාහරණ :

- සුදුසු විරාමයන් සහිතව කාලපරිච්ඡේදය අතරතුරදී සාකච්ඡාවන් සිදුවේ
- කාර්යභාරයට බලපෑහැකි විශේෂවූ කරුණු බාහිර විගණකවරයා අභ්‍යන්තර විගණන කාර්යභාරයට දන්වයි.
- බාහිර විගණකවරයාගේ කාර්යයන්ට බලපෑමක් එල්ලවිය හැකි වැදගත් කරුණු කාරණා කාර්යභාරයේ අවධානයට ලක්වූ විට ඒවා බාහිර විගණකවරයාට දන්වනු ලබන අතර අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැදගත් වාර්තා වලට ප්‍රවේශ වීමටත් ඒවා පිළිබඳව දැනුම්දීම් ලැබීමටත් බාහිර විගණකට අවකාශය හා හැකියාව ඇත. ඒ අනුව එවැනි කරුණු කාරණා වලින් තම විගණන කාර්යභාරයට පැනනගින ප්‍රතිවිපාක සලකා බැලීමට බාහිර විගණකවරයාට හැකිවේ.

අ26. ශ්‍රී.ල.වි.ප්‍ර. 200[41] සාකච්ඡා කෙරෙන්නේ විගණකවරයා විසින් විගණන සාක්ෂි වශයෙන් ප්‍රයෝජනයට ගන්නා විමසීම් වලට ලැබුන ප්‍රතිචාර සහ ලිය-කියවිලි වල විශ්වාසවන්තභාවය ප්‍රශ්න සහගත බවට පත්කෙරෙන තොරතුරු පිළිබඳව සෝදිසියෙන් සිටීමද ඇතුලත්ව වෘත්තීය සංශය දෘෂ්ඨියෙන් යුතුව විගණනය සැලසුම් කර ඉටුකිරීමයි. එයාකාරයෙන්, කාර්යභාරය පුරාම අභ්‍යන්තර විගණන කාර්යභාරය සමග සන්නිවේදනය කිරීමෙන් බාහිර විගණකවරයාගේ වැඩ වලට බලපෑමක් ඇතිවිය හැකි කරුණු බාහිර විගණකවරයාගේ අවධානයට යොමු කිරීමට අභ්‍යන්තර විගණකවරුන්ට අවස්ථාව ලබාදෙනු ඇත[42]. එවිට ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගේ අවදානම තක්සේරු කරගැනීම හා හඳුනාගැනීම සඳහා එම තොරතුරුද සැලකිල්ලට ගැනීමට බාහිර විගණකවරයාට හැකිවේ. ඊට අමතරව එවැනි තොරතුරු මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඉහල අවදානමක් අඟවන සුළු විය හැකි නම් සහ කිසියම් සත්‍ය, සැකසහිත, සිදුවූවායයි චෝදනා කරන වංචාවක් සම්බන්ධයෙන් නම් බාහිර විගණකවරයාට ශ්‍රී.ල.වි.ප්‍ර. 240[43] ප්‍රකාරව වංචා හේතු කොටගෙන සිදුවූ ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් හඳුනාගැනීමක් වශයෙන් සැලකිල්ලට ගත හැකිය.

*අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස්වල ප්‍රමාණවත්භාවය නිශ්චය කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය. (යොමුව: ඡේද 21-22)*

අ27. බාහිර විගණකවරයා භාවිතා කිරීමට සැලසුම් කරන සමස්තයක් වශයෙන් වූ අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් මත වන බාහිර විගණකවරයාගේ විගණන පද්ධතිය කාර්යභාරයේ වැඩකොටස් පිළිබඳ සමස්ත ගුණාත්මකභාවය සහ එය ඉටුකිරීමේ අරමුණුගතභාවයත් ඇගයීමට පදනම සපයයි.

අ28. 22 ඡේදය අනුව වන ප්‍රති ඉටු කිරීම් වලට අමතරව අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටු කරන ලද වැඩකොටස්වල ගුණාත්මකභාවය හා එළඹි නිගමනයන් ඇගයීමට බාහිර විගණකවරුන් ඉටු කළහැකි ක්‍රියාපටිපාටීන්ට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- අභ්‍යන්තර විගණන කාර්යභාරය ඇතුලත සිටින නිසි පුද්ගලයන්ගෙන් විමසීම් කිරීම අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් ඉටුකරනු ලැබූ ක්‍රියාපටිපාටීන් නිරීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ සටහන් සහ වැඩ පත්‍රිකා සමාලෝචනය කිරීම

අ29. ප්‍රමාණාත්මක අවප්‍රකාශවල තකසේරු කළ අවදානම ඉහළ වන විට, වැඩියෙන් විනිශ්චයන් අවශ්‍ය කෙරේ. අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධානමය තත්වය සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස දක්වන සහාය අඩු හෝ අභ්‍යන්තර විගණන කාර්යභාරයේ නිපුණතා මට්ටම පහත් නම් විගණන මතය පදනම්වීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමේදී අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩ භාවිතා කිරීමට ගත් තීරණයට සහායවීමට, කාර්යභාරයේ සමස්ත වැඩවල ප්‍රධාන අංගයන් මත බාහිර විගණක විසින් බොහෝ විගණන පටිපාටි ඉටු කිරීම අවශ්‍ය වේ.

**ප්‍රති ඉටු කිරීම (යොමුව: ඡේදය 22 )**

අ30. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා ප්‍රති ඉටු කිරීම් යනුවෙන් අදහස් කරන්නේ අභ්‍යන්තර විගණන කාර්යභාරය එළඹුන නිගමනයන් බාහිර විගණකවරයා විසින් ස්වාධීනව ක්‍රියාපටිපාටි ඉටු කිරීම මඟින් වලංගු කිරීමයි.

[41] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 15 සහ A 18 ඡේද
[42] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), A 116 ඡේදය
[43] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) A 11 ඡේදය *ශ්‍රී.ල.වි.ප්‍ර. 240 මූල්‍ය ප්‍රකාශ විගණනයෙහිදි වංචා සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම*

අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් දැනටමත් විභාග කර ඇති අයිතමයන් විභාග කිරීමෙන් මෙම අරමුණ මුදුන් පත් කර ගත හැකිය හෝ එසේ කිරීමට නොහැකි වන විට අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් සත්‍ය වශයෙන්ම විභාග නොකරන ලද සමාන අයිතමයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් විභාග කිරීමෙන් එම අරමුණ මුදුන්පත් කර ගත හැකිය. ඡේද A28 සඳහන් බාහිර විගණකවරයා විසින් ඉටුකරනු ලැබිය හැකි බවට සඳහන්ව ඇති වෙතත් ක්‍රියාපටිපාටීන් හා සමඟ සන්සන්දනය කරන කල්හි ප්‍රතිඉටු කිරීම්, අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස්වල ප්‍රමාණවත්භාවය පිළිබඳව වඩාත් ඒත්තු ගන්වන සාක්ෂි සපයයි. බාහිර විගණකවරයා විසින් ප්‍රයෝජනයට ගන්නා අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් සියල්ලම මත ප්‍රති ඉටු කිරීම් කිරීම අවශ්‍ය නොවන අතරම ඡේද 22 අනුව බාහිර විගණකවරයා ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර ඇති අභ්‍යන්තර විගණන කාර්යභාරයේ වැඩකොටස් මත යම් ප්‍රති ඉටු කිරීමක් අවශ්‍ය කෙරේ. අභ්‍යන්තර විගණන කාර්යභාරය විසින් සැලසුම් කිරීම, ඉටුකිරීම සහ ඉහළ අවදානමක් ඇති ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් ඇති විෂයපථයන්හි විගණන ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල ඇගයීම වෙනුවෙන් වැඩිමනත් විනිශ්චයන් ක්‍රියාත්මක කොට ඇති විෂය පථයන් ප්‍රති ඉටු කිරීමට අවධානය යොමු කිරිමට බාහිර විගණකවරයා කැමැත්ත දැක්විය හැකිය .

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.